# 2018 – 2020 වර්ෂ සඳහා පළාත් සභා ත්‍රෛවාර්ෂික වාර්තාව.

--------------------------------------------------------------------------

1987 වර්ෂයේ දී පාර්ලිමේන්තුවේ සම්මත කරන ලද 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජන රජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකතු කරන ලද 154 අ (1) ව්‍යවස්ථාව මඟින් පළාත් සභා පිහිටුවා තිබේ. පළාත් සභා ගණනින් 09 කි. එනම් බස්නාහිර, වයඹ, ඌව, සබරගමුව. මධ්‍යම, නැගෙනහිර, දකුණ, උතුරු මැද, උතුර වශයෙන් වේ.

පළාත් සභාවල අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, පළාත් සභා රජයේ සේවයට අදාළ කාරණා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට අනුෂංගික කාරණා පිළිබඳ විධිවිධාන සැලැස්වීම සඳහා 1987 අංක 42 දරන පළාත් සභා පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කර තිබේ. මේ වන විට ශ්‍රී ලංකා රජයට පළාත් සභා සම්බන්ධව වසර 35 ක ඉතිහාසයක් ඇත. මෙම වාර්තාවේ දින වන විට පළාත් සභා 09 හි නිල කාලය අවසන්ව ඇති නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඉ ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව එම සභා විසිර ගියා සේ සලකනු ලැබ ඇත. ඒ අනුව “ සභාව ” නොමැතිව 2018 – 2020 වර්ෂ 03 තුළ 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂංගික විධිවිධාන) පනතේ 2 (1) (අ) වගන්තියේ විධිවිධාන ප්‍රකාර එක් එක් පළාත් සභාවේ ආණ්ඩුකාරවරු විසින් පළාත් සභා පවත්වාගෙන එමින් තිබේ. එක් එක් පළාතේ පැවති අවසන් “ පළාත් සභාව ” ආරම්භ කළ සහ එහි නිල කාලය අවසන් වූ දින පහත දැක්වේ.

| පළාත් සභාව | අන්තිම සභාවේ ආරම්භක දිනය | අන්තිම සභාව අවසන් වූ දිනය |
|---|---|---|
| බස්නාහිර | 2014.04.22 | 2019.04.21 |
| වයඹ | 2013.10.11 | 2018.10.10 |
| ඌව | 2014.10.09 | 2019.10.08 |
| සබරගමුව | 2012.09.27 | 2017.09.26 |
| මධ්‍යම | 2013.10.09 | 2018.10.08 |
| නැගෙනහිර | 2012.10.01 | 2017.09.30 |
| දකුණ | 2014.04.11 | 2019.04.10 |
| උතුරු මැද | 2012.10.02 | 2017.10.01 |
| උතුර | 2013.10.25 | 2018.10.23 |

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 වගන්තිය ප්‍රකාරව පළාත් සභා අරමුදල විගණනය කිරීම විගණකාධිපති වෙත පැවරී තිබේ. එම විධිවිධාන පරිදි සිදු කරනු ලබන විගණනයන් පසුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන විගණන වාර්තාවල නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ ඇතුළත් ත්‍රෛවාර්ෂික වාර්තාවක් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 14 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති විසින් පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වේ. ජාතික විගණන පනතේ එන එම විධිවිධාන ප්‍රකාරව 2018 – 2020 යන වර්ෂ 03 සඳහා මෙම පළමු ත්‍රෛවාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2018, 2019 සහ 2020 වර්ෂ තුනෙහිම සියලුම පළාත් සභා සඳහා තත්ත්වාගණනය කළ විගණන මතයක් ප්‍රකාශයට පත්කර තිබේ. විගණනයට ඉදිරිපත් කර ඇති වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පරිදි එම වර්ෂ තුනේ පළාත් සභාවල රජයේ මූලධන සහ පුනරාවර්තන ප්‍රදාන ඇතුළත් මුළු ආදායම රුපියල් මිලියන 970,629 ක් වූ අතර මුළු වියදම රුපියල් මිලියන 953,135 ක් විය. එසේම 2020 දෙසැම්බර් 31 දිනට පළාත් සභා 09 සතු මුළු ජංගම නොවන වත්කම් ප්‍රමාණය රුපියල් මිලියන 247,355 කි. එම වර්ෂ 03 තුළ දී පළාත් සභාවල වියදම් සඳහා මහා භාණ්ඩාගාරය විසින් රුපියල් මිලියන 707, 234 ක් පළාත් සභා වෙත ලබා දී තිබේ. එම ප්‍රමාණය පළාත් සභාවල එම වර්ෂ තුනෙහි සමස්ත වියදමින් සියයට 74 කි. මේ පිළිබඳ සවිස්තර තොරතුරු පහත වගුවෙහි දැක්වේ.

**2018 – 2020 වර්ෂ තුනෙහි පළාත් සභාවල මූල්‍ය තොරතුරු.**

---------------------------------------------------------------------------

| වර්ෂය | මුළු ආදායම | මුළු වියදම | භාණ්ඩාගාර ප්‍රදාන | දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම් |
|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 2018 | 306,472 | 300,291 | 203,810 | 182,836 |
| 2019 | 317,596 | 317,843 | 219,029 | 190,300 |
| 2020 | 346,561 | 335,001 | 284,395 | 247,355 |
| එකතුව | 970,629 | 953,135 | 707,234 | |

මූලාශ්‍රය - පළාත් සභා නවයෙහි වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

එක් එක් පළාත් සභාවට අදාළව 2018, 2019, සහ 2020 වර්ෂයන් සඳහා පාර්ලිමේන්තුවේ සභාගත කර ඇති විගණන වාර්තාවල ඇතුළත් මේ දක්වා නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ ඒවාට අදාළ විගණකාධිපතිගේ නිර්දේශ, මේ වන විට ගෙන ඇති වැළැක්වීමේ ක්‍රියාමාර්ග සහ ඒවායේ වර්තමාන තත්ත්වය ඇතුළත් වාර්තාව පහත දැක්වේ.

**විගණකාධිපති ත්‍රෛවාර්ෂික තත්ත්ව වාර්තාව (2018, 2019, 2020)**

විගණන අස්ථිතායේ නම - වයඹ පළාත් සභාව

| | | |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය | 2018 - | තත්වාගණනය කළ මතය |
| | 2019 - | තත්වාගණනය කළ මතය |
| | 2020 - | තත්වාගණනය කළ මතය |

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| **01.** | **ශීර්ෂය 201 - ආණ්ඩුකාර කාර්යාලය** | | | |
| **(අ)** | ආණ්ඩුකාර කාර්යාලය මඟින් 2019 ජනවාරි 26 දින පවත්වන ලද ඉංග්‍රීසි ගුරුවරුන් බඳවා ගැනීමේ විභාගයේ ප්‍රතිඵල නිකුත් කර පසුව ආණ්ඩුකාරතුමා විසින් මුළු විභාගයම අවලංගු කිරීම හා 2019 ජූනි 20 දින නැවත විභාගයක් පැවැත්වීමට කටයුතු කිරීම මත අයදුම්කරුවන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවරූ නඩුව සඳහා රු.375,000 ක් හා මෙම විභාගයේ ප්‍රශ්න පත්‍රවල අඩුපාඩු මත ආණ්ඩුකාරතුමා විසින් රාජ්‍ය සේවා කොමිසම විසුරුවාහැරීම හේතුවෙන් එහි සාමාජිකයින් අභියාචනාධිකරණයේ පැවරූ නඩුව සඳහා නඩු ගාස්තු ලෙස රු.1,508,776 ක් ගෙවීමටත් සිදුවී තිබුණි. උසාවි තීන්දු මත නැවත කොමිෂන් සභාවට එම සාමාජිකයින්ම පත්කර තිබුණු අතර ගනු ලැබූ සාවද්‍ය තීරණය හේතුවෙන් ඉහත පරිදි දරන ලද එකතුව රු.1,883,776 ක වියදම ආර්ථික | මෙවැනි වියදම් ඇති නොවීමට වගබලා ගත යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත. ගරු ආණ්ඩුකාරතුමා වෙත 1987 අංක 42 දරන පළාත් සභා පනත අනුව හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඉ(2) අනුව පැවරී ඇති විධායක බලතල අනුව එම තීරණ ගන්නා ලද අතර, ඊට අදාළ CA(Writ) 297/2019 හා SCFR No 228/2019 අංක දරන නඩු දෙකම පැමිණිලිකාර පාර්ශවයන්ගේ එකඟතාවය මත වයඹ පළාත් සභාවේ කීර්තිනාමයට හානියක් නොවන ආකාරයෙන් හා මූල්‍ය අලාභයන් වළක්වා ගනිමින් සමතයකට පත්කරගෙන ඇති බව | සිදු වූ වරද එලෙසම පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | නොවූ ගනුදෙනුවක් බව 2019 වර්ෂයේ විගණනයේදී අනාවරණය වී තිබුණි. (2020) | | සඳහන් කර තිබුණි. | |
| **(ආ)** | ආණ්ඩුකාර නිල රථය 2020 ජූලි 01 දින අනතුරකට භාජනය වී තිබුණි. එහිදී යෙදුන රාජකාරිය නිශ්චිතව ප්‍රකාශ නොවන බව මූලික විමර්ශන වාර්තාවේ සඳහන් වුවද, මේ පිළිබඳව පළාත් මූල්‍ය රීති 54 ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර පළාත් මූල්‍ය රීති 60.1.2 පරිදි වූ ලේඛනයෙහි රු.5,286,458 ක වූ සම්පූර්ණ අලාභය සහ එයින් රියදුරුගෙන් අයකර ගැනීමට තීරණය කර තිබුණු රු.1,420,728 ක් පිළිබඳ සටහන් කර නොතිබුණි. (2020) | පළාත් මූල්‍ය රීති 54 හා 60.1.2 ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මූලික විමර්ශනයක් පවත්වා ඇති අතර සිදු වූ හානිය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මඟින් හානි පූර්ණය කර ගැනීමටත්, ඉතිරි මුදල රියදුරුගෙන් අයකර ගැනීමටත් තීරණය කර තිබුණි. | අලුත්වැඩියා වියදම රු.5,286,458 ක් වූ අතර හානිය සම්බන්ධයෙන් රු.3,865,730 ක මුදලක් රක්ෂණය මඟින් පියවා ඇති අතර ඉතිරි මුදල වූ රු.1,420,728 ක මුදල ගෙවන ලෙස රියදුරුට දන්වා ඇත. |
| **02.** | **ශීර්ෂය 202 - සභා ලේකම්** | | | |
| | වයඹ පළාත් සභා සභාපති නිල නිවසේ භාණ්ඩ ආපසු කාර්යාලයට භාරදීමේදී අස්ථානගත වූ ලෙස සැලකෙන රු.45,000 ක් වටිනා අඟල් 32 ක වර්ණ රූපවාහිනී යන්ත්‍රය සම්බන්ධයෙන් දැනට වසර 04 ක කාලයක් ගතවී තිබුණු නමුත්, රු.45,000 ක පාඩුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. (2020) | පාඩුවට අදාළ පාර්ශව හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | පළාත් මූල්‍ය රීති 54 අනුව පරීක්ෂණයක් පැවැත්වීමට සහ පොලිසිය වෙත පැමිණිලි කිරීමට කටයුතු කර තිබුණි. | මේ වනතෙක් අදාළ මුදල අයකර ගෙන නොතිබුණි. |

**03. ශීර්ෂය 210 - වයඹ ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන හා පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ පළාත් අමාත්‍යවරයා**

---

| | | | | |
|---|---|---|---|---|
| (අ) | ප්‍රධාන අමාත්‍යාංශය විසින් 2017 වර්ෂයේදී මදුරු කීට උගුල් 1,650 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.825,000 ක මුදලක් වියදම් කර ආරම්භ කර තිබුණු මදුරු ගහනය අවම කිරීමේ විශේෂ පරීක්ෂණ ව්‍යාපෘතිය අසාර්ථක වී ඇති බැවින් ඒ සඳහා වැය කරන ලද මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. (2018) | ව්‍යාපෘතිය සක්‍රීය කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම ව්‍යාපෘතිය පර්යේෂණ ව්‍යාපෘතියක් වන අතර එහිදී හඳුනා ගන්නා ලද මදුරු කීට උගුලේ තාක්ෂණික දෝෂයන් නිවැරදි කර නැවත ක්‍රියාත්මක කිරීමට සුදුසු තත්ත්වයේ පවතීද යන්න පරීක්ෂා කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහාය මත ඉදිරියේදී නැවත ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදුකරමින් පවතී. | දෙවන අදියර ආරම්භ කර එම අදියරේ ප්‍රතිඵල මත ආයතනයේ ඇති කීට උගුල් 480 සම්බන්ධව තීරණයක් ගැනීමේ අපේක්ෂාවෙන් සිටී. |
| (ආ) | ප්‍රධාන අමාත්‍යාංශය යටතේ 2019 නොවැම්බර් 18 දින සිට වයඹ පළාත් අධ්‍යාපන සංවර්ධන අරමුදල ආණ්ඩුකාර අනුමැතිය මත ක්‍රියාත්මක කර තිබුණු නමුත් එය ගැසට් මඟින් ප්‍රසිද්ධ කර නොතිබුණි. එම අරමුදල තරකර ගැනීම සඳහා අභ්‍යාස පොත් මුද්‍රණය කර බෙදාහැර විකිණීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති අතර එහි ආදායම්, වියදම් අරමුදල් බැංකු ගිණුම මඟින් සිදු කර නොතිබුණි. එසේම ආණ්ඩුකාරවර අනුමත කළ අරමුදල සම්බන්ධ ව්‍යවස්ථාවේ 17 හා 18 අනුව්‍යවස්ථා අනුව විගණන කටයුතු සඳහා විගණකාධිපති වෙත මෙම අරමුදල් ගිණුම ඉදිරිපත් කර නොතිබුණි. (2020) | අරමුදලේ නීතිමය වලංගුභාවය හා ක්‍රියාත්මක කිරීමේ හැකියාව පිළිබඳව නැවත සමාලෝචනය කර අරමුදල විධිමත් කිරීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. | වර්තමානය වන විටද මෙම තත්වයෙන්ම පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ප්‍රධාන අමාත්‍යාංශය සතු වාහනයක් මදුරන්කුලිය ප්‍රදේශයේ ගරාජයක අලුත්වැඩියාව සඳහා භාරදී තිබියදී ගිනිතබා විනාශ කිරීම සම්බන්ධව පැවති නඩුවේදී එම වාහනය භාවිතා කළ පළාත් සභා මන්ත්‍රීවරියගෙන් මුළු අලාභය අයකර ගැනීමට තීරණය කර තිබුණි. මූල්‍ය ප්‍රකාශන මඟින් මෙම සිද්ධිය අනාවරණය කර නොතිබුණු අතර අලාභය අයකර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. (2020) | නඩුවේදී ලබාදී ඇති තීරණය අනුව අලාභ හානි අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මේ වන තෙක් අලාභය අයකර ගැනීමට කටයුතු කර නොමැත. |
| (ඇ) | ප්‍රධාන අමාත්‍යාංශය වයඹ පළාත් සභාව හා කුරුණෑගල මහා නගර සභාව ඒකාබද්ධව ඉදිකරනු ලබන රුපියල් මිලියන 1,334 ක කොන්ත්‍රාත් වටිනාකමකින් යුතු සය මහල් ගොඩනැගිල්ල සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය කෙරේ.<br>**(i)** වයඹ පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ සිටින සුදුසුකම්ලත් ඉංජිනේරු තාක්ෂණයෙන් සපිරි කාර්යමණ්ඩලය ලවා නිර්මාණය සහ ඇස්තමේන්තු සකස් කිරීමේ හැකියාව තිබියදී මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම පළාත් සභාවේ ප්‍රමුඛ කාර්යයක් බවත්, මේ සඳහා පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් සැලසුම් සකස් කරන්නේනම් ඊට දීර්ඝ කාලයක් ගතවන බවත්, එම | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව කොන්ත්‍රාත්කරු තෝරා නොගැනීම, ප්‍රමාදවීම සඳහා ගිවිසුම් අනුව ක්‍රියාමාර්ග නොගැනීම දෝෂ සහගත ප්‍රසම්පාදන තීරණය සම්බන්ධ අනාවරණයවීමෙන් පසු ක්‍රියාමාර්ග නොගැනීම සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන්ට එරෙහිව පරීක්ෂණයක් පැවැත්විය යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම ප්‍රසම්පාදන ක්‍රමය යටතේ තෝරාගත් ආයතනය විසින් ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතී. |

නිසා නිර්මාණය හා ඉදිකිරීමේ ප්‍රසම්පාදන ක්‍රමය තෝරාගත් බව දක්වමින් නිර්මාණය සහ ඉදිකිරීමේ (Design & Building) ප්‍රසම්පාදන ක්‍රමය තෝරාගෙන තිබුණි.

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8.4(ආ) මාර්ගෝපදේශයට අනුකූල නොවන පරිදි ලංසු සුරක්ෂණය ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ලබාදෙන ලද සම්මත ආකෘතියට වඩා වෙනස්වීම හා සම්මත ආකෘතියේ ඇති 02 වන වගන්තිය වන ''ලංසුකරු විසින් ලංසුවෙහි ඇති වැරදි නිවැරදි කිරීම පිළිගැනීම ප්‍රතික්ෂේප කරයි නම්'' යන වගන්තිය ඉදිරිපත් කළ ආකෘතියේ නොමැතිවීම මත විශාල බැහැරවීමක් ලෙස සලකා බලා ලංසුව ප්‍රතික්ෂේප කළ යුතු වුවද, එම ලංසුකරුට ටෙන්ඩරය ප්‍රදානය කර තිබුණි. මේ පිළිබඳව වයඹ ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් විසින් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවෙන් විමසා සිටීමේදී එම සභාව විසින්ද මෙය වරදක් බව වැඩි දුරටත් තහවුරුකර තිබුණු බව නිරීක්ෂණය විය. (2020)

| | | | | |
|---|---|---|---|---|
| **(ඉ)** | පළාත් පාලන ආයතනවල ප්‍රධාන විධායකය සඳහා වෙන් කර තිබුණු වාහන වෙනුවෙන් ඉන්ධන සීමාවන් වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යවරයා ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණු අතර පළාත් පාලන ආයතන විසින් ද ඉන්ධන සීමා පනවා නොතිබුණි. මේ හේතුවෙන් කිසිදු සීමාවකින් තොරව ඉන්ධන ලබා ගන්නා අවස්ථා මෙන්ම සභා තීරණ මත ප්‍රවාහන දීමනා ලබා ගන්නා අවස්ථා ද පැවතුණි. (2019) | ඉන්ධන සීමා පැනවීමට හා අධීක්ෂණයට කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වර්තමානය වන විටත් ඉන්ධන සීමා, ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි. |

**04. වයඹ කර්මාන්ත සේවා කාර්යාංශය**

| | | | | |
|---|---|---|---|---|
| **(අ)** | වයඹ කර්මාන්ත සේවා කාර්යාංශයට අයත් හෙරලියාවල කර්මාන්තපුරයේ පර්චස් 922.36 ක් වූ භූමි ප්‍රමාණයක් කර්මාන්ත 04 ක් සඳහා රු.3,830,025 ක වටිනාකමකට සින්නක්කර පදනමට පෞද්ගලික අංශය වෙත විකුණා තිබුණි. (2020) | රජය සතු ඉඩම් පුද්ගලික අංශයට විකිණීමට කටයුතු කිරීමකින් තොරව දීර්ඝකාලීනව බදුදීමට කටයුතු කළ යුතුය. | කර්මාන්තපුර අදියර I මුල් අවස්ථාවේදී ආයෝජකයින් එසේ ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව එම කර්මාන්තකරුවන් 04 හට භූමි ප්‍රමාණය සින්නක්කරව හිමිවිය. ඉන් පසු සෑම ගිවිසුමකම එම වගන්තිය ඉවත් කර ඇත. | විගණනයෙන් පෙන්වාදීමෙන් පසු රජය සතු ඉඩම් දීර්ඝකාලීන පදනම මත බදු දීමට කටයුතු කර ඇත. |
| **(ආ)** | හෙරලියාවල කර්මාන්තපුරයට අයත් කර්මාන්ත 55 ක් වසර 20 ක කාලයක් සඳහා බදු දී තිබුණු අතර ඉන් කර්මාන්ත 19 ක් සඳහා පමණක් ගිවිසුම්ගත වී ඇතත් එකතුව රු.2,375,530 ක වාර්ෂික කුලියකට බදු දී ඇති ඉතිරි කර්මාන්ත 36 සඳහා 2020 දෙසැම්බර් 31 දින වන විටත් බදු ගිවිසුම්වලට එළැඹී නොතිබුණි. (2020) | කර්මාන්ත සියල්ල විධිමත් පරිදි ගිවිසුම්ගතව බදුදීමට කටයුතු කළ යුතුය. | කර්මාන්ත 36 න් 11 ක් නියමිත පරිදි ගිවිසුම්ගත වී ඇත. 24 ක් සඳහා ගිවිසුම් සකස් කර බදු ගිවිසුම් ලියාපදිංචි කිරීම සඳහා භාර දී ඇත. එක් කර්මාන්ත ශාලා ඉඩමක් සින්නක්කර පදනම මත විකුණා ඇත. | බදු ගිවිසුම් 24 ක් ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කර ඇතත් මෙතෙක් ලියාපදිංචිය සිදුවී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| **(ඇ)** | ජොෂ්ය උපදේශක තනතුරු 02 ක් සඳහා අනුමත කාර්යමණ්ඩලය ඉක්මවා බඳවා ගැනීම් සිදුකර තිබුණු අතර එම තනතුරු සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.1,859,533 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. (2020) | අනුමත කාර්යමණ්ඩලය පමණක් බඳවාගැනීම් සිදු කළ යුතු අතර අතිරික්තතා විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුය. | කාර්යමණ්ඩල සංශෝධනයක් සිදුකර මෙම තනතුරු 02 ක සඳහා අනුමැතියක් ලබාදෙන ලෙස ප්‍රධාන ලේකම්තුමාගෙන් ඉල්ලීම් කර ඇත. | එම අතිරික්ත තනතුරු 02 ක තව දුරටත් පවතින අතර වැටුප් ගෙවමින් සිටී. |
| **(ඈ)** | 2016 දෙසැම්බර් 16 දිනැති අංක 303 දරන මාණ්ඩලික පත්‍රිකාව අනුව කාර්යාංශයේ එක් එක් කාර්ය පැවරුම් සඳහා ඉපයූ ලාභයෙන් සියයට 5 ක් සුභසාධන අරමුදලට අඩුකොට ඉතිරි ලාභයෙන් සියයට 55 ක් කාර්යමණ්ඩලය සඳහා දිරිදීමනා වශයෙන් ගෙවනු ලබන අතර එලෙස 2019 වර්ෂය තුළ දිරිදීමනා වශයෙන් රු.4,813,222 ක් ගෙවා තිබුණි. ඊට අමතරව ඉතිරි සියයට 45 න් රු.1,292,126 ක් නිලධාරීන් විසින් ඉතිරිකරගත් අසනීප නිවාඩු වෙනුවෙන් ගෙවා තිබුණි. (2019) | දිරිදීමනා යෝජනා ක්‍රමය හා එහි නිර්ණායක සඳහා විධිමත් පරිදි අනුමැතිය ලබා ගත යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | දිරිදීමනා හා ඉතිරි කරගත් නිවාඩු සඳහා අඛණ්ඩව දීමනා ගෙවීම් සිදුකරයි. |

**05.** **වයඹ ජනකලා පදනම**

--------------------------

| | | | |
|---|---|---|---|
| ජනකලා පදනමෙහි 2020 වර්ෂය හැර පසුගිය වර්ෂ 05 ක ආදායම, වියදම, හා ලාභ/අලාභ තත්ත්වය විශ්ලේෂණය කිරීමේදී කටුනායක වයඹ එක්ස්පෝට් අලෙවිසැල පමණක් 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ලාභදායී තත්ත්වයක පැවති අතර කුරුණෑගල විස්කම් | එම අලෙවිසැල් අඛණ්ඩව අලාභ ලබන තත්ත්වයට පත්වීමට හේතු විග්‍රහාත්මකව සොයා බලා ආදායම් වර්ධනය කර ගැනීමට කටයුතු | • විකුණුම් ප්‍රවර්ධන ක්‍රමවේද අනුගමනය කිරීම.<br>• මිල සහන ලබාදීම.<br>• දිරිදීමනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.<br>• අන්තර්ජාලය ඔස්සේ භාණ්ඩ ඇණවුම් | 2021 වර්ෂය තුළදීද කුරුණෑගල විස්කම් නිවස හා හලාවත විස්කම් නිවස ලැබූ මුළු ආලාභය රු.4,188,052 ක් |

| | | | | |
|---|---|---|---|---|
| | නිවස හා හලාවත විස්කම් නිවස 2020 වර්ෂය ඇතුළු පසුගිය වසර 05 තුළම අලාභ ලැබී තිබුණි. (2020) | කළ යුතුය. | භාරගෙන විකුණුම් සිදු කිරීම වැනි ක්‍රියාමාර්ග ගෙන තිබුණි. | වූ අතර වයඹ එක්ස්පෝර්ට් ආයතනයද 2021 වර්ෂයේ රු.1,046,285 ක අලාභයක් ලබා ඇත. |
| **06.** | **වයඹ පරිසර අධිකාරිය** | | | |
| **(අ)** | පළාත් පරිසර අධිකාරියේ සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) 2017 වර්ෂයේ තාක්ෂණික ඇගයීම් කමිටු 50 ක වියදම් දැරීමට ලබාගෙන තිබුණු අත්තිකාරම් වලින් වියදම් නොවූ රු.310,000 ක් සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) ගෙන් අයකර ගතයුතු බව ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් විසින් පත්කරන ලද කමිටුවක් විසින් නිර්දේශ කර ඇතත්, එම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. (2020) | පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන්කර නිලධාරිනියගෙන් අයවිය යුතු මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | • නිලධාරිණියගේ වැඩ තහනම් කර ඇත .<br>• සේවයෙන් ඉවත් කිරීම හෝ විනය ක්‍රියාමාර්ගයක් ගැනීමට මූලික විමර්ශනයක් සිදු කර ඇත. | මූලික විමර්ශනයට අදාළව නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු වුවද, අධ්‍යක්ෂ මණ්ඩලය විසුරුවාහැර ඇති බැවින් නැවත අධ්‍යක්ෂ මණ්ඩලය පත්වන තෙක් තීරණයක් ගැනීමට නොහැකි තත්ත්වයක් පවතී. |
| **(ආ)** | පළාත් පරිසර අධිකාරියේ අධ්‍යක්ෂවරයා වාහනය තමා විසින් පදවාගෙන යාමට අමාත්‍යාංශ ලේකම්ගෙන් ලබාගත් අනුමැතියකින් තොරව වාහනය ධාවනය කරමින් සිටියදී 2019 මාර්තු | ආයතන ප්‍රධානීන් නීති රීති රෙගුලාසි අනුකූලව කටයුතු කළ යුතු අතර අලාභය සම්බන්ධයෙන් | අමාත්‍යාංශ ලේකම්ගේ වාචික අනුමැතිය ඇතිව සාකච්ඡාවකට සහභාගි වූ අතර වාහනය භාවිත කිරීම සඳහා ද ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්තුමා විසින් | රක්ෂණ සමාගමින් රු.2,082,160 ක හානිය අයකර ගෙන ඇත. වාහනය මේ වන |

| | | | | |
|---|---|---|---|---|
| | 07 දින පේරාදෙණිය විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී ගිනිගෙන, සිදුවී තිබුණු අනතුර සම්බන්ධයෙන් ප.මු.රී 54.6 ප්‍රකාරව අලාභ හානිය සිදු වූ දිනයේ සිට තුන්මසක් ඇතුළත දී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණු අතර ගමනේ යෙදීමේ රාජකාරී අවශ්‍යතාවයද තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි කිසිවක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. (2020) | ප්‍රාරම්භක වාර්තා අවසන් වාර්තා ඉදිරිපත් නොකිරීම සම්බන්ධයෙන් අදාළ පාර්ශව වගකිව යුතු අතර අලාභ අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | අනුමැතිය ලබාදී තිබුණි. එදින එම වාහනයට සිදුවූ අනතුර සම්බන්ධයෙන් ප.මු.රී.54.6 ප්‍රකාරව මාණ්ඩලික නිලධාරියෙකුගේ සභාපතිත්වයෙන් යුතුව යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුද ඇතුළුව පරීක්ෂණයක් කර ඇත. එම පූර්ණ වාර්ථාවක් ලද වහාම පියවර ගැනීමට අපේක්ෂිතය. | විට ධාවන මට්ටමේ පවතී. |

**07. වයඹ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | 2001 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා පවතින ලැබිය යුතු රු.15,820,426 ක ණය ශේෂය සමාලෝචිත වර්ෂයේ අදාළ පාර්ශවයන්ගෙන් අයකරගෙන නොතිබුණි. (2020) | ලැබිය යුතු මුදල් අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ ණය ශේෂ එලෙසම පවතී. |
| (ආ) | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ නව කාර්යාල සංකීර්ණය ඉදිකිරීම සඳහා රු.59,112,869 ක්ද, වැට හා තාප්පය ඉදිකිරීම සඳහා රු.3,247,813 ක්ද වැයකර තිබූ නමුත් 2020 නොවැම්බර් 25 විගණිත දින වන විටත් මෙම ඉඩම අධිකාරිය වෙත පවරා නොතිබුණු බව නිරීක්ෂණය විය. (2020) | ඉඩමේ අයිතිය අධිකාරිය වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | ඉඩම පවරා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. | ඉඩමේ අයිතිය අධිකාරිය වෙත පවරාගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| **(ඇ)** | රියදුරු අභ්‍යාස විද්‍යාලයේ ආදායම් වියදම් වාර්තා අනුව සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් 30 දින වන විට උපයා ඇති ආදායම රු.259,500 ක් වන අතර, වියදම රු.1,669,513 කි. ඒ අනුව 2020 වර්ෂයේ ඔක්තෝබර් 30 දින වනවිට රු.1,410,013 ක අලාභයක් සිදුවී ඇති බව නිරීක්ෂණය විය. (2020) | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව රියදුරු අභ්‍යාස විද්‍යාල කටයුතුවලින් ආදායම වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ප්‍රමාණවත් පරිදි ගෙන නොතිබුණි. | රියදුරු පාසල මානව සහ භෞතික සම්පත් නොමැතිවීමෙන් අක්‍රියව පවතී. |
| **(ඈ)** | වයඹ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට අයත් ටොයෝටා ෆෝචූන් ජීප් රථය 2020 පෙබරවාරි 16 දින අනතුරට ලක්වී තිබුණි. මෙම වාහනය අලුත්වැඩියා කිරීම සඳහා රු.87,400 ක මුදලක් වැයවී ඇති අතර, එම මුදල අදාළ රක්ෂණ සමාගමෙන් ආවරණය කළ නොහැකි බව දැනුම්දී තිබුණි. මේ සම්බන්ධයෙන් විමර්ශන කටයුතු කඩිනම් කර අලාභය වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. (2020) | අනතුර සම්බන්ධයෙන් සිදුවූ අලාභ හානිය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | වගකිවයුතු නිලධාරීන්ගෙන් රු.57,400 ක් අයකර ගැනීමට කටයුතු කර ඇත. ඉතිරි මුදලද අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | අලුත්වැඩියාව සඳහා ගිය වියදමෙන් රු.57,400 ක් රියදුරුගෙන් අයකරගෙන තිබුණු අතර, තවදුරටත් රු.30,000 ක පාඩුවක් අයකර ගැනීමට ඇත. |
| **(ඉ)** | 1995 අංක 04 දරන වයඹ පළාත් මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තියේ 17 (ආ) වගන්තිය අනුව මගී ප්‍රවාහනය සඳහා අවසරපත් නිකුත් කිරීම, එම අවසරපත් අලුත් කිරීම හෝ අවලංගු කිරීම සහ ගාස්තු නියම කිරීම අධිකාරිය විසින් කළ යුතුය. එම ගාස්තු සහ නියෝග සකස් කර 2012 ඔක්තෝබර් 15 දින දක්වා අවස්ථා කිහිපයකදී ගැසට් කිරීම මගින් නීතිගත කර ඇතත් ඉන් පසු අවස්ථා | ගාස්තු සංශෝධනයන් ගැසට් පත්‍රයේ පළකර නීතිගත කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ගාස්තු සංශෝධන ගැසට් පත්‍රයේ පළකර නීතිගත කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | කිහිපයකදීම සිදුකරන ලද ගාස්තු සංශෝධන ගැසට් පත්‍රයේ එලකර නීතිගත කර නොතිබුණි. (2019) | | | |
| **(ඊ)** | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය සඳහා තොරතුරු තාක්ෂණික පද්ධතියක් සකස් කිරීම වෙනුවෙන් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.7,500,000 ක් ඇස්තමේන්තු කර තිබුණු නමුත් එම ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණු අතර, 2018 දෙසැම්බර් 31 දින වන විට රු.1,500,000 ක උපදේශන ගාස්තු සඳහා පමණක් ගෙවා තිබුණි. (2018) | ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ පසුවිපරම් කටයුතු සිදුකොට එහි ප්‍රගතිය ඇගයීමට හා උපදේශන වාර්තාවට අනුව ව්‍යාපෘතිය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ප්‍රමාණවත් පරිදි ගෙන නොතිබුණි. | අධිකාරිය විසින් පරිගණක මෙහෙයුම් කළමනාකරණ පද්ධතිය සකස් කිරීම වෙනුවෙන් 2018 වර්ෂයේ සිට රු.18,215,169 ක වියදමක් දරා ඇතත්, මහජනතාවට සේවයක් ලැබෙන පරිදි තවමත් ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

**08. වයඹ සංවර්ධන අධිකාරිය**

------------------------------

| | | | | |
|---|---|---|---|---|
| **(අ)** | නිවාඩු නිකේතනයක් ලෙස පවත්වාගෙන යනු ලබන පුත්තලම මැරිටයිම් හෙරිටේජ් බංගලාවෙන් 2020 වර්ෂයේදී උපයා තිබුණු මෙහෙයුම් ආදායමට වඩා පවත්වාගෙන යාමට දරා තිබුණු වියදම් ඉහළ යාමෙන් රු.681,553 ක පාඩුවක් සිදුව තිබුණද, මෙම සංචාරක නිකේතනය ලාභදායීව | සංචාරක නිකේතනයේ ලාභදායීත්වය නැංවීමට සුදුසු පියවරක් කඩිනමින් ගැනීමට කළමනාකරණය කටයුතු කළ යුතුය. | • විකුණුම් ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කර පවතී.<br>• අත් පත්‍රිකා, වෙබ් අඩවි නිර්මාණය කිරීම සිදුකර ඇත. | 2021 දෙසැම්බර් 31 වන විට මෙහෙයුම් අලාභය රු.959,563 ක මට්ටමට වර්ධනය වී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | පවත්වාගෙන යාම කෙරෙහි විශේෂ අවධානයක් යොමුකර නොතිබුණි. (2020) | | | |
| **(ආ)** | 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයගැතියන් 15 දෙනෙකුගෙන් රු.10,845,552 ක් අයවිය යුතු අතර එයින් රු.3,469,673 ක් 2019 වර්ෂයේ සිට ණයගැතියන් 07 කට අදාළව අයවිය යුතු ශේෂ විය. (2020) | ලැබිය යුතු මුදල් ප්‍රමාදයකින් තොරව අයකර ගැනීමට සුදුසු හා ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ඇතිකර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | ණයගැතියන් දැනුවත් කර අයකර ගැනීමට කටයුතු කර ඇත. | රුපියල් මිලියන 8.1 ක් මේ වන විට අයකර ගැනීමට කටයුතු කර ඇත. |
| **(ඇ)** | වටිනාකම රු.1,850,000 ක් වූ ඩබල් කැබ් රථයක් වර්ෂ 2 ½ ක කාලයක සිට එන්ජිම හා අභ්‍යන්තර පද්ධතිවල දෝෂ හේතුවෙන් ධාවනය නොකර පැවතුණි. (2020) | වාහන අලුත්වැඩියා කිරීමට හෝ භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ මත අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. | වාහන අලුත්වැඩියාව සිදු කිරීමට හෝ අපහරණය කිරීමට ප්‍රධාන ලේකම්ගෙන් උපදෙස් ඉල්ලා ඇත. | මේ වන විටත් ධාවනයේ නොපවතී. |
| **(ඈ)** | නිසි ශක්‍යතා අධ්‍යනයක් හා සැලසුම්කරණයක් නොමැතිව රු.12,618,363 ක වියදමක් දරා නිම කරන ලද මදුරන්කුලිය සංචාරක තොරතුරු හා පහසුකම් මධ්‍යස්ථානය වසර දෙකකට නොවැඩි කාලයක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. (2019) | සංචාරක පහසුකම් මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු හැකි ඉක්මණින් ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. | ගිවිසුම්ගතව සේවය සැපයීමට ලබාගත් ආයෝජකයා හට කරගෙන යාමට නොහැකිනම් වෙනත් පාර්ශවයකට ඉදිරිපත් කිරීමට යෝජිතව පවතී. | මදුරන්කුලිය සංචාරක තොරතුරු හා පහසුකම් මධ්‍යස්ථානය මේ වන විටත් නිෂ්කාර්යව පවතී. |

**09. වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය**

| | | | | |
|---|---|---|---|---|
| **(අ)** | නිශ්චිත ගාස්තු මත අය කළ බදු මුදල් අයකළ මසට පසුව එළඹෙන මාසයේ 15 දින හෝ එයට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු බදු මුදල් නියමිත | හිඟ මුදල කොටස් වශයෙන් ගෙවීමට කටයුතු කර ඇත. | හිඟ මුදලින් රු.450,000 ගෙවා ඇති අතර 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය |

| | | | | |
|---|---|---|---|---|
| | වුවත්, 2020 හා ඉකුත් වර්ෂවලට අදාළව රු.11,592,070 ක බදු මුදල් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. (2020) | දිනට පෙර ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතුය. | | යුතු ශේෂය රු.7,412,278 ක් විය. |
| **(ආ)** | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත සහ 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනත අනුව සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් නියමිත දිනට ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් ඉකුත් වර්ෂයේදී රු.9,954,740 ක අධිභාර මුදලක් ගෙවීමට සිදුවී තිබුණු බවත්, එයින් තවදුරටත් අධිභාරය ලෙස රු.3,033,485 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයේදීද, ගෙවිය යුතුව තිබුණි. (2020) | සේවක අර්ථසාධක අරමුදල් පනතට හා සේවක භාරකාර අරමුදල් පනතට අනුව නියමිත දිනට අදාළ වැටුප මත වාරික ගණනය කර අරමුදලට යැවීමට කටයුතු කළ යුතුය. | මේ වන විට නිවැරදිව සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් ගෙවනු ලැබේ. | ලද නඩු තීන්දුවට අනුව සෑම මසකම රු.75,000 බැගින් හිඟ අධිභාර මුදල ගෙවීම් සිදුකරමින් පවතී. |
| **(ඇ)** | කුලී ගාස්තු, වාහන අලුත්වැඩියා ගාස්තු, සේවා මධ්‍යස්ථාන ගාස්තු හා සිවිල් වැඩ ගාස්තු ලෙස ලැබිය යුතු ශේෂයන්ගේ සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.64,703,661 ක් වූ අතර, 2021 ජූනි 14 දින වන විට තවදුරටත් අය විය යුතු රු.26,246,546 ක් විය. එම ශේෂය තුළ වසර 05 කට වඩා වැඩි කාලයක සිට අයනොවී පවතින රු.8,370,119 ක ණය ශේෂයන්ද විය. (2020) | අධිකාරියේ පවතින මූල්‍ය දුෂ්කරතා අවම කරගැනීම සඳහා ඉකුත් වර්ෂවල සිට අය නොවී පවතින හිඟ ණය අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. | • සිහිකැඳවීම් ලිපි යැවීම හා ණය එකතු කිරීම සඳහා නිලධාරීන් පත්කර ඇත.<br>• පළාත් සභාවට අයත් ආයතන වලින් ලැබිය යුතු ආයතන දැනුවත් කිරීම් වැනි ක්‍රියාමාර්ග ගෙන ඇත . | 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ශේෂය එකතුව රු.20,128,321 ක් වන අතර වසර 05 ට වඩා පැරණි ශේෂය රු.9,349,168 ක් විය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ආයතනය භාරයේ ඇති රු.8,625,000 ක් වටිනා වාහන හා යන්ත්‍රෝපකරණ අයිතම 17 ක් වර්ෂ ගණනාවක සිට අක්‍රීය තත්ත්වයේ පවතින අතර, අලුත්වැඩියා කළහැකි තත්ත්වයේ පවතින වාහන හා යන්ත්‍ර ස්වභාවික උපද්‍රවවලට භාජනය වෙමින් පැවතුණි. මෙම තත්ත්වය ඉකුත් වර්ෂවල විගණන වාර්තාවලින්ද පෙන්වා දී ඇතත්, ඒ සඳහා අධිකාරියේ විශේෂ අවධානය යොමුකර නොතිබුණි. (2020) | අලුත්වැඩියා කළ යුතු වාහන හා යන්ත්‍රෝපකරණ ඉතා ඉක්මණින් අලුත්වැඩියා කිරීමටද ඵලදායී නොවන වාහන හා යන්ත්‍රෝපකරණ අපහරණය කිරීමටද කටයුතු කළ යුතුය. | • වාහන හා යන්ත්‍රෝපකරණ ආරක්ෂිතව ගාල් කිරීම සඳහා අංගනයක් ඉදිකරමින් පවතී .<br>• අලුත්වැඩියා කළ හැකි වාහන හා යන්ත්‍රෝපකරණ හඳුනා ගැනීම සිදුකරමින් පවතී. | එක් වාහනයක් අලුත්වැඩියා කර ඇති අතර වාහන 03 ක් අලුත්වැඩියා කළ හැකි තත්ත්වයේ පවතී. යන්ත්‍රෝපකරණ 02 ක් හා වාහන 11 ක් අලුත්වැඩියා කිරීම ආර්ථික වශයෙන් ඵලදායී නොවන බව හඳුනාගෙන ඇත. |

**10. ශීර්ෂය 212 - වයඹ ඉංජිනේරු දෙපාර්තමේන්තුව**

---------------------------------------------------------

| | | | |
|---|---|---|---|
| වයඹ පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂයේ සිට 2020 අගෝස්තු 31 දින දක්වා ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති 116 ක පවතින අඩුපාඩු හේතුවෙන් රු.47,244,442 ක රඳවුම් මුදල් නිදහස් කර නොතිබුණු අතර එම අඩුපාඩු කොන්ත්‍රාත්කරු මඟින් ඉටු කරවා ගැනීමට හෝ රඳවුම් මුදලින් යළි සකස්කර ගැනීමට හෝ වගකීම් පැහැර හැරීම මත ඔවුන් අසාධු ලේඛනගත කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. (2020) | ගිවිසුම්වල නීති රීති හා කොන්දේසිවලට අනුකූලව කටයුතු කළ යුතුය. | • ව්‍යාපෘතිය නිමවනතෙක් රඳවුම් මුදල් නිදහස් නොකිරීමට කටයුතු කර ඇත.<br>• වගකීම් පැහැර හරින ලද කොන්ත්‍රාත්කරුවන් අසාදු ලේඛනගත කිරීමට අදාළ තොරතුරු නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) වෙත යැවීමට කටයුතු කර ඇත. | ව්‍යාපෘති 116 න් 110 ක් නිම කර ඇති අතර ඉතිරි ව්‍යාපෘති 06 හි වටිනාකම රු.4,548,381 ක් වූ රඳවුම් මුදල තවදුරටත් රඳවා තබාගෙන ඇත. |

**11. ශීර්ෂය 213 - අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | ඉබ්බාගමුව කලාප අධ්‍යාපන කාර්යාලයේ ලැබෙන චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනයක සටහන් තබා සහතික කර නොතිබුණු අතර 2010 ජූලි සිට 2010 නොවැම්බර් දක්වා අවස්ථා 30 කදී එකතුව රු.5,075,309 ක මුදල් සම්බන්ධයෙන් වූ කුවිතාන්සිවල මුල් පිටපත ගෙවීම් කරන්නාට ලබාදීමට කටයුතු කර නොතිබුණි. තවද 2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වසර 04 ක කාලය තුළ ලැබී තිබුණු රු.2,411,457 ක මුදලක් සරප් විසින් බැංකුගත කර නොතිබුණු අතර අක්‍රීය කරන ලද ගිණුම් දෙකට අදාළව බැංකු සැසඳුම් සකස් කිරීමට සහ සරප් විසින් එක්රැස් කරගන්නා ලද මුදල් බැංකුගත කිරීම පිළිබඳ සොයා බලා වාර්තා කිරීම සඳහා අවස්ථා කිහිපයකදී කමිටු කිහිපයක් පත්කර ඇතත්, එම සියලුම කමිටු විසින් එම කාර්ය ඉටුකිරීමට කටයුතු කර නොතිබුණු අතර වගකිව යුතු බලධාරීන් ද, ඒ පිළිබඳව විධිමත් අවධානයක් යොමු කර නොතිබුණි. තවද 2007 වර්ෂයේ සිට 2012 වර්ෂයේ මැයි මාසය දක්වා බැංකු සැසඳුම් සකස් නොකිරීම හේතුවෙන් අක්‍රීය කරන ලද මහජන බැංකුවේ පවත්වාගෙන ගිය පොදු හා ගුරු වැටුප් බැංකු ගිණුම් දෙක වෙනුවට 2012 ජූනි මාසයේදී ලංකා බැංකුවේ | විධිමත් පරීක්ෂණයක් සිදු කොට බැංකු සැසඳුම් විධිමත් ලෙස පිළියෙල කිරීම හා මුදල් බැංකු ගත නොකිරීම සම්බන්ධ වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන කටයුතු කළ යුතුය. | ප.මු.රී. 57-61 වගන්ති අනුව කටයුතු කරමින් සෘජුව වගකිව යුතු නිලධාරීන්ගෙන් අදාළ මුදල් අයකර ගැනීමට විශේෂ පරීක්ෂණයක් සිදුකර ඇත. | වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන පාඩුව මෙතෙක් අයකරගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | නව ගිණුම් දෙකක් ආරම්භකර තිබුණි. (2019) | | | |
| **(ආ)** | හලාවත කලාප අධ්‍යාපන කාර්යාලය සතුව පවතින නිල නිවාස 26 කින් නිල නිවාස 03 ක පමණක් ගුරුවරුන් පදිංචි වී තිබුණි. නිල නිවාස 07 ක් භාවිත කළ නොහැකි තත්ත්වයේ පවතින අතර, නිල නිවාස 16 ක් අලුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පැවතියද, එම නිල නිවාස අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. (2019) | නිල නිවාස අලුත්වැඩියා කර ගුරුවරුන්ගේ හෝ රජයේ නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා යෙදවීමට කටයුතු කළ යුතු යුතුය. | අලුත්වැඩියාව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණි. | ගුරු නිවාස අලුත්වැඩියාව ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළද, ප්‍රතිපාදන නොමැතිවීම නිසා එම කාර්යය ඉටුවී නොමැත. |
| **(ඇ)** | 2007 වර්ෂයේ සිට 2010 වර්ෂය අතර කාලසීමාව තුළදී ගිරිඋල්ල අධ්‍යාපන කාර්යාලයේ සිදුවී තිබුණු මූල්‍ය අක්‍රමිකතාවයකට අදාළ අයකර ගත යුතු රු.13,609,655 ක් එම අක්‍රමිකතාවය සිදුවී වසර 13 ක පමණ කාලයක් ගතවී ඇතත්, අයකර ගැනීමට ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් එම වටිනාකම ජංගම වත්කම් යටතේ මුදල් හා මුදලට සමාන දැවල පළාත් භාණ්ඩාගාර තැන්පතු (භානි) වශයෙන් ද්‍රවශීලතාවයෙන් යුතු වත්කමක් ලෙස ගිණුම් ගතකර තිබුණි. (2019) | මූල්‍ය අක්‍රමිකතාවයට සම්බන්ධ පාර්ශවයන්ගෙන් රු.13,609,655 ක වටිනාකම අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම මූල්‍ය වංචාව සම්බන්ධයෙන් මේ වන විට ප්‍රධාන ලේකම් කාර්යාලය මඟින් පරීක්ෂණ කටයුතු සිදුකරමින් පවතී. | අලාභය මේ වන තෙක් අයකරගෙන නොමැත. |

**12. ශීර්ෂය 222 - ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | වයඹ පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් 2018 දෙසැම්බර් 31 දිනට ආදායම් සංකේත 02 ක් සඳහා අයකර ගත යුතු එකතුව රු.78,415,133 ක් වූ හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. (2018) | හිඟ බදු මුදල් අයකර ගැනීම සම්බන්ධව අභ්‍යන්තර පාලනයක් ස්ථාපිත කළ යුතුය. | හිඟ බදු මුදල් අය කර ගැනීමටද අය නොවන මුදල් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ද යොමු වී ඇත. | මෙම හිඟයට අදාළව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 24 කට අදාළ තොරතුරු යාවත්කාලීන කර තොරතුරු ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතින අතර 2021 වර්ෂයට අදාළ හිඟ මුදල රු.112,032,090 කි. ඒ අනුව 2018 - 2021 දක්වා හිඟ බදු අයවීම රු.45,787,789 කි. හිඟ මුදල් වලට අදාළ කපා හැරීම් රු.30,641,423 කි. |
| (ආ) | වයඹ පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ රජය සතු ඉඩම් විවිධ සංවර්ධන කටයුතු සඳහා යෝජනා කර තිබුණද, එම යෝජනා ක්‍රියාත්මක නොවීම මත අක්කර 85, රූඩ් 01, පර්චස් 73 යුත් ඉඩම් පරිහරණය කිරීමකින් තොරව පැවතුණි. (2020) | රජය සතු ඉඩම් විවිධ සංවර්ධන කටයුතු සඳහා අප්‍රමාදව යෙදවීමට කටයුතු කළ යුතුය. | අධිකරණ කටයුතු නිම වූ පසු අනවසරකරුවන් ඉවත් කිරීමට හා ව්‍යාපෘති ක්‍රියාත්මක නොවන ඉඩම් වෙනත් කටයුතු සඳහා පවරා දීමට කටයුතු කරනු ලැබේ. | අධිකරණ කටයුතු සඳහා යොමුකර එන්තරවාසි ලබාගෙන අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට හා |

| | | | | |
|---|---|---|---|---|
| | | | | වෙනත් සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩම් බදු දීමට කටයුතු කරමින් පවතී. |

**13. ශීර්ෂය 230 - වයඹ පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු හා සභා කටයුතු පිළිබඳ පළාත් අමාත්‍යාංශය**

---

| | | | | |
|---|---|---|---|---|
| | පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යටතේ මීගහකොටුව ළමා නිවාසයේ රු.3,844,321 ක් වූ සනීපාරක්ෂක පද්ධතිය වැඩිදියුණු කිරීම හා ජලනල අලුත්වැඩියාව වෙනුවෙන් 2019 දෙසැම්බර් 30 දින පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු සමඟ අත්සන් කරන ලද ගිවිසුම අවලංගු කර ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණි. (2020) | කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීමේදි පශ්චාත් සුදුසුකම් පිළිබඳ තාක්ෂණික හා ඇගයීම් කමිටුවේදී අවධානය යොමු කළ යුතුය. | ගිවිසුම අනුව පළමු දිගුව ලබා දී තිබුණද එම කාල සීමාව ඉක්මයන විටත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණු අතර වරින් වර දැනුවත් කිරීම් සිදුකළ ද ආරම්භ නොකළ බැවින් ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්තුව අවලංගු කර ඇත. | ගිවිසුම අනුව කොන්ත්‍රාත්කරු කටයුතු නොකිරීම මත අසාධු ලේඛනගත කර කාර්යසාධන සුරක්ෂණය මුදල්කරගෙන නොමැත. |

**14. ශීර්ෂය 231 - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව**

---

| | | | | |
|---|---|---|---|---|
| (අ) | කුරුණෑගල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් සෞඛ්‍ය වෛද්‍ය ආයතන වල වාහන 16 කට සිදු වූ අනතුරුවලට අදාළ මූලික විමර්ශන පවත්වා වගකිවයුත්තන්ගෙන් එම පාඩු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. (2018) | පළාත් මූල්‍ය රීති 54,55 හා 57 ප්‍රකාරව කටයුතු කර යුතුය. | • වාහන අනතුරු සම්බන්ධව මූලික විමර්ශන කටයුතු පවත්වා එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලැබේ.<br>• වාහන අනතුරු වලින් පැන නගින අලාභය අදාළ පාර්ශවයන්ගෙන් | • මූලික පරීක්ෂණ පවත්වා වාර්තා විගණකාධිපති වෙත එවා ඇත.<br>• එක් වාහනයක |

| | | | | |
|---|---|---|---|---|
| | | | අයකරගැනීමට කටයුතු කරනු ලැබේ . | අනතුර සම්බන්ධයෙන් රු.627,146 ක මුදලක් රියදුරුගෙන් අයකරමින් පවතින අතර මේ වන විට රු.186,304 ක මුදලක් අයකර ඇත.<br>• තවත් වාහනයක අලුත්වැඩියාව රියදුරු විසින් සිදුකර ඇත.<br>• ඉතිරි වාහන 14 ක හානි වටිනාකම රක්ෂණ සමාගමින් ප්‍රතිපූර්ණය කර ඇත. |
| **(ආ)** | සමාලෝචිත වර්ෂය අවසන් වන විට දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් මූලික රෝහල්, ප්‍රාදේශීය රෝහල්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල හා ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකවලට අයත් නිල නිවාස 38 ක් නිෂ්ක්‍රීයව තිබුණි. (2018) | නිල නිවාස සම්බන්ධ කමිටු පවත්වා කළමණාකරණය කර ගැනීමට කටයුතු කළ යුතුය. | එක් තනතුරක් සඳහා වෙන්කර ඇති නිල නිවාස අවශ්‍යතාවය අනුව වෙනත් නිලධාරීන්ට ලබාදීමට හා භාවිතයට ගත නොහැකි නිල නිවාස කඩා ඉවත් කර එම භාණ්ඩ හමුදාව වෙත භාරදීමට කටයුතු කර ඇත. | නිල නිවාස 30 ක් භාවිතයට ගෙන ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | මුන්දලම දිසා රෝහලේ ඖෂධ ගබඩාවේ රු.810,169 ක් වටිනා ඖෂධවල ඌනතාවයක් හා රු.19,943 ක් වටිනා ඖෂධවල අතිරික්තයක් පවතින බව 2018 ජුලි 02 දිනැති සමීක්ෂණ මණ්ඩල වාර්තාවෙන් අනාවරණය කර තිබුණි. (2018) | පළාත් මූල්‍ය රීති 52, 54 හා 55 අනුව කටයුතු කර ඌනතාවය අයකරගත යුතු අතර පළාත් මූල්‍ය රීති 477.2 අනුව කටයුතු කළ යුතුය. | • ඖෂධ ගබඩා කටයුතු සඳහා ඖෂධවේදීන් පත්කර ඇත.<br>• දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරීන් විසින් අධීක්ෂණය කරනු ලැබේ.<br>• අතිරික්තයන් හා ඌනතාවයන් වළක්වා ගැනීමට කටයුතු කරනු ලැබේ. | මේ වන විට රෝහලෙහි ඖෂධ කළමනාකරණය සම්බන්ධයෙන් ප්‍රාදේශීය වෛද්‍ය සැපයීම් අංශයේ නිරන්තර අධීක්ෂණය සිදු වේ. |
| (ඈ) | සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් රෝහල් 11 කට අයත් තනතුරු 17 ක සේවා කාලය වර්ෂ 05 ඉක්මවූ නිලධාරීන් 689 ක් ස්ථාන මාරුවීම් නොලබා එකම රෝහලේ සේවය කරමින් තිබුණි. (2019) | වාර්ෂික මාරු මණ්ඩලයක් ස්ථාපිත කර චක්‍රලේඛ ප්‍රකාරව ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ යුතුය. | ස්ථාන මාරු ප්‍රතිපත්තියක් සකස් කර ඇත. | මෙම වසර 05 කට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන් ස්ථානමාරු කිරීම්වලට යටත් නොවූ අවස්ථා තව දුරටත් පැවතුණි. |
| (ඉ) | පුත්තලම දිස්ත්‍රික්කයේ වකුගඩු රෝග නිවාරණ කටයුතු කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා, දිස්ත්‍රික් වකුගඩු රෝග නිවාරණ ඒකකය සඳහා ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් නොමැතිවීම හා වකුගඩු රෝගී විශේෂඥ වෛද්‍යවරයෙකු (වෘක්කවේදී) පුත්තලම දිස්ත්‍රික්කය සඳහා අනුයුක්ත කර නොමැතිවීම බාධාවක්ව පැවතුණි. (2019) | වකුගඩු රෝගී විශේෂඥ (වෘක්කවේදී) වෛද්‍යවරයෙක්ද ලබාදීමට අභ්‍යන්තර ක්‍රමවේදයක් සකස් කළ යුතුය. | රේඛීය අමාත්‍යාංශය වෙතින් ඉල්ලීම් කර ඇත. | වකුගඩු රෝගීන් පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකු අනුයුක්ත කිරීමට කටයුතු කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී අවදානම් කලාප 11 ක් තුළ පිහිටි පාසල් 347 කින් 2018 හා 2019 වර්ෂවල ජල පරීක්ෂා කර තිබුණේ පාසල් 187 ක පමණක් වූ අතර ඉන් පාසල් 169 කම ජලය බීමට නුසුදුසු බව හඳුනාගෙන තිබුණි. එසේම පොල්පිතිගම, ගිරිබාව හා මහව යන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවලට අයත් පාසල්වල ජල සාම්පල් පරීක්ෂා කිරීම ඉතා අවම මට්ටමක පැවතුණි. (2019) | රෝගීන් පිළිබඳ සැලකිල්ල වැඩි දියුණු කිරීමට කටයුතු කළ යුතු අතර අවදානම් ප්‍රදේශ වලට දැඩි අවධානමක් යොමු කරමින් ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කර සෞඛ්‍ය පිළිබඳ යටිතල පහසුකම් හා උපකාරක සේවා සවිමත් කිරීමට කටයුතු කළ යුතුය. | මහජන සෞඛ්‍ය නිලධාරීන් විසින් වාර්ෂිකව ජලය පරීක්ෂා කිරීම හා ජල සාම්පල නිවැරදි ආකාරයෙන් යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. | මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් විසින් ජල සාම්පල් පරීක්ෂා කිරීම පිළිබඳව නිරීක්ෂණය කිරීමට අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇත. |
| (උ) | 2018 වර්ෂය තුළදී රු.3,408,168 ක වියදම් දරා මිලදීගෙන තිබුණු ආස්‍රැත ජලය නිපදවීමේ යන්ත්‍ර (Distil Water Operatormachine) යන්ත්‍ර 07 න් දඹදෙණිය, නිකවැරටිය හා ගල්ගමුව රෝහල් වෙත ලබාදුන් යන්ත්‍ර 03 ක් වසර 1 ½ ක් තුළ අක්‍රීය තත්වයට පත්වී තිබුණි. (2019) | මිලදී ගැනීමට පෙර මනා ශක්‍යතා අධ්‍යනයක් සිදුකර යුතු අතරම තාක්ෂණික ඇගයීම් කමිටුවේදී පිරිවිතරයන් පිළිබඳ සැලකිලිමත් විය යුතුය. | ආස්‍රැත ජලය නිපදවීමට වඩා මිළදී ගැනීම ලාභදායක බැවින් ටෙන්ඩර් මඟින් මිළදී ගැනීම සිදු කරයි. | මෙම යන්ත්‍ර භාවිතයෙන් ඉවත් කර ඇත. |
| (ඌ) | ගල්ගමුව මූලික රෝහලේ ජල අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා 2017 වර්ෂයේදී රු.15,081,000 ක් වැයකර ඉදිකළ මහ ගල්ගමුව ජල ව්‍යාපෘතියේ ජලයද රු.2,253,856 ක් වැයකර ඉදිකළ නළ ළිදේ ජලය ද බීමට නුසුදුසු බව නිරීක්ෂණය වී තිබුණි. එබැවින් 2017 වර්ෂයේ සිට 2020 ජූනි දක්වා රු.2,282,026 ක් වැයකර බවුසරයක් මඟින් හා 2020 | ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. | ජල සම්පාදන මණ්ඩලය මඟින් ජලය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | මේ වන විට නළ ළිඳෙන් ලබා ගන්නා ජලය බීමට සුදුසු නොමැති බැවින් නිල නිවාස වල ප්‍රයෝජනය සඳහා භාවිතා කරයි. |

| | | | | |
|---|---|---|---|---|
| | ජනවාරි සිට දෙසැම්බර් දක්වා රු.493,308 ක් වැයකර ජල සම්පාදන මණ්ඩලය මහින්ද ජලය ලබාගැනීම සඳහා කටයුතු කර තිබුණි. (2020) | | | |
| (එ) | වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව 2014 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුළ කුරුණෑගල දිස්ත්‍රික්කයේ රු.27,850,294 ක්ද, පුත්තලම දිස්ත්‍රික්කයේ රු.15,503,661 ක්ද වශයෙන් එකතුව රු.43,353,955 ක කල් ඉකුත් වූ ඖෂධ පැවති අතර 2014 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයේ රු.8,569,847 ක්ද, පුත්තලම දිස්ත්‍රික්කයේ රු.3,138,655 ක්ද වශයෙන් එකතුව රු.11,708,502 ක ඖෂධ ගුණාත්මක තත්ත්වයෙන් අසමත් වී තිබුණි. (2020) | ක්‍රියාකාරි සැලැස්මකට අනුව කටයුතු කරමින් කල් ඉකුත්වන සහ ගුණාත්මක බවින් අඩු ඖෂධ ප්‍රථමව හඳුනාගෙන ක්‍රියාමාර්ග ගත යුතුය. | • නිවැරදිව හා තාත්වික ලෙස ඉදිරි වසර සඳහා අවශ්‍ය ඖෂධ සම්බන්ධව පුරෝකථනය සිදුකරනු ලැබේ.<br>• සියලුම රෝහල් සඳහා දත්ත පද්ධතියක් ස්ථාපනය කර අතිරික්ත / කල් ඉකුත් වීමට ආසන්න ඖෂධ හඳුනාගෙන බෙදා හැරීමට කටයුතු කරනු ලැබේ.<br>• කාර්තු වාර්තා ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | • මේ වන විට කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම හැර අනෙකුත් සියලුම මූලික රෝහල් වල හා සඳලංකාව, ගොකරැල්ල යන ප්‍රාදේශීය රෝහල්වල දත්ත පද්ධතියක් ක්‍රියාත්මක කර ඇති අතර අනෙකුත් රෝහල්වලට එම පද්ධතිය ස්ථාපනය කරදෙන ලෙස ඉල්ලීම් කර ඇත.<br>• 2015 |

| | | | | |
|---|---|---|---|---|
| | | | | වර්ෂයේ සිට ගුණාත්මක තත්ත්වයෙන් අසමත් ඖෂධ සම්බන්ධයෙන් වෛද්‍ය සැපයුම් ඒකකය දැනුවත් කිරීම් සිදුකර ඇත.<br>• දැනට කල් ඉකුත් වූ ඖෂධ අපහරණය කිරීමට කටයුතු කර ඇත. |
| **(ඒ)** | වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව රු.9,898,271 ක් වැයකර ඉදිකරන ලද සියඹලන්ගමුව මධ්‍යම බෙහෙත් ශාලා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2016 ජූනි 31 දින වන විට නිම කර තිබුණද වසර 04, අධික කාලයක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන අත්හැර දමා තිබුණි. (2020) | ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කර යුතුය. | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය ස්ථාපිත කිරීමට අවශ්‍ය කාර්යමණ්ඩලය අනුමත කිරීමට හා අනුයුක්ත කිරීමට ඉල්ලීම් කර ඇත. | 2022 පෙබරවාරි 28 දින වන විටත් ගොඩනැඟිලි භාවිතා කරනු නොලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඹ) | වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව රු.8,691,185 ක් වැයකර නිම කරන ලද සියඹලන්ගමුව මධ්‍යම බෙහෙත් ශාලාවට අයත් නිල නිවසේ ඉදිකිරීමේ කටයුතු 2017 මැයි මස 30 දින වන විට නිම කර තිබුණද 2020 දෙසැම්බර් 31 වන විට වසර 03 කට අධික කාලයක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. (2020) | ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කර යුතුය. | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය ස්ථාපිත කිරීමට අවශ්‍ය කාර්යමණ්ඩලය අනුමත කිරීමට හා අනුයුක්ත කිරීමට ඉල්ලීම් කර ඇත. | 2022 පෙබරවාරි 28 දින වන විටත් ගොඩනැඟිලි භාවිතා කරනු නොලැබේ. |

**15. ශීර්ෂය 241 - පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | ගිවිසුම්ගත වටිනාකම රු.27,831,877 ක් වූ පරමාකන්ද - විහාර පිවිසුම් මාර්ගයේ සංවර්ධන කටයුතු අවස්ථා දෙකකදී දින දීර්ඝ කිරීම් අනුව වැඩ අවසන් විය යුතු දිනය 2020 ජනවාරි 31 වුවද, විගණනය සිදුකළ 2020 සැප්තැම්බර් 21 දින වන විටත් මෙම මාර්ගයේ වැඩ කටයුතු අවසන්ව නොතිබුණි. අදාළ ප්‍රමාද කාලයට ගිවිසුම් ප්‍රකාරව දිනකට රු.13,916 ක් බැගින් විගණන දින වන විට දින 234 ක් සඳහා ප්‍රමාද ගාස්තු ලෙස රු.3,256,344 ක් අයකිරීමට කටයුතු කර නොතිබුණි. (2020) | ගිවිසුම් ප්‍රකාරව නියමිත ප්‍රමිතියට හා නියමිත දිනයට නිම නොකළ ව්‍යාපෘති සම්බන්ධව ප්‍රමාද ගාස්තු ගිවිසුම් ප්‍රකාරව අයකළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි. | ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. |
| (ආ) | කුඩා ඔය - බුළුගහමුල හන්දිය මාර්ගයේ විගණනය සිදුකළ 2020 සැප්තැම්බර් 16 දින වන විටත් වැඩ අවසන්ව නොතිබූ අතර 2020 පෙබරවාරි 15දින සිට ගිවිසුම් කාලය | ගිවිසුම් ප්‍රකාරව නියමිත ප්‍රමිතියට හා නියමිත දිනයට නිම නොකළ ව්‍යාපෘති සම්බන්ධව ප්‍රමාද | වැළැක්වීමේ ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි. | ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | අවසන් වන බැවින් ගිවිසුම් ප්‍රකාරව අයකළ යුතු රු.4,677,693 ක ප්‍රමාද ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි. (2020) | ගාස්තු ගිවිසුම් ප්‍රකාරව අයකළ යුතුය. | | |
| **(ඇ)** | 2019 වර්ෂයේ පළමු භාගය සඳහා වයඹ පළාත් මිල නියම කිරීමේ කමිටුව විසින් නිව්ටන් 40 (40N) කොන්ක්‍රීට් කැට ගලක මිල ප්‍රවාහනයද සමඟ රු.52 ක් ලෙස මිල තීරණය කර තිබුණද, ප්‍රවාහන වියදම් රහිතව කැටයක මිල රු.52 ක් ලෙස සලකාද, වර්ග මීටරයක අවශ්‍ය සත්‍ය කැටගල් ප්‍රමාණය40 ක් වුවද, 43 ක් ලෙස සලකාද කොන්ක්‍රීට් කැටගල් යොදා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩ විෂයය සඳහා (RS1-017) මාර්ග සම්මත අනුපාතය සකස් කර තිබුණි. මෙම දෝෂ සහගත තත්ත්වයන් මත මාර්ග සම්මත අනුපාතයන් සකස් කිරීම හේතුවෙන් ගම්පෙරළිය වැඩසටහන යටතේ කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ප්‍රජා පාදක සංවිධාන මඟින් ඉටුකරන ලද ව්‍යාපෘති 100 කින් රු.5,508,631 ක පාඩුවක් රජයට සිදුවී තිබුණි. (2020) | • රජයට සිදුවී ඇති රු.5,508,631 ක පාඩුව සම්බන්ධයෙන් ප.මූ.රී. 106 ට අනුව කටයුතු කළ යුතුය.<br>• මාර්ග සම්මත අනුපාතයන් නිසි වෘත්තීය සැලකිල්ලකින් යුතුව සකස් කිරීමට කටයුතු කළ යුතුය. | කිසිදු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | දෝෂ සහගත මාර්ග සම්මත අනුපාතයන් නිසා රජයට සිදුවූ පාඩුව අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ 2019 වර්ෂයේ කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදුන් ප්‍රතිපාදනයන් මත ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 611.13 ක් වන මාර්ග සංවර්ධන ව්‍යාපෘති 09 ක් වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සෘජු කම්කරු ශ්‍රම පදනම මත ඉටුකර තිබුණ අතර එම මාර්ග ව්‍යාපෘති සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා යන්ත්‍ර සපයා ගැනීම් පිළිබඳව කරනු ලැබූ විගණන පරීක්ෂණවලදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය විනිවිදභාවයකින් සිදුකර නොතිබීම, තරඟකාරීත්වය සීමාකර තිබීම, මිලදීගැනීම් සඳහා විධිමත් අධිකාරී බලතල ලැබී නොතිබීම ඇතුළු රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලින් හා වයඹ පළාත් මුදල් රීති 419 න් බැහැරව සිදුකර තිබුණි. එසේම මෙම ව්‍යාපෘතීන් සඳහා ප්‍රධානම අමුද්‍රව්‍ය 04 මිලදීගැනීම සම්බන්ධයෙන් කරනු ලැබූ විගණන පරීක්ෂණවලදී සාමාන්‍ය වෙළඳපල මිලගණන්වලට වඩා ඉතාමත් ඉහළ මිල ගණන්වලට මිලදීගැනීම සිදුකර තිබීම හේතුවෙන් රජයට රුපියල් මිලියන 153.75 කට ආසන්න පාඩුවක් සිදු වී තිබුණි. එසේම තරඟකාරී ප්‍රසම්පාදනයන්ගෙන් බැහැරව සෘජු කම්කරු පදනම මත මෙම ව්‍යාපෘති ඉටුකරගැනීම සඳහා විධිමත් අනුමැතියක් ලැබී නොතිබුණු | • ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුය.<br>• රජයට සිදුවී ඇති රු.මිලියන 153.75 කට ආසන්න පාඩුව සම්බන්ධයෙන් ප.මු.රී. 106 ට අනුව කටයුතු කළ යුතුය. | විගණනයෙන් පෙන්වාදී ඇති කරුණු සම්බන්ධයෙන් පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා වයඹ පළාත් ප්‍රධාන ලේකම් විසින් කමිටුවක් පත්කර ඇත. | පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | අතර සෘජු කම්කරු පදනම මත මෙම ව්‍යාපෘති ඉටුකිරීම සඳහා අවශ්‍ය කම්කරුවන්, යන්ත්‍රෝපකරණ ඇතුළු පහසුකම් වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව තුළ නොතිබුණි. (2020) | | | |

**16. ශීර්ෂය 243 - කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව**

---

| | | | | |
|---|---|---|---|---|
| **(අ)** | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගිවිසුම්ගත වටිනාකම රු.9,727,058 ක් වූ වලකුඹුර මැටි හා විසිතුරු භාණ්ඩ නිෂ්පාදන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් 2019 සැප්තැම්බර් 30 දින ආරම්භවී 2019 දෙසැම්බර් 28 දින අවසන් කිරීමට නියමිතව තිබුණු නමුත් 2020 දෙසැම්බර් 31 වන විටත් නිමකර නොතිබුණු අතර සැකසූ දොර කවුලු කඩා නැවත සැකසීමට සිදුවී තිබුණි. ඒ අනුව භූමියේ පිහිටීම, ගොඩනැගිල්ල ඉදිකිරීමේ අරමුණ පිළිබඳ නිසි අවධානයකින් සැලසුම් සකස් නොකිරීම නිසා අමතර කාලයක් හා පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි. (2020) | අදාළ ව්‍යාපෘති නියමිත දිනට නිම කර මහජන ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කළ යුතුය. | 2021 වර්ෂයේ ව්‍යාපෘතිය වැඩ නිම කිරීමට කොන්ත්‍රාත්කරු තෝරාගෙන ඇතත්, ගිවිසුම් අත්සන් කිරීමට කොන්ත්‍රාත්කරු ඉදිරිපත්වී නොමැත. | ව්‍යාපෘතිය වැඩ නිම නොකිරීම නිසා අපේක්ෂිත මහජන ප්‍රතිලාභ ලබාදීමට නොහැකිවී ඇත. |
| **(ආ)** | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව සතු කාර්මික මධ්‍යස්ථාන 03 ක් අඩු ක්‍රියාකාරීත්වයෙන් පවත්වාගෙන යාමට වසර ගණනාවක සිට පැවත එන කාර්ය මණ්ඩල පුරප්පාඩු බලපා තිබුණු අතර 2020 ජූනි 30 දිනට | දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත අරමුණු හා පරමාර්ථ ළඟාකර ගැනීමට අවශ්‍ය අනුමත කාර්යය මණ්ඩලය පවත්වාගෙන යාමට | වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට තනතුරු සඳහා බඳවා ගැනීමට ඉල්ලීම් කර ඇත. | කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | පැවති පුරප්පාඩු සංඛ්‍යාව 80 කි. (2020) | කටයුතු කළ යුතුය. | | |
| **(ඇ)** | වයඹ පළාත් සභාවේ පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ 381.1 ප්‍රකාරවමුදල් වර්ෂය අවසන්වීමට පෙර පවත්නා ප්‍රතිපාදන හෝ පරිපූරක ප්‍රතිපාදනයන් සලසා නොගෙන රු.93,188,977 ක් වූ බලය නොලත් කාරක පාඩු දිගින් දිගටම ශේෂ පත්‍රයේ දක්වා තිබුණි. (2020) | පළාත් මූල්‍ය රීති 381.1 ප්‍රකාර කටයුතු කළ යුතුය. | කාරක පාඩු කපාහැරීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබාගැනීමට කටයුතු කර නොමැති බැවින් වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කාරක පාඩු අඛණ්ඩවම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පවතී. |

**17. ශීර්ෂය 250 - වයඹ පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශය**

---

| | | | | |
|---|---|---|---|---|
| **(අ)** | වයඹ පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ 2020 - 2024 සඳහා පිළියෙල කරන ලද පස් අවුරුදු සැලැස්මට අනුව 2020 වර්ෂයේ ඉටු කිරීමට සැලසුම් කර තිබුණු යටි වගාව යටතේ පොල් පැළ 1280 ක් රෝපණය කිරීම, ගොවිපලේ “ඒ” කොටසේ අක්කර 40 ක් සඳහා සහ “සී” කොටසේ අක්කර 20 ක් සඳහා ජල සම්පාදන ක්‍රමයක් ස්ථාපිත කිරීම, කෙසෙල් වගාව යටතේ සීනි කෙසෙල් පැළ 500 ක්, අළු කෙසෙල් පැළ 1,000 ක්, ඇඹුල් කෙසෙල් පැළ 150 ක් රෝපණය කිරීම හා නඩත්තුව, කහ වගාව යටතේ කහ අක්කර 01 ක් තුළ වගා කිරීම, පළතුරු අක්කර 01 ක වගා කිරීම, බඩඉරිඟු අක්කර 01 ක වගා කිරීම, බණ්ඩක්කා අක්කර 01 ක වගා | සැලසුම් කළ පරිදි අදාළ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. | 2021 වර්ෂයේදී සැලසුම් කළ කටයුතු සිදුකිරීමට නියමිත බව දන්වා ඇත. | 2020 වර්ෂයේ ඉටුකිරීමට සැලසුම් කර තිබූ කටයුතු 2021 වර්ෂයේදීද සම්පූර්ණයෙන් නිමකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | කිරීම, කරවිල අක්කර 01 ක වගා කිරීම, වැටකොළු අක්කර 01 ක වගා කිරීම, කොළ එළවලු වගාව යටතේ කතුරු මුරුංගා, කංකුන් අක්කර ½ බැගින් වගා කිරීම හා නඩත්තුව, අක්කර 40 ක් තුළ සත්ත්ව හානි වැට ස්ථාපිත කිරීම, මීමැසි ජනපද සහිත මීමැසි පෙට්ටි 05 ක් ස්ථාපිත කිරීම හා පටක රෝපණ විද්‍යාගාරය ස්ථාපිත කිරීම යන ක්‍රියාකාරකම් ඉටුකර නොතිබුණි. (2020) | | | |
| **(ආ)** | වයඹ පළාත් සභා වාර්ෂික මුදල් ප්‍රකාශය 2020 ට අනුව විෂය අංක 25003 දරන වාණිජ අත්තිකාරම් ගිණුමේ ලැබීම්වල අවම සීමාව රු.1,500,000 ක් වුවද, සමාලෝචිත වර්ෂය තුළ සත්‍ය ලැබීම් ප්‍රමාණය රු.1,380,285 ක් වූයෙන් රු.119,715 කින් අවම ලැබීම් සීමාවට ළඟාවී නොතිබුණි. (2020) | පූර්ව අනුමැතියකින් තොරව වාණිජ අත්තිකාරම් ගිණුම්වල අනුමත සීමාවන් නොඉක්මවිය යුතුය. | 2020 වර්ෂයේ කොරෝනා වසංගත තත්ත්වය නිසා මාර්තු මස මැද සිට අප්‍රේල් මස අග දක්වා විද්‍යාගාරය වසා තැබීමත් 2020 නොවැම්බර් 02 සිට මේ දක්වාද ක්‍රියාත්මක නොවීමත් හේතුවෙන් මෙම තත්ත්වය ඇතිවී ඇති බව සඳහන් කර ඇත. | සීමා ඉක්මවීම් සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| **(ඇ)** | 2020 පටක රෝපණ ව්‍යාපෘතියෙහි සමාලෝචිත වර්ෂයේ අපේක්ෂිත නිෂ්පාදනය පැළ 21000 ක් වුවත්, සත්‍ය නිෂ්පාදනය පැළ 8550 ක් විය. ඒ අනුව අපේක්ෂිත නිෂ්පාදනයන් ළඟාකර තිබුණේ සියයට 41 ක් පමණි. (2020) | වාර්ෂික අපේක්ෂිත ඉලක්ක ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. | වාර්ෂික අපේක්ෂිත ඉලක්ක ළඟාකර ගැනීමට අවශ්‍ය සැලසුම් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි. | වාරියපොල පටක රෝපණ විද්‍යාගාරය 2020 වර්ෂයේ අවසාන කාර්තුවේ වසා දමා මාවතගම ඩෙනවර්වත්ත අභිජනන ගොවිපොළ භූමිය වෙත රැගෙන ගොස් ඇත. |

| | | | |
|---|---|---|---|
| | | | ඩෙනවර්වත්ත අභිජනන ගොවිපොළෙහි පටක රෝපණ විද්‍යාගාරය සඳහා ඉදිකරනු ලබන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් නොවීම හේතුවෙන් 2021 වර්ෂයේ පටක රෝපණ විද්‍යාගාරයේ කිසිදු නිෂ්පාදනයක් සිදුකර නොමැත. |

**18. ශීර්ෂය 251 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

------------------------------------------------

| | | | |
|---|---|---|---|
| පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් වාරියපොල සහ ගල්ගමුව රජයේ ගොවිපොළවල් දෙකෙහි වටිනාකම තක්සේරු කර නොමැති වාහන 07 ක් නියමිත කාලවකවානු තුළ නඩත්තු කිරීම, අලුත්වැඩියාව හෝ අපහරණය සිදුනොකර වර්ෂ ගණනාවක සිට අභාවිතව දිරාපත්වෙමින් පැවති අතර නිල නිවාස ඇතුළු ගොවිපොළට අයත් ගොඩනැගිලි 05 ක්, යන්ත්‍ර උපකරණ නියමිත කාලවකවානු තුළ නඩත්තු කිරීම හෝ අලුත්වැඩියා නොකිරීම හේතුවෙන් නිෂ්ක්‍රීයව පැවතුණි. (2019) | නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම් ආර්ථික සංවර්ධන කටයුතුවලට ඵලදායී ලෙස යෙදවිය යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි. | නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම් ආර්ථික සංවර්ධන කටයුතුවලට ඵලදායී ලෙස යොදවා නොමැත. |

**19. ශීර්ෂය 253 - වාරිමාර්ග දෙපාර්තමේන්තුව**

| | | | |
|---|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ වයඹ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තු තිරසාර නඩත්තු අරමුදලට ස්ථාවර තැන්පතු පොලී රු.5,340,700 ක්, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන රු.1,218,915 ක් වාරි සුරක්ෂා ගාස්තු රු.13,620,700 ක යනාදී වශයෙන් රු.20,180,315 ආදායමක් ලැබී තිබුණු නමුත් සුළු වාරිමාර්ග නඩත්තු හා කාලීන නඩත්තු කටයුතු සඳහා රු.6,856,900 ක් පමණක් ගෙවීම් කර තිබුණු අතර, වෙනත් සංවර්ධන කටයුත්තක් හෝ ව්‍යාපෘතියක් ඉටුකිරීම සඳහා මුදල් වැයකර නොතිබුණි. (2020) | නඩත්තු අරමුදලේ වාර්ෂික ආදායම හැකිතාක් දුරට එම වර්ෂය තුළදීම අරමුදල් අරමුණු සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුය. | එම ආදායම්වලින් මේ වන විට වැව් මිණුම් කටයුතු (සීමා මායිම් නිර්ණය කිරීම) සහ ජලජ පැලෑටි කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. | වර්ෂය තුළ සැලසුම් කළ සංවර්ධන ව්‍යාපෘති එම වර්ෂය තුළම සම්පූර්ණ කිරීමට කටයුතු නොකර වාර්ෂික අතිරික්ත මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමට කටයුතු කර ඇත. |

**20. ශීර්ෂය 260 - ප්‍රධාන ලේකම්**

| | | | |
|---|---|---|---|
| උකස් බ්‍රෝකර්වරුන්ගෙන් ගාස්තු අයකිරීම සම්බන්ධව ප්‍රඥප්තියක් කෙටුම්පත් කර තිබුණද, එම ප්‍රඥප්තිය මේ දක්වා බලාත්මක නොවන බැවින් මෙම ආදායම් රැස්කිරීම නියාමනයට කටයුතු කර නොතිබුණි. (2020) | පළාත් සභාව පිහිට වූ පසු ප්‍රඥප්තිය අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. | 2018 වර්ෂයේ ප්‍රඥප්තිය කෙටුම්පත් කර ඇති නමුත් පළාත් සභාව නොපැවැත්වීම මත ප්‍රඥප්තිය අනුමත කර ගැනීමට නොහැකි වී තිබුණි. | පළාත් සභාව රැස්වූ විට ප්‍රඥප්තිය අනුමත කර ගැනීමට යෝජිතව ඇත. |

**21. ශීර්ෂය 263 - පළාත් ආදායම් දෙපාර්තමේන්තුව**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ ආදායම් රු.123,036,518 ක් වූ අතර, එයින් රු.99,085,915 ක් ඉකුත් වර්ෂයන්ට අදාළව අය විය යුතු හිඟ ආදායම් ශේෂයක් විය. (2020) | හිඟ ශේෂ අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. | අදාළ මුදල් අයවීමේ සතුටුදායක ප්‍රගතියක් වාර්තා වී නොමැත. | 2021 දෙසැම්බර් 31 දින වන විට ඉකුත් වර්ෂයන්ට අදාළ හිඟ බදු ශේෂය රු.89,320,911 ක් දක්වා අඩුවී ඇත. |
| (ආ) | පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ 2005 සිට 2017 දක්වා කාල පරිච්ඡේදයට අදාළ එකතුව රු.18,432,580 ක් වූ මුද්දර ගාස්තුවලට අදාළ නඩු ලිපිගොනු 40 ක් සහ 2003 සිට 2019 දක්වා කාලපරිච්ඡේදයට අදාළව රු.10,535,353 ක් වූ පිරිවැටුම් බදු නඩු ලිපිගොනු 10 ක් 2015 සිට 2020 දක්වා කාලපරිච්ඡේදය තුළ බහා තබා තිබුණු නමුත්, එම නඩු නිරවුල් කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. (2020) | හිඟ බදු අයකිරීම් පිළිබඳ පසු විපරම් කටයුතු අඛණ්ඩව සිදුකර අදාළ ආදායම එකී වර්ෂයන්ට ආසන්න වර්ෂවල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මුද්දර ගාස්තු බහා තබා ඇති ගොනු 40 සහ පිරිවැටුම් බදු ගොනු සම්බන්ධව ක්ෂේත්‍ර පරීක්ෂණ මඟින් තොරතුරු සොයාගෙන ඉදිරි කටයුතු කිරීමට තීරණය කර ඇත. | මුද්දර ගාස්තුවලට අදාළ බහා තබා ඇති නඩු ගොනු 40 න් ගොනු 15 ක ලිපිනයන් සොයාගෙන නඩු සක්‍රීය මට්ටමට ගෙන ඇත. |

විගණකාධිපති ත්‍රෛවාර්ෂික තත්ත්ව වාර්තාව ( 2018, 2019,2020)

---------------------------------------------------------------------------

**විගණන අස්ථිත්‍යයේ නම - සබරගමුව පළාත් සභාව**

**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය**

**2018 - තත්ත්වාගණනය කළ මතය**

**2019 - තත්ත්වාගණනය කළ මතය**

**2020 - තත්ත්වාගණනය කළ මතය**

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (01) | බලපත්‍ර ලබා නොගෙන වසර ගණනාවක සිට ධාවනය වන බස්රථ පිළිබඳ තොරතුරු අනාවරණය කර ගැනීමට සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය අසමත් වී තිබුණි. | ධාවන බලපත්‍ර ලබානොගෙන ධාවනය වන බස් රථ පිළිබඳ තොරතුරු අනාවරණය කරගැනිමට කටයුතු කර ඒ සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතු වේ. | බලපත්‍ර ලබා නොගෙන ධාවනය වන බස්රථ සම්බන්ධව නීතිමය කටයුතු කිරිම සඳහා 2021 වසරේ දී රහස් තොරතුරු ඒකකයක් ස්ථාපිත කර ඇත. | රහස් තොරතුරු ඒකකය මගින් අනාවරණය කර ගත් තොරතුරු හා ගත් ක්‍රියා මාර්ග වාර්තාකර නොතිබුණි. |
| (02) | සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් 2015 වර්ෂයේ රු.3,441,110 ක් වැයකර මිල දී ගෙන තිබුණු ආරක්ෂිත කැමරා පද්ධතිය 2019 මැයි 06 දින වනවිටත් නිෂ්ක්‍රීයව පැවතුණි. | අදාළ උපකරණ ප්‍රයෝජනයට ගත යුතු වේ. | රත්නපුර බස් නැවතුම්පොළ භූමියේ ඇති කැමරා පද්ධතිය අලුත්වැඩියා කර සක්‍රීය ලෙස භාවිතා කරන අතර, කෑගල්ල බස්නැවතුම්පොළ භූමියේ ඇති කැමරා පද්ධතිය අලුත්වැඩියා කළද නිතර බිඳ වැටීම් සිදුවන බැවින් fiber line ක්‍රමයක් ක්‍රියාත්මක කර | කෑගල්ල බස්නැවතුම්පොළ භූමියේ ඇති කැමරා පද්ධතිය තවදුරටත් නිෂ්ක්‍රීයව පැවතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | යථා තත්ත්වයට පත්කර ගැනීමට නියමිත බව වාර්තා කර ඇත. | |
| (03) | කරවනැල්ල මූලික රෝහලෙහි පල්දෝරු පද්ධතියේ නිරාවරණය වූ අපජල ටැංකි වර්ෂාවත් සමඟ උතුරා ජල මූලාශ්‍ර වලට මිශ්‍ර වන බැවින් එම පද්ධතිය විධිමත් කිරීමට ක්‍රියාකර නොතිබුණි. එසේම මෙම පල්දෝරු පද්ධතිය සඳහා පරිසර බලපත්‍රයක් ද ලබාගෙන නොතිබුණි. | පරිසර බලපත්‍රයක් ලබාගෙන එම පද්ධතිය විධිමත් කිරීමට කටයුතු කළ යුතු වේ. | පල්දෝරු පද්ධතිය අලුතෙන් සැකසිය යුතු බැවින් අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීමට 2021 සංවර්ධන සැලැස්මට ඇතුළත් කර තිබුණි. | 2021 ප්‍රාග්ධන වියදම් සීමා කිරීම් යටතේ මෙම ඉදිකිරීමට අදාළ ප්‍රතිපාදන කපා හැර ඇත. |
| (04) | පළාත් මාර්ග අමාත්‍යාංශ ප්‍රතිපාදන මත කොළොන්න ප්‍රාදේශීය සභාවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කර තිබුණු ක්‍රීඩා පිටි සංවර්ධන ව්‍යාපෘති 21ක ගෙවීම් කරන ලද වැඩ විෂයයක් මඟින් ආවරණය වී තිබුණු අට්ටි ගසන ලද පස් ඇතිරීම යන වැඩ විෂයය අතිරේක වැඩ විෂයයක් ලෙසද ඇතුළත් කර පස් ඝණ මීටර් 38,872 ක් වෙනුවෙන් එකතුව රු.5,928,010 ක් අධි ඇස්තමේන්තුගත කර ගෙවා තිබුණි. | ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතු අතර අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මූලික විමර්ශන කටයුතු අවසන් කර අදාළ නිලධාරින් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියා මාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | 2022 ජනවාරි 31 දක්වා වැඩිපුර ගෙවීම් අයකර නොතිබුණි. |
| (05) | සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ රු.5,700,000 ක් වටිනා ළමා ලොකු පුටු 3,000 ක් මිල දී ගැනීම සඳහා 2016 වර්ෂයේ පෞද්ගලික ආයතනයක් සමග ගිවිසුම්ගත වී | අදාළ සියලු කොන්දේසි ඇතුළත් කර ගිවිසුම් විධිමත්ව පිළියෙළ කර ඒ අනුව කටයුතු කළ යුතු වේ. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සැපයුම්කරුගෙන් එම මුදල් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | තිබුණි. භාණ්ඩ භාර දිය යුතු අවසාන දිනය ගිවිසුමට ඇතුළත් කර නොතිබුණු නමුත් භාණ්ඩ පිරිවිතර ලේඛනයට අනුව 2017 පෙබරවාරි 15 දිනට පෙර භාණ්ඩ භාර දිය යුතුව තිබුණි. සති 27 ක ප්‍රමාදයකින් පසු භාණ්ඩ භාරදී තිබුණු අතර ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් භාණ්ඩ සැපයීමේ ප්‍රමාද ගාස්තුව වූ රු.570,000 ක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | | | |
| (06) | සබරගමුව පළාත් මාර්ග අමාත්‍යාංශ ප්‍රතිපාදන මත ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරන ලද වැඩ වටිනාකම රු.1,970,667 ක් වූ පනාමුර පරෙවිකන්ද මාර්ගයේ දිග මීටර් 223 ක් කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතියේ වැඩ අවසන් කර වර්ෂ 1 ½ ක් ගතවීමට පෙර සම්පූර්ණ මාර්ගයේ කොන්ක්‍රීට් සඳහා යොදන ලද අඟල් ¾ ගල් මතු වී තිබීමත් මාර්ගයේ පාදම ප්‍රමිතිගතව ඉටු නොකිරීමෙන් මීටර් 43 ක කොටසක කොන්ක්‍රීට් ස්ථරයේ දික් අතට පැළුම් ඉරි මතු වී තිබුණි. | ව්‍යාපෘතිය ක්‍රියාත්මකවන අවස්ථාවේදී නිසි අධීක්ෂණයක් සිදු කළ යුතු වේ. | කාර්මික නිලධාරි සහ කොන්ත්‍රාත්කරු දැනුවත් කර, එම අඩුපාඩු කඩිනමින් නිවැරදි කරන ලෙසට උපදෙස් ලබා දුන් බව ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා ලේකම් විසින් වාර්තා කර ඇත. මෙම කර්මාන්තයේ අඩුපාඩු සකස් නොකිරිම සම්බන්ධයෙන් වාර්තාවක් ලබා දෙන ලෙස පළාත් පාලන ඉංජිනේරු වෙත දන්වා යවා ඇත. එම වාර්තාව ලද පසු ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරමි. | ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා ලේකම් විසින් 2021 සැප්තැම්බර් 07 දින ඉදිරිපත් කරන ලද වාර්තාව අනුව මේ වන විට ග්‍රාමීය මාර්ග ලක්ෂයක් කාපට් කිරීමේ ව්‍යාපෘතිය යටතේ මෙම මාර්ගයේ මුල සිට කි.මී. 1.7 දක්වා කාපට් කිරීමට යෝජනා වී ඇති බව හා මේ වන විට මාර්ගය දෙපස උරහිස් |

| | | | | |
|---|---|---|---|---|
| | | | | කපා මාර්ග පෘෂ්ඨයට පස් වැටීම හේතුවෙන් මාර්ග පෘෂ්ඨය නිරීක්ෂණය කිරීම අපහසු බව දන්වා ඇත. |
| (07) | බලංගොඩ විධායක ඉංජිනේරු කාර්යාලයට අයත් ලෙලන තලන යන්ත්‍රයේ ඇන්ජිම අලුත්වැඩියා නොකිරීම හේතුවෙන් වර්ෂ 05 කට වැඩි කාලයක සිටද ඇඹිලිපිටිය විධායක ඉංජිනේරු කාර්යාලයට අයත් ලෙලන තලන යන්ත්‍රය 2016 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණි. | අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | බලංගොඩ විධායක ඉංජිනේරු කාර්යාලයේ ලෙලන තලන යන්ත්‍රය අලුත්වැඩියා කටයුතු සඳහා සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය වෙත භාරදී ඇත. ඇඹිලිපිටිය විධායක ඉංජිනේරු කාර්යාලයට අයත් ලෙලන තලන යන්ත්‍රය සම්බන්ධයෙන් පරීක්ෂාකර වාර්තා කිරීමට කමිටුවක් පත්කර ඇත. | බලංගොඩ විධායක ඉංජිනේරු කාර්යාලයට අයත් යන්ත්‍රය අලුත්වැඩියා කළ නොහැකි තත්ත්වයේ පවතීනම් ආපසු භාරගෙන විධිමත් පරිදි අපහරණය කිරීමේ කටයුතු කරන මෙන් උපදෙස් ලබා දී ඇත. ඇඹිලිපිටිය විධායක ඉංජිනේරු කාර්යාලයට අයත් යන්ත්‍රය සම්බන්ධයෙන් පත් කර ඇති කමිටු වාර්තාව ලැබී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (08) | කහවත්ත මූලික රෝහල් භූමිය ඇතුළතින් පෞද්ගලික මාර්ගයක් පිහිටා තිබීම නිසා ඒ අසල පිහිටා තිබෙන රෝහලේ රසායනාගාර ගොඩනැගිල්ල හා ළමා වාට්ටුවට ආරක්ෂාව සම්බන්ධව ගැටලුකාරී තත්වයක් පැවතිණ. එසේ ම, රෝහලට අයත් ඉඩමෙන් කොටසක් බාහිර පාර්ශවයන් විසින් අත්පත් කරගෙන තිබුණ ද, එම දේපළ නිරවුල් කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | රෝහල් ඉඩම නිරවුල් කර රෝහල් ගොඩනැගිලි සඳහා ප්‍රමාණවත් ආරක්ෂාවක් යෙදිය යුතු යි. | ආසන්න පදිංචිකරුවන්ට රෝහල හරහා ගමන් නොකර රෝහල් මායිමෙන් ගමන් කිරීමට මාර්ගයක් ඉදිකිරීමේ කටයුතු සිදුකරමින් පවතී. | මාර්ගය ඉදිකිරීම සඳහා මායිම් සලකුණු කර ඇත. දේපළ නිරවුල් කරගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (09) | පුස්සැල්ල ආයුර්වේද රෝහල් භූමියේ ප්‍රධාන පාරට මුහුණලා අනවසර ඉදිකිරීම් කර ඇති අතර, ඉඩමේ වැට මායිම් සකස් කර ඉඩම් ඔප්පුවක් හෝ වෙනත් බලපත්‍රයක් ලබාගෙන ඉඩමේ අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රෝහලේ දේපළ නිවැරදිව හඳුනාගෙන ලේඛනගත කළ යුතු ය. | වැට මායිම් හා තාප්පය ඉදිකිරීමේ දී මිණුම් පිළිබඳ ඇති වූ ගැටලුකාරී තත්ත්වය හේතුවෙන් නැවත මිණුම් කටයුතු සිදුකර දෙන ලෙස පළාත් ඉඩම් කොමසාරිස් ගෙන් ඉල්ලීම් කර ඇත. ඉඩම ශුද්ධ පවිත්‍ර කර සියලුම මායිම් සීමා පැහැදිලිව තබා ගැනීමට කටයුතු කරන ලෙසත්, ඉදිරියේ දී ආයතනයේ දේපළ වලට යම් අකටයුත්තක් හෝ හානියක් සිදුවන්නේ නම් ඒ සඳහා නෛතික කටයුතු කිරීමටත් පුස්සැල්ල ආයුර්වේද රෝහලේ ආයතන භාර වෛද්‍ය නිලධාරි වෙත උපදෙස් ලබා දී ඇත. | ඉඩමේ මැනුම් කටයුතු නැවත සිදුකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (10) | ර/ඇඹිලිපිටිය මහා විද්‍යාලය විසින් නිර්දේශ කිරීම, අනුමත කිරීම හා සහතික කිරීමෙන් තොරව 2018 වර්ෂයේ දී ගෙවීම් වවුචර් 105 කින් එකතුව රු.1,752,019 ක් හා 2019 ජනවාරි සිට ජුනි 26 දින දක්වා ගෙවීම් වවුචර් 25 කින් එකතුව රු.467,994 ක් පාසල් සංවර්ධන සමිති ගිණුමෙන් ගෙවීම් කර තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | වර්තමානයේ දී එලෙස නිර්දේශ කිරීම, අනුමත කිරීම හා සහතික කිරීමෙන් තොරව වවුචර් පත්වලට ගෙවීම් සිදු නොකරයි. | විගණනය පෙන්වා දී මෙන් පසුව ද එම වරද නිවැරදි කර නොතිබුණි. |
| (11) | සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය භුක්ති විඳිමින් පවතින කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 7ක් තුළ පවත්නා අක්කර 4.094 ක් වූ ඉඩම් සහ ඒවායේ ඉදිකර ඇති ගොඩනැගිලි අදාළ පාර්ශවයන්ගෙන් පවරාගෙන තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉඩම් සහ ගොඩනැගිලි පවරාගෙන ගිණුම්ගත කිරීම කළ යුතුය. | අධිකාරිය සතු අක්කර 4.094 ක භූමි ප්‍රමාණය අත්පත් කර ගැනීමේ කටයුතු මේ වනවිට කෑගල්ල දිස්ත්‍රික් ලේකම් මාර්ගයෙන් සිදුවෙමින් පවතී. | 2021 දෙසැම්බර් 31 දින වන විටත් අත්පත් කරගෙන නොතිබුණි. |
| (12) | 2014 දෙසැම්බර් 30 දිනැති අංක 03/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03(vii) ඡේදය ප්‍රකාරව නිලධාරියෙකුගේ ස්ථිර තනතුරට අමතරව වෙනත් තනතුරක වැඩබැලීමට හෝ රාජකාරි ආවරණය කිරීමට පත් කර ඇති විටක චක්‍රලේඛයේ 2(iii)(ආ) යටතේ හිමිවන දූරකථන දීමනාව ලෙස ගෙවිය හැක්කේ එක් තනතුරක් සඳහා අදාළවන මාසික උපරිම ඒකාබද්ධ වියදම් සීමාව යටතේ වුවද, ඊට පටහැනිව | චක්‍රලේඛය ප්‍රකාරව ගෙවීම් කළයුතු අතර, වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. | ආයතනමය මූල්‍ය දුෂ්කරතා නිසා 2019 වර්ෂයේ සිට දීමනාව ගෙවනු නොලැබේ. | වැඩිපුර ගෙවීම් අයකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සබරගමුව ඉපැරණිගම තේමා උද්‍යානයේ සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි සඳහා දුරකථන දීමනා 2017 සිට 2019 ජුනි දක්වා පිළිවෙලින් රු.87,500 ක් හා රු.100,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. | | | |
| (13) | රඹුක්කන විධායක ඉංජිනේරු කාර්යාලය පිහිටි හෙක්ටයාර් 1.9263 ක වපසරියකින් යුක්ත ඉඩමෙන් හෙක්ටයාර් 0.6867 ක් වන බිම් කොටස් 11 ක් අනවසර පදිංචිකරුවන් විසින් අත්කරගෙන තිබුණි. රජයේ වැඩ දෙපාර්තමේන්තුව සතුව තිබුණු මෙම ඉඩම 1987 වර්ෂයේ දී මාර්ග සංවර්ධන අධිකාරියටත්, ඉන් අනතුරුව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය වෙතත් අවිධිමත්ව භාරදී තිබුණු අතර පවරා ගැනීම් කටයුතු මේ දක්වා සිදුව නොතිබුණි. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය යටතේ පවතින ආයතන පවත්වාගෙනයන ඉඩම්, පළාත් සභාව වෙත පවරාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. | මෙම ඉඩම මැන ගැනීම සඳහා පළාත් ඉඩම් කොමසාරිස් වෙත දන්වා ඇත. ඉඩමේ මැනුම් කටයුතු සිදුකර ඇත. එම මැණුමට අදාළ සැලසුම්පත් ලැබුණු පසුව ඉඩම පවරා ගැනීම සඳහා කටයුතු කිරීමට නියමිත ය. | අනවසර පදිංචිකරුවන් 2021 දෙසැම්බර් දක්වා ඉවත් කර නොතිබුණි. |
| (14) | ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 1995 වර්ෂයේ සිට අනවසරයෙන් භුක්ති විදිනු ලබන රජයේ ඉඩම් හෙක්ටයාර 9.9123 ක් දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දිම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා සහ අමාත්‍යවරයා විසින් පිළිවෙලින් 2011 සහ 2016 වර්ෂයන්හි දී අනුමත කර තිබුණි. 2020 ජනවාරි 13 දින වන විටත් අදාළ ඉඩම් භුක්ති විදින පුද්ගලයින් | කඩිනමින් බදුකරයන් ලබා දී හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | පුද්ගලයින් 03 දෙනෙකු දැනුවත් කරන ලදි. ඒ අනුව ඉදිරියේදී බදු අයකර ගැනීමට කටයුතු සිදු කරනු ලැබේ. අනෙක් ආයතනය සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් ලබාදුන් උපදෙස් වලට අනුව නැවත තක්සේරු වාර්තා කැඳවා ඇත. | බදු ගෙවීම සම්බන්ධයෙන් එකඟතාවයක් නොමැති බැවින් පුද්ගලයින් 03 දෙනෙකු බදු ගෙවීම් කටයුතු සිදු නොකරයි. අනෙක් ආයතනය සඳහා තක්සේරු |

| | | | | |
|---|---|---|---|---|
| | 04 දෙනෙකුගෙන් අයකළ යුතු රු.10,451,432 ක හිඟ බදු මුදල් අයකර දිර්ඝ කාලීන බදුකරයන් ලබා දීමට කටයුතු කර නොතිබුණි. | | | වාර්තාව ලැබී නොමැති නිසා මේ දක්වා බදු මුදල් අයකර ගැනීමට නොහැකි වී ඇත. 2021 ජුලි 28 දිනැතිව ද තක්සේරු වාර්තාව ඉල්ලා ලිපියක් යොමුකර ඇත. |
| (15) | සබරගමුව සමුපකාර සංවර්ධන අරමුදල මඟින් 1997 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා කාලසීමාව තුළ දී සමුපකාර සමිති 07 ක් වෙත ලබා දී තිබුණු ණය මුදලින් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂය හා පොලිය පිළිවෙලින් රු.4,456,444 ක් හා රු.6,536,961 ක් වූ අතර, එම ණය අය කර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ ණය හා පොලිය අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු ය. | ණය මුදල් ගෙවන ලෙස අදාළ සමිති වාචිකව හා ලිඛිතව දැනුවත් කර ඇති අතර, අක්‍රීය සමිති ඈවර කර එමඟින් ණය අයකිරීමට කටයුතු කරමින් පවතී. | 2021 දෙසැම්බර් 31 දින වන විට සමිති 02 ක් පමණක් පොලිය රු.1,092,719 ක් ගෙවා තිබුණි. |
| (16) | 2014 නොවැම්බර් 28 දිනැති සබරගමුව පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ 03/2012(1) චක්‍රලේඛය මඟින් පළාත් පාලන ආයතනවල නගරාධිපතිවරුන් හා සභාපතිවරුන් වෙත රු. 5,000 ක සීමාවකට යටත්ව මාසික ඉන්ධන දීමනාවක් ලබාදිම අනුමත කර තිබුණි. පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත එක් එක් සභාව | පළාත් පාලන ආයතනවල නගරාධිපතිවරුන් හා සභාපතිවරුන් වෙත සභාව විසින් අනුමත ඉන්ධන ප්‍රමාණයක් මාසිකව සපයන බැවින් ඊට අමතරව ඉන්ධන දීමනාවක්ද ගෙවීම | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2018 වර්ෂයේ සිට 2022 පෙබරවාරි දක්වා උක්ත චක්‍රලේඛයේ අනුමැතිය යටතේ ප්‍රාදේශීය සභා 06 ක සභාපතිවරුන් වෙත එකතුව |

| | | | | |
|---|---|---|---|---|
| | විසින් අනුමත ඉන්ධන ලීටර් ප්‍රමාණයක් මාසිකව ලබාදෙමින් පැවතියදී මාසික ඉන්ධන දීමනාවක් ද අනුමත කර තිබුණි. | විධිමත් නොවේ. | | රු.755,000 ක් මාසික ඉන්ධන දීමනා වශයෙන් ගෙවා තිබුණි. |
| (17) | වැඩ වටිනාකම රු.120,710,188 ක් වූ පුස්සැල්ල පුහුණු මධ්‍යස්ථානයේ පස්මහල් නව නේවාසිකාගාරය ඉදිකිරීමේ කර්මාන්තයට අදාළව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 හි 5.4.8(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව රු.6,035,509 ක කාර්යය සාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණු අතර, 5.4.4.(i) මාර්ගෝපදේශයට පටහැනි ලෙස කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 35 ක් වූ රු.42,248,566 ක් අත්තිකාරම් ලෙස ගෙවීම් කිරීම හේතුවෙන් රු.18,106,528 ක් වැඩිපුර ගෙවා තිබුණි. 2020 ඔක්තෝබර් 19 දින වන විට ගෙවා තිබු අතුරු බිල්පත් වලින් රු.17,546,238 ක් අත්තිකාරම් ලෙස අයකරගෙන තිබු අතර, තවදුරටත් රු.24,702,328 ක් අයවිය යුතුව පැවතුණි. තවද, 2020 ජුනි 24 දිනවන විට ද ඉදිකිරිම් නිමකර නොතිබුණු අතර කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරිම් කටයුතු අතරමඟ නවතා දමා තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කොන්ත්‍රාත් කටයුතු සිදු කළ යුතුය. | කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් කටයුතු අතර මග නවතා තිබීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු හා සබරගමුව පළාත් සභාව සමග මේ වන විට පළාත් සභාවට අයකර ගත යුතු මුදල් අය කර ගැනීමටත්, මෙම කර්මාන්තයේ ඉතිරි වැඩ සඳහා රු. මිලියන 55 ක් වටිනා නව ඇස්තමේන්තුවක් පිළියෙල කර වෙනත් සුදුසු පාර්ශවයක් වෙත ප්‍රසම්පාදන ක්‍රමය අනුව පිරිනමා ඉටුකර ගැනීමටත්, එකඟතා ගිවිසුමක් සකස්කර ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කර ඇත. | කොන්ත්‍රාත්කරු ගෙන් පළාත් සභාවට අයවිය යුතු මුදල අයකර ගැනීමටත් සුදුසු පාර්ශවයක් වෙත නැවත කොන්ත්‍රාත්තුව පිරිනැමීමටත් කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (18) | සබරගමුව පළාතේ සංචාරක ප්‍රවර්ධනය අරමුණු කරගනිමින් පළාත් මාර්ග අමාත්‍යාංශය විසින් 2014 සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ දී රු.2,030,475 ක් වැය කරමින් සීලෝගම ප්‍රජා සංචාරක ගම්මානයේ සංචාරක නිවාස සඳහා උපකරණ ලබා දිම හා ගොඩනැගිලි ඉදිකිරිම සිදුකර තිබුණ ද අදාළ අරමුණ වෙනුවෙන් එම උපකරණ/ගොඩනැගිලි උපයෝජනය කර නොතිබුණි. | අපේක්ෂිත අරමුණු ලඟාකර ගැනීම පිළිබඳව නිසි අධීක්ෂණයක් සිදු කළ යුතුය. | මෙම උපකරණ නිසි අරමුණු ඉටුවන පරිදි යොදාගන්නා ලෙස ප්‍රජා සංචාරක පදනමේ සාමාජිකයින් දැනුවත් කර ඇති අතර අධීක්ෂණය සහ පසු විපරම දිගටම පවත්වාගෙන යාමට කටයුතු කරන බව වාර්තා කර තිබුණි. | වසංගත තත්ත්වයත් සමග සංචාරක කර්මාන්තය අඩාල වීම නිසා මෙම ප්‍රජා සංචාරක ගම්මානයේ කටයුතු නවතා දැමීමට සිදු වී ඇත. ගම්මානය තුළ වැඩසටහන් කිසිවක් නොපවත්වන බැවින් ගොඩනැගිල්ල නිරන්තර භාවිතයට ලක් නොවන නමුත් ගම්මානයෙහි ප්‍රජාපාදක සංවිධානයන්හි මාසික රැස්වීම් ආදිය සඳහා එම ගොඩනැගිල්ල භාවිතා කෙරේ. |
| (19) | ඉඩම් කොමසාරිස්ගේ 1996 අගෝස්තු 01 දිනැති අංක 96/5 දරන චක්‍රලේඛයේ 6.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික ඉඩම් බදු මුදල් යම් වර්ෂයක ජනවාරි 01 දින හෝ ඊට පෙර අයවිය යුතු වුවත් රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර හිඟ බදු මුදල් අයකරගත යුතු ය. | වාර්ෂික හිඟ බදු අයකර ගැනීම කඩිනම් කරන ලෙස ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබාදී ඇති අතර වරින් වර ඒ පිළිබඳ විමසීම් කර හිඟ බදු ලබා | 2021 ඔක්තෝබර් 31 දිනවන විට හිඟ වාර්ෂික බදු මුදලින් රු.3,415,452 ක මුදලක් හා හිඟ |

| | | | | |
|---|---|---|---|---|
| | ලේකම් කාර්යාල 17 ක 2020 දෙසැම්බර් 31 දිනට එකතුව රු.35,430,569 ක් වූ වාර්ෂික බදු මුදල් සහ රු.8,270,056 ක් වූ දඩ මුදල් යාවත්කාලීනව අයකර ගැනීමට සබරගමුව පළාත් ප්‍රධාන ලේකම් විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර එම චක්‍රලේඛයේ 7 (1) ඡේදය ප්‍රකාරව බදු ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවල ඉඩමේ සන්තකය ආපසු ගැනීමට පියවර ගෙන නොතිබුණි. එසේ ම, උක්ත චක්‍රලේඛයේ 6.11 ඡේදය ප්‍රකාරව රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක හා කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක 2020 දෙසැම්බර් 31 දිනට එකතුව රු.7,159,607 ක් වූ හිඟ දීර්ඝකාලීන බදු මුදල් සහ දඩ මුදල් යාවත්කාලීනව අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | ගැනීමට කටයුතු කර ඇත. එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අදාළ හිඟ දීර්ඝ කාලීන බදු අය කර ගැනීම සඳහා බදුකරුවන්ට ලිපි මඟින් දන්වා ඇත. නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා සාකච්ඡා පැවැත්වීම සහ හිඟ බදු අයකර ගැනීම පිළිබඳව ඉඩම් කොමසාරිස් ජනරාල්ගෙන් උපදෙස් ඉල්ලා ඇත. | දඩ මුදලින් රු.663,384 ක මුදලක් එකතුකර ඇත. බලංගොඩ සහ කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් හිඟ දීර්ඝකාලීන බදු රු.985,850 ක් අයකරගෙන ඇත. |
| (20) | 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 09 වැනි උප ලේඛනයේ පළමු වන ලැයිස්තුවේ 36.12 යටතේ පළාත් සභාවට පැවරුණු සහ 1995 පෙබරවාරි 20 දින අනුමැතිය ලද, සබරගමුව පළාත් සභාවේ 1994 අංක 10 දරන මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තියේ viii වැනි පරිච්ඡේදයේ 13 වැනි වගන්තිය ප්‍රකාරව වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක | වනෝද්‍යානයේ පිවිසුම් ගාස්තු නිතිපතා සබරගමුව පළාත් සභා අරමුදලට ගෙන්වා ගැනීමටත් 2001 වර්ෂයේ සිට හිඟව පවතින මුදල් ලබා ගැනීමටත් ක්‍රියා කළ යුතුය. | මෙම මුදල ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරන ලෙස වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙතින් 2013 වර්ෂයේ සිට ඉල්ලීම් සිදුකර ඇත. | මෙම මුදල් ලබාගැනීම සඳහා වනජීවී දෙපාර්තමේන්තුව සහ මහ භාණ්ඩාගාරයෙන් නැවත විමසීම් සිදු කිරීමට කටයුතු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | ආඥා පනත යටතේ අයකරනු ලබන ගාස්තු ලෙස උඩවලව ජාතික වනෝද්‍යානයේ පිවිසුම් ගාස්තු සබරගමුව පළාත් සභාවට අයවිය යුතු වේ. එසේම වනජීවී සංරක්ෂණ අධ්‍යක්ෂකගේ අංක වජී/2/11/2 හා 2002 ජුනි 26 දිනැති ලිපිය මගින් 2001 වර්ෂයේ ඔක්තෝබර් සිට උඩවලව උද්‍යාන ගාස්තුවෙන් වනජීවී සංරක්ෂණ අරමුදලට බැර කරනු ලබන සියයට 50 හැර ඉතිරියෙන් සියයට 40 ක් සබරගමුව පළාත් සභාවට බැර කරන බවත් එම මුදල මහ භාණ්ඩාගාරය මගින් පළාත් සභාව වෙත ප්‍රේෂණය කරන බවත් දන්වා තිබුණි. එසේ වුවද 2001 ඔක්තෝබර් සිට 2007 නොවැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ රු.24,956,756 ක් සහ 2007 වර්ෂයේ දෙසැම්බර් සිට 2020 දෙසැම්බර් 31 දක්වා අයවිය යුතු මුදල වනජීවී දෙපාර්තමේන්තුවෙන් හෝ මහ භාණ්ඩාගාරයෙන් පළාත් සභාව වෙත ලබා දී නොතිබුණි. | | | |
| (21) | සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් අත් යන්ත්‍ර මගින් රෙදි නිෂ්පාදනය පුළුල් කිරීමත් ග්‍රාමීය කාන්තාවන්ට රැකියා අවස්ථා උත්පාදනය කරදීමත් අරමුණු කොටගෙන 2017 වර්ෂයේ දී රු.9,219,299 ක් වැයකර කෑගල්ල පේෂකර්ම | i. සී/ස කෑගල්ල පේෂකාර්මිකයින් ගේ සමුපකාර සමිතියට මෙය ක්‍රියාත්මක කිරීමට නොහැකිවීමට හේතු විමසා යම් | බලවේග යන්ත්‍ර මිල දී ගැනීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය ශක්තියක් සමිතියට නොමැති බැවින් ඒ සඳහා සමුපකාර සංවර්ධන අරමුදලින් ණය මුදල් ඉල්ලීම් සිදුකර ඇත. සමිතියෙහි රු.ලක්ෂ 32 ක් | ගරු ආණ්ඩුකාරතුමා විසින් ණය මුදල් නිකුත් කිරීම අනුමත කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ගොඩනැඟිල්ලේ ඉහළ මහළ ඉදිකර සී/ස කැගල්ල පේෂකාර්මිකයින්ගේ සමුපකාර සමිතිය වෙත 2017 දෙසැම්බර් 25 දින භාර දී තිබුණ ද එම ගොඩනැඟිල්ල වසර 2 ක් නිෂ්කාර්යව පැවති අතර, එම සමිතිය විසින් 2020 ජනවාරි 01 දින සිට පෞද්ගලික ජාත්‍යන්තර පාසලක් වෙත කුලී පදනම මත ලබා දී තිබුණි. ඒ අනුව, උක්ත වියදමෙන් අපේක්ෂිත අරමුණ ඉටු වී නොතිබුණි. | නිලධාරියෙකුගේ අතපසුවීමක් සිදු වී ඇතිනම් එම නිලධාරියා සම්බන්ධයෙන් සුදුසු පියවර ගත යුතු ය.<br>ii. නොපමාව එම ගොඩනැඟිල්ල අමාත්‍යාංශයේ අපේක්ෂිත කාර්යන් සඳහා යොදා ගත යුතු ය. | තරම් වූ ණයගැති ශේෂය අයකර ගැනීමට කටයුතු කිරීමට නියමිත ය. | |
| (22) | ජයිකා පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මිල දී ගෙන තිබුණු රු.29,900,000 ක් වූ පෙරමුසු ඇතුරුම් නිෂ්පාදන යන්ත්‍ර දෙකක් 2015 වර්ෂයේ දී සබරගමුව සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය වෙත ලැබී තිබුණු අතර, එම යන්ත්‍ර භාරගත් දින සිට උපයෝජනය කර නොතිබුණු අතර, 2021 අප්‍රේල් 09 වන විට මෙම යන්ත්‍ර නිසි ලෙස නඩත්තු නොකිරීම හේතුවෙන් විනාශ වෙමින් පැවතුණි. තවද, මෙම යන්ත්‍රයන්හි ආරක්ෂාව සඳහා යෙදූ මුරකරුවන් තිදෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු.699,100 ක වැටුප් ගෙවා තිබුණි. | උපයෝජනයට ගැනීම හෝ එසේ කළ නොහැකි නම් අපහරණය කළ යුතු ය. | ගරු ආණ්ඩුකාරතුමා විසින් යන්ත්‍ර දෙක මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්යයන් සඳහා භාවිතයට ගත හැකි ද යන්න පිළිබඳව මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කරමින් පවතී. | 2021 දෙසැම්බර් වන විටත් මෙම යන්ත්‍ර නිෂ්කාර්යව පැවතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (23) | 2020 වර්ෂය තුළ රත්නපුර දිස්ත්‍රික් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් එකතුව රු.13,451,196 ක පිරිවැයක් දරමින් ආයතන 17 ක පැවති සමාන ආකාරයේ ඉදිකිරීම්/ අලුත්වැඩියා කටයුතු කුඩා කොටස් 95 ක් ලෙස වෙන්ව හඳුනාගෙන සිදුකර තිබුණු බව ආයතන 21 කට අදාළ ඉදිකිරීම්/ අලුත්වැඩියා කටයුතු පරික්ෂාවේ දී නිරීක්ෂණය විය. එහිදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ලංසු කැඳවා කොන්ත්‍රාත්කරුවන් තෝරාගැනීමකින් තොරව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගේ හෝ අදාළ ආයතන ප්‍රධානීගේ නිර්දේශය පරිදි තෝරාගත් පුද්ගලයින් ලවා අදාළ කාර්යයන් සිදුකිරීම නිරීක්ෂණය විය. ඒ අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව රජයට ලබා ගැනීමට හැකිව තිබුණු පිරිවැය වාසි අහිමි වී ඇති බවත්,1.2.1 (ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව සුදුසුකම්ලත්, උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගී වීම සඳහා සමාන හා උපරිම අවස්ථාවක් ලබා දී නොමැති බවත් නිරීක්ෂණය විය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව රජයට උපරිම පිරිවැය වාසි ලබාගත හැකි පරිදි කොන්ත්‍රාත් පිරිනැමීම සිදුකළ යුතු ය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වර්තමානයේ දී ද විගණන ඡේදයේ සඳහන් ක්‍රමවේදය ම අනුගමනය කරනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| (24) | සබරගමුව පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.19,692,264 ක් වූ වෙළඳ ණයගැතියන්ගෙන් එකතුව රු.1,549,130 ක් වූ ණයගැති ශේෂ 18 ක් වසර 05 කට වැඩි කාලයක සිට ද එකතුව රු.565,268 ක් වූ ණයගැති ශේෂ 07 ක් වසර 10 කට වැඩි කාලයක සිට ද හිඟව පැවතුණි. | හිඟහිටි ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව අදාළ ණයගැතියන් සඳහා ලිපි මඟින් ලිඛිතව දැන්වීම සහ ණය අයකිරීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත. | 2022 ජනවාරි 31 දක්වා අයකිරීම් සිදුකර නොතිබුණි. |
| (25) | 1994 අංක 04 දරන සබරගමුව පළාත් සභාවේ සමාජ සේවා අරමුදල පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තියේ 06 වන රෙගුලාසිය මඟින් දක්වා ඇති පරිදි අසරණ හා ආබාධිතව සිටින දරුවන් සඳහා ලබාදිය හැකි පෝෂණ හා අධ්‍යාපන ආධාර ලබා දීමට අරමුදල කටයුතු කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ අවසානයට අරමුදලේ මුදල් ශේෂය රු.77,943,752 ක් විය. | ප්‍රඥප්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. | පරිවාස, ළමාරක්ෂක හා සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් දරුවන් සඳහා පෝෂණ හා අධ්‍යාපන ආධාර ලබාදෙන බැවින් වෛද්‍යමය හේතුන් සඳහා සමාජසේවා අරමුදල ආධාර ලබා දීමට වැඩි නැඹුරුවක් දක්වන බව දන්වා තිබුණි. | 2021 දෙසැම්බර් 31 දින වන විටත් අරමුදල් අසරණ හා ආබාධිත දරුවන්ගේ සුභසාධනය සඳහා යොදාගෙන නොතිබුණි. |
| (26) | කෑ/අඹේපුස්ස මහා විද්‍යාලයේ තාක්ෂණික ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2017 ජනවාරි 23 දින පෞද්ගලික සමාගමක් සමඟ රු.20,833,115 ක වැඩ වටිනාකමකට ගිවිසුම්ගතව තිබුණි. ගිවිසුම් ප්‍රකාරව 2017 ඔක්තෝබර් 15 දින වැඩ අවසන් කළ යුතුව තිබුණද | කොන්ත්‍රාත් ප්‍රමාදයන් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන් අනුව කටයුතු කළ යුතු ය. | ඉදිකිරීම් කටයුතු නවතා ඇති අතර, තවදුරටත් අයකරගත යුතු අත්තිකාරම් මුදල වන රු.2,662,741 පියවා ගැනීම සඳහා පළාත් සභා නීති අංශයෙන් නීති උපදෙස් විමසා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | නීති අංශයෙන් උපදෙස් ලැබුණු වහාම මෙම කර්මාන්තය ඒක පාර්ශවිකව අවලංගු කිරීමට කටයුතු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම වැඩ අවසන් කර නොතිබුණු අතර, රු.1,041,656 ක් වූ කාර්යය සාධන ඇපකරය 2019 ඔක්තෝබර් 18 දින කල් ඉකුත්වී තිබුණි. තවද, රු.6,249,934 ක් අත්තිකාරම් වශයෙන් ගෙවා තිබූ අතර ඉන් රු.4,066,315 ක් පියවා නොතිබුණි. එසේ වූවද, අත්තිකාරම් ඇපකරය ද 2020 මාර්තු 31 දින කල් ඉකුත්ව තිබුණි. | | | |
| (27) | බලංගොඩ, ඇඹිලිපිටිය, නිවිතිගල, දෙහිඕවිට, මාවනැල්ල හා කෑගල්ල අධ්‍යාපන කලාපවල එකම පාසලක වසර 15 කට වැඩි කාලයක් සේවය කළ විදුහල්පතිවරු 54 ක් ද, වසර 10 ත් 15 ත් අතර කාල පරාසයක සේවය කළ විදුහල්පතිවරු 86 ක් ද, වසර 08 ත් 10 ත් අතර කාල පරාසයක සේවය කළ විදුහල්පතිවරු 130 ක් ද ස්ථාන මාරු වීම් නොලබා අඛණ්ඩව තවදුරටත් සේවයේ යෙදී සිටිමින් පැවතුණි. | විදුහල්පති සේවයේ ස්ථානමාරුවීම් කාලීනව සිදුකළ යුතු ය. | විදුහල්පති ස්ථාන මාරු ප්‍රතිපත්තිය සකස් කර ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කර තිබුණි. | විදුහල්පති මාරු ප්‍රතිපත්තිය ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ වහාම විදුහල්පති ස්ථාන මාරු ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට කලාප මට්ටමින් තොරතුරු සකස් කර ඇත. |
| (28) | කලවාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුකුළේගම උතුර හා තපස්සරකන්ද ග්‍රාම නිලධාරි වසම්වල පිළිවෙලින් රූඩ් 03 ක් හා අක්කරයක් විශාල වූ රජයේ ඉඩම් 02 ක් වාර්ෂික අවසර පත්‍රයක් මඟින් හා ජයභූමි ඔප්පුවක් මඟින් පෞද්ගලික පාර්ශවයන් වෙත ලබා දී තිබුණු අතර, එම පාර්ශවයන් | ප්‍රාදේශීය ලේකම් ලවා ඉඩම් කොමසාරිස්ගේ නියෝග ක්‍රියාත්මක කරවිය යුතු ය. | කුකුළේගම උතුර දුරකතන සම්ප්‍රේෂණ කුලුන සම්බන්ධව කලවාන ප්‍රදේශීය ලේකම් විසින් පළාත් පාලන ආයතනයේ සහ මොබිටෙල් සමාගමේ එකඟතාවය ලබා දීමට කටයුතු කරනමෙන් දන්වා ඇති අතර, හිඟ බදු | උක්ත ලිපිය ප්‍රකාරව දීමනා පත්‍ර රජයට භාරගෙන ඉඩම් කොටස අදාළ සමාගම වෙත දීර්ඝ කාලීන බලපත්‍රයක් යටතේ ලබාදීම |

විසින් ඉඩම්වලින් පිළිවෙලින් පර්චස් 15 ක් හා 20 ක් වූ බිම් කොටසක් පෞද්ගලික ආයතනයක සම්ප්‍රේෂණ කුලුනු ඉදිකිරීමට වර්ෂ 10 කට බදු දී තිබුණි. මේ සම්බන්ධයෙන් සබරගමුව පළාත් ඉඩම් කොමසාරිස්ගේ 2012 සැප්තැම්බර් 27 දිනැති අංක පීඑල්සී 10 දරන ලිපිය මඟින් කලවාන ප්‍රාදේශිය ලේකම්ට දිමනා පත්‍ර රජයට භාර ගැනීමටත් සම්ප්‍රේෂණ කුලුනු ඉදිකිරීමට අදාළ ඉඩම් කොටස් දිගුකාලීන බලපත්‍ර මත එම සමාගම් වලටම ලබාදීමට යෝජනා ඉදිරිපත් කරන ලෙසටත් දන්වා තිබුණද එපරිද්දෙන් කටයුතු කර නොතිබුණි.

සම්බන්ධව කඩිනම් ක්‍රියා සිදුකර කරන ලෙස කලවාන ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා ඇත.

මාර්ග ගැනිමට කටයුතු නොතිබුණි.

තපස්සරකන්ද දූරකථන සම්ප්‍රේෂණ කුලුන ඉදිකිරීම සම්බන්ධයෙන් කටයුතු කර ඇත්තේ ප්‍රාදේශීය සභාවේ එකඟතාවය මත පමණි. දීමනා පත්‍රය අවලංගු කිරීමට රජය වෙත බාර දෙන මෙන් දැන් වුවද ප්‍රතිචාර නොලැබීම මත අදාළ ඉඩම් කොටස මැන වෙන් කිරීම සඳහා මැනුම් ඉල්ලීමක් යොමුකර ඇත.

**විගණකාධිපති ත්‍රෛවාර්ෂික තත්ත්ව වාර්තාව (2018,2019,2020)**

**විගණන අස්ථිත්‍යයේ නම :- මධ්‍යම පළාත් සභාව**

**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය**

**2018 - තත්ත්වාගණනය කළ මතය**

**2019 - තත්ත්වාගණනය කළ මතය**

**2020 - තත්ත්වාගණනය කළ මතය**

| විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ගය | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| 1. **ගිණුම්කරණ අඩුපාඩු** | | | |
| (අ) 2018 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයතන 07 ක එකතු වටිනාකම රු.2,671,198 ක් වූ නොපිය වූ අග්‍රිම ශේෂයක් පැවතුණි. | අග්‍රිම ශේෂයන් දෙසැම්බර් 31 දිනට පෙර පියවීමට කටයුතු කළ යුතු වේ. | අග්‍රිම ශේෂ 06 ක් සම්පූර්ණයෙන් නිරවුල් කර ඇත. | ආයතන 07 න් එක් ආයතනයකට අදාළ රු.299,247 ක අග්‍රිම ශේෂය පියවා නොතිබුණි. |
| (ආ) 2015 වර්ෂයේ සිට එකතුව රු.26,000,000 ක් වැය කර ඉදිකර තිබුණු මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටි ගොඩනැගිල්ල 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා නොතිබුණි. | මෙම ගොඩනැගිල්ල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතුය. | බිල්පත් ගෙවීම් අමාත්‍යාංශයෙන් සිදු වූ බැවින් වටිනාකම් ගිණුම් ගත කිරීමට නොහැකි වී ඇති බව දන්වා ඇත. | 2020 වර්ෂය සඳහා ගොඩනැගිලි වටිනාකම ගිණුම්ගත කර නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) මධ්‍යම පළාත් ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ 2020 වර්ෂය අවසානයට පොදු ගිණුම යටතේ දක්වා තිබුණු හඳුනා නොගත් අවිනිශ්චිත ශේෂය රු.832,955 ක් විය. | ගෙවිය යුතු ස්ථානමාරු ණය ශේෂය හා අවිනිශ්චිත ශේෂය හඳුනාගෙන නිරවුල් කළ යුතුය. | අන්තර් පළාත් පොදු ගිණුම තුළ රු.1,129,703 ක ශේෂයක් පැවති අතර 2021 වර්ෂයේ මෙම ණය ශේෂයන් රු.296,748 ක් නිරවුල් කළ පසු පොදු ගිණුමේ ශේෂය රු.832,955 කි. මෙම ශේෂයද ඉදිරියේ දී හැකි ඉක්මනින් නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත | අවිනිශ්චිත ගිණුමේ ශේෂය හඳුනාගෙන නිරවුල් කර නොමැත. |

2. **ශීර්ෂය 541 - සභා ලේකම් කාර්යාලය**

**-----------------------------------------**

| | | | |
|---|---|---|---|
| (අ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2001 මාර්තු 28 දිනැති අංක 01/2001 දරන මුදල් චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා වූ අත්තිකාරම් ගිණුමට අදාළව මියගිය මන්ත්‍රීවරයෙකුගෙන් අයවිය යුතු රු. 92,176 ක සහ ධූරය අත්හැර ගොස් තිබුණු මන්ත්‍රීවරයෙකුගෙන් අයවිය යුතු රු. 157,114 ක ණය ශේෂයන් 2018 දෙසැම්බර් 31 දිනටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීතිපති වෙත දැනුම් දී ඇත. | හිඟ ණය ශේෂය අයකර නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ආ) සභා ලේකම් කාර්යාලය විසින් 2012 වර්ෂයේ දී ක්‍රියාත්මක කළ පළාත් සභා මැති ඇමතිවරුන් සඳහා ලැප්ටොප් පරිගණක ලබාදීමේ වැඩසටහන යටතේ ධූරධාරීන් 26 දෙනෙකු වෙත ලබා දී තිබුණු රු. 2,789,100 වටිනා පරිගණක යන්ත්‍ර 26 ක් ගිවිසුම් ප්‍රකාරව 2018 දෙසැම්බර් 31 දිනටත් ආපසු භාර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ලැප්ටොප් පරිගණක භාරදීම සඳහා සිහිකැඳවීම් යවා ඇත. | ලැප්ටොප් පරිගණක ගිවිසුම් ප්‍රකාරව ආපසු භාරගෙන නොමැත. |
| (ඇ) ජනාධිපති ලේකම්ගේ පීඑස්/සීඑස්ජ්/11-18 හා 2018 ඔක්තෝබර් 12 දිනැති රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයෙන් ප්‍රතිපාදන සලසා නොතිබියදී 2018 ඔක්තෝබර් 15 සිට 2019 ඔක්තෝබර් 31 දක්වා මසකට රු.40,000 බැගින් එකතුව රු.420,000 ක නිවාස කුලී දීමනාවක් පළාත් සභාවේ සභාපතිවරයාට ගෙවා තිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග වාර්තා කර නැත. | චක්‍රලේඛයට අනුකූල නොවන ලෙස ගෙවා තිබුණු නිවාස කුලී දීමනාව අයකර ගෙන නොමැත. |

3. **ශීර්ෂය 542 - ප්‍රධාන ලේකම් කාර්යාලය**

**-------------------------------------------**

| | | | |
|---|---|---|---|
| පළාත් සභා රැස් කිරීමේ ජංගම ගිණුම් 06 ක සහ ප්‍රධාන ලේකම් කාර්යාලයේ ප්‍රධාන ජංගම ගිණුම් 02 ඇතුළත්ව ගිණුම් 08 ක 2019 වර්ෂයේ රු.1,857,991,945 ක් නිෂ්කාර්යව පැවති අතර 2019 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය බැංකු 02 | පළාත් පාලන ආයතන වෙත ගෙවිය යුතු මුදල් අප්‍රමාදව ගෙවීමට කටයුතු කිරීම. | වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන ලේකම් කාර්යාලයේ ප්‍රධාන ජංගම ගිණුම් 02 ඇතුළත්ව ගිණුම් |

| | | | |
|---|---|---|---|
| ක පවත්වාගෙන ගොස් තිබූ රු.2,481,656,658 ක ස්ථාවර තැන්පතු පළාත් සභා අරමුණු ඉටුකර ගැනීමට යොදාගෙන නොතිබුණි. | | | 08 ක රු.659,036,520 ක ශේෂයක් හා රු.2,621,485,974 ක ස්ථාවර තැන්පතු පැවතුණි. |

4. **ශීර්ෂය 544 - පළාත් පරිපාලන**

---------------------------------

| | | | |
|---|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ ලේඛන ගත වීමක් සිදුවී නොතිබුණු කුඩා ජල විදුලි බලාගාර 04 ක් 2019 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ විදුලිය කිලෝවොට් 8,430,932 ක් නිෂ්පාදනය කර රු.118,033,048 ක ආදායමක් උපයා ඇති නමුත් උඩ පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට කිසිදු බදු මුදලක් අයවී නොතිබුණි. | හිඟ බදු මුදල් අය කිරීමට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විදුලි බලාගාරවල ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. | කුඩා ජල විදුලි බලාගාර එකක් 2021 දක්වා බදු ගෙවා ඇත. කුඩා ජල විදුලි බලාගාර 2 ක් ක්‍රියාත්මක කර නොමැත. කුඩා ජල විදුලි බලාගාර එකකින් බදු අනුමත කර ගැනීම සඳහා මූලික කටයුතු කරමින් පවතී. | විදුලිය නිෂ්පාදනය සඳහා 2021 දෙසැම්බර් 31 දිනටත් බදු අයකර නොමැත. |

5. **ශීර්ෂය 545 - පළාත් මුදල් කළමනාකරණය**

---------------------------------------------

| | | | |
|---|---|---|---|
| (අ) 2020 වර්ෂය තුළ රු.2,140,860,112 ක මුද්දර ගාස්තු හා රු.130,555,222 ක උසාවි දඩ ආදායමක් පළාත් සභාව විසින් රැස්කර තිබුණද ඉන් පළාත් පාලන ආයතන වෙත ගෙවා තිබුණේ රැස්කළ ආදායමෙන් සියයට 0.06 ක් වූ රු.1,310,102 ක මුද්දර ගාස්තු පමණි. එමෙන්ම උසාවි දඩ ආදායම් පළාත් පාලන ආයතන වෙත ගෙවා නොතිබුණි. | පළාත් පාලන ආයතනවලට අදාළව ලැබී තිබුණු, මුද්දර ගාස්තු හා උසාවි දඩ ගෙවීමට කටයුතු කළ යුතුය. | මුද්දර ගාස්තු රැස්කළ ආදායමින් 2020 වර්ෂයේ දී සියයට 52 ක් ගෙවා ඇත. | පළාත් පාලන ආයතනවලට අදාළව ගෙවිය යුතු මුළු මුද්දර ගාස්තු සහ උසාවි දඩ ගෙවා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) මධ්‍යම පළාත් මූල්‍ය රීති 116.1 ප්‍රකාරව හිඟ ආදායම් අයකර ගැනීමේ දී එකතු කරන නිලධාරීන් ඒ පිළිබඳ අවධානයෙන් හා ඉතාම සැලකිලිමත්ව සිටිය යුතු බවට හා අවශ්‍ය අවස්ථාවලදී නියමිත කාලය තුළ නීති මඟින් කටයුතු කිරීම සඳහා විධිවිධානයන් යෙදීම ගැනද වගකිව යුතු වුවද 2020 වර්ෂයේ දී 2017,2018 සහ 2019 වර්ෂවලට අදාළව මධ්‍යම පළාතේ ආදායම් ගිණුමෙන් රු.6,773,747ක හිඟ ආදායම් කපාහැර තිබුණි. එමෙන්ම එම ආදායම් ගිණුම අනුව ආදායම් විෂයය 06 කට අදාළව 2020 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.195,023,111 ක හිඟ ආදායම් අයකර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | හිඟ ආදායම් එකතු කිරීම සඳහා විශේෂ විධිවිධාන යෙදවීමට කටයුතු කරන බව දන්වා ඇත. | හිඟ ආදායම් අයකර නොමැත. |
| (ඇ) 2020 දෙසැම්බර් 31 දිනට සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් මධ්‍යම පළාත් සභාවට ලැබිය යුතු කාල විශ්ලේෂණයක් ඉදිරිපත් නොකළ රු.171,988,242 ක අත්තිකාරම් මුදල් අයකරගෙන නොතිබුණි. | අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නිරවුල් නොවූ අත්තිකාරම් තවදුරටත් එලෙසම පවතී. |

6. **මධ්‍යම පළාත් කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය**

| | | | |
|---|---|---|---|
| කටුකිතුල මගී ගිමන්හල බදු දීම සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය හා කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය එළඹ තිබූ ගිවිසුමට අනුව උපබදු දීම හා ගිමන්හලේ ආකෘතිමය වෙනස්කම් කළ නොහැකි වුවත්, කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය එය වෙනත් පෞද්ගලික ආයතනයකට උපබදු දී තිබූ අතර, එම ආයතනය රු.මිලියන 6 කට ආසන්න මුදලක් වැයකර එහි ආකෘතිය වෙනස් කර තිබුණි. තවද එම ආයතනයෙන් 2013 පෙබරවාරි සිට 2019 දෙසැම්බර් දක්වා අය විය යුතු රු.2,164,390 ක හිඟ බදු මුදල අය කර ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කිරීම. | හිඟය අය කිරීම සඳහා අධිකරණ ක්‍රියාමාර්ග වලට යොමු වී ඇත. | රු.2,164,390 හිඟ බදු මුදල අයකර නොමැත. |

7. **ශීර්ෂය 550 - ප්‍රධාන අමාත්‍යාංශය**

| | | | |
|---|---|---|---|
| මධ්‍යම පළාත් සභාව විසුරුවා හැරීමත් සමඟ ප්‍රධාන අමාත්‍යවරයාට වෙන්කර තිබූ අනගාරික ධර්මපාල මාවතේ පිහිටි මලබාර් හවුස් ගොඩනැගිල්ල ග්‍රාම ශක්ති ව්‍යාපෘතිය වෙනුවෙන් භාරදී තිබුණු අතර නිල නිවාස භාරදීමේ ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව රජයේ තක්සේරුකරු විසින් තක්සේරු කරන ලද රු.325,000 ක මාසික කුලියක් අයකර ගත යුතු වුවත් 2019 මාර්තු 15 දින සිට 2019 | අයවිය යුතු නිවාස කුලී අයකර ගැනීමට කටයුතු කිරීම. | කුලී අයකර ගැනීම සඳහා ජනාධිපති ලේකම් වෙත 2022 මාර්තු 03 නැවත සිහිකැඳවීම් ලිපියක් යවා ඇත. | ග්‍රාම ශක්ති ව්‍යාපෘතියේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ගෙන් අයවිය යුතු නිවාස කුලිය අයකර ගෙන නොමැත. |

| | | | |
|---|---|---|---|
| දෙසැම්බර් 22 දින දක්වා වූ කාලයට අදාළව අයවිය යුතු රු.2,925,000 ක නිවාස කුලිය අයවී නොතිබුණි. | | | |

8. **ශීර්ෂය 551 - පළාත් පාලන දෙපාර්තමේන්තුව**

---

| | | | |
|---|---|---|---|
| විගණකාධිපති විසින් මධ්‍යම පළාතේ, පළාත් පාලන ආයතන සඳහා 1996 වර්ෂයේ සිට 2020 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය තුළ නිකුත් කර තිබුණු රු.3,688,891 ක අධිභාර සහතික 10 ක් සම්බන්ධයෙන්, අභියාචනා ලැබී ඇත්නම් ඒ පිළිබඳව ද සලකා බලා මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අධිභාර අයකර ගත යුතුය. | අධිකරණ කාර්යයන් නිම වීමෙන් පසු හා අභියාචනා අවසන් වීමෙන් පසු අය කිරීමට කටයුතු කරන අතර, පාර්ශව කීපයක් විසින් කොටස් වශයෙන් ද මුදල් ගෙවා ඇත. | සම්පූර්ණ අධිභාර මුදල අයකර නොමැත. |

9. **ශීර්ෂය 552 - අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

---

| | | | |
|---|---|---|---|
| (අ) අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2007 දෙසැම්බර් 13 දිනැති අංක 2007/20 දරන චක්‍රලේඛය අනුව 2018 දෙසැම්බර් 31 දිනට කොත්මලේ අධ්‍යාපන කලාපයේ පාසැල් 14 ක ගුරුවරුන් 29 දෙනෙකු වසර 10 ට වැඩි කාලයක් ද හැටන් අධ්‍යාපන කලාපයේ පාසැල්වල ගුරුවරුන් 484 දෙනෙකු වසර 08 සිට වසර 32 දක්වා කාලයක් ද එකම පාසැලක සේවය කරමින් තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව වඩාත් ඵලදායී ලෙස නියමිත කාලය තුළ ස්ථාන මාරුවීම් ලබා දිය යුතුය. | අතිදුෂ්කර පාසැල් වල ගුරු මාරු කිරීමේ දී ගැටලු මතු වී ඇති බැවින් අදාළ අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමින් පවතී. | අඩුපාඩුව නිවැරදි කර නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ආ) අංක 552202 දරන ගුරුදෙණිය අධ්‍යාපන සංවර්ධන කේන්ද්‍රයේ වාණිජ අත්තිකාරම් ගිණුමේ 2017 සහ 2018 වර්ෂවලට අදාළ රු.736,450 ක ආදායම් ගිණුම්ගත කර නොතිබුණි. | හිඟ ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. | ආදායම් කිහිපයක් ගිණුම්ගත කර ඇත. අනෙකුත් ඒවා PIV මඟින් ගිණුම්ගත කරන බව දන්වා ඇත. | සම්පූර්ණ මුදල ගිණුම් ගතකර නොමැත. |
| (ඇ) පරණගම මධ්‍ය මහා විද්‍යාලයේ පැරණි පරිගණක කාමරය පහසුකම් සහිත පන්ති කාමර (Smart class room) සඳහා යොදාගත් පසු එහි පැවති වායුසමීකරණ 03 ක් හා මහින්දෝදය විද්‍යාගාරය සඳහා ලබාදී තිබුණු උපකරණ 33 කට අදාළ ඒකක 53 ක් 2018 දෙසැම්බර් 31 දිනටත් නිෂ්කාර්යව පැවතුණි. | රජයේ වත්කම් නිෂ්කාර්ය නොවීමට වගබලා ගත යුතුවේ. | අක්‍රියව පවතින වායු සමීකරණ 03 ක් ඉවත් කර ඇත. රේඩියෝ යන්ත්‍ර 02 හා අනෙකුත් විද්‍යාගාර උපකරණ වර්තමාන සිසුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා යොදා ගෙන ඇත. | වායු සමීකරණ යන්ත්‍ර 03 නිෂ්කාර්යව පවතී. අනිකුත් උපකරණ ප්‍රයෝජනයට ගෙන ඇත. |
| (ඈ) උඩවෙල බණ්ඩාරනායක විද්‍යාලයේ අවස්ථා 11 කට අදාළ රු.8,584,356 ක හානි හා පාඩු පිළිබඳව 2017 හා 2018 වර්ෂයේ දී විගණන විමසුම් මඟින් පෙන්වාදී තිබුණ ද 2019 මාර්තු මස වන විටත් මු.රී.54 (3) පරීක්ෂණ සිදුකර වගකිව යුත්තන් නිශ්චය කර පාඩු පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි අනුව අදාළ කටයුතු කළ යුතුය. | පරීක්ෂණ මණ්ඩල පත් කර තොරතුරු පරීක්ෂා කර ඇත. | පාඩු පියවා ගැනීමට කටයුතු කර නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඉ) 2019 දෙසැම්බර් 31 දිනට මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 2894 කගෙන් ලැබිය යුතු රු.76,230,006 ක් වූ ණය ශේෂය හා ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන් 1059 දෙනෙකුගේ පියවිය යුතු රු.30,889,780 ක් වූ ණය ශේෂය ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛය ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. | 2019 දෙසැම්බර් 31 ක දිනට පෙර ස්ථානමාරු වී ගිය සහ ස්ථානමාරුවී පැමිණි නිලධාරින්ගෙන් පිළිවෙලින් 149 කුගේ රු.17,419,250 ක හා 98 කුගේ රු.10,273,221 ක හිඟ ණය ශේෂ 2021 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරය හරහා නිරවුල් කර ඇත. | ස්ථානමාරු වී ගිය නිලධාරින් 2745 ගෙන් රු.58,810,756 ක සහ ස්ථානමාරු වී පැමිණි නිලධාරින් 98 කුගේ රු.20,616,559 ක හිඟ ණය ශේෂ නිරවුල් කර නැත. |
| (ඊ) 2019 වර්ෂය අවසන් වන විට මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් 259 කට අදාළව අයවිය යුතු ණය ශේෂය රු.11,173,799 ක් වූ අතර එම ශේෂය තුළ ඇතුළත් වසර 05 ට වැඩි ණය ශේෂය රු.1,694,649 ක් විය. | ආයතන සංග්‍රහය අනුව කටයුතු කර ණය අයකර ගැනීමට හා ණය ශේෂ නිරවුල් කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | 2019 දෙසැම්බර් 31 දිනට පෙර විශ්‍රාම ගිය හා මියගිය නිලධාරින් 64 කුගේ රු.2,969,830 හිඟ ණය ශේෂ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හරහා නිරවුල් කර ඇත. | මියගිය හා විශ්‍රාම ගිය නිලධාරින් 195 කුගේ රු.8,203,969 ක හිඟ ණය ශේෂ නිරවුල් කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | 2019 දෙසැම්බර් 31 දිනට පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ වැඩ තහනම් කළ හා සේවය අතහැරගිය නිලධාරීන් 144 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු.5,439,775 ක් වූ අතර ඉන් වර්ෂ 05 ඉක්මවූ ණය ශේෂය රු.3,392,787 ක් විය. | හිඟ ණය අයකර ගත යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ ණය ශේෂ අයකර නැත. |
| (ඌ) | රජතලාව කණිෂ්ඨ විද්‍යාලයේ නල ළිඳට සවිකරන ලද ජල මෝටරය අළුත්වැඩියා කර නොගැනීම හා අක්‍රීය වූ සූර්ය කෝෂ 02 අළුත්වැඩියා කර නොගැනීම නිසා රු.ලක්ෂ 65 කට ආසන්න පිරිවැයක් දරා විදේශීය ආධාර යටතේ විද්‍යාලයට ලබාදී තිබුණු ජල පද්ධතිය 2019 දෙසැම්බර් 31 දිනට වසර 03 ක පමණ කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | දරන ලද වියදම් නිෂ්කාර්ය වීමට ඉඩනොහැර ගුරු හා සිසු අවශ්‍යතා සපුරා දීමට පියවර ගත යුතුය. | සූර්ය බල ශක්ති ජලනල පද්ධතිය අලුත්වැඩියා කරන තෙක් පාසැල් භූමියේ ළිඳක් සකස් කර ජලය ලබාගනී. | ජල පද්ධතිය නිෂ්කාර්යව පවතී. |
| (එ) | 2019 දෙසැම්බර් 31 දිනට මාතලේ කලාප කාර්යාලයට අයත් පාසල් 61 ක ඉඩම් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර එම ඉඩම් මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා නොගත් පාසැල් ඉඩම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | පවරා නොගත් පාසැල් ඉඩම් පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වා ඇත. | අඩුපාඩුව නිවැරදි කර නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඒ) 2019 දෙසැම්බර් 31 දිනට මාතලේ කලාපයේ පාසැල්වල සිංහල මාධ්‍ය ගුරුභවතුන් 47 කගේ හා දෙමළ මාධ්‍ය ගුරුභවතුන් 54 කගේ පුරප්පාඩු පැවතුණි. | ගුරු පුරප්පාඩු පිරවිය යුතුය. | 2021 දෙසැම්බර් 31 දිනට මුළු ගුරු පුරප්පාඩු සංඛ්‍යාව 18 කි. | ගුරු පුරප්පාඩු 18 ක් තවදුරටත් පුරවා නොමැත. |
| (ඔ) 2019 දෙසැම්බර් 31 දිනට මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අදාළව පළාත් මූල්‍ය රීති 54.6 පරීක්ෂණ මඟින් කපාහැරීමට, ගැලපුම් කිරීමට හා ඉවත් කිරීමට නිර්දේශ කර තිබූ පිළිවෙලින් රු.5,747,195 ක් රු.3,389,528 ක් හා රු.3,954,598 ක් වූ ණය ශේෂ සම්බන්ධයෙන් කටයුතු අවසන් කර නොතිබුණි. | පරීක්ෂණ වාර්තා වල ඇතුළත් නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය. | ණය ශේෂ කපා හැරීමට, ගැලපුම් කිරීමට හා ඉවත් කිරීමට කටයුතු කරමින් පවතී. | ණය ශේෂ කපා හැරීම ගැලපුම් කිරීම හා ඉවත් කිරීම සිදු කර නොමැත. |
| (ඕ) ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 12.5.4 වගන්තිය අනුව නිලධාරියෙකු ස්ථිර තනතුරක් දරන අතරතුරදී තවත් තනතුරක වැඩ බලන්නේ නම් පමණක් වැඩ බැලීමේ දීමනාව ලබාගත හැකි වුවද නාඋල සහ ගලේවෙල කලාප අධ්‍යාපන කාර්යාලවලට වැඩ බැලීම සඳහා පත්කර තිබුණු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්ට එම තනතුරේ රාජකාරී පැවරීම පමණක් කර තිබුණු අතර ඔවුන් වෙනත් තනතුරක | වැඩිපුර ගෙවා ඇති වැටුප් ආපසු අයකර ගත යුතුය. | පත්කිරීම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 12.3 වගන්තිය යටතේ රාජකාරී ඉටුකිරීම වශයෙන් සංශෝධනය කරන ලෙස ඉල්ලීමක් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමුකර ඇත. එය සංශෝධනය කළ පසු වැඩ බැලීමේ වැටුප් අයකිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | වැඩිපුර ගෙවා ඇති වැටුප් ආපසු අයකර නොමැත. |

| | | | |
|---|---|---|---|
| කාර්යයන් ද ආවරණය කර නොතිබුණි.එහෙත් 2016 පෙබරවාරි සිට 2020 දෙසැම්බර් දක්වා රු.857,789 ක් නාඋල කලාපයේ අධ්‍යාපන අධ්‍යක්ෂකට සහ 2016 ජනවාරි සිට 2019 වර්ෂයේ අගෝස්තු දක්වා රු.828,130 ක් ගලේවෙල කලාපයේ අධ්‍යාපන අධ්‍යක්ෂකට එකතුව රු.1,685,919 ක වැඩ බැලීමේ වැටුප් ගෙවා තිබුණි. | | | |
| (ක) මාතලේ, ගලේවෙල, විල්ගමුව අධ්‍යාපන කලාපවලට අයත් පාසල්වල පුරප්පාඩු වී ඇති විදුහල්පති තනතුරු සඳහා 2020 වර්ෂය අවසාන වන විට පිළිවෙළින් වසර 32, 47 හා 27 බැගින් වූ කාලයක් තිස්සේ වැඩබලන විදුහල්පතිවරුන් පත්කර තිබුණු අතර ඇතැම් වැඩ බලන විදුහල්පති වරුන් වසර 13 කට අධික කාලයක සිට එම තනතුරේ රාජකාරි ඉටුකරමින් පැවතුණි. මාතලේ කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු 04 කට වැඩබලන අධ්‍යක්ෂවරුන් පත්කර තිබුණු අතර ඇතැම් නිලධාරින් වසර 18 කට වඩා කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරේ වැඩ බලමින් පැවතුණි. | පුරප්පාඩු පවතින විදුහල්පති තනතුරු සඳහා ස්ථිර විදුහල්පතිවරු පත් කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පුරප්පාඩු පවතින විදුහල්පති තනතුරු සඳහා ස්ථිර විදුහල්පතිවරු පත් කර නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ග) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, අවස්ථා 193 කට අදාළ වසර 5 සිට 10 දක්වා කාල පරාසයක් තුළ රු.19,375,312 ක, අවස්ථා 45 කට අදාළ වසර 10 ට වැඩි රු.3,495,427 ක වාහන අනතුරුවලින් සිදු වී තිබුණු අලාභ හානි සම්බන්ධයෙන් අයවිය යුතු මුදල් 2020 දෙසැම්බර් 31 දිනට ද පළාත් මුල්‍ය රීති 55.2.1 සහ 55.4 ප්‍රකාර අයකර ගැනීම හෝ විනයානුකූලව කටයුතු කිරීම හෝ සිදු කර නොතිබුණි. | වාහන අනතුරු සම්බන්ධයෙන් මුල්‍ය රීති ප්‍රකාර කටයුතු කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අලාභ හානි සම්බන්ධයෙන් අයකර ගත යුතු මුදල් අයකර නොමැත. |
| (ජ) 2020 දෙසැම්බර් 31 දිනට මහනුවර අධ්‍යාපන කලාපයේ පාසල් 35 ක අනුමත සංඛ්‍යාවට වඩා වැඩිපුර විදුහල්පති ශ්‍රේණිධාරීන් 61 දෙනෙකු සිටියදී එම කලාපයේ පාසල් 28 ක විදුහල්පති තනතුරේ වැඩබැලීමට ශ්‍රී ලංකා ගුරු සේවයේ I, II, III ශ්‍රේණියේ නිලධාරීන් පත්කර තිබුණි. | විදුහල්පති පුරප්පාඩු පවතින පාසල් සඳහා ස්ථිර පදනමින් විදුහල්පතිවරු පත්කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | විදුහල්පති පුරප්පාඩු පවතින පාසල් සඳහා ස්ථිර පදනමින් විදුහල්පතිවරු පත් කර නොමැත. |

10. **ශීර්ෂය 554 - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**

----------------------------------------------------------

| | | | |
|---|---|---|---|
| පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂයේ දී රු.460,000 ක පිරිවැයක් දරා කාර්යාලීය අවශ්‍යතා සඳහා සැකසූ පරිගණක මෘදුකාංගය හා | නිෂ්කාර්ය සම්පත් ඵලදායී ලෙස යොදා ගැනීමට කටයුතු කිරීම. | ඉදිරියේ දී අපේක්ෂිත පරිගණක මෘදුකාංගය භාවිත කිරීමට කටයුතු කරමින් සිටින බව වාර්තා කර ඇත. | මෘදුකාංගය භාවිතා කර නොමැති අතර ප්‍රයෝජනයට ගත හැකි ටැබ් |

| | | | |
|---|---|---|---|
| එය කාර්යක්ෂමව යෙදවීම වෙනුවෙන් 2018 වර්ෂයේදී මිලදී ගත් රු.1,347,500 ක ටැබ් යන්ත්‍ර 55 ක් ඵලදායී අයුරින් අරමුණුගත කාර්යයට යොදවා නොතිබුණි. | | | යන්ත්‍ර 15 ක් අභාවිතව පවතී. |

11. **ශීර්ෂය 555 - ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව**

**---------------------------------------------------------**

| | | | |
|---|---|---|---|
| මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ පිහිටුවා තිබුණු තත්ත්ව පාලන පර්යේෂණාගාරයට 2008 වර්ෂයේ මිලදීගෙන තිබුණු රු.2,702,500 ක තත්ත්ව පරීක්ෂණ උපකරණ 3 ක්, 2019 දෙසැම්බර් 31 දිනටත් කිසිදු පරීක්ෂණයකට යොදාගෙන නොතිබුණි. | උපකරණ ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. | පරීක්ෂණාගාරයේ නිලධාරින් පුහුණුව ලබා ගෙන ඇත. Direct Shear Test උපකරණය සඳහා ඉල්ලීම් ලැබුණ පසු පරීක්ෂණ කටයුතු කිරීමටත් Consolidation Test සහ Hardness Test සඳහා පරීක්ෂණ කටයුතු සිදු කරයි. | එක් උපකරණයක් අභාවිතව පවතී. |

12. **ශීර්ෂය 557 - මධ්‍යම පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**

**---------------------------------------------------------------------------**

| | | | |
|---|---|---|---|
| (අ) මධ්‍යම පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නව ගොඩනැගිල්ලේ බිම් මහලේ වර්ග අඩි 1,900 ක් හා පල්ලේකැලේ කෝප්මාට් වෙළඳසැල පිහිටි ගොඩනැගිල්ල, තක්සේරුවකින් තොරව 2013 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කුලියට ලබාදී තිබුණු අතර වර්ග අඩි 683 ක් ගිවිසුමක් හෝ කුලී අයකිරීමකින් තොරව ආයතන 3 ක් වෙත ලබාදී තිබුණි | රජයේ ගොඩනැගිලි කුලියට දීමේදී තක්සේරුවක් ලබාගෙන කුලී මුදලක් අයකිරීමට කටයුතු කළ යුතුය. | 2021 පෙබරවාරි මස සිට බලපැවැත්වෙන පරිදි ගිවිසුම්ගතව ඇත. කුලී මුදල් නිසි පරිදි අයවෙමින් පවතින බව දන්වා ඇත. | 2013 සිට 2021 ජනවාරි දක්වා කාල පරිච්ඡේදයට අදාළ හිඟ කුලී අය කර ගැනීමට කටයුතු කර නැත. |

| | | | |
|---|---|---|---|
| (ආ) සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව 2016 ජුනි 20 දින නුවරඑළිය මල් වවන්නන්ගේ ව්‍යවසාය සමිතියට ලබාදී තිබුණු රු.1,250,000 ක ණය මුදල් 2020 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | ණය මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | නුවරඑළිය මල් වවන්නන්ගේ ව්‍යවසාය සමිතිය වෙත නිකුත් කර ඇති 1,250,000 ක ණය මුදල එම සමිතිය තුළ පැවැති ද්‍රවශීලතා ගැටලුව හේතුවෙන් ණය වාරික අයකර ගැනිමක් සිදු නොකළද අයවියයුතු පොලිය අයකර ගැනිමට කටයුතු කර තිබේ. එසේ වුවද එම ණය වාරිකද අය කර ගැනිමට කටයුතු කරමින් පවතී. | ණය මුදල අයකර නැත. |
| (ඇ) මධ්‍යම පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන නිලධාරින්ට නිරාකරණය කිරීම සඳහා භාරදී තිබුණු රු.500,000 කට වැඩි තීරක ගැටළුවලින්, වසර 5 කට වැඩි කාලයක් පමාවූ රු.6,245,658 ක තීරක ගැටළු 3 ක්, වසර 3 ක් කල් පමාවූ රු.16,487,484 ක තීරක ගැටළු 4 ක්, වසර 2 ක් කල් පමාවූ රු.592,459 ක තීරක ගැටළුවක් සහ වසරක් කල් පමාවූ රු.52,892,056 ක තීරක ගැටළු 17 ක් 2020 දෙසැම්බර් 31 දිනට ද නිරාකරණය කර නොතිබුණි. | තීරක ගැටලු නොපමාව නිරාකරණය කළ යුතුය. | විසඳීම සඳහා දීර්ඝ කාලයක් ගත වන බවත් තීරක ගැටලු විසඳීම සඳහා නිලධාරින්ගේ හිඟයක් පවතින අතර ප්‍රධාන රාජකාරියට ප්‍රමුඛත්වය ලබා දෙමින් තීරක විභාග කටයුතු සිදු කරන බවත් දන්වා ඇත. | තීරක ගැටලු නිරාකරණය කර නොමැත. |

13. **ශීර්ෂය 560 - මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය ව්‍යාජ සහතිකපත් ඉදිරිපත් කර තිබූ අනියම් සෞඛ්‍ය කාර්ය සහායකයින් 07 දෙනෙකු බඳවාගෙන 2017 ජනවාරි සිට 2019 ජුනි දක්වා රු.2,457,000 ක වැටුප් ගෙවා තිබුණි. | ව්‍යාජ අධ්‍යාපන සහතික ඉදිරිපත් කළ සේවකයන් සම්බන්ධයෙන් අදාළ ක්‍රියාමාර්ග ගත යුතුය. | අනියම් පදනමින් ලබා ගත් සේවාව අවසන් කර ඇත. | ව්‍යාජ සහතිකයක් ඉදිරිපත් කළ සෞඛ්‍ය කාර්ය සේවකයින් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි. |
| (ආ) | පුහුණු කාර්ය මණ්ඩලයක් නොමැතිවීම, හදිසි ප්‍රතිකාර ඒකක ස්ථාපනය නොකිරීම, අවශ්‍ය අමතර උපකරණ සපයා නොතිබීම සහ හෙද කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පැවතීම යන හේතූන් නිසා ලෝක බැංකු සංවර්ධන ව්‍යාපෘතිය යටතේ 2015 සහ 2016 වර්ෂවලදී උඩුවෙල, මොරගහ, දෙල්තොට, දොළොස්බාගේ රෝහල්වලට ලබාදී තිබුණු එකතු වටිනාකම රු.3,916,000 ක හෘදරෝගීන්ගේ හෘද ස්පන්ධනය පරීක්ෂා කිරීම, උත්තේජනය කිරීම හා නැවත යථා තත්ත්වයට පත් කිරීම සඳහා යොදා ගනු ලබන යන්ත්‍ර (Defibrillator) 04 ක් 2020 දෙසැම්බර් වන විටද භාවිතයට ගෙන නොතිබුණි. | අදාළ යන්ත්‍ර භාවිතයට ගත යුතුය. | නව හෙද කාර්ය මණ්ඩලයක් යෙදවීමට, බැටරි අක්‍රීයව ඇති එම වෛද්‍ය උපකරණ ඵලදායී ලෙස භාවිතා කිරීමට අවශ්‍ය අමතර උපාංග හා කොටස් යොදවා එම යන්ත්‍ර යථා තත්ත්වයට පත් කිරීමට සහ හදිසි ප්‍රතිකාර ඒකක සඳහා ගොඩනැගිලි බොහෝමයක් මේ වන විටත් ඉදිකරමින් පවතින බවද වෛද්‍ය නිලධාරින් හා හෙද නිලධාරින් සම්බන්ධ කර ගනිමින් මෙම යන්ත්‍ර භාවිතා කිරීම සම්බන්ධයෙන් පුහුණු සැසියක් ඉදිරියේදී පැවැත්වීමට කටයුතු කරන බවත් දන්වා ඇත. | යන්ත්‍ර භාවිතයට ගෙන නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2018 වර්ෂයේ මධ්‍යම රජයේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන රු.10,814,800 ක් වැයකර නාවලපිටිය දිස්ත්‍රික් රෝහල සඳහා 2019 වර්ෂයේ දී පෞද්ගලික ආයතනයකින් මිලදී ගෙන තිබුණු ශාරීරික අභ්‍යන්තර චලන ක්ෂනිකව පරීක්ෂා කර රූප ලබා ගැනීමේ යන්ත්‍රය (Mobile C-arm X-ray) සවිකිරීමට අදාළ යටිතල පහසුකම් නොමැතිවීම හා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ බලපත්‍ර නොලැබීම නිසා රෝගීන් සඳහා උපයෝජනයට ගත නොහැකිව 2021 පෙබරවාරි 25 වන විගණන දින වන විටද භාවිතයට ගෙන නොතිබුණි. | යන්ත්‍රය භාවිතයට ගත යුතුය. | නාවලපිටිය දිස්ත්‍රික් රෝහලේ යටිතල පහසුකම් නොතිබීම හේතුවෙන් යන්ත්‍රය තෙල්දෙණිය රෝහල වෙත ලබා දී තිබුණි. තෙල්දෙණිය රෝහලේ මෙම යන්ත්‍රය භාවිතයට නොගෙන නාවලපිටිය දිස්ත්‍රික් රෝහලේ ශල්‍යාගාර අලුත්වැඩියා කටයුතු වලින් පසු 2020 ජූලි 31 දින නැවත නාවලපිටිය දිස්ත්‍රික් රෝහලට භාර දී ඇත. මෙම යන්ත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා පරමාණු බල ශක්ති නියාමන සභාව 2021 පෙබරවාරි 24 වන දින අවසර ලබා දී ඇත. ඒ අනුව අදාළ යන්ත්‍රය ස්ථාපිත කිරීමට අවශ්‍ය මූලික කටයුතු මේ වන විට සපුරා ඇති බවත් අමතර උපකරණ ලබා දීමෙන් පසු කඩිනමින් රෝගීන්ගේ සේවය සඳහා ලබා දෙන බවත් දන්වා ඇත | යන්ත්‍රය භාවිතයට ගෙන නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2020 දෙසැම්බර් 31 දිනට පළාත් සෞඛ්‍ය සේවා කාර්යමණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ, තෘතියික, ද්විතියික සහ ප්‍රාථමික මට්ටම්වල පුරප්පාඩු 2509 ක් පැවතුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පුරප්පාඩු පුරවා නොමැත. |
| (ඉ) 2020 දෙසැම්බර් 31 දිනට පළාත් සෞඛ්‍ය සේවා කාර්යමණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ, ද්විතියික සහ ප්‍රාථමික මට්ටම්වල සහ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සේවකයන් 69 කු ඇතුළුව 87 ක සේවක අතිරික්තයක් පැවතුණි. | අතිරික්ත සේවකයන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අතිරික්ත සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

14. **ශීර්ෂය 561 - මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව**

-----------------------------------------------------------------------

| | | | |
|---|---|---|---|
| (අ) පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පැවති ජලභීතිකා මර්ධන කටයුතු 2018 අප්‍රේල් 01 දින සිට පළාත් සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට පවරා තිබුණු නමුත් සේවකයින් පවරාගෙන නොතිබුණි. ඒ අනුව මහනුවර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අනුයුක්තව සිටි පශු එන්නත් ක්ෂේත්‍ර සහකාරවරු 15 දෙනෙකුට එදින සිට රාජකාරි පැවරීමෙන් තොරව මාස 06 ක කාලයක් | මෙම නිලධාරීන්ට මාස 06 ක කාලයක් සඳහා රාජකාරී පැවරීමෙන් තොරව වැටුප් ගෙවූ නිලධාරින් සම්බන්ධයෙන් යම් පියවරක් ගත යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | රාජකාරි පැවරීමෙන් තොරව වැටුප් ගෙවීමට අදාළ වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| සඳහා රු.3,813,738 ක වැටුප් ගෙවා තිබුණි. | | | |
| (ආ) මහනුවර ප්‍රාදේශීය ඖෂධ ගබඩාවේ 2001 වර්ෂයේ ගබඩා සමීක්ෂණයේදී අනාවරණය වූ රු.1,217,482 ක ගබඩා ද්‍රව්‍ය ඌනතාවය සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති 54.6 යටතේ පරීක්ෂණයක් පවත්වා ගබඩා භාරකරු 2002 අප්‍රේල් 18 දින සිට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2.12 වගන්තිය යටතේ විශ්‍රාම ගන්වා වසර 15 ක් පමණ ගතවී ඇති නමුත් අදාළ ගබඩා ඌනතාවය රජයේ ගාස්තු ද සමඟ 2019 දෙසැම්බර් 31 දිනට ද අයකර ගෙන නොතිබුණි. | ගබඩා භාණ්ඩ ඌනතාවයට වගකිව යුතු පාර්ශව හඳුනාගෙන අවශ්‍ය කටයුතු කළ යුතුය. | කිසිදු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ඌනතාවය අයකර නැත. |
| (ඇ) 2020 දෙසැම්බර් 31 දිනට මාතලේ දිස්ත්‍රික් මහ රෝහලේ ඖෂධ ගබඩාවේ රු.5,641,122 ක කල් ඉකුත් වූ ඖෂධ තොග පැවතුණි. | කල් ඉකුත් වූ තොග අපහරණය කළ යුතුය. නිලධාරීන්ගේ නොසැලකිල්ලක් මත කල් ඉකුත් වූයේද යන්න පරීක්ෂා කර අදාළ ක්‍රියාමාර්ග ගත යුතුය. | කල් ඉකුත් ඖෂධ සම්බන්ධයෙන් තවදුරටත් කොළඹ වෛද්‍ය සැපයීම් අංශය වෙත දැනුම්දී ඉදිරි කටයුතු කරන බවත් රු.25,000 ට වඩා අඩු වටිනාකමැති ඖෂධ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් වෙත පැවරී ඇති බලතල පරිදි අපහරණය කිරීමටත් කටයුතු කරන බව දන්වා ඇත. | කල් ඉකුත් වූ තොග අපහරණය කර හෝ ඊට වගකිව යුතු නිලධාරින් වෙතොත් හඳුනාගෙන අදාළ පියවර ගෙන නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) දෙපාර්තමේන්තුවේ 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ සිදුව තිබූ වාහන අනතුරු 5 ක රු.571,824 ක අලාභ හානි සම්බන්ධයෙන් අදාළ වගකිවයුතු අයගෙන් හෝ එම අදාළ කාලය තුළ අයකර ගැනීම පැහැර හැරි නිලධාරීන්ගෙන් අලාභය අයකර ගැනීම සඳහා මධ්‍යම පළාත් සභා ගිණුම් කාරක සභාව ලබාදුන් නියෝග 2021 අප්‍රේල් 30 දිනට ද ක්‍රියාත්මක කර නොතිබුණි. | මධ්‍යම පළාත් සභා ගිණුම් කාරක සභාව ලබාදුන් නියෝග ක්‍රියාත්මක කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මධ්‍යම පළාත් සභා ගිණුම් කාරක සභාව ලබාදුන් නියෝග ක්‍රියාත්මක කර නැත. |
| (ඉ) 2020 දෙසැම්බර් 31 දිනට සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ අවස්ථා 100 කට අදාළව වසර 1 සිට වසර 18 ක දක්වා කාල පරාසය තුළ රු.31,283,271 ක වාහන අනතුරුවලින් සිදු වී තිබුණු අලාභ හානි සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති 55.2.1 සහ 55.4 ප්‍රකාර මුදල් අයකර ගැනීම හෝ විනයානුකූලව කටයුතු කිරීම හෝ සිදු කර නොතිබුණි. | වාහන අනතුරු වලින් සිදුවන හානි හා පාඩු අයකර ගැනීම සඳහා විනය කටයුතු කඩිනම් කළ යුතුය. | දීර්ඝ කාලය සිට නොවිසඳී පවත්වා වාහන ගැටලු නිරාකරණයට අදාළව මහනුවර, මාතලේ, නුවරඑළිය දිස්ත්‍රික්කවල අදාළ නිලධාරීන් කැඳවා 2021 මාර්තු 19 දින අයව දැනුවත් කර තිබුණි. | හානි හා පාඩු අයකර ගෙන නැත. |
| (ඊ) 2019 මැයි 9 දින මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් විසින් අදාළ වගකිව යුතු නිලධාරීන් 14 දෙනෙකුගෙන් අයකර ගැනීමට නිර්දේශ කර තිබුණු, | ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය අනුව මුදල් අයකරගත යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නිර්දේශය අනුව මුදල් අයකර ගෙන නැත. |

| | | | |
|---|---|---|---|
| මහනුවර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මඟින් සෞඛ්‍ය උපකරණ තීන්ත ආලේප කිරීම යනුවෙන් සාවද්‍ය ලෙස ගෙවා තිබුණු රු.3,114,905 ක මුදල 2021 අප්‍රේල් 30 දිනට ද අයකර නොතිබුණි. | | | |

15. **ශීර්ෂය 562 - ආයුර්වේද දෙපාර්තමේන්තුව**

| | | | |
|---|---|---|---|
| ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අංක බීඩී/ජීපීඑස්/130/9/14/එම්සී දරන 2016 ජනවාරි 06 දිනැති චක්‍රලේඛය අනුව ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් යතුරුපැදි ලබාගෙන වෙනත් තනතුරුවල රාජකාරි සඳහා ගොස් සිටි ගිය ක්ෂේත්‍ර නිලධාරීන් 19 දෙනෙකුගෙන් 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.2,617,180 ක් අයකර ගෙන නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීම. | යතුරුපැදි වටිනාකම නාවින්න ආයුර්වේද දෙපාර්තමේන්තුව මඟින් 2021 අප්‍රේල් සිට 2022 මාර්තු දක්වා නිලධාරින්ගේ වැටුපින් අයකර ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත බැර කිරීමට කටයුතු කරන බව දක්වා ඇත. | රු.2,617,180 ක මුදල ජාතික අයවැය දෙපාර්තමේන්තුවට බැර කර නොමැත. |

16. **ශීර්ෂය 570 - මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අමාත්‍යාංශය**

(අ) **මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරිය**

| | | | |
|---|---|---|---|
| (i) රාගල බස් නැවතුම්පල පවත්වාගෙන යනු ලබන ඉඩම මිලදී ගැනීම සඳහා රු. 6,668,311 ක මුදලක් 2018 ජනවාරි 09 දින ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ගෙවා තිබුණද ඉඩමේ | ඉඩමේ ඔප්පුව ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | කඩිනමින් ඔප්පුව ලබා දෙන බවට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව එකඟතාවය එල කර ඇත. | ඉඩමේ අයිතිය සනාථ කෙරෙන ඔප්පුව ලබා ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ඔප්පුව ලබාගෙන නොතිබුණි. | | | |
| (ii) | 2020 දෙසැම්බර් 31 දිනට මාස 11 සිට අවුරුදු 08 මාස 09 දක්වා කාල පරාසයක් අයවීමට හිඟහිට තිබුණු කාඩකාමර 174 කට අදාළ රු. 6,884,131 ක බදු කුලී අයකර ගෙන නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව හිඟ කුලී අයකර ගත යුතුය. | ආදායම් නිසි වෙලාවට නොගෙවීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවට සියලුම කඩකාමර බදු කරුවන් වෙත ලිඛිතව දැනුම් දී ඇත.හිඟ ආදායම් කලට වේලාවට අයකර ගැනීම සඳහා නිලධාරියෙකු පත්කර ඇත. | ගිවිසුම් ප්‍රකාරව හිඟ කුලී අයකර නොමැත. |

(ආ) **මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය**

**---------------------------------------------**

| | | | | |
|---|---|---|---|---|
| (i) | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන චක්‍රලේඛයේ 8.3.2 (ආ) අනුව මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් හට ප්‍රසාද දීමනා ලබා ගැනීම සඳහා හිමිකමක් නොමැති වුවද සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට 2017 සහ 2018 වර්ෂවලට අදාළව ප්‍රසාද දීමනා ලෙස රු.725,000 ක් ගෙවා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග වාර්තා කර නැත. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල නොවන ලෙසට ගෙවා තිබුණු මුදල් අයකර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) කොන්ත්‍රාත්කරුවන් සමඟ ඉදිකිරීම් සම්බන්ධයෙන් එළඹ තිබුණු ගිවිසුම් වල කොන්දේසි අනුව, 2018 වර්ෂයේ ගිවිසුම්ගත කර්මාන්ත 56 ක් සම්බන්ධයෙන් අය කළ යුතු ප්‍රමාද ගාස්තු රු.1,797,310 ක් අයකර නොතිබුණි. | ප්‍රමාද ගාස්තු නිවැරදිව අයකරගත යුතුය. | ගිවිසුම් කාලයට ඇතුළත් සෙනසුරාදා, ඉරිදා හා පෝය දින ප්‍රමාද දින වශයෙන් ගණනය කර නොමැත. | අදාළ ප්‍රමාද ගාස්තු අය කර නොතිබුණි. |
| (iii) | 2020 වර්ෂයේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ කොන්ත්‍රාත් ඒකකය මඟින් ක්‍රියාත්මක කළ “ඩෝල මාර්ගය අක්කරමලේ තුන්වන පටුමග හා ග්‍රීන්වුඩ් පාසැල්මාවත” ඉදිකිරීමේ දී ඇස්තමේන්තුවේ සඳහන් මිලට ටෙන්ඩරය පිරිනමා තිබුණි. ඒ අනුව කර්මාන්තය සඳහා කිලෝ මීටර් 35 ක් දුරින් ප්‍රවාහනය කළ ගල්තාර (Asphalt) මෙට්‍රික් ටොන් 929 ට ඇස්තමේන්තුවේ | පරීක්ෂණයක් සිදුකර වගකිවයුතු පාර්ශවයන් සම්බන්ධයෙන් අදාළ විනය ක්‍රියාමාර්ග ගත යුතුය. වැඩිපුර ගෙවූ මුදල්ද ආපසු අයකරගත යුතුය. | කිසිදු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | වගකිවයුතු අය සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොමැති අතර වැඩිපුර ගෙවූ මුදල්ද ආපසු අයකර නොමැත. |

සඳහන් දුර ප්‍රමාණය වන කිලෝ මීටර් 70 සඳහාම ගෙවීම් කිරීම හේතුවෙන් වැඩිපුර කිලෝ මීටර් 35 ක් සඳහා කිලෝ මීටරයකට රු.44.64 බැගින් ප්‍රවාහනය කළ ගල්තාර (Asphalt) මෙට්‍රික් ටොන් 929 ක් වෙනුවෙන් රු.1,451,470 ක් පෞද්ගලික උප කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි.

17. **ශීර්ෂය 571 - මධ්‍යම පළාත් නිවාස දෙපාර්තමේන්තුව**

| | | | |
|---|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට, 1997 වසරේ සිට මධ්‍යම පළාත් නිවාස දෙපාර්තමේන්තුව විසින් ඍජුවමද, 1994 වසරේ සිට 1996 වසර දක්වා සහ 1999 වසර තුළ සීමා සහිත සණස සමිති මඟින් ද 1994 සිට 1999 දක්වා සමුපකාර සමිති මඟින් ද මධ්‍යම පළාත් නිවාස දෙපාර්තමේන්තුව නිවාස නොමැති පවුල් වෙත ලබා දී ඇති නිවාස ණය වලින් පිළිවෙලින් අයවීමට ඇති මුදල හා පොලිය රු.3,588,424 ක්, රු.1,082,548 ක් සහ රු.2,165,790 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ ණය මුදල් හා පොලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | පුද්ගලයින් වෙත ඍජු ණය ලබා දීම - 435 දෙනෙකුගෙන් ණය රු.1,993,192 ක් හා පොලිය රු.484,804 අයවිය යුතුව ඇත.<br>සමුපකාර සමිති හරහා ණය ලබා දීම - ප්‍රතිලාභීන් 268 දෙනෙකුගෙන් ණය රු.1,629,832 ක් හා පොලිය රු.289,386 ක මුදලක් අයවීමට ඇත.<br>සණස ණය දෙන සමිතිය මඟින් ණය ලබා දීම - ප්‍රතිලාභීන් 177 දෙනෙකුගෙන් ණය රු.1,024,111 ක් හා පොලිය රු.261,253 ක | හිඟ ණය අයකර නොමැත. |

| | | | |
|---|---|---|---|
| | | මුදලක් අයවීමට ඇත. ඉහත ණය අයකර ගැනීම සඳහා විවිධ පියවරයන් ගෙන ඇත. | |

18. **ශීර්ෂය 580 - මධ්‍යම පළාත් කර්මාන්ත අමාත්‍යාංශය**

---------------------------------------------------------

| | | | |
|---|---|---|---|
| පළාත් යෞවන කටයුතු, වනිතා කටයුතු, ග්‍රාමීය සංවර්ධන, සමුපකාර සංවර්ධන හා කර්මාන්ත අමාත්‍යාංශය 2016 වසරේ සිට 2019 දක්වා රු.45,581,286 ක මහන මැෂින් 1760 ක් මිලදී ගෙන ස්වයං රැකියා ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් මධ්‍යම පළාතේ කාන්තාවන් අතර බෙදාහැර තිබුණි. බෙදාදුන් එම මහන මැෂින් පිළිබඳ පසු විපරම් කටයුතු 2019 වර්ෂය වන තෙක් සිදු කර නොතිබුණු අතර අමාත්‍යාංශය විසින් 2020 වර්ෂයේ පසු විපරම් කටයුතු කරන ලද ප්‍රතිලාභීන් 864 කින් 302 ක්ම ස්වයං රැකියාවක් ලෙස ඇඳුම් මැසීමේ නොයෙදෙන බැවින් ව්‍යාපෘතියේ අරමුණ ඉටු වී නොතිබුණි. | ස්වයං රැකියා ව්‍යාපෘති සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ස්වයං රැකියා ව්‍යාපෘති සාර්ථක කර ගැනීමට පියවර ගෙන නොමැත. |

19. **ශීර්ෂය 584 - මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව**

-------------------------------------------------------------------

| | | | |
|---|---|---|---|
| 2019 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මධ්‍ය පළාතේ රජයේ කාන්තා සංවර්ධන මධ්‍යස්ථාන වලට ලබා දී තිබුණු මහන මැෂින් 31 ක් 2020 දෙසැම්බර් 31 දිනටත් අභාවිතව | අභාවිතව පවතින මැෂින් අලුත්වැඩියා කර භාවිතා කිරීමට හෝ අපහරණය කළ යුතුය. | මෙම මැෂින් ඉතා පැරණි තත්ත්වයේ මැෂින් වන අතර අලුත්වැඩියා කර භාවිතා කිරීමද අපහසු බැවින් කර්මාන්ත අමාත්‍යාංශය ලේකම් වෙත මධ්‍යස්ථාන වල අක්‍රිය | අපහරණය කටයුතු නිමා කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | පැවතුණි. | | තත්ත්වයේ පවතින මහන මැෂින් සම්බන්ධව තාක්ෂණික වාර්තාවක් ලබා ගැනීමට කමිටුවක් පත් කරන මෙන් දැනුම් දී ඇති අතර අදාළ කමිටු නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදුකරන බව වාර්තා කර ඇත. | |

20. **ශීර්ෂය 590 - මධ්‍යම පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | සභා ලේකම් කාර්යාලයට අයත් රු.5,000,000 වටිනා මෝටර් රථයක් සහ වටිනාකම සඳහන් නොවූ ජීප් රථයක්ද, කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් වටිනාකම සඳහන් නොවන වාහන 02 ක් ද ඇතුළුව වාහන 04 ක් 2019 දෙසැම්බර් 31 දිනට මාස 04 සිට වර්ෂ 4 ක් දක්වා නිෂ්කාර්යව පැවතුණි. | අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ චක්‍රලේඛ උපදෙස් පරිදි අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. | භාවිතයට ගත නොහැකි වාහන පිළිගත් ක්‍රමවේදය යටතේ ඉවත් කිරීමට හා අලුත්වැඩියා කළ හැකි වාහන අලුත්වැඩියා කිරීමට කටයුතු කරමින් පවතී. | නිෂ්කාර්යව පවතී. |
| (ආ) | වසර 4 කට හා වසර 11 ක කාලයකට පෙර අනතුරට ලක්වී තිබුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් වාහන 02 ක පරික්ෂණ කටයුතු 2019 වර්ෂය අවසාන වන විටත් අවසන්ව නොතිබූ අතර, දැල්පිටිය කෘෂිකර්ම උපදේශක කාර්යාලය, බෝවල සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය හා | පාඩු හා හානි සම්බන්ධයෙන් මධ්‍යම පළාත් මූල්‍ය රීති 54.3 අනුව අදාළ පරීක්ෂණ කාල ප්‍රමාදයකින් තොරව අවසන් කිරීමට කටයුතු කර එම වාර්තා අනුව අදාළ ක්‍රියාමාර්ග ගත යුතුය. | රු.95,000 ක මුදලක් අයකර ගෙන ඇත. | විවිධ අලාභ සම්බන්ධයෙන් රු.136,273.75 ක මුදලක් අයකර නොමැත. වාහන 02 හි අලාභ හානියද අයකර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | කුණ්ඩසාලේ පශු වෛද්‍ය කාර්යාලයේ එකතුව රු.1,332,257 ක විවිධ අලාභ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | | |
| (ඇ) | මධ්‍යම පළාත තුළ වතු ආශ්‍රිත මිරිදිය මත්ස්‍ය වගාව දියුණුකිරීමේ අරමුණින් 2017 වර්ෂයේදී ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ රු.4,479,184 ක මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනය කර පොකුණු 13 ක් ඉදිකර තිබුණි. විගණන දින වූ 2020 සැප්තැම්බර් 25 දින වනවිට ස්ථානගත කිරීමේ දෝෂ සහ එම පොකුණුවලට මත්ස්‍ය ඇඟිල්ලන් මුදා නොහැරීම හේතුවෙන් අදාළ ව්‍යාපෘතිය මුළුමනින්ම අසාර්ථක වී තිබුණි. රජයෙන් දරන ලද වියදම මුළුමනින්ම නිෂ්කාර්ය වී තිබුණු අතර ඉදිකිරීම් සිදුකිරීමට පූර්වයෙන් ඉඩමේ නෛතික අයිතිය රජයට පවරා ගැනීමට ද කටයුතු කර නොතිබුණි | ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. | පැවැති වාර්තා අනුව මෙම පොකුණු 13 මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීමට සැලැසුම් කර ඇති බවත් ප්‍රතිලාභීන් සාර්ථකව පවත්වා ගැනීමට දායක විය යුතු බව දැනුවත් කර ඇති බවත් දන්වා ඇත. | අඩුපාඩු නිවැරදි කර නොමැත. |

21. **ශීර්ෂය 591 - මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

| | | | |
|---|---|---|---|
| (අ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කුණ්ඩසාලේ රජයේ ගොවිපලට අයත් භූමියක් 1990 වසරේ සිට 2014 වසර දක්වා වසර 24 ක කාලයක් රාජ්‍ය දැව සංස්ථාව පරිහරණය කිරීම වෙනුවෙන් ලැබිය යුතු බදු කුලිය වන රු.13,200,000 ක් 2019 දෙසැම්බර් 31 දිනටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ බදු මුදල් අයකර ගත යුතුය. | අස්ගිරිය පිහිටි දැව ගබඩා භූමිය වෙනුවට ලබාදුන් විකල්ප ඉඩමක් බැවින් ඔහු ගෙවිය යුතුද යන්න ප්‍රාදේශීය ලේකම් ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් විමසා ඇත. උපදෙස් පරිදි සනාථ කිරීමට අවශ්‍ය අදාළ ලේඛන කඩිනමින් සපයන ලෙස රාජ්‍ය දැව සංස්ථාව වෙත ඉල්ලීමක් කර ඇත. | හිඟ බදු මුදල් අයකර නොමැත. |
| (ආ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් දේශීය ආහාර ප්‍රවර්ධන වැඩසටහන - 2016 යටතේ මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ, කිඹිස්ස සහ නාලන්ද කෘෂි උපදේශක කොට්ඨාශ තුළ හෙළ බොජුන්හල් 03 ක් ඉදිකිරීම සඳහා රු.11,866,202 වැය කර තිබුණු නමුත් අලෙවි කටයුතු සඳහා 2018 වර්ෂයේ සිට තෝරාගත් ව්‍යවසායකයින් සමඟ විධිමත් වූ ගිවිසුමකට එළඹ නොතිබීමෙන් ගාස්තුවක් අයකර ගැනීමට නොහැකිවී තිබුණි. | බාහිර පාර්ශවයන් වෙත රජයේ වත්කම් ලබාදීමේදී නීත්‍යානුකූලභාවය ක් තිබිය යුතු අතර රජයට වාසිදායක වන අයුරින් ආදායමක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | 2020 ජනවාරි 01 දින සිට හෙළ බොජුන් ව්‍යවසායිකාවන් සමඟ ගිවිසුම්ගතව ඇත. | 2018 හා 2019 වර්ෂ සඳහා ගාස්තු අයකර නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද පළතුරු ගම්මාන වැඩසටහනෙහි ප්‍රගතිය පරීක්ෂාවේදී කෘෂි උපදේශ කොට්ඨාශ 16 ක් වෙත ලබාදුන් රු.3,726,100 වටිනා පළතුරු පැළ 26625 කින් 2020 දෙසැම්බර් 31 දිනට අවසන් වනවිට සාර්ථකව පවත්වාගෙන ගොස් තිබුණු පැළ සංඛ්‍යාව 13970 ක් වූ අතර එම කාල පරිච්ඡේදය තුළදී ලබාදුන් පැළවලින් එකතු වටිනාකම රු.1,756,100 ක් වූ පැළ 12655 ක් එනම් සියයට 48 ක ප්‍රතිශතයක් හානි වී තිබුණි. | පරීක්ෂණයක් පවත්වා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | කිසිදු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අඩුපාඩුව සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොමැත. |

22. **ශීර්ෂය 592 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

| | | | |
|---|---|---|---|
| (අ) ප.මු.රී.378(2) ප්‍රකාරව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙනයනු ලබන ඖෂධ අත්තිකාරම් ගිණුම් කටයුත්තේ 2017 සහ 2018 වර්ෂවලට අදාළ රු.13,986,388 ක් වූ සමුච්චිත අතිරික්තය පළාත් සභා ආදායමට බැරකර නොතිබුණි. | මූල්‍ය රීති ප්‍රකාරව සම්මුචිත අතිරික්තය පළාත් සභා අරමුදලට බැරකළ යුතුය. | වර්ෂ අවසාන මුදල් ශේෂය භාණ්ඩාගාරය වෙත යොමු කළහොත් ඊළඟ වර්ෂයේ අත්තිකාරම් ගිණුම් කටයුතු පවත්වාගෙන යාමට අග්‍රිම ලබාදීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී නැත. 2020 වර්ෂයේ ලාභය භාණ්ඩාගාරය වෙත යවා ඇත. | අඩුපාඩුව නිවැරදි කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට හා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් වසර 10 කට අධික කාලයක සිට භාවිතයට නොගන්නා අත් ට්‍රැක්ටර් 2, ට්‍රැක්ටර් රථයක්, ත්‍රීරෝද රථයක් හා යතුරුපැදි 12 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | භාවිතයට නොගන්නා වත්කම් චක්‍රලේඛ අනුව අපහරණ කිරීමට කටයුතු කළ යුතුය. | ට්‍රැක්ටරය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට පවරා දීමටත්, යතුරු පැදිය හා ත්‍රීරෝද රථය වෙන්දේසි කිරීමටත් සහ අත්ට්‍රැක්ටර් දෙක ගල්පාලම ගොවිපලට ලබා දීමටත් කටයුතු කරන බව දන්වා ඇත. | අඩුපාඩුව නිවැරදි කර නොමැත. |

2018, 2019 සහ 2020 වර්ෂයන් සඳහා ත්‍රෛවාර්ෂික විගණකාධිපති වාර්තාව

-----------------------------------------------------------------------------------

**විගණිත ආයතනයේ නම : නැගෙනහිර පළාත් සභාව**

**මූල්‍ය ප්‍රකාශන මත විගණන මතය:**

2018 වර්ෂය සඳහා – තත්ත්වාගණනය කළ මතය

2019 වර්ෂය සඳහා – තත්ත්වාගණනය කළ මතය

2020 වර්ෂය සඳහා – තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශය | විගණිත ආයතනය මගින් ගන්නා ලද ක්‍රියාමාර්ග | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | ------------------------- | ----------------------- | ---------------------- | ------------------ |
| 01 | මුද්දර ගාස්තු වශයෙන් අඩු මුදලක් ගෙවීම සඳහා ඉඩම් හිමියන් තම ඉඩම් සඳහා අඩු වටිනාකමක් ප්‍රකාශ කර තිබුණු බව අනාවරණය විය. එබැවින් අඩු වටිනාකමක් තක්සේරු කරන ලද දේපළ සඳහා අවස්ථා 188 කදී රුපියල් මිලියන 5.25 ක දඩ මුදලක් සමඟ අතිරේක මුද්දර ගාස්තු පනවා තිබුණි. කෙසේ වෙතත්, හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුද්දර ගාස්තු දඩ මුදල් සහිතව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | හිඟ මුදල් එකතු කිරීමේ කටයුතු සිදුවෙමින් පවතී. | 2014 ජනවාරි 01 සිට 2022 ජනවාරි 31 දක්වා කාලය තුළ රුපියල් මිලියන 33.32 ක අතිරේක මුද්දර ගාස්තු අයකර ගෙන නොතිබුණි. |
| 02 | ඉඩම් වටිනාකම අඩුවෙන් තක්සේරු කිරීම හේතුවෙන් අතිරේක මුද්දර ගාස්තු ගණනය කිරීම සහ පැනවීම සඳහා 2012 සිට 2018 දක්වා කාලය තුළ නැගෙනහිර පළාතේ ලියාපදිංචි කර ඇති ඔප්පු හයදහස් විසිහයක් (6,026) පළාත් සභාවේ ආදායම් අංශය විසින් තක්සේරු කර නොතිබුණි. | ලියාපදිංචි ඉඩමේ සාධාරණ වටිනාකම තක්සේරු කිරීම සඳහා භාවිතා කළ යුතුය. | තක්සේරු කිරීම් කඩිනම් කරනු ලැබේ. | නැගෙනහිර පළාතේ ලියාපදිංචි කර ඇති මෙම ඉඩම්වල වටිනාකම තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 03 | නැගෙනහිර පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 09 ක් මගින් බදු දී ඇති රජයේ ඉඩම්වලට අදාළ රුපියල් මිලියන **328.89** ක බදු කුලිය නැගෙනහිර පළාත් සභාවේ ඉඩම් පරිපාලන දෙපාර්තමේන්තුව විසින් අයකර නොගෙන වසර **01** සිට වසර **04** දක්වා කාලසීමාවක් හිඟ මුදල් ලෙස දක්වා තිබුණි. | බදු කුලී හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. | මේ බදු කුලී අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | හිඟ මුදල් අයකරගෙන නොතිබුණි. |
| 04 | නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, නැගෙනහිර පළාත් සභාවේ විෂය පථය යටතට ගැනෙන ආයතන වල නිලධාරීන් සඳහා 2019 වර්ෂය තුළ කාර්යක්ෂමතා කඩඉම් විභාග 36 ක් පැවැත්විය යුතුවේ. කෙසේවෙතත්, 2019 වර්ෂය තුළ කාර්යක්ෂමතා කඩඉම් විභාග 10 ක් පවත්වා නොතිබුණි. | කාර්යක්ෂමතා කඩඉම් විභාග නියමිත වේලාවට පැවැත්වීමට කටයුතු කළ යුතුය. | 2019 සඳහා සැලසුම් කර තිබුණු කාර්යක්ෂමතා කඩඉම් විභාග 09ක් පවත්වා නොතිබුණද සැලසුම් කර නොතිබුණු කාර්යක්ෂමතා කඩඉම් විභාග 08 ක් සහ බඳවා ගැනීමේ විභාග 07 ක් පවත්වා ඇත | 2021 පෙබරවාරි වන විට කාර්යක්ෂමතා විභාග 36 ද ඇතුලත්ව විභාග 72 ක් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. |
| 05 | නැගෙනහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුව පිහිටුවා වසර 11 ක් ගතවී ඇතත්, නැගෙනහිර පළාතේ ක්‍රියාත්මක වන උකස් මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීමට හා වාර්ෂික බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ප්‍රඥප්තියක් බලාත්මක කර නොතිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස පළාත් සභාවේ ආදායමට සැලකිය යුතු මුදලක් අහිමි වී තිබුණි. | උකස් මධ්‍යස්ථාන සඳහා පළාත් ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුයි. | ප්‍රඥප්තියක් බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ප්‍රඥප්තියක් බලාත්මක නොකර උකස් මධ්‍යස්ථාන ක්‍රියාත්මක වෙමින් පැවතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 06 | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති එකතුව රුපියල් මිලියන 9,479.43 ක් වටිනා ඉඩම් සහ ඉඩම් වැඩිදියුණු කිරීම්, ගොඩනැගිලි සහ ව්‍යුහයන් ආදියට අදාළ හිමිකම් ඔප්පු, සමීක්ෂණ සැලැස්ම, තක්සේරු වාර්තා නොමැති වීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | අදාළ සාක්ෂි ලබාගැනීමට කටයුතු කළ යුතුයි. | සාක්ෂි එකතු කිරීමට කටයුතු කරනු ලබන බව වාර්තා කර ඇත. | සාක්ෂි ලබාදී නොතිබුණි. |
| 07 | 2014 සිට 2019 දක්වා වූ වර්ෂ සඳහා වාර්ෂික වාර්තා 2021 අගෝස්තු 30 වන දින වන විටත් නැගෙනහිර පළාත් සභාවේ සභාගත කර නොතිබුණි. | වාර්ෂික වාර්තාව සභාගත කිරීමට කටයුතු කළ යුතුය. | පළාත් සභාව නැවත පිහිටවූ පසු එම වාර්ෂික වාර්තා සභාගත කිරීමට පියවර ගනු ලබන බව වාර්තා කර ඇත | වාර්ෂික වාර්තා සභාගත කර නොතිබුණි. |
| 08 | නැගෙනහිර පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ට ප්‍රමාණවත් ඇප ලබා ගැනීමකින් තොරව රුපියල් මිලියන 4.6ක ණය ලබා දී වසර 10ක් ගත වුවද ඉන් රු. මිලියන 1.10ක් හිඟ මුදල් ලෙස පැවතුණි. | හිඟ ණය ශේෂ ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුය | මෙම කරුණ නීතිමය කටයුතු සඳහා මෙම පළාත් සභාවේ නීති අංශය වෙත යොමු කර තිබේ. | නීතිමය ක්‍රියාමාර්ගය අවසන් කර නොතිබුණි. |
| 09 | හිටපු මහ ඇමැතිතුමාගේ ලේකම්වරයාට අත්තිකාරම් වශයෙන් ගෙවූ රුපියල් මිලියන 2 න් රුපියල් මිලියන 1.12ක් අයකරගෙන නොතිබුණි. | හිඟ අත්තිකාරම් ආපසු අයකර ගැනීමට කටයුතු' කළ යුතුය | ප්‍රධාන නීති නිලධාරි වෙත ඉදිරිපත් කර ඇති අතර ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතී | අත්තිකාරම් අයකරගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 10 | වාණිජ අත්තිකාරම් ක්‍රියාකාරකම් යටතේ රුපියල් මිලියන 04 ක් වූ වෙළඳ ණය ගැතියන්ගේ හිඟ ශේෂ වසර 05 ක් පුරා අයකර නොගෙන හිඟ මුදල් ලෙස පැවතුණි. | ප්‍රමාදයකින් තොරව හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. | අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | හිඟ මුදල් ශේෂ අයකරගෙන නොතිබුණි. |
| 11 | පුනරාවර්තන ආදායම් ශීර්ෂ 14ක් යටතේ මුළු ආදායම රු.මිලියන **902** ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණද**,** 2020 වර්ෂය තුළ රු.මිලියන **331** ක් එකතු කර නොතිබුණි. | ඇස්තමේන්තුගත ආදායම වාර්ෂිකව එකතු කර ගැනීම සඳහා ආදායම් ඉන්වොයිසි කාලීනව නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ආදායම් කාලීනව රැස්කරගෙන නොතිබුණි. |
| 12 | නැගෙනහිර පළාත් සභාවේ දෙපාර්තමේන්තු 07කට අදාළව රුපියල් මිලියන 32.6ක රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් ශේෂ 2004 ඔක්තෝබර් 11 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 118 ප්‍රකාරව කටයුතු නොකර වසර 05කට වැඩි කාලයක සිට පියවා නොතිබුණි. | හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. | චක්‍රලේඛන උපදෙස් ප්‍රකාරව අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ශේෂ අයකරගෙන නොතිබුණි. |
| 13 | නැගෙනහිර පළාත් සැලසුම් ලේකම් කාර්යාලය විසින් කොන්ත්‍රාත් කරුවෙකුට රුපියල් මිලියන 194.5 ක එකඟ වූ කොන්ත්‍රාත්තු මිලකට ලබා දී ඇති සිව්මහල් කාර්යාල ගොඩනැගිලිවල ඉදිකිරීම් කටයුතු 2018 සැප්තැම්බර් 04 හෝ ඊට පෙර නිම කළ යුතු අතර ඒ සඳහා | මනා ඉදිකිරීම් අධීක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුයි. | ඉදිකිරීම් කටයුතු ප්‍රමාදවීම් වලක්වාලීමට පියවර ගෙන නොතිබුණි. | ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | 2021 ජුනි 29 දක්වා රුපියල් මිලියන 152.91 ක් ගෙවා තිබුණු අතර පසුගිය වසර 03 තුළ 07 වරක් කාලය දීර්ඝ කර තිබුණි. කෙසේ වෙතත් 2021 නොවැම්බර් 15 දින වන විටත් ඉදිකිරීම් වැඩ නිම කර නොතිබුණි. | | | |
| 14 | නැඟෙනහිර පළාතේ තිරසාර තුළිත සංවර්ධනයක් සඳහා කේන්ද්‍රස්ථානයක් පිළිබඳ දැක්ම සහිතව නැගෙනහිර පළාත් සභාවේ සැලසුම් ලේකම් කාර්යාලය පිහිටුවනු ලැබුවද, **2017** අංක **19** දරන තිරසාර සංවර්ධන පනතට අනුව නැගෙනහිර පළාත් සභාවේ ලේකම් කාර්යාල, අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු ඇතුළු ආයතන 40ක් විසින් වසර **03**කට වැඩි කාලයක් තුළ තිරසාර සංවර්ධන ඉලක්ක, සාක්ෂාත් කර ගත් ඉලක්කය, ඉලක්ක ලඟා කර ගැනීමේ ප්‍රගතිය වරින් වර සමාලෝචනය කර නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. | තිරසාර සංවර්ධන ඉලක්ක හඳුන්වා දීමට කටයුතු කළ යුතුයි. | තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන නොතිබුණි. |
| 15 | නැගෙනහිර පළාත් සභාවට අයත් අබලන් වාහන 340ක් නිසි නඩත්තුවක් හෝ අලුත් වැඩියාවක් නොකර වසර 01කට වඩා වැඩි කාලයක් විවිධ දෙපාර්තමේන්තුවලට අයත් විවිධ වාහන අංගනවල ගාල්කර තිබුණි. | වාහන අලුත්වැඩියා කර ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. | දෙපාර්තමේන්තු ප්‍රධානීන්, යාන්ත්‍රික ඉංජිනේරුවන්ගේ නිර්දේශය මත වාහනය අලුත්වැඩියා කිරීමට පියවර ගනු ලබන බව වාර්තා කර තිබුණි. | වාහන අක්‍රියව පැවතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 16 | අධ්‍යාපන කලාප 14ක පාසල්වල විදුහල්පතිවරුන් 293 දෙනෙකුගේ තනතුරු සියයට 04 සිට සියයට 63 දක්වා ප්‍රතිශතයකින් පුරප්පාඩු වී තිබුණු අතර අම්පාර දිස්ත්‍රික්කයේ අනෙකුත් අධ්‍යාපන කලාප 03 ක පාසල්වල විදුහල්පතිවරුන් 33ක අතිරික්තයක් තිබුණි | විදුහල්පතිවරුන් හිඟ පාසල් සඳහා විදුහල්පතිවරුන් පත් කිරීමට කටයුතු කළ යුතුයි. | විදුහල්පති හිඟ පාසල් සඳහා අතිරික්ත විදුහල්පතිවරුන් මාරු කිරීමට කටයුතු කරනු ලබන බව වාර්තා කර ඇත. | පුරප්පාඩු පිරවීමට හා අතිරික්ත කාර්ය මණ්ඩලය ඉවත් කිරීමට පියවර ගෙන නොතිබුණි. |
| 17 | අධ්‍යාපන කලාප 11 ක පාසල්වල සියයට 05 සිට සියයට 23 දක්වා ප්‍රතිශතයක් ලෙස ගුරුවරුන් 1,262 දෙනෙකුගේ තනතුරු පුරප්පාඩු වී තිබුණද අනෙකුත් අධ්‍යාපන කලාප 06 ක පාසල්වල ගුරුවරුන් 1,063ක් අතිරික්තයක් පැවතුණි. | ගුරුවරු පුරප්පාඩුව පවතින පාසල් සඳහා ගුරුවරුන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුයි. | ගුරුවරු පුරප්පාඩුව පවතින පාසල් සඳහා අතිරික්ත ගුරුවරු සංඛ්‍යාව මාරු කිරීමට කටයුතු කරනු ලැබේ. | ගුරුවරුන්ගේ පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. |
| 18 | 2016 අගෝස්තු 26 දිනැති අංක 04/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් සංශෝධිත ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5:4:1 උපවගන්තිය අනුව, නැගෙනහිර පළාත් සෞඛ්‍ය සේවා අමාත්‍යාංශයේ නිලධාරීන් 08 දෙනෙකුගෙන් වසර 01කට වඩා වැඩි කාලයක සිට රුපියල් මිලියන 1.47ක නිල නිවාස කුලිය අයකරගෙන නොතිබුණි. | ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන අනුව නිල නිවාස කුලිය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | සියලුම නිල නිවාස සඳහා කුලී ඇස්තමේන්තු දැනට තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන බව වාර්තා කර ඇත. | නිල නිවාස කුලිය අයකරගෙන නොතිබුණි. |
| 19 | රුපියල් මිලියන 5.55 ක්වූ එකතු කළ අගය මත බද්ද (VAT) සියයට 08 බැගින් ගෙවිය යුතු වුවද, නැගෙනහිර පළාතේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ | වැඩිපුර ගෙවූ එකතු කළ අගය මත බද්ද අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | වැඩිපුර ගෙවන ලද බදු මුදල් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | වැඩිපුර ගෙවන ලද බදු මුදල් අයකරගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | කාර්යාල තුනකින් එකතු කළ අගය මත බද්ධ ලෙස රුපියල් මිලියන 10.42 ක් සියයට 15ක ප්‍රතිශතයක් යටතේ ගෙවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2A වගන්තියට සහ 2019 නොවැම්බර් 29 දිනැති අංක 2151/52 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2005 අංක 06 දරන පනතට පටහැනිව, 2019 දෙසැම්බර් 01 සිට 2020 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ කොන්ත්‍රාත්කරුවන්ට රුපියල් මිලියන 4.87ක් වැඩිපුර ගෙවා තිබුණි. | | | |
| 20 | 2016 වසරේ සිට 2020 දක්වා කාලය තුළ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල 03ක් මගින් එකතුව රුපියල් මිලියන 2.94ක්වූ ජාතිය ගොඩනැගීමේ බද්ද 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත අනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය නොකර සැපයුම්කරුවන්ට ගෙවා තිබුණි. | බදු මුදල අයකරගෙන දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතුයි. | ගෙවූ සම්පූර්ණ මුදල සැපයුම්කරුවන්ගෙන් අයකර ගන්නා ලෙස අදාළ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්ට උපදෙස් ලබා දී ඇත. | බදු මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| 21 | නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් බස් පර්යන්ත වෙත බස්රථ ලඟාවීම හා පිටවීම පටිගත වන **(GPRS)** සහිතව විකුණුම් උපකරණ **(POS)** 13 ක් සහ ටිකට් රෝල් | ප්‍රමාදයකින් තොරව උපකරණ ක්‍රියාත්මක කිරීමට මෘදුකාංග පද්ධතියක් ස්ථාපනය කළ | දැන් පද්ධතිය පරීක්ෂණ කාලය යටතේ ක්‍රියා කරන බවත් පරීක්ෂණ කාලය සම්පූර්ණ කිරීමෙන් පසුව, මෘදුකාංගය නිවැරදිව ක්‍රියාත්මක වන්නේ නම් | උපකරණ ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | 2000 ක් 2015 ජුනි 08 දින රු. මිලියන **1.14** ක පිරිවැයකට මිලදී ගෙන තිබුණි. කෙසේ වෙතත්, මෙම උපකරණ ක්‍රියාත්මක කිරීමට විධිමත් මෘදුකාංග පද්ධතියක් නොමැති වීමෙන් අදාළ උපකරණ වසර 5කට වඩා වැඩි කාලයක් නිෂ්කාර්යව තිබුණි. | යුතුය. | උපකරණ භාවිතා කළ හැකි බවත් වාර්තා කර ඇත. | |
| 22 | නැගෙනහිර පළාත් නිවාස අධිකාරිය මගින් සකස් කර තිබුණු නිවාස සංවර්ධන සැලැස්ම (2015-2019) අනුව, 2015 සිට 2019 කාලය තුළ රු. මිලියන 14,525 ක ඇස්තමේන්තුගත පිරිවැයකින් නිවාස නොමැති පවුල් 29,700 කට නිවාස ඉදිකර දීමට අපේක්ෂා කර තිබුණද පළාත් සංවර්ධන ප්‍රදාන යටතේ ප්‍රතිලාභීන්ට නිවාස ආධාර ලබා දීම හැර මෙම කාලය තුළ කිසිදු නිවසක් ඉදිකර නොතිබුණි. | නිවාස සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුයි. | නිවාස නොමැති පවුල් සඳහා නිවාස ඉදිකිරීමට පියවර ගෙන නොතිබුණි. | 2020 වර්ෂයේදී ප්‍රතිලාභීන් පස් දෙනෙකුට පමණක් නිවාස ආධාර ලබා දී ඇත. |
| 23 | නැගෙනහිර පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/EPC/B/14/R/H හා 2014 ජුනි 20 දිනැති ලිපිය අනුව, පළාත් නිවාස අධිකාරිය, ඒකාබද්ධ අරමුදල මත යැපීම වෙනුවට ස්වයං අරමුදල් උත්පාදනය කිරීමේ කොන්දේසිය මත 2014 වර්ෂයේදී වැටුප් හා අනෙකුත් වියදම් සඳහා ඒකාබද්ධ අරමුදලෙන් අරමුදල් සපයා තිබුණි. කෙසේවෙතත්, අධිකාරිය | ස්වයං අරමුදල් උත්පාදනය කිරීමට කටයුතු කළ යුතුය | ප්‍රාග්ධනය සහ ශ්‍රමය නොමැතිකම නිසා ආදායම් උපයා ගැනීමට නොහැකි වී ඇති බව වාර්තා කර ඇත. | ස්වයං අරමුදල් උත්පාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | පිහිටුවා වසර 5ක් ගතවී ඇතත්, වියදම් දැරීම සඳහා අරමුදල් උත්පාදනයට කිසිදු ව්‍යාපාරික කටයුත්තක් ආරම්භ කිරීමට අධිකාරිය සමත් වී නොතිබුණි. | | | |
| 24 | නැගෙනහිර පළාත් සභාව විසින් සම්මත කරන ලද ප්‍රඥප්ති අනුව 2020 වර්ෂය තුළ ස්ථාපිත ව්‍යවස්ථාපිත ආයතන දෙකක් සඳහා නැගෙනහිර පළාත් නිවාස අධිකාරිය විසින් එම ආයතනවල කාර්ය මණ්ඩලයේ **21** දෙනෙකු සඳහා පෞද්ගලික පඩිනඩි වෙනුවෙන් රුපියල් මිලියන **7**ක් ගෙවා තිබුණද සේවකයින් බඳවා ගැනීමේ පරිපාටිය හෝ කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව වසර 04 සිට 07 දක්වා කාල පරාසයක් ගත වුවද අනුමත කර නොතිබුණි. | සේවක සංඛ්‍යාව සහ බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීමට ක්‍රියා කළ යුතුය. | අනුමැතිය සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත කිහිප වතාවක්ම ඉල්ලීම් ඉදිරිපත් කර තිබුණද එය ප්‍රතික්ෂේප වී තිබුණි. | බඳවා ගැනීම් පරිපාටිය සහ සේවක සංඛ්‍යාව අනුමත කර නොතිබුණි. |
| 25 | නැගෙනහිර පළාත් සභාව විසින් සම්මත කරන ලද ප්‍රඥප්ති අනුව පිහිටුවන ලද නැගෙනහිර පළාත් සංචාරක කාර්යාංශයේ ව්‍යවස්ථාපිත ආයතන 02 ක් සමාලෝචිත වර්ෂය තුළදී කාර්ය මණ්ඩලය 13 දෙනෙකු සඳහා පුද්ගල වැටුප් සඳහා රුපියල් මිලියන 4 ක් ගෙවා තිබුණද වසර 04 සිට 07 දක්වා කාලයක සිට බඳවා ගැනීමේ පරිපාටිය හෝ කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව අනුමත කර නොතිබුණි. | සේවක සංඛ්‍යාව සහ බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීමට ක්‍රියා කළ යුතුය. | එම අනුමැතිය සඳහා වන ඉල්ලීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත කිහිප වතාවක්ම යොමු කර තිබුණද එය දිගින් දිගටම ප්‍රතික්ෂේප වී තිබුණි. | බඳවා ගැනීමේ පරිපාටිය සහ සේවක සංඛ්‍යාව අනුමත කර නොතිබුණි. |

**විගණකාධිපති ත්‍රෛවාර්ෂික තත්ත්ව වාර්තාව (2018,2019,2020)**

විගණන අස්ථිත්‍යයේ නම :- උතුරු මැද පළාත් සභාව.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය :-

2018 - තත්ත්වා ගණනය කළ විගණන මතය.

2019 - තත්ත්වා ගණනය කළ විගණන මතය.

2020 - තත්ත්වා ගණනය කළ විගණන මතය.

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 01. | **ශීර්ෂය 600 - උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලය** | | | |
| | ජනාධිපති ලේකම්ගේ රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ 2018 ඔක්තෝබර් 12 දිනැති අංක PS/CSA/11-18 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය අනුව පළාත් ආණ්ඩුකාරවරයකු වෙත වෙන්කරනු ලබන උපරිම නිල වාහන සංඛ්‍යාව 02 ක් වන අතර, අවශ්‍ය වන්නේ නම් ආරක්ෂක කටයුතු වෙනුවෙන් එක් වාහනයක් ලබාදිය හැකි වුවත්, විගණන පරික්ෂණ දින වූ 2020 ඔක්තෝබර් 22 වන විට වාහන 05 ක් පරිහරණය කරමින් තිබුණි. | ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛ උපදෙස් පරිදි වාහන භාවිතා කළයුතුය. | චක්‍රලේඛ විධිවිධාන අනුව නිවැරදි කිරීම් කරන ලෙස ප්‍රධාන ලේකම්වරයා විසින් ආණ්ඩුකාර ලේකම්වරයාට දැනුම් දී ඇත. | නිවැරදි කිරීම් සිදුකර නැත |

02. **ශීර්ෂය 610 - උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍ය හා උතුරු මැද පළාත් නීතිය හා සාමය, මුදල් හා ක්‍රමසම්පාදන, පළාත් පාලන, ග්‍රාමීය යටිතල පහසුකම් හා විශේෂ ව්‍යාපෘති, සංචාරක අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ, ඉංජිනේරු ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

---

| | | | | |
|---|---|---|---|---|
| (අ) | පලුගස්දමන සමන්තිලක මහතාගේ නිවස අසල සිට සිංහපුර ප්‍රධාන මාර්ගය දක්වා වූ මාර්ගය අදියර 03 කින් කුට්ටිගල් අතුරා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.11,194,750 ක් ගෙවා තිබුණි.පළමු අදියරේදී ඉටුකළ වැඩවලට වඩා රු.45,672 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර තත්ත්ව පාලන ඒකකයේ නිලධාරීන් සමඟ විගණන නිලධාරීන් විසින් අදියර 03 න්ම ස්ථාන 03 කින් කුට්ටි ගල් 21 ක් ලබාගෙන පරීක්ෂා ලදී. ඉන් කුට්ටිගල් 11 කම දරා ගැනීමේ ශක්තිය 25 N/mm$^2$ ක් වූ ප්‍රමිත දරා ගැනීමේ ශක්තියට වඩා අඩුබව තත්ත්ව පාලන වාර්තාවලින් තහවුරු විය. | මෙම මුදල අයකළ යුතු අතර නියමිත ප්‍රමිතියෙන් යුතු ගල් යොදා නැවත ඉදිකළ යුතුය. | කිසිදු වැළැක්වීමේ ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | වැඩිපුර ගෙවා ඇති මුදල් ආපසු අයකර නැති අතර නියමිත ප්‍රමිතියෙන් යුතු කුට්ටි ගල් යොදා නැවත ඉදිකර නොතිබුණි. |
| (ආ) | උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් විශේෂ ව්‍යාපෘති යටතේ 2016 වර්ෂයේදී තඹුත්තේගම පුස්තකාල සේවා මණ්ඩල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.24,987,271 ක මුදලකට කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ගිවිසුම් ගතවී තිබුණ ද, | | | |

| | | | | |
|---|---|---|---|---|
| (i) | ගිවිසුම් ප්‍රකාරව 2017 පෙබරවාරි 22 දින අවසන් කළයුතු වූ ඉදිකිරීම් කටයුතු 2019 ජනවාරි 10 දින අවසන් කර තිබුණු නමුත් ගිවිසුම් ප්‍රකාරව අයකළ යුතු රු.2,498,727 ක ප්‍රමාද ගාස්තු අයකරගෙන නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව අයකළ යුතු රු.2,498,727 ක ප්‍රමාද ගාස්තු අයකරගත යුතු වේ. | වැළැක්වීමේ ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | ගාස්තු අයකර ගෙන නොතිබුණි. |
| (ii) | රු.25,204,783 ක් වැයකර ඉදිකර තිබුණු මෙම ගොඩනැගිල්ල 2020 ජූලි 15 දින වන විටත් විවෘත නොකර අවුරුද්දකට අධික කාලයක් නිෂ්ක්‍රීයව පැවතුණි. | 2020 සැප්තැම්බර් 30 දින වන විටත් විවෘතකර නොතිබුණු මෙම ගොඩනැගිල්ල කඩිනමින් විවෘත කළයුතු වේ. | 2022 මාර්තු මාසයේ දී විවෘත කිරීමට සැලසුම්කර ඇත. | වර්තමානයේ දී ද නිෂ්ක්‍රීයව පවතී. |
| (ඇ) | 2016 සහ 2017 වර්ෂවලදී “ළඟම පාසල හොඳම පාසල” ව්‍යාපෘතියේ ප්‍රතිපාදන යොදවා උතුරු මැද පළාතේ පාසල්වල ක්‍රියාත්මක කර තිබුණු ඉදිකිරීම් පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ. | | | |
| (i) | ගිවිසුම්ගත මුදල රු.21,946,785 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 02 ක් වෙනුවෙන් රු.9,066,775 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවා ඇති නමුත් ගිවිසුම් ප්‍රකාරව වැඩ අවසන් කර නොතිබුණු බව නියැදි විගණනයේදී අනාවරණය විය. එසේ වුවත් එකී අත්තිකාරම් අයකර ගැනීමට සහ ගිවිසුම් ප්‍රකාරව වැඩ නිමනොකළ කොන්ත්‍රාත්කරුවන් | ගිවිසුම් ප්‍රකාරව වැඩ අවසන් කර නොතිබුණු කොන්ත්‍රාත් වලට අදාළව ගෙවා තිබුණු අත්තිකාරම් අයකර ගැනීමට සහ ගිවිසුම් ප්‍රකාරව වැඩ නිමනොකළ කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් | කොන්ත්‍රාත්කරු විසින් සිදුකරන ලද වෙනත් කොන්ත්‍රාත්වලින් අත්තිකාරම් මුදල් අයකරගෙන ඇත. | ගිවිසුම් ප්‍රකාරව වැඩ නිම නොකළ කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් නීතිමය කටයුතු සිදුකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සම්බන්ධයෙන් නීතිමය කටයුතු සිදුකර නොතිබුණි. | නීතිමය කටයුතු සිදුකළ යුතුවේ. | | |
| (ii) | ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකම රු.1,707,275 ක් වූ උප ව්‍යාපෘතියක් අනුමත සමිතියකට ප්‍රදානය කිරීමේදී එකී ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා රු.292,725 කින් වැඩි වටිනාකමකට ගිවිසුම් අත්සන් කර තිබුණි. | අනුමත සමිතිවලට කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ වටිනාකම ඉංජිනේරු ඇස්තමේන්තුව නොඉක්ම විය යුතුවේ. එම නිසා ඉංජිනේරු ඇස්තමේන්තුව ඉක්ම වූ රු.292,725 ක මුදල අදාළ නිලධාරීන්ගෙන් හෝ කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගතයුතුය. | වැළැක්වීමේ ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | ඉංජිනේරු ඇස්තමේන්තුව ඉක්ම වූ රු.292,725 ක මුදල අදාළ නිලධාරීන්ගෙන් හෝ කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගෙන නොතිබුණි. |
| (ඇ) | ඉදිකිරීම සඳහා නිශ්චිත ස්ථානයක් හඳුනා නොගෙන මුල් ළමාවිය සංවර්ධන අධිකාරියේ පරිපාලන සම්පත් මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.24,267,211 ක මුදලකට ප්‍රධාන අමාත්‍යාංශය 2017 ජූලි 31 දින ගිවිසුම් අත්සන් කර තිබුණි. පසුව අනුරාධපුර මහනගර සභා බල ප්‍රදේශයේ භූමියක ඉදිකිරීම් ආරම්භ කර ඇතත් සංවර්ධන බලපත්‍රය ලබාගැනීමට කටයුතු නොකිරීම සහ එකඟතාවය | නිශ්චිත ස්ථානයක් හඳුනාගැනීමෙන් පසුව ව්‍යාපෘතිය සැලසුම් කිරීම, ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙල කිරීම හා ලංසු ලියවිලි සකස් කිරීම යනාදිය සිදුකළ යුතුවේ. | නාගරික කොමසාරිස් සහ නගරාධිපති සමඟ සාකච්ඡාකර එහි ප්‍රගතිය ඉදිරියේ දි වාර්තා කරන බව දක්වා ඇත. | ඉදිකිරීම සඳහා නිශ්චිත ස්ථානයක් හඳුනා නොගෙන ව්‍යාපෘතිය සැලසුම් කිරීම, ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙල කිරීම හා ලංසු ලියවිලි සකස් කිරීම යනාදිය සිදුකර |

| | | | | |
|---|---|---|---|---|
| | ලබාදුන් පරිදි ගොඩනැගිල්ල ඉදිකිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතියෙහි වැඩ අතරමඟ නවතා දමා තිබුණු අතර ව්‍යාපෘතිය සඳහා ගෙවා ඇති රු.2,079,562 ක මුදල නිෂ්ඵල වියදමක් වී තිබුණි. | | | තිබුණු නිලධාරීන්ගෙන් ව්‍යාපෘතිය සඳහා ගෙවා ඇති රු.2,079,562 ක මුදල අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. |
| (ඉ) | 2020 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශයට අදාළව පියවා නොතිබුණු රු.26,405,861 ක අග්‍රිම ශේෂයක් වර්ෂ 10 කට අධික කාලයක සිට පැවත එමින් තිබුණි. | පළාත් මූල්‍ය රීති 259.2 හා 259.3 ප්‍රකාරව දෙසැම්බර් 31 දිනට ඉතිරි වූ අග්‍රිම ශේෂයන් ආපසු පියවිය යුතුය. | වැළැක්වීමේ ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | වර්තමානයේ දී ද අග්‍රිම ශේෂය එලෙසම පවතී. |
| (ඊ) | උතුරු මැද පළාතේ සංචාරක ව්‍යාපාරයේ ප්‍රවර්ධනය උදෙසා තාක්ෂණික ප්‍රමිතියෙන් යුතු වාර්තාමය වීඩියෝ වැඩ සටහනක් සකස් කිරීම, ආකර්ෂණීය පින්තූර සහිත ප්‍රමිතියෙන් යුතු පොතක් නිර්මාණය කිරීම සහ විධිමත් තොරතුරු සහිත වෙබ් අඩවියක් නිර්මාණය කිරීම වෙනුවෙන් ප්‍රධාන ලේකම් විසින් පෞද්ගලික සැපයුම්කරුවෙකු සමඟ රු.15,797,500 ක මුදලකට 2016 මාර්තු 23 දින ගිවිසුම් ගතවී තිබුණි. ගිවිසුම්ගත මුදලින් රු.12,144,500 ක් 2016 දෙසැම්බර් 26 දින වන විට ගෙවා තිබුණු නමුත් 2021 මැයි 10 දින | නීතිමය කටයුතු කඩිනම් කිරීම, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ උල්ලංඝනය පිළිබඳව අභ්‍යන්තර පරීක්ෂණයක් පැවැත්වීම සහ මෙවැනි අඩුපාඩු නැවත ඇති නොවීමට විධිවිධාන යෙදීම කළයුතුය. | අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කර ඇත. | සැපයුම්කරු විසින් මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කර උතුරු මැද පළාත් සභාව වෙත භාරදී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | වන විටද සැපයුම්කරු විසින් මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කර උතුරු මැද පළාතේ සංචාරක ව්‍යාපාරයේ ප්‍රවර්ධනය උදෙසා යොදා ගැනීමට හැකිවන ලෙස පළාත් සභාව වෙත භාරදී නොතිබුණි. | | | |
| (උ) | අලුත්වැව කුමාර මහ විද්‍යාලයේ විදුහල්පති නිල නිවාසය හා තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම සහ සුළු හා විශාල අලුත්වැඩියා කටයුතු සිදුකිරීම සඳහා රු.39,791,666 ක මුදලකට ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කොන්ත්‍රාත්කරුවකු සමඟ ගිවිසුම්ගත වී තිබුණි. ශක්‍යතා අධ්‍යනයකින් තොරව ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් සුළු හා විශාල අලුත්වැඩියාවන් සඳහා විචලන වැඩ යටතේ රු.3,876,335 ක මුදලක් හා ප්‍රධාන ඉදිකිරීම් සඳහා විචලන වැඩ යටතේ රු.10,926,181 ක මුදලක් ගෙවා ඇති අතර එකී මුදල් පිළිවෙලින් රු.6,521,836 ක් හා රු.33,269,830 ක් වූ මුළු ඇස්තමේන්තු වටිනාකම් වලින් පිළිවෙලින් සියයට 59 ක් හා සියයට 33 ක් විය. | ශක්‍යතා අධ්‍යයනයකින් සහ පාසලේ අවශ්‍යතාවය හඳුනාගෙන ගොඩනැගිලි සැලසුම් (plan) සකස්කර ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. මෙවැනි දුර්වලතා නැවත ඇති නොවීමට වගබලාගත යුතුය. | වර්තමානයේ දී විචලනයන් අවම වන පරිදී ප්‍රමාණ පත්‍ර සකස් කරනු ලැබේ. | තත්ත්වය එලෙසම පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | පුද්ගලයින් 4000 කට වැඩි පිරිසකට ආසන සැපයිය හැකි ශ්‍රවනාගාරයක අවශ්‍යතාවයක් නොමැතිව සහ ප්‍රතිපාදන නොමැතිව ප්‍රසම්පාදන කටයුතු සිදුකර පලුගස්දමන මහා විද්‍යාලයේ ශ්‍රවණාගාරය ඉදිකිරීම සඳහා රු.542,019,300 ක මුදලකට සැලසුම් පිළියෙල කර ඉදිකිරීම (Design and Build) සඳහා ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් විසින් 2017 අප්‍රේල් 05 දින කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ගිවිසුම්ගත වී තිබුණි. එසේම පළාත් මූල්‍ය රීති 418.2 හි විධිවිධානවලින් බැහැරවීමට ලබාගත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය පදනම් කරගෙන අදියර වශයෙන් ගිවිසුම්ගත වී ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබියදී සම්පූර්ණ ව්‍යාපෘතියම රු.542,019,300 ක මුදලකට ක්‍රියාත්මක කිරීමට ගිවිසුම්ගත වී තිබුණු අතර 2017 අප්‍රේල් 28 දින රු.100,000,000 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම්ද ගෙවා තිබුණි. එසේ වුවත් 2021 මැයි 07 දින වන විටද ඉදිකිරීම් අවසන්කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතියට අදාළව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් වාර්ෂික මුදල් ප්‍රකාශයට ඇතුළත්කර නැති නිසාත් මුදල් ප්‍රතිපාදන නොමැති නිසාත් වියදම් දැරීම සඳහා බලය දීමට කිසිදු බලධාරියෙකුට අවසරයක් නොමැති හෙයින් මේ පිළිබඳව පරීක්ෂණයක් සිදුකළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | ඉදිකිරීම් අවසන් කරවා ගැනීමට හෝ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් අයකර ගැනීමට හෝ කටයුතුකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ළ) | “ළහම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය” යටතේ නැගම මුස්ලිම් විද්‍යාලයේ බහුකාර්යය ගොඩනැඟිල්ල ඉදිකිරීමට අදාළ බිල්පත් අනුව කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු වටිනාකම රු.7,663,843 ක් වුවත් 2017 වර්ෂයේදී රු.9,695,499 ක් ගෙවා තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත්කරුට රු.2,031,656 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර එම වැඩිපුර ගෙවීම වෙනුවෙන් එකතු කළ අගය මත බද්ද රු.320,731 ක් ද ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් අයකරගත යුතුය. වගකිව යුතු අයට එරෙහිව පරීක්ෂණයක් සිදුකළ යුතුය. | වැඩිපුර ගෙවා ඇති මුදල ආපසු ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟ වී ඇත. | මේ වන තෙක් වැඩිපුර ගෙවා ඇති මුදල අයකර ගැනීම සහ වගකිවයුතු අයට එරෙහිව පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ළු) | “ළහම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය” යටතේ පලුගස්දමන මහා විද්‍යාලයේ ආපනශාලාව ඉදිකිරීම සඳහා 2017 අගෝස්තු 28 දින රු.10,298,211 ක් වූ (වැට් රහිත) මුදලකට ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ගිවිසුම් අත්සන් කර තිබුණු අතර 2017 අගෝස්තු 31 දින ගිවිසුම්ගත වටිනාකමින් සියයට 30 ක් වූ රු.3,089,463 ක මුදලක් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි. ගිවිසුම ප්‍රකාරව 2017 දෙසැම්බර් 28 වන දින ඉදිකිරීම් වැඩ සම්පූර්ණ කර භාරදිය යුතු වුවත් 2021මැයි10 දින වන විටද ගොඩනැඟිල්ලෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමටද | කොන්ත්‍රාත්කරු අසාධු ලේඛනගත කර ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු වෙත කොන්ත්‍රාත්තුව පිරිනැමිය යුතුය. | කොන්ත්‍රාත්කරු විසින් සිදුකරන ලද වෙනත් කොන්ත්‍රාත්වලින් අත්තිකාරම් මුදල් අයකරගෙන ඇත. | මෙම කොන්ත්‍රාත්කරු අසාධු ලේඛනගත කිරීමට සහ වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා ගොඩනැඟිල්ලෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට කටයුතුකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | කටයුතුකර නොතිබුණි. එසේ වුවත් අත්තිකාරම් බැදුම්කරය මුදල් කරගෙන වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල අයකරගෙන නොතිබුණු අතර වර්ෂ 03 කට ආසන්න කාලයක් ඉකුත්වීමෙන් පසුව කොන්ත්‍රාත්කරු විසින් ඉටුකළ වෙනත් කොන්ත්‍රාත් සඳහා ගෙවීමට තිබුණු මුදල් වලින් එකී අත්තිකාරම් මුදල හිලව් කරගෙන තිබුණි. | | | |
| (ඔ) | “ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය” යටතේ නල්ලච්චිය ප්‍රාථමික විදුහලෙහි ගොඩනැගිලි 04 ක් අලුත්වැඩියා කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකු සමඟ රු.4,943,744 ක වටිනාකමකට 2017 වර්ෂයේදී ගිවිසුම් අත්සන් කර තිබුණු නමුත් ගුරු නිවාසයයේ හා තවත් එක් ගොඩනැගිල්ලක අලුත්වැඩියා කිරීම ආරම්භ කර අතර මඟ නවතා දමා තිබුණි. එම ගොඩනැගිලි 02 හි අලුත්වැඩියා කටයුතු 2021 මැයි 10 දින වන විටත් නැවත ආරම්භකර නොතිබුණි. එසේ වුවත් එකී කොන්ත්‍රාත්කරුට එරෙහිව ගිවිසුම් ප්‍රකාරව කිසිඳු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ඉදිරිකිරීම් ප්‍රමාදය වෙනුවෙන් ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකිරීමට කටයුතු කළයුතුය. | මේ වන විට සියයට 75 ක ප්‍රගතියක් අත්කරගෙන ඇත. | 2022 ජනවාරි 31 දින වන විටත් ඉදිකිරීම අවසන්කර නොතිබුණු අතර ප්‍රමාද ගාස්තු අයකිරීමට ද කටයුතුකර නොතිබුණි |

| | | | | |
|---|---|---|---|---|
| (ඕ) | ප්‍රධාන අමාත්‍යාංශය විසින් 2017 සහ 2018 යන වර්ෂවලදී අ/කැකිරාව තිරප්පනේ මහානාම විද්‍යාලයේ රු.11,840,935ක වියදමක් දරා ඉදිකර තිබුණු ආපන ශාලාව හා රු.8,700,703ක වියදමක් දරා ඉදිකර තිබුණු ගුරු නේවාසිකාගාරය සම්බන්ධයෙන් 2021 අප්‍රේල් 07 දින සිදුකළ ස්ථානීය පරීක්ෂාවේදී, පහත කරුණු අනාවරණය විය. | | | |
| (i) | ආපන ශාලාව ඉදිකිරීමට අදාළ ගිවිසුම්ගත ඇස්තමේන්තුවේ වටිනාකම රු.2,774,170 ක වැඩ අයිතම 32ක් සම්පූර්ණ නොකර ඒ වෙනුවට උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්වරයා අනුමත නොකළ අතිරේක වැඩ යටතේ අයිතම 13 ක් සඳහා එකතුව රු.5,538,503 ක මුදලක් ගෙවා තිබුණි. ඒ අනුව ආපන ශාලාව ඉදිකිරීම සඳහා වූ ගිවිසුම්ගත ඇස්තමේන්තුගත මුදලට වඩා එකතුව රු.2,515,767ක් වැඩිපුර ගෙවා තිබුණු අතර එය මුල් ඇස්තමේන්තුවට වඩා සියයට 27ක වැඩිවීමක් විය. | අනුමත නොකරන ලද අතිරේක වැඩ ඉටුකළ සහ ඒ සඳහා ගෙවීම්කළ නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතුය. | දැනට ඇති අඩුපාඩු සම්පූර්ණකර කඩිනමින් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම්වරයා විසින් ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දන්වා ඇත. | අදාළ නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 2016 දෙසැම්බර් 02 දින ගුරු නේවාසිකාගාරය ඉදිකිරීමේ කාර්යය සඳහා ප්‍රධාන අමාත්‍යාංශය විසින් ගිවිසුම් ගතවී තිබුණු රු.12,180,508 ක ඇස්තමේන්තුවෙන් සියයට 32 ක්වූ එකතුව රු.3,922,999 ක වැඩ අයිතම 46 ක් අතහැර දමා ඉදිකිරීම අවසන් කර තිබුණි. | අවශ්‍ය වැඩ කොටස් හඳුනා නොගෙන එකතුව රු.3,922,999 ක් වූ වැඩ අයිතම 46 ක් ඇස්තමේන්තුවට ඇතුළත් කිරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්විය යුතුය. | ඉටුකර නැති වැඩ අයිතමයන් කොන්ත්‍රාත්කරු මගින් ඉටුකර ගන්නා ලෙස ප්‍රධාන ලේකම්වරයා විසින් ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දන්වා ඇත. | අවශ්‍ය නොවන එකතුව රු.3,922,999 ක් වූ වැඩ අයිතම 46 ක් ඇස්තමේන්තුවට ඇතුළත් කිරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා නොතිබුණු අතර අතහැර දමා ඇති වැඩ අයිතමයන් මෙතෙක් නිමකර නැත. |
| (ක) | ප්‍රධාන අමාත්‍යාංශය විසින් රු.13,790,629 ක වියදමක් දරා ඉදිකර තිබුණු අ/කැකිරාව තිරප්පනේ මහානාම විද්‍යාලයේ ක්‍රීඩාපිටිය වටා කාණු පද්ධතිය සම්බන්ධයෙන් සිදුකළ විගණනයේ දී පහත කරුණු අනාවරණය විය. | | | |
| (i) | ඇස්තමේන්තුවේ 2.1 හා 2.2 අයිතම යටතේ භාවිත කරන ලද කොන්ක්‍රීට් ප්‍රමාණය පිළිවෙළින් සියයට 92 කින් හා සියයට 30 කින් වැඩිවීම හේතුවෙන් ක්‍රීඩාපිටිය වටා කාණු පද්ධතිය ඉදිකිරීම සඳහා ගිවිසුම්ගත වූ රු.11,977,650 ක වටිනාකම | අඩුපාඩු සහිතව ඇස්තමේන්තු සකස් කළ, අනුමත නොකරන ලද අතිරේක වැඩ කරවාගත් සහ ඒ සඳහා ගෙවීම්කළ නිලධාරීන්ට | කඩිනමින් ඇස්තමේන්තු පිළියෙල කිරීම නිසා අඩුපාඩු සිදුවී ඇත. ඉදිරියේ දී මෙවැනි අඩුපාඩු ඇති නොවන ලෙස කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම්වරයා විසින් ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දන්වා ඇත. | අදාළ නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතුකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සියයට 15 කින් ඉක්මවා තිබුණද අතිරේක වැඩ සඳහා උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබානොගෙන ඒ සඳහා ගෙවීම් කර තිබුණි. | එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතුය. | | |
| (ii) | ක්‍රීඩාපිටියේ ඉහළ දකුණු පස එක් කෙළවරක ස්වාභාවිකව පිහිටි කළුගල උඩට මතුව ඉතිරිවන පරිදි කළුගලට දෙපසින් පමණක් කාණු පද්ධතිය ඉදිකර තිබුණු අතර එම නිසා ක්‍රීඩා පිටියට ඉහළින් පිහිටි පුද්ගලික ඉඩම්වලින් ගලා එන ජලය ක්‍රීඩාපිටියට එකතු වී ක්‍රීඩාපිටියේ ඇතැම් ස්ථාන මඩ වගුරක්ව පැවතුණි. | ක්‍රීඩා පිටියට ඉහළින් පිහිටි පුද්ගලික ඉඩම්වලින් ගලා එන ජලය ක්‍රීඩාපිටියට එකතු නොවන ලෙස කාණු පද්ධතියේ අඩුපාඩු සම්පූර්ණ කළයුතුය. | ඉදිරියේ දී මෙම අඩුපාඩු සම්පූර්ණ කරනු ලබන බව වාර්තා කර ඇත. | මෙතෙක් අඩුපාඩු සම්පූර්ණ කර නැත. |
| (iii) | කාණු පද්ධතිය ඉදිකිරීමේදී Shuttering සඳහා රු.2,766,280 ක මුදලක් ගෙවා තිබුණු නමුත් කාණු පැති බැම්වල දෙපස විශාල පිපුරුම් හා පිටතට නෙරා තිබුණු කොන්ක්‍රීට් කොටස් දක්නට ලැබුණු අතර බැම්වල පතුලෙන් හා පිපුරුම් ස්ථානවලින් පිටත ජලය කාණුව තුළට කාන්දුවෙමින්ද පැවතුණි. | ගෙවීම් කිරීමට පෙර වැඩබිම් භාර ඉංජිනේරුගෙන් වාර්තාවක් ලබා ගතයුතු අතර අඩුපාඩු සම්පූර්ණ කළයුතුය. | ඉදිරියේ දී මෙම අඩුපාඩු සම්පූර්ණ කරනු ලබන බව වාර්තා කර ඇත. | මෙතෙක් අඩුපාඩු සම්පූර්ණ කර නැත. |
| (ග) | ලෝක බැංකු ව්‍යාපෘති ප්‍රතිපාදන යටතේ 2017 වර්ෂයේ දී රු.4,859,999 ක ගිවිසුම්ගත වටිනාකමක් මත ප්‍රධාන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කර තිබුණු අ/කැකිරාව තිරප්පනේ මහානාම විද්‍යාලයේ ක්‍රීඩාපිටිය | | | |

| | | | | |
|---|---|---|---|---|
| | වටා වැට හා ගේට්ටුව ඉදිකිරීම සම්බන්ධයෙන් 2021 අප්‍රේල් 07 දින සිදුකළ විගණනයේ දී පහත කරුණු අනාවරණය විය. | | | |
| (i) | ලංසුකරුවන් වෙත ප්‍රධාන අමාත්‍යාංශය විසින් නිකුත්කර තිබුණු ලංසු ලියවිලි එකිනෙකට වෙනස් වැඩ විෂයයන් සඳහා සකස් කර තිබුණු අතර එකී ලියවිලිවල සඳහන් තොරතුරු විස්තරාත්මකව ඇගයීමට ලක් නොකර ලංසු ලියවිලිවල එකතු වටිනාකම් පමණක් සැලකිල්ලට ගෙන අවම මිලගණන් ඉදිරිපත් කරන ලද ලංසුකරුට කොන්ත්‍රාත්තුව පිරිනැමීමට තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කර තිබුණි. | කිසියම් පාඩුවක් සිදුවූවහොත් එය තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන් වෙත පැවරිය යුතුය. තාක්ෂණික ඇගයීම් කමිටුවේ ක්‍රියාමාර්ගය පිළිබඳ පරීක්ෂණයක් කළ යුතුය. | ඉදිරියේ දී මෙවැනි අඩුපාඩු ඇති නොවන ලෙස කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම්වරයා විසින් ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දන්වා ඇත. | තාක්ෂණික ඇගයීම් කමිටුවේ ක්‍රියාමාර්ගය පිළිබඳ කිසිදු පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ii) | දැල් වැට ඉදිකිරීමේදී 1.52 m ක උසින් වූ Gauge 10 යේ දැල් (Chain link mesh) වර්ග මීටර් 826.2 ක් සඳහා, වර්ග මීටරයකට රු.767 බැගින් එකතුව රු.633,695ක මුදලක් ගෙවා තිබුණි. එසේ වුවත් අදාළ තාක්ෂණික නිලධාරීන් සමඟ විගණන නිලධාරීන් ලබාගත් තත්ත්ව පාලන සහතිකය අනුව ඒ සඳහා යොදා තිබුණු දැල Gauge 12 ප්‍රමාණයේ වූ බැවින් ඒ සඳහා රු.253,478 ක් වැඩිපුර ගෙවා තිබුණි. මෙම දැල ඇස්තමේන්තුගත ගුණත්වයෙන් යුක්ත නොවීම හේතුවෙන් | නියමිත ප්‍රමිතිය සහිත දැල් යොදා නැවත දැල් වැට ඉදිකළ යුතුය. | ඉදිරියේ දී මෙවැනි අඩුපාඩු ඇති නොවන ලෙස කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම්වරයා විසින් ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දන්වා ඇත. | නියමිත ප්‍රමිතිය සහිත දැල් යොදා නැවත දැල් වැට ඉදිකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | බොහෝ ස්ථානයන්හි දී එය විශාල ලෙස ඉරී හානි වී තිබුණි. | | | |
| (ජ) | අ/කැකිරාව තිරප්පනේ මහානාම විද්‍යාලයේ තෙමහල් ගොඩනැගිල්ලක් හා ප්‍රාථමික ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා රු.41,451,987 ක වටිනාකමකට කොන්ත්‍රාත්කරුවකු සමඟ 2017 මාර්තු 13 දින ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් විසින් ගිවිසුම්ගත වී තිබුණි. ඒ සම්බන්ධයෙන් 2021 අප්‍රේල් 07 දින සිදුකළ විගණනයේ දී පහත කරුණු අනාවරණය විය. | | | |
| (i) | ICTAD – SBD – 2007 දෙවන සංස්කරණයෙහි කොන්ත්‍රාත් සඳහා වන කොන්දේසි අංක 51 හි නියමයන් හා ඒ සම්බන්ධයෙන් වන නියමිත ක්‍රියාපටිපාටි අනුව වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවීම සඳහා අදාළ ව්‍යාපෘතිය අධීක්ෂණය භාර ඉංජිනේරු වෙතින් නිර්දේශ ලබා ගතයුතු වේ. එසේ වුවත් එකී නිර්දේශයක් ලබා නොගෙන කොන්ත්‍රාත්කරුට රු.14,508,196 ක (VAT සහිතව) වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවා තිබුණු අතර කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් භූමියේ බේස් වලවල් කිහිපයක් පමණක් කපා වැඩ අතහැර දමා තිබුණි. | අත්තිකාරම් මුදල් ගෙවූ නිලධාරීන්ට සහ ගිවිසුම් ප්‍රකාරව වැඩ නිම නොකළ කොන්ත්‍රාත්කරුට එරෙහිව නීතිමය පියවර ගත යුතුය. | මේ වන විට ඉංජිනේරු අනුමැතිය මත පමණක් අත්තිකාරම් නිකුත් කිරීම සිදුකරනු ලැබේ. | අත්තිකාරම් මුදල් ගෙවූ නිලධාරීන්ට සහ ගිවිසුම් ප්‍රකාරව වැඩ නිම නොකළ කොන්ත්‍රාත්කරුට එරෙහිව නීතිමය පියවර ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | රු.12,435,596 ක අත්තිකාරම් ඇපකරය සහ රු.2,072,600 ක කාර්යසාධන ඇපකරය 2018 මාර්තු 31 දින දක්වා පමණක් වලංගුව පැවතුණු අතර ඒවායේ වලංගු කාලය අවසන්වීමට දින 58 කට පෙර කොන්ත්‍රාත්කරු වැඩ අතහැර දමා ඇති බව කැකිරාව ප්‍රාදේශීය ඉංජිනේරු විසින් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් වෙත දන්වා තිබුණද වගකිවයුතු නිලධාරින් යථෝක්ත ඇපකරවල වලංගු කාලය අවසන්වීමට පෙර ඒවා මුදල්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කොන්ත්‍රාත්කරු වැඩ අතහැර දමා ඇති බව දැනගත් වහාම අත්තිකාරම් ඇපකරය සහ කාර්යසාධන ඇපකරය මුදල් කර ගැනීමට කටයුතු නොකළ නිලධාරීන්ට එරෙහිව විනයාණුකූලව කටයුතු කළ යුතුය. | කොන්ත්‍රාත්කරු අසාදු ලේඛන ගතකර ඇති අතර අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව වෙතද පැමිණිලි කර ඇත. | අදාළ නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතුකර නොතිබුණි. |
| (iii) | මෙම තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් පාසලේ පැවති අඩි 80 x 20 ප්‍රමාණයේ පැරණි ගොඩනැගිල්ලක්ද කඩා ඉවත්කර තිබුණු බැවින් සිසුන්ගේ පන්ති කාමර අවශ්‍යතාවය සපුරාලීමට නොහැකි වී තිබුණි. | නව ගොඩනැගිල්ල ඉතා කඩිනමින් ඉදිකර සිසුන්ගේ පන්ති කාමර අවශ්‍යතාවය සපුරාලීමට ක්‍රියා කළ යුතුය. | පළාත් සභා අරමුදල් යොදවා මෙම ගොඩනැගිල්ලේ වැඩ අවසන් කිරීමට සැලසුම්කර ඇත. | නව ගොඩනැගිල්ල මෙතෙක් ඉදිකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ට) | “ළඟම පාසල හොඳම පාසල” වැඩසටහන යටතේ ප්‍රධාන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කළ අ/කැකිරාව තිරප්පනේ මහානාම විද්‍යාලයේ ක්‍රීඩා ප්‍රේක්ෂකාගාරය ඉදිකිරීම සඳහා රු.4,542,277 ක මුදලක් මත ගිවිසුම්ගත වී සිටි කොන්ත්‍රාත්කරු 2017 වර්ෂයේදී එහි වැඩ ආරම්භ කර තිබුණි. එකතුව රු.1,086,085 ක වටිනාකමින් යුතු වැඩ කොටසක් පමණක් නිමකර යථෝක්ත ව්‍යාපෘතිය අතහැර දමා තිබුණු අතර ඒ සඳහා ගෙවා තිබුණු රු.1,086,085 ක මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. එහිදී ඉටුනොකළ වැඩ සඳහාද රු.63,700 ක මුදලක් ගෙවා තිබුණි. | ව්‍යාපෘතිය අවිච්ඡේදකර වැඩ නිමකළ යුතු අතර ඉටු නොකළ වැඩ සඳහා ගෙවීම්කළ නිලධාරීන්ගෙන් එම මුදල අයකර ගත යුතුය. | අතිරේක ප්‍රතිපාදන සලසා ගන්නා තෙක් තිබුණු ප්‍රතිපාදන වලින් කොටසක් නිමකරන ලද බව වාර්තාකර ඇත. | ඉටු නොකළ වැඩ සඳහා ගෙවීම්කළ නිලධාරීන්ගෙන් එම මුදල අයකර ගෙන නොතිබුණි. |
| (ඩ) | අ/කැකිරාව තිරප්පනේ මහානාම විද්‍යාලයේ ක්‍රීඩාපිටිය සහිත භූමිය වැඩිදියුණු කිරීම සඳහා රු.5,061,771 ක වටිනාකමකට 2017 මැයි 15 දින කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් විසින් ගිවිසුම්ගත වී තිබුණි. ඒ සඳහා අවස්ථා 03 කදී එකතුව රු.7,124,767 ක මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණු අතර ඇස්තමේන්තුකළ පස් ප්‍රමාණයට අතිරේකව පස් කියුබ් 5770 ක් සපයා තිබුණි. | ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති නම් පළාත් මූල්‍ය රීති 46.1 ප්‍රකාරව ගිවිසුම්ගත නොවිය යුතු හෙයින් මෙයට වගකිවයුතු නිලධාරීන්ට සහ කොන්ත්‍රාත්කරුට එරෙහිව නීතිමය පියවර ගත යුතුය. | පස් කොටස් සඳහා පිඩලි ඇල්ලීම,ආරක්ෂිත වැටක් ඉදිකිරීම,කොන්ක්‍රීට් කාණු බැම් ඉස්සීම සහ කාණු ආවරණය කිරීමට යෝජනා කර ඇත. | වගකිවයුතු නිලධාරීන්ට සහ කොන්ත්‍රාත්කරු ට එරෙහිව නීතිමය පියවර ගෙන නොතිබුණු අතර පාසලේ දරුවන්ට ක්‍රීඩාකිරීමට සුදුසු පරිදි ක්‍රීඩාපිටිය සහිත භූමියේ කිසිඳු කටයුත්තක් |

| | | | | |
|---|---|---|---|---|
| | විගණිත දිනය වූ 2021 අප්‍රේල් 07 දින වන විටත් වැඩ නිම නොකර අත්හැර දමා තිබුණු අතර පාසලේ දරුවන්ට ක්‍රීඩාකිරීමට තිබුණු අවස්ථාවද වසර 05 කට වැඩි කාලයක් තිස්සේ අහිමි වී තිබුණි. එසේම මෙම ක්‍රීඩාපිටිය තැනීම සඳහා ගෙවා තිබුණු රු.7,124,769 ක මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | | | සිදුකර නොතිබුණි. |
| (න) | ළහම පාසල හොඳම පාසල ව්‍යාපෘති ප්‍රතිපාදන මත සිදුකළ ඉදිකිරීම් වෙනුවෙන් මැනුම්පත්, වැඩ අවසාන වාර්තාව හා බිල්පත් ගෙවීම් සාරාංශය ඇතුළු ලියකියවිලිවල මුල් පිටපත් මත එක් අවස්ථාවකදී සහ එකී ලියකියවිලිවල ඡායා පිටපත් මත තවත් අවස්ථාවකදී වශයෙන් ද්විත්ව ගෙවීම් සිදුකර තිබුණි. විගණන නියැදි පරීක්ෂණයේදි 2020 පෙබරවාරි 26 දින වනවිට ද්විත්ව ගෙවීම් මගින් වංචනිකව ලබාගෙන තිබුණු මුදල රු.8,608,290 ක් විය.මෙම සම්පූර්ණ මුදලම අයකර ඇති නමුත් ද්විත්ව ගෙවීම් සිදුකළ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියා මාර්ග ගැනීම අවසන්කර නොතිබුණි. | වංචනිකව ලබාගෙන තිබුණු රු.8,608,290 ක මුදල වහාම අයකරගත යුතු අතර වංචනික නිලධාරීන්ට එරෙහි විනය කටයුතු කඩිනම් කළයුතුය. | රු.8,608,290 ක මුදල අයකරගෙන ඇත. | වංචනික නිලධාරීන්ට චෝදනා පත්‍ර භාර දී නොතිබුණි. |
| (ත) | 2017 ජනවාරි 26 දිනැති අංක CSA/1/4 දරන ජනාධිපති ලේකම්ගේ ලිපියේ | | | |

| | | | | |
|---|---|---|---|---|
| (i) | 02 වන ඡේදය පරිදි විදේශගත වන කණ්ඩායමේ සංඛ්‍යාව 05 ට අඩු නම් භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගතයුතු වුවද, 2018 වර්ෂයේ ප්‍රධාන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයා ජපානයේ කළ සංචාරය සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | 2017 ජනවාරි 26 දිනැති අංක CSA/1/4 දරන ජනාධිපති ලේකම්ගේ ලිපියේ 02 වන ඡේදය ප්‍රකාරව සංචාරය සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතුය. | ආයතන සංග්‍රහයේ XV පරිච්ඡේදයේ විධිවිධාන ප්‍රකාරව ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබාගත් බව දක්වා ඇත. | භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ii) | ඉහත ලිපියේ 03 වන ඡේදය පරිදි විදේශගත වන කණ්ඩායමේ සංඛ්‍යාව 05 ට වැඩි නම් භාණ්ඩාගාරයේ අනුමැතිය, මෙන්ම ජනාධිපති කාර්යාලයේ අනුමැතියද ලබා ගතයුතු වුවද, 2017 වර්ෂයේ ප්‍රංශයේ සහ ජර්මනියේ කළ සංචාරය හා සිංගප්පූරුවේ කළ සංචාරයන් සඳහා නිලධාරීන් 06 දෙනෙකු බැගින් සහභාගි වී තිබුණු නමුත් එම සංචාර 02 සඳහා ප්‍රධාන අමාත්‍යාංශය විසින් ජනාධිපති කාර්යාලයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | 2017 ජනවාරි 26 දිනැති අංක CSA/1/4 දරන ජනාධිපති ලේකම්ගේ ලිපියේ 03 වන ඡේදය ප්‍රකාරව සංචාරය සඳහා භාණ්ඩාගාරයේ සහ ජනාධිපති කාර්යාලයේ අනුමැතිය ලබාගත යුතුය. | ආයතන සංග්‍රහයේ XV පරිච්ඡේදයේ විධිවිධාන ප්‍රකාරව ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබාගත් බව දක්වා ඇත | භාණ්ඩාගාරයේ සහ ජනාධිපති කාර්යාලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

03. **ශීර්ෂය 611 උතුරු මැද පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවට අදාළව පියවා නොතිබුණු රු.80,000 ක අග්‍රිම ශේෂයක් වර්ෂ 01 කට අධික කාලයක සිට පැවත එමින් තිබුණි. | පළාත් මූල්‍ය රීති 259.2 හා 259.3 ප්‍රකාරව දෙසැම්බර් 31 දිනට ඉතිරි වූ අග්‍රිම ශේෂයන් ඊළඟ වර්ෂයේ ජනවාරි 10 දිනට හෝ පළාත් භාණ්ඩාගාරය විසින් නියම කරනු ලබන දිනයක ආපසු නොපියවීම සම්බන්ධව පරීක්ෂණයක් සිදුකර නිසි පියවර ගත යුතුය. | මීට අදාළව පරීක්ෂණයක් සිදුකර වාර්තා කරන ලෙස පළාත් පාලන කොමසාරිස් වෙත උපදෙස් දී ඇත. | අග්‍රිම ශේෂය මෙතෙක් පියවා නොතිබුණි. |
| (ආ) | පළාත් පාලන දෙපාර්තමේන්තුවට අයත් වාහන 03 ක් 2019 සහ 2020 වර්ෂවලදී අවස්ථා 05 කදී අනතුරුවලට ලක්වීම නිසා එකතුව රු.2,498,180 ක අලාභයක් සිදුවී ඇති බවට ප්‍රාරම්භක පරීක්ෂණ වාර්තාවන්වල සඳහන් කර තිබුණු නමුත් උතුරු මැද පළාත් මූල්‍ය රීති 54.1.6 ප්‍රකාරව එම අනතුරුවලට වගකිවයුතු පුද්ගලයන් හඳුනාගෙන අලාභයන් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | අනතුරුවලට වගකිවයුතු පුද්ගලයන් හඳුනාගෙන උතුරු මැද පළාත් මූල්‍ය රීති 54.1.6 ප්‍රකාරව අලාභයන් අයකර ගැනීමට කටයුතු කළයුතුය. | අදාළ පරීක්ෂණ ප්‍රමාද වීමට හේතු පළාත් පාලන කොමසාරිස්ගෙන් විමසා ඇත. | උතුරු මැද පළාත් මූල්‍ය රීති 54.1.6 ප්‍රකාරව අලාභයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

04. **ශීර්ෂය 612 - උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | 2015 ජනවාරි 29 දිනැති අංක 5/2015 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 08 ඡේදය ප්‍රකාරව ගලෙන්බිඳුණුවැව මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් දෙමව්පියන්ගෙන් රු.645,000 ක මුදලක් එකතු කර තිබුණි. | චක්‍රලේඛයේ 08 ඡේදය අනුව දෙමව්පියන්ගෙන් මුදල් එකතු කළ නොහැක. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | දෙමව්පියන්ගෙන් මුදල් එකතු කිරීම සම්බන්ධයෙන් විදුහල්පතිවරයාට එරෙහිව කටයුතු කර නැත. |
| (ආ) | 2009 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුල ධාවනයෙන් ඉවත් කර ඇති වාහන 06 ක් සම්බන්ධයෙන් 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු නොකර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු භූමිය තුළ ස්වභාවික ආපදාවන්ට ලක්වන ආකාරයෙන් අනාරක්ෂිතව ගාල් කර තිබුණි. | 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වර්තමානයේ දී ද අභාවිතව පවතී. |
| (ඇ) | විශේෂ අධ්‍යාපන ඒකකයකට දරුවන් ඇතුළත් කර ගැනීම, 2001 මැයි 24 දිනැති අංක 1/වි.අ/2/84 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 01 ඡේදය ප්‍රකාරව ක්ෂේත්‍රය පිළිබඳ අවබෝධයක් ඇති තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මඟින් සිදු කළයුතු වේ. එසේ වුවත් උතුරුමැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව එම | විශේෂ අධ්‍යාපන ඒකකයකට දරුවන් ඇතුළත් කර ගැනීමේදී, චක්‍රලේඛයේ දක්වා ඇති නිලධාරීන් 03 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මඟින් විශේෂ අවශ්‍යතා සහිත දරුවන් හඳුනා | වෛද්‍ය වාර්තා පදනම් කරගෙන සිසුන් හඳුනා ගැනීම සිදු කෙරේ. | විශේෂ අවශ්‍යතා සහිත දරුවන් හඳුනා ගැනීම වර්තමානයේ දී ද චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පත්කළ කමිටුවක් මඟින් සිදු කරනු නොලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| | ක්‍රමවේදයෙන් බැහැරව කටයුතු කිරීම නිසා සාමාන්‍ය පන්ති කාමරයක අධ්‍යාපනය ලබා දිය යුතු කියවීමේ හා ලිවීමේ හැකියාව අවම මට්ටමක පවතින දරුවන්, පූර්ව ළමාවිය අධ්‍යාපනයක් ලබා නොමැති දරුවන්, ඉතා දිළිඳු පවුල්වල සාමාන්‍ය දරුවන් සහ පිරිසිදුකමින් හා පිළිවෙලින් අඩු දරුවන් බොහොමයක් විශේෂ අධ්‍යාපන ඒකකවලට යොමු කර තිබුණි. | ගැනීම කළයුතු වේ. | | |
| (ඇ) | 2012 නොවැම්බර් 23 දිනැති අංක 42/ 2012 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව අවම වශයෙන් විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ශිෂ්‍යයන් 05 කට එක් ගුරුවරයෙකු බැගින්වත් එම ක්ෂේත්‍රයෙහි පුහුණුව ලබා ඇති ගුරුවරුන් පත් කළ යුතු වේ. එසේ වුවත් උතුරු මැද පළාතේ එම ක්ෂේත්‍රයෙහි පුහුණුව ලැබූ ගුරුභවතුන් 29 දෙනෙකුගේ පුරප්පාඩු පැවතිය දී විශේෂ අධ්‍යාපන ඒකකයක ඉගැන්වීම සඳහා විධිමත් පුහුණුව ලබා ඇති ගුරුභවතුන් 20 දෙනෙකු උතුරු මැද පළාතේ පාසල්වල වෙනත් විෂයයන් ඉගැන්වීම සඳහා යොදවා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව අවම වශයෙන් ශිෂ්‍යයන් 05 කට එක් ගුරුවරයෙකු බැගින්වත් විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි පුහුණුව ලබා ඇති ගුරුවරුන් පත් කළ යුතු වේ. | නිවැරදි කිරීමට පියවර ගන්නා ලෙස කළාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ට උපදෙස් දී ඇත. | වර්තමානයේදීද තත්ත්වය එසේම පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | ගලෙන්බිඳුණුවැව අධ්‍යාපන කලාපයේ පාසල්වල පැවති නිල නිවාස 25 න් රජයේ නිවාස 22 ක් ගුරුවරුන්ට ලබා දීමට කටයුතු නොකිරීම නිසා නිෂ්ක්‍රීයව පැවතුණි. | 2020 සැප්තැම්බර් වන විටත් නිෂ්ක්‍රීයව පවතින මෙම රජයේ නිවාස 22 ක ගුරුවරුන්ට ලබා දීමට කටයුතු කළයුතු වේ. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වර්තමානයේදී ද නිෂ්ක්‍රීයව පවතී. |
| (ඊ) | ගලෙන්බිඳුණුවැව කලාප අධ්‍යාපන කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 03 ක පුරප්පාඩු 14 ක් සහ තනතුරු 02 ක අතිරික්තතා 06 ක් පැවතුණු අතර එකී කලාපයේ පාසල්වල තනතුරු 05 ක අතිරික්තතා 91 ක් සහ තනතුරු 04 ක පුරප්පාඩු 131 ක් පැවතුණි. | පුරප්පාඩු සඳහා සේවකයින් බඳවා ගැනීමට සහ අතිරික්ත සේවකයින් වෙනත් ස්ථානවලට මාරුකර යැවීමට කටයුතු කළයුතු වේ. | පුරප්පාඩු හා අතිරික්ත සම්බන්ධව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව දැණුවත් කර ඇත. | වර්තමානයේ දී කලාප අධ්‍යාපන කාර්යාලයේ තනතුරු 10 ක පුරප්පාඩු 26 ක් සහ තනතුරු 01 ක අතිරික්තතා 05 ක් ද පාසල්වල තනතුරු 03 ක අතිරික්තතා 72 ක් සහ තනතුරු 05 ක පුරප්පාඩු 253 ක් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ විෂයය අංක 61211 (කාර්යාල කාර්ය මණ්ඩලය) දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ 2020 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් සභාවේ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 46 දෙනෙකුට, අනෙකුත් පළාත් සභාවල පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 08 දෙනෙකුට, සේවය කරමින් සිට මියගොස් ඇති නිලධාරීන් 03 දෙනෙකුට, විශ්‍රාම ගොස් ඇති නිලධාරීන් 13 දෙනෙකුට, සේවය අතහැර ගිය නිලධාරියෙකුට සහ වැඩ තහනම් කළ නිලධාරියෙකුට අදාළ එකතුව රු.7,948,736 ක ණය ශේෂයක් මාස 03 ත් වර්ෂ 07 ත් අතර කාලයක් අයවීම හිඟහිට තිබුණි. එසේම උතුරු මැද පළාත් සභාවේ වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවලින් ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන් 08 දෙනෙකුට අදාළ රු.1,123,933 ක ණය ශේෂයක් පියවීමට කටයුතු නොකර මාස 03 ත් වර්ෂ 07 ත් අතර කාලයක් ගතවී තිබුණි. එසේ වුවත් එකී ණය ශේෂයන් ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 1:6, 1:7, 4:2:2, 4:2:4, 4:2:5, 4:5, 4:6 හා 6:3 | ආයතන සංග්‍රහයේ, 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ සහ 2019 ජුනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03(ඉ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ණය ශේෂයන් නිරවුල් කළයුතුය. | එකතුව රු.7,948,736 ක ණය ශේෂයෙන් රු.4,449,418 ක් අයවී ද එකතුව රු.1,123,933 ක ණය ශේෂය සම්පූර්ණයෙන්ම ද 2021.12.31 දින වන විට නිරවුල් වී ද ඇත. | 2020 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් සභාවේ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 46 දෙනෙකුට, අනෙකුත් පළාත් සභාවල පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 08 දෙනෙකුට, සේවය කරමින් සිට මියගොස් ඇති නිලධාරීන් 03 දෙනෙකුට, විශ්‍රාම ගොස් ඇති නිලධාරීන් 13 දෙනෙකුට, සේවය අතහැර ගිය නිලධාරියෙකුට සහ වැඩ තහනම් කළ නිලධාරියෙකුට අදාළ එකතුව රු.3,449,319 ක ණය |

| | | | | |
|---|---|---|---|---|
| | වගන්තිවල විධිවිධාන, 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.7 ඡේදයේ විධිවිධාන සහ 2019 ජූනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03(ඉ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | | | ශේෂයක් තව දුරටත් අයවීම හිඟහිට තිබුණි. |
| (ළු) | උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ විෂයය අංක 61201 (පාසල් කාර්ය මණ්ඩලය) දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ 2020 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් සභාවේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 101 දෙනෙකුට, අනෙකුත් පළාත් සභාවල පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 481 දෙනෙකුට, මධ්‍යම රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා හා මණ්ඩලවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 119 දෙනෙකුට සේවය කරමින් සිට මියගොස් ඇති නිලධාරීන් 19 දෙනෙකුට, විශ්‍රාම ගොස් ඇති නිලධාරීන් 180 දෙනෙකුට, වැඩ තහනම් කළ නිලධාරීන් 19 දෙනෙකුට, සේවය අතහැර ගිය නිලධාරීන් 18 දෙනෙකුට සහ විදේශගතවී ඇති | ආයතන සංග්‍රහයේ, 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ සහ අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03(ඉ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ණය ශේෂයන් නිරවුල් කළ යුතුය. | එකතුව රු.48,637,496 ක ණය ශේෂයෙන් රු.15,940,993 ක් ද, රු.924,670 ක ණය ශේෂයෙන් රු.874,940 ක මුදලක්ද 2021 දෙසැම්බර් 31 දින වන විට අයවී ඇත. | 2020 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් සභාවේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 101 දෙනෙකුට, අනෙකුත් පළාත් සභාවල පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 481දෙනෙකුට, මධ්‍යම රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු , සංස්ථා හා මණ්ඩලවලට ස්ථාන මාරු වී |

නිලධාරියෙකුට අදාළ එකතුව රු.48,637,496 ක ණය ශේෂයක් මාස 03 ත් වර්ෂ 32 ත් අතර කාලයක් අයවීම හිඟහිට තිබුණි. එසේම උතුරු මැද පළාත් සභාවේ වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවලින් ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන් 03 දෙනෙකුට සහ අනෙකුත් පළාත් සභාවල අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවලින් ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන් 14 දෙනෙකුට අදාළ රු.924,670 ක ණය ශේෂයක් පියවීමට කටයුතු නොකර මාස 02 ත් වර්ෂ 22 ත් අතර කාලයක් ගතවී තිබුණි. එසේ වුවත් එකී ණය ශේෂයන් ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 1:6, 1:7, 3:18, 4:2:2, 4:2:4, 4:2:5, 4:5, 4:6 හා 6:3 වගන්තිවල විධිවිධාන, 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.7 ඡේදයේ විධිවිධාන සහ 2019 ජූනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03(ඉ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

ගිය නිලධාරීන් 119 දෙනෙකුට සේවය කරමින් සිට මියගොස් ඇති නිලධාරීන් 19 දෙනෙකුට, විශ්‍රාම ගොස් ඇති නිලධාරීන් 180 දෙනෙකුට, වැඩ තහනම් කළ නිලධාරීන් 19 දෙනෙකුට, සේවය අතහැර ගිය නිලධාරීන් 18 දෙනෙකුට සහ විදේශගතවී ඇති නිලධාරියෙකුට අදාළ එකතුව රු.32,696,503 ක ණය ශේෂයක් තව දුරටත් අයවීම හිඟහිට තිබුණි. එසේම උතුරු මැද පළාත් සභාවේ වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වලින් ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන් 03 දෙනෙකුට සහ අනෙකුත් පළාත්

| | | | | |
|---|---|---|---|---|
| | | | | සභාවල අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවලින් ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන් 14 දෙනෙකුට අදාළ රු.49,730 ක ණය ශේෂයක් පියවීමට කටයුතු නොකර තව දුරටත් පැවතුණි. |
| (එ) | කැකිරාව කලාප අධ්‍යාපන කාර්යාලයට, කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල 05 කට, කැකිරාව ගුරු මධ්‍යස්ථානයට සහ පාසල් 125 කට අයත් ඉඩම්වල මැනුම් කටයුතු සිදුකර උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර හිඟුරක්ගොඩ කලාප කාර්යාලයට අයත් පාසල් 78 කට අදාළ ඉඩම් සඳහා බලපත්‍ර/ඔප්පු ලබා ගෙන නොතිබුණි. | සියලු පාසල් හා කාර්යාලවල ඉඩම් සඳහා බලපත්‍ර/ඔප්පු ලබාගතයුතු වේ. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ මහවැලි සංවර්ධන අධිකාරිය වෙත යොමුකර ඇත. | පාසල් හා කාර්යාලවල ඉඩම් සඳහා බලපත්‍ර/ඔප්පු ලබා ගෙන නොතිබුණි. |
| (ඒ) | තඹුත්තේගම, කැකිරාව, හිඟුරක්ගොඩ, පොලොන්නරුව හා ගලෙන්බිඳුණුවැව අධ්‍යාපන කලාපයන්හී පාසල්වල ගුරුභවතුන් 28 දෙනෙකු 1993 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුළ රජයේ වෙනත් දෙපාර්තමේන්තු හා ආයතන වෙත | ගුරුභවතුන් වෙනත් කාර්යයන් සඳහා මුදා හැරීම අත්හිටුවීම, මුදාහැර ඇති ගුරුභවතුන් ආපසු ගෙන්වා ගැනීම සහ ඔවුන්ට ගෙවන ලද වැටුප් | අදාළ ආයතන වැටුප් ප්‍රතිපූර්ණය කිරීම ප්‍රතික්ෂේප කර ඇත. | ගුරුභවතුන් වෙනත් කාර්යයන් සඳහා මුදා හැරීම වර්තමානයේදී ද සිදුවන අතර, ගෙවූ වැටුප් ප්‍රතිපූර්ණය කර |

| | | | | |
|---|---|---|---|---|
| | මුදා හැර තිබුණි. එසේම ඔවුන්ගේ සේවය ලබාගන්නා ආයතන වෙතින් සේවයට පැමිණීමේ වාර්තා ලබා නොගෙන උතුරුමැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් එකී ගුරුභවතුන් වෙත වැටුප් ලෙස රු.51,546,748 ක මුදලක් ගෙවා තිබුණු නමුත් එම වැටුප් අදාළ ආයතන වෙතින් ප්‍රතිපූර්ණය කරගෙන ගෙන නොතිබුණි. | ප්‍රතිපූර්ණය කර ගැනීම සිදුකළ යුතුය. | | ගැනීමට පියවර ගෙන නොතිබුණි. |
| (ඔ) | තඹුත්තේගම, කැකිරාව, පොලොන්නරුව, දිඹුලාගල සහ කැබිතිගොල්ලෑව අධ්‍යාපන කලාපයන්හී පාසල්වල වර්ෂ 04 ක සිට වර්ෂ 31 ක් දක්වා කාලයක් සේවය කරන ගුරුවරුන් 194 කගේ පරිවාස කාලයේ විශේෂ අසනීප නිවාඩු ලබාගැනීම, ආධූනික පත්වීම් ලිපියේ නම වෙනස්වීම, පරිවාස වාර්තා ලබාදී නොතිබීම හෝ ප්‍රමාද වීම, වෛද්‍ය වාර්තාවල අඩුපාඩු පැවතීම, අ.පො.ස උසස් පෙළ, උපාධි හා ගුරු පුහුණු සහතිකවල ප්‍රතිඵල සනාථ කරගෙන නොතිබීම යනාදී හේතුන් නිසා සේවය ස්ථිර කර නොතිබුණි. | පවතින අඩුපාඩු කඩිනමින් නිවැරදිකර පරිවාස කාලය අවසන් වූ වහාම සේවයේ ස්ථිර කළයුතුය. | කඩිනමින් අදාළ කටයුතු සිදුකර ස්ථිර කිරීමට කටයුතු කරන බව දක්වා ඇත. | පවතින අඩුපාඩු නිවැරදිකර සේවයේ ස්ථිර කිරීමට මෙතෙක් කටයුතුකර නොතිබුණි. |
| (ඕ) | සමාලෝචිත වර්ෂය අවසානයට උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාසල් කාර්ය මණ්ඩලයේ අනුමත ඇතැම් තනතුරුවල පුරප්පාඩු 2515 ක් හා | පුරප්පාඩු වී ඇති තනතුරුවලට බඳවා ගැනීම සහ අතිරික්ත සේවකයින් ඉවත් | පුරප්පාඩු/අතිරික්ත තනතුරු පිළිබඳව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව දැනුවත් කර ඇත. | පුරප්පාඩු පිරවීම සහ අතිරික්ත කාර්ය මණ්ඩල ඉවත් කිරීම සඳහා පියවර |

| | | | | |
|---|---|---|---|---|
| | අතිරික්ත 93 ක් ද කාර්යාල කාර්ය මණ්ඩලයේ අනුමත ඇතැම් තනතුරුවල පුරප්පාඩු 28 ක් ද පැවති නමුත් පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමට සහ අතිරික්ත සේවකයින් සම්බන්ධව සුදුසු පියවර ගැනීමට කටයුතුකර නොතිබුණි. | කිරීම කළයුතුය. | | ගෙන නොතිබුණි. |
| (ක) | කැබිතිගොල්ලෑව අධ්‍යාපන කලාපයේ පාසල් සඳහා විද්‍යාගාර සහකාර, පාසල් කාර්යය සහායක හා මුරකරු අනුමත සේවක සංඛ්‍යාව 104 ක් වුවත්, එම සංඛ්‍යාව ඉක්මවා සේවකයින් 71 ක් අතිරික්තව සේවයේ යොදවා වැටුප් ගෙවා තිබුණි. | අතිරික්ත සේවකයින් පුරප්පාඩු පවතින වෙනත් කළාප වෙත යොමුකළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වර්තමානයේ දී ද තත්ත්වය එලෙසම පවති. |
| (ග) | ගලෙන්බිඳුණුවැව අධ්‍යාපන කලාපයේ සිංහල මාධ්‍ය හා දෙමළ මාධ්‍ය පාසල්වල විෂයයන් අනුව ගුරු පුරප්පාඩු පිළිවෙලින් 102 ක් හා 52 ක් ද, ගුරු අතිරික්තතා පිළිවෙලින් 202 ක් හා 24 ක් ද පැවති අතර අතිරික්ත ගුරුවරු පුරප්පාඩු පවතින පාසල් වෙත යොමු කර මානව සම්පත් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම පිළිබඳ අවධානය යොමුකර නොතිබුණි. | අතිරික්ත ගුරුවරුන් පුරප්පාඩු පවතින පාසල් වෙත යොමුකළ යුතුය. | අතිරික්ත ගුරුවරු පාසල්වල පුරප්පාඩු අනුව තුළනය කර ඇති බව වාර්තා කර ඇත. | අතිරික්ත ගුරුවරුන් පුරප්පාඩු පවතින පාසල් වෙත යොමුකර නැත. |
| (ජ) | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පරිපාටික රීති සංග්‍රහයේ රීති අංක 147 ප්‍රකාර නිලධාරියෙකුගේ සමස්ත සේවා | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පරිපාටික රීති ප්‍රකාරව | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වර්තමානයේ දී ද තත්ත්වය එසේම පවති. |

| | | | |
|---|---|---|---|
| කාලය තුළ තාවකාලිකව මුදාහළ හැකි උපරිම කාලපරිච්ඡේදය වසර 05 ක් වුවත් හිඟුරක්ගොඩ සහ පොළොන්නරුව අධ්‍යාපන කලාපවල ගුරුවරුන් 08 දෙනෙකු ගුරුසේවයෙන් වර්ෂ 06 ත් 16 ත් අතර කාලයක් හමුදා සේවයට හා මන්ත්‍රී පෞද්ගලික කාර්යය මණ්ඩලවලට මුදාහැර තිබුණි. | නිලධාරියෙකුගේ සමස්ත සේවා කාලය තුළ වසර 05 ක කාලයකට වඩා වැඩියෙන් තාවකාලිකව මුදා නොහැරිය යුතු වේ. | | |

05. **ශීර්ෂය 620 - උතුරු මැද පළාත් කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය**

---

| | | | |
|---|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයට අදාළව පියවා නොතිබුණු රු.1,072,848 ක අග්‍රිම ශේෂයක් වර්ෂ 06 කට අධික කාලයක සිට පැවත එමින් තිබුණි. | පළාත් මූල්‍ය රීති 259.2 හා 259.3 ප්‍රකාරව දෙසැම්බර් 31 දිනට ඉතිරි වූ අග්‍රිම ශේෂයන් ඊළඟ වර්ෂයේ ජනවාරි 10 දිනට හෝ පළාත් භාණ්ඩාගාරය විසින් නියම කරනු ලබන දිනයක ආපසු නොපියවීම සම්බන්ධව පරීක්ෂණයක් සිදුකර නිසි පියවර ගත යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ආපසු නොපියවීම සම්බන්ධව පරීක්ෂණයක් සිදුකර නිසි පියවර නොගැනීම හේතුවෙන් වර්තමානයේ දී ද එලෙසම පවතී. |

06. **ශීර්ෂය 631 - උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛනවලට අනුව වකුගඩු ආසාදන තත්ත්වයෙන් පෙලෙන රෝගීන්ගෙන් සියයට 60 ක් පිරිමින් වන නමුත් උතුරු මැද පළාතේ ක්‍රියාත්මකවන වකුගඩු රෝග නිවාරණ වැඩසටහනේ අකාර්යක්ෂමතාව නිසා සායනවලට සහභාගී වන පිරිමින්ගේ ප්‍රතිශතය සියයට 25 ක් විය. | වකුගඩු ආසාදන තත්ත්වයෙන් පෙලෙන සියලුම රෝගීන් සායනවලට සහභාගී කරවා ගත යුතුවේ. | පිරිමි පුද්ගලයින් දිවා කාලයේ කෘෂිකාර්මික කටයුතුවල නියැලෙන බැවින් රෝගීන් හඳුනා ගනීමේ පරීක්ෂණවලට ඔවුන්ගේ සහභාගිත්වය අඩු වී ඇත.එම නිසා සති අන්තයේ සහ සවස් කාලයේ විහාරස්ථානවල දී සහ සමිති සමාගම්වල දී මෙම වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලැබේ. | වර්තමානයේ දී ද සායනවලට සහභාගිවන පිරිමි ප්‍රතිශතය අඩු මට්ටමක පවතී. |
| (ආ) | සෞඛ්‍ය සේවාව කාර්යක්ෂමව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ තෝරාගත් රෝහල් 03 ක බාහිර රෝගී අංශ ජාලගත කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. ඒ අනුව 2012 සහ 2017 වර්ෂවලදී ශක්‍යතා අධ්‍යනයකින් සහ නිලධාරීන් පුහුණු කිරීමකින් තොරව උක්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වටිනාකම රු.12,349,783 ක පරිගණක මෘදුකාංග හා අමතර කොටස් ලබාදී තිබුණු නමුත්, ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොතිබුණි. මිලටගෙන තිබුණු පරිගණක මෘදුකාංග හා අමතර කොටස්වලින් රු.9,684,543 ක් වූ ප්‍රමාණයක් තාක්ෂණික වශයෙන් යල් පැන ගොස් තිබුණු අතර අපේක්ෂිත | ව්‍යාපෘතිය නොපමාව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතුවේ. | මානව සම්පත් නොමැති වීම නිසා අපේක්ෂිත ප්‍රතිඵල ලඟාකර ගැනීමට නොහැකි වී ඇති අතර මිලටගෙන තිබුණු පරිගණක මෘදුකාංග හා අමතර කොටස් වෙනත් රෝහල්වල පරිගණක අවශ්‍යතා සඳහා ලබා දී ඇති බව වාර්තා කර ඇත. | බාහිර රෝගී අංශ ජාලගත කිරීමේ ව්‍යාපෘතිය අසාර්ථක වී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | අරමුණ ඉටුනොවීමෙන් වියදම නිශ්කාර්යය වී තිබුණි. | | | |
| (ඇ) | 1984 වර්ෂයේ මධ්‍යම බෙහෙත් ශාලාවක් (Dispensary) ලෙස ආරම්භකර 2015 පෙබරවාරි මාසයේ සිට “C” ශ්‍රේණියේ ප්‍රාදේශීය රෝහලක් ලෙස සංවර්ධනය කළ වාහල්කඩ රෝහලෙහි ඇඳන් 17 ක් සහිත වාට්ටු සංකීර්ණයක් ඉදිකර, නේවාසික ප්‍රතිකාර කිරීම් ආරම්භ කර තිබුණි. එමෙන්ම රෝහල් භූමියේ වෛද්‍ය නිල නිවාසයක්, සෞඛ්‍ය සේවිකාවන් සඳහා නිල නිවාස 02 ක්, රියදුරු නිල නිවාසයක් ඇතුළු පහසුකම් ද සපයා තිබුණි. එසේ වුවත්, ප්‍රදේශයේ රෝගී ජනතාව වෙත ඵලදායී සෞඛ්‍ය සේවාවක් සඳහා අවශ්‍ය මානව සම්පත් සපයා නොතිබීම නිසා එකී ප්‍රාදේශීය රෝහල නැවත මධ්‍යම බෙහෙත් ශාලාවක (Dispensary) තත්ත්වයෙන් ක්‍රියාත්මක වෙමින් පැවති අතර ගොඩනැගිලි හා උපකරණද විනාශ වෙමින් පැවතුණි. | අවශ්‍ය පහසුකම් සපයා රෝගීන්ට හොඳ සෞඛ්‍ය සේවයක් ලබා දිය යුතුවේ. | ප්‍රමාණවත් මානව සම්පත් රෝහලට සපයා දී ඇති බැවින් මේ වන විට නේවාසික රෝගීන්ට ප්‍රතිකාර ලබා දීමට කටයුතු කරමින් පවති. | කාන්තා සහ පිරිමි දෙපාර්ශවයටම එක් වාට්ටුවක් පමණක් ඇති නිසා රෝගීන් ඇතුළත් වන්නේ ඉතා සුළු වශයෙන් වන අතර නිල නිවාස 02 ක්ද විනාශ වෙමින් පැවතුනි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | දෙවන සෞඛ්‍ය ආංශික සංවර්ධන ව්‍යාපෘති (SHSDP) ප්‍රතිපාදන යටතේ උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සඳහා ඉදිරි වර්ෂ 25 කට ප්‍රමාණවත් ධාරිතාවයෙන් යුත් වර්ග අඩි 2500 ක නව තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු.59,546,072 ක මුදලකට 2017 පෙබරවාරි 15 දින කොන්ත්‍රාත් ආයතනයකට පවරා තිබුණි. | | | |
| (i) | පසුව එය සත්මහල් ගොඩනැගිල්ලක් ලෙස ඉදිකිරීමට තීරණයකර අදියර 1 ලෙස ගොඩනැගිල්ලේ පළමු මහල දක්වා වූ මූලික ඉදිකිරීම් විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන්ද බැහැරව පළමු කොන්ත්‍රාත්කරුටම පළමු ගිවිසුම්ගත මුදලට භාරදී තිබුණි. ඒ අනුව 2018 සැප්තැම්බර් 15 දින අවසන් කිරීමට උපදෙස් දී පසුව 2018 දෙසැම්බර් 15 දින දක්වා කල්දිගු ලබාදී තිබුණි. එසේ 2018 දෙසැම්බර් 15 දින දක්වා කල්දිගු ලබාදී තිබියදී සහ කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් නිමකර භාරදීමට පෙර එනම් 2018 නොවැම්බර් 14 දින ගොඩනැඟිල්ලේ II - A අදියරේ ඉදිකිරීම් රු.17,337,504 ක මුදලකට දින 40 ක අසාමාන්‍ය කාලයක් තුළ අවසන් කිරීම සඳහා වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු | ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකිරීමත්, මුළු පිරිවැය ඇස්තමේන්තු පිළියෙල නොකිරීමත්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය නොකිරීමත් මෙම තත්ත්වයට හේතු වී ඇති බැවින් ව්‍යාපෘතිය ආරම්භයේ සිට අවසානය දක්වා විධිමත් සැලැස්මකට අනුව ක්‍රියාත්මක කළයුතුවේ. | 2022 අප්‍රේල් වන විට බිම් මහලේ සහ දෙවන මහලේ ඉදිකිරීම් කටයුතු අවසන්කර කාර්යාල කටයුතු සඳහා යොදා ගැනීමට සැලසුම්කර ඇත. | ඡේදවලින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදිකර නැත. ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නැත. |

| | | | |
|---|---|---|---|
| | සමඟ ගිවිසුම්ගතව තිබුණි. ඒ අනුව II - A අදියරේ ඉදිකිරීම් ආරම්භ කිරීම සඳහා 1 අදියරේ ඉදිකිරීම් කඩිනම් කළ යුතු බැවින් කොන්ක්‍රීට් ශක්තිමත් කිරීමට රු.185,310 ක අතිරේක වියදමක් දරා තිබුණි. | | |
| (ii) | ප්‍රසම්පාදනයේ දුර්වලතා සහ පිළිගත නොහැකි හේතුන්මත කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම නිසා I අදියර වෙනුවෙන් මිල විචලනය ලෙස රු.4,185,040 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවීමට සිදුවී තිබුණි. මෙම ගොඩනැගිල්ලේ සැලසුම් කිරීමේ සහ ඇස්තමේන්තු කිරීමේ දුර්වලතා නිසා සියයට 10 ක අවිනිශ්චිත ගෙවීම් සීමාවද ඉක්මවා තිබුණු අතර, පළමු මහලේ කොන්ක්‍රීට් තට්ටුව පුළුල් කිරීම සඳහා රු.3,960,196 ක මුදලක් සහ අතිරේක වහළක් ඉදිකිරීම සඳහා තවත් විශාල මුදලක්ද වැය කළ යුතුව තිබුණි | සැලසුම් කිරීම, ඇස්තමේන්තු සැකසීම සහ ක්‍රියාත්මක කිරීම විධිමත් අයුරින් සිදුකළ යුතුවේ. | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | එමෙන්ම ඉදිකිරීම්වල දුර්වලතා පැවති අතර ,ඇස්තමේන්තු සැකසීමේ නොසැලකිලිමත්භාවය නිසා බැහැර වූ වැඩ විෂයයන් අතිරේක වැඩ වශයෙන් ඉටු කිරීමේදී කොන්ක්‍රීට් ඝනමීටර් 438.9ක් වෙනුවෙන් ගිවිසුම්ගත රේටය ඉක්මවා රු 1,245,595.ක මුදලක් ද වැඩිපුර ගෙවා තිබුණි. | ඇස්තමේන්තු සැකසීම නිවැරදිව කළ යුතුවේ. | - එම - | |
| (ඉ) | බර්ටි ප්‍රේමලාල් පදනම විසින් පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබුණු සියලු පහසුකම් සහිත “සුව මඟ” ජංගම සායන රථය වාහන සේවා මධ්‍යස්ථාන භූමියේ වර්ෂ 02 කට අධික කාලයක සිට නිෂ්ක්‍රීයව ගාල්කර තිබුණි. | උපයෝජනය කිරීමට කටයුතු කළයුතුවේ. | ජංගම සායන රථවල දී ප්‍රතිකාර කිරීම පුහුණු කිරීමට මෙම රථය පුහුණු ඒකකයට ලබා දී මට තීරණය කර ඇති බව 2022 පෙබරවාරි 18 දින දක්වා ඇත. | වර්තමානයේදීද නිෂ්ක්‍රීයව පවතී. |
| (ඊ) | අනුරාධපුර ගල්කිරියාගම ප්‍රාදේශීය රෝහලේ වෛද්‍යවරුන් දෙදෙනෙකු 2019 වර්ෂයේදී සේවයට නොපැමිණි දිනවල සේවයට පැමිණි බවට දින පොත් ලියා තිබුණු බව නිරීක්ෂණය විය. ඉන් කාර්යභාර වෛද්‍ය නිලධාරී ලෙස සේවය කළ එක් වෛද්‍යවරයෙකු සේවයට නොපැමිණි දින 99 ක දී පැය 396 ක අතිරේක රාජකාරී දීමනා ලෙස රු.385,856 ක් හා සේවයට නොපැමිණි දින 06 කට නිවාඩු දින රාජකාරී දීමනා ලෙස රු.25,739 ක් ද, අනෙක් වෛද්‍යවරයා සේවයට නොපැමිණි | රේඛීය අමාත්‍යාංශය සහ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය වෙත ත්‍රෛමාසිකව යවනු ලබන නේවාසික රෝගීන් සම්බන්ධ වාර්තා සහ බාහිර රෝගීන් සම්බන්ධ වාර්තා එක් එක් වෛද්‍යවරයාට අදාළව වෙන වෙනම පිළියෙල කර දෛනිකව විද්‍යුත් තැපැල | 2021 ජූලි 17 දින වෛද්‍යවරුන් සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් සිදුකර සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කිරීමෙන් පසුව අදාළ මුදල් අයකර ගන්නා ලෙස සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දී ඇත. | මේ දක්වා මුදල් අයකර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | දින 67 කදී පැය 268 ක අතිරේක රාජකාරී දීමනා ලෙස රු.146,060 ක් හා සේවයට නොපැමිණි දින 04 කට නිවාඩු දින රාජකාරී දීමනා ලෙස රු.9,732 ක් ද ලබාගෙන තිබුණි. කාර්යභාර වෛද්‍ය නිලධාරීවරයා සේවා මුර සටහන් සකස් කර තිබුණේ වර්ෂයේ මාස 03 ක් සඳහා පමණි. | මගින් යොමු කිරීමට සියලුම රෝහල් වෙත නියම කළ යුතුය. | | |
| (උ) | තඹුත්තේගම සහ කැබිතිගොල්ලෑව යන රෝහල් දෙකෙහි රුධිර කාන්දුකරණ ඒකක ජනතා අයිතියට පවරා තිබුණු නමුත්, 2020 දෙසැම්බර් 31 දින වනතුරුත් කළමනාකරණයේ දුර්වලතාවයන් මත ආරම්භ කිරීමට අසමත්වී තිබුණි. ඒ අනුව මෙම රෝහල් 02 ක සඳහා ලබාදී තිබුණු රුධිර කාන්දුකරණ යන්ත්‍ර 08 ද ඇතුළුව වියදම් කර තිබුණු රු.මි. 90.8 ක මුදලින් වකුගඩු රෝගීන් වෙත විගණිත දින වනතුරුත් කිසිදු ප්‍රතිකාරයක් ලැබී නොතිබුණු අතර, එකී ගොඩනැගිලි සහ උපකරණ අභාවිතව පැවතුණි. | රුධිර කාන්දුකරණ ඒකක ආරම්භ නොකිරීමට බලපෑ කළමනාකරණ දුර්වලතාවයන් මගහරවා ගෙන එකී ඒකකවලින් වකුගඩු රෝගීන් වෙත ප්‍රතිකාර ලබාදීම කඩිනමින් කළ යුතු වේ. | ගොඩනැගිලි හා උපකරණ භාවිතයට ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇති බව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා දක්වා ඇත. | රුධිර කාන්දුකරණ ඒකක ක්‍රියාත්මක නොවේ. |
| (ඌ) | 2009 මාර්තු 27 දිනැති අංක 02/19/2009 දරන සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 04 (xiv) ඡේදය ප්‍රකාරව එක් එක් නිලධාරියාගේ අමතර සේවා දීමනාව නිලධාරියාගේ මාසික | එක් එක් නිලධාරියාගේ අමතර සේවා දීමනාව නිලධාරියාගේ මාසික වැටුප් සීමාව ඉක්මවන්නේ නම් | වැටුප් ඉක්මවා අමතර සේවා දීමනා නොගෙවන ලෙස පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත දැනුම් දී ඇත. | තත්ත්වය එසේම පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | වැටුප් සීමාව ඉක්මවන්නේ නම් ඒ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, 2009 වර්ෂයේ සිට 2020 දෙසැම්බර් 31 දක්වා උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් එකී විධිවිධානවලට අනුකූලව ක්‍රියාකර නොතිබුණි. | ඒ සඳහා 2009 මාර්තු 27 දිනැති අංක 02/19/2009 දරන සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශයේ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතුය. | | |
| (එ) | විශේෂඥ වෛද්‍ය නිලධාරීන් 24 ක් සහ අනිකුත් වෛද්‍ය නිලධාරීන් 124 ක් ඇතුළු රෝහල් කාර්ය මණ්ඩලයේ පැවති පුරප්පාඩු 1032 ක් ද උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තු කාර්යාල කාර්ය මණ්ඩලයේ පැවති පුරප්පාඩු 64 ක් ද පිරවීමට කටයුතු කර නොතිබුණි. | උතුරු මැද පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකර ගැනීමට රෝහල් කාර්ය මණ්ඩලයේ සහ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තු කාර්යාල කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් කළ යුතුය. | අවශ්‍ය කාර්ය මණ්ඩල ලබා දෙන ලෙස රේඛීය අමාත්‍යාංශය වෙත ඉල්ලීම් කර ඇත. | තත්ත්වය එසේම පවතී. |

07. **ශීර්ෂය 641 - උතුරු මැද පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**

---

| | | | |
|---|---|---|---|
| 2011 අංක 01 දරන උතුරු මැද පළාත් සමුපකාර ප්‍රඥප්තිය ප්‍රකාරව පළාතේ පිහිටි සමුපකාර සමිතිවල මූල්‍ය ප්‍රකාශන, ගිණුම් වර්ෂය අවසන් වී මාස 03 ක් ඇතුළත ලබාගෙන ඒවා විගණනය කර වාර්තා නිකුත් කිරීම උතුරු මැද පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වුවත් උතුරු මැද පළාතේ පිහිටි සමුපකාර සමිති 682 ක් විසින් ඉදිරිපත්කර තිබුණු මූල්‍ය ප්‍රකාශන 2152 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද විගණනය කර නොතිබුණි. | 2011 අංක 01 දරන උතුරුමැද පළාත් සමුපකාර ප්‍රඥප්තිය ප්‍රකාරව උතුරු මැද පළාතේ පිහිටි සමුපකාර සමිති විගණනය කර වාර්තා කඩිනමින් නිකුත් කළ යුතුය. මෙම රාජකාරි ප්‍රමාදය ගැන පරීක්ෂණයක් සිදුකළ යුතුය. | කඩිනමින් විගණන කටයුතු අවසන් කරන ලෙස ප්‍රධාන ලේකම්වරයා විසින් පළාත් සමුපකාර කොමසාරිස් වෙත දන්වා ඇත. | වර්තමානයේදී ද තත්ත්වය එසේම පවතී. |

08. **ශීර්ෂය 642 - පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව**

---

| | | | |
|---|---|---|---|
| කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ විස්කම් පියස ගොඩනැගිල්ලෙහි පවත්වාගෙන යන ප්‍රදර්ශනාගාර කඩ කාමර 22 කින් 2016 වර්ෂයේ සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදයට අදාළව අයවිය යුතු රු.1,111,105 ක් වූ කුලිය හිඟව පැවතුණු අතර එම කඩ කුලී අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කඩ කුලී අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගතයුතු වේ. | හිඟ කඩ කුලී අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට නීති අංශය වෙත දැනුම් දී ඇත. | 2022 පෙබරවාරි වන විටද හිඟ කඩ කුලී අයකරගෙන නොතිබුණි. |

09. **ශීර්ෂය 643 - උතුරු මැද පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව**

| | | | |
|---|---|---|---|
| පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව විසින් 2018 හා 2019 වර්ෂවල මිලදී ගත් වටිනාකම රු.661,344 ක් වූ ක්‍රීඩක ගමන් මලු හා සපත්තු තොගයක්ද 2019 වර්ෂයේ මිලදී ගත් රු.266,785 ක් වටිනා ක්‍රීඩා ඇඳුම් තොගයක්ද 2018 හා 2019 වර්ෂවල ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලබා දී තිබුණු ටී ෂර්ට් 68 ක්ද වටිනාකම හඳුනා ගැනීමට නොහැකි වූ 2018 වර්ෂයේ දී මිලට ගත් ක්‍රීඩා ඇඳුම් තොගයක් හා 2015 වර්ෂයේදී මිලට ගත් ගමන් මලු 14 ක්ද ප්‍රයෝජනයට නොගෙන 2021මැයි 10 දින වන විටද ගබඩාවේ ගොඩ ගසා තිබුණි. | විධිමත් ක්‍රමවේදයකට අනුව අවශ්‍යතාවන් පවතින පිරිස් වෙත නියමිත වාර්තා පවත්වා ගනිමින් මෙම භාණ්ඩ ලබාදීම හෝ අවශ්‍යතාවය පවතින වෙනත් පළාතකට යැවීම හෝ කළ යුතු වේ. | පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තු නිලධාරීන් වෙත බෙදා දී ඇත. | එම භාණ්ඩ පළාතේ ක්‍රීඩකයින් වෙත බෙදාදුන් බවට සාක්ෂි නොතිබුණි. |

10. **ශීර්ෂය 650 – උතුරු මැද පළාත් ඉඩම්, වාරිමාර්ග, මහාමාර්ග, නිවාස, ග්‍රාම සංවර්ධන සහ කාන්තා කටයුතු අමාත්‍යාංශය**

---

| | | | |
|---|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් වාරිමාර්ග අමාත්‍යාංශයට අදාළව පියවා නොතිබුණු රු.302,158 ක අග්‍රිම ශේෂයක් වර්ෂ 08 කට අධික කාලයක සිට පැවත එමින් තිබුණි. | පළාත් මූල්‍ය රීති 259.2 හා 259.3 ප්‍රකාරව දෙසැම්බර් 31 දිනට ඉතිරි වූ අග්‍රිම ශේෂයන් ඊළඟ වර්ෂයේ ජනවාරි 10 දිනට හෝ පළාත් භාණ්ඩාගාරය විසින් නියම කරනු ලබන දිනයක ආපසු පියවිය යුතුය. | මේ පිළිබඳව සොයා බලා වාර්තා කිරීමට කමිටුවක් පත්කර ඇත. | අග්‍රිම ශේෂය එලෙසම පවතී. |

11. **ශීර්ෂය 652 – උතුරු මැද පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව**

---

| | | | |
|---|---|---|---|
| නැගෙනහිර නුවරගම් පළාත හා කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණයන්ට අනුව පළාත් ඉඩම් කොමසාරිස් විසින් දීර්ඝකාලීන බදු පදනම මත රැස් කළයුතු ඉඩම් බදු, පිළිවෙලින් රු.285,138,949 ක් සහ රු.11,529,373 ක් 2020 දෙසැම්බර් 31 දිනට හිඟව පැවති අතර රජයේ ඉඩම් පිළිබඳ කාර්ය සංග්‍රහයේ 10 වැනි කාණ්ඩයේ 89 වගන්තිය සහ 11 කාණ්ඩයේ 104 සිට 125 වගන්ති ප්‍රකාරව ඉඩම් බදු ගෙවීම් ප්‍රමාද කරන්නන් හෝ ගෙවීම් පැහැර හරින්නන් | රජයේ ඉඩම් පිළිබඳ කාර්ය සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව ඉඩම් බදු ගෙවීම් ප්‍රමාද කරන්නන් හෝ ගෙවීම් පැහැර හරින්නන් සම්බන්ධයෙන් ඉඩමෙන් නෙරපීම, නඩු පැවරීම වැනි ක්‍රියාමාර්ග ගතයුතුය. | ඉදිරි වර්ෂවල දී හිඟ බදු අයකරන ලෙස පළාත් ඉඩම් කොමසාරිස්ට ප්‍රධාන ලේකම් විසින් උපදෙස් දී ඇත. | වර්තමානයේ දී ද තත්ත්වය එසේම පවතී. |

සම්බන්ධයෙන් ඉඩමෙන් නෙරපීම, නඩු පැවරීම වැනි ක්‍රියාමාර්ග ගෙන නොතිබීම මෙම බදු අයවීම දුර්වල මට්ටමක පැවතීමට හේතු වී ඇත.

12. **ශීර්ෂය 660 – උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය**

| | | | |
|---|---|---|---|
| පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ පරිපාලන නිලධාරි ලෙස සේවය කළ නිලධාරිනියක් රජයේ නිවාසයක වර්ෂ 20 කට වැඩි කාලයක සිට පදිංචිව සිටින අතර එකී නිලධාරිනිය 2017 මාර්තු මාසයේදී විශ්‍රාම ගොස් ඇත. එසේ වුවත් 2021 මැයි 10 දින වන විටත් ඉන් ඉවත්ව ගොස් නොතිබුණි. | 1971 අංක 03 හා 1974 අංක 40 දරන පනත්වලින් සංශෝධිත 1969 අංක 07 දරන රජයේ නිවාස (සන්තකය ආපසු ලබාගැනීමේ) පනත අනුව ක්‍රියා කර එම නිවාසයෙන් ඉවත් කිරීම සහ වර්ෂ 05 ක බදු කාලය ඉක්මවා එකී නිවාසයේ පදිංචිව සිටි කාලච්ඡේදය වෙනුවෙන් සාමාන්‍ය නිවාස කුලියට අමතරව දණ්ඩන කුලී අයකරගත යුතුය. | අධිකරණය විසින් ලබා දී ඇති නිල නිවාසයෙන් නෙරපීමේ නියෝගයට මෙම නිලධාරිණිය විසින් අභියාචනාධිකරණයේ අභියාචණයක් ගොනුකර ඇත. | වර්තමානයේ දී ද තත්ත්වය එසේම පවතී. |

13. **උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.49,661,220 ක් වූ ගොඩනැගිලිවල අයිතිය තහවුරු කර ගැනීම සඳහා එකී ගොඩනැගිලි පිහිටි ඉඩම්වල ඔප්පු හෝ පැවරුම් සහතික පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සතුව නොතිබුණි. | අයිතිය තහවුරු කර ගැනීම සඳහා ඉඩම්වල ඔප්පු හෝ පැවරුම් සහතික ලබාගත යුතුය. | පැවරුම් සහතික ලබා ගැනීම සඳහා අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ඉල්ලීම් කර නියමිත කටයුතු සිදුවෙමින් පවති. | වර්තමානයේ දී ද තත්ත්වය එසේම පවති. |
| (ආ) | උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ එකතු කළ අගය මත බදු ගොනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2015 සැප්තැම්බර් මාසයේ සිට අක්‍රීය තත්ත්වයට පත්කර තිබියදී එකතු කළ අගය මත බදු පනතේ විධිවිධානයන්ට පටහැනිව 2019 දෙසැම්බර් 31 දින දක්වා ගනුදෙනුකරුවන්ගෙන් රු.7,361,498 ක එකතු කළ අගය මත බද්දක් අය කරගෙන තිබුණු අතර එකී මුදල් සමාලෝචිත වර්ෂයේ දී ආදායමට ගෙන තිබුණි. | විධිමත් බලයක් නොමැතිව රැස්කළ එකතු කළ අගය මත බදු ආපසු ගෙවිය යුතුය. | මෙම මුදල් ආදායමට ගෙන ඇත. | ආපසු ගෙවා නොතිබුණි. |

14. **උතුරු මැද පළාත් මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ රු.42,612,200 ක් වූ ඌනතාවය 2019 වර්ෂයේදී රු.56,426,500 ක ඌනතාවයක් දක්වා වර්ධනය වී තිබීම නිසා 2015 දෙසැම්බර් 09 දිනැති අංක 02/2015 දරන මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 01 | මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 01 ඡේදය ප්‍රකාරව ප්‍රසාද දීමනා ලෙස රු.2,000 බැගින් ගෙවියයුතු අතර | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වැඩිපුර ගෙවීම් අයකර ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ඡේදය ප්‍රකාරව ප්‍රසාද දීමනා ලෙස ගෙවිය හැක්කේ රු.2,000 බැගින් වුවත් අධිකාරිය විසින් එම චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව සේවකයින් 120 දෙනෙකු වෙත රු.5,000 බැගින් රු.600,000 ක මුදලක් ප්‍රසාද දීමනා වශයෙන් ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් අයකර ගතයුතු වේ. | | |
| (ආ) | 1994 අංක 08 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය පිහිටුවීමේ ප්‍රඥප්තියේ II කොටසේ 6.1 (ආ) ඡේදය අනුව මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියට පළාත ඇතුළත මගී ප්‍රවාහනය සඳහා බස්රථ පාවිච්චි කිරීමට අවසරපත් නිකුත් කිරීම සහ එම අවසරපත් අලුත් කිරීම සඳහා පමණක් බලය දී ඇත. එසේ වුවත් ඊට පටහැනිව 2000 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලච්ඡේදයේ දී වර්තමාන වටිනාකම රු.16,700,000 ක් වූ අන්තර් පළාත් මාර්ග බලපත්‍ර 167 ක් නිකුත් කර තිබුණු අතර ඉන් බලපත්‍ර 72 ක වලංගු කාලයද දීර්ඝ කර පවත්වාගෙන යමින් පැවතුණි. | 1994 අංක 08 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය පිහිටුවීමේ ප්‍රඥප්තියේ II කොටසේ 6.1 (ආ) ඡේදය අනුව මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියට පළාත ඇතුළත මගී ප්‍රවාහනය සඳහා බස්රථ පාවිච්චි කිරීමට අවසරපත් නිකුත් කිරීම සහ එම අවසරපත් අලුත් කිරීම සඳහා පමණක් බලය දී ඇති නිසා ඊට අනුකූල නොවී කටයුතු කළ අය සම්බන්ධයෙන් විනය පියවර ගතයුතුය. | මෙම මාර්ගයන්හි දුර ප්‍රමාණයන්ගෙන් සියයට 90 කට වැඩි ප්‍රමාණයක් උතුරු පළාතට අයත් මාර්ග බව දක්වමින් උතුරු මැද පළාත් මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය කිසිඳු ක්‍රියාමාර්ගයක් නොගෙන සිටී. | අදාළ නිලධාරීන් සම්බන්ධයෙන් විනය පියවර ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ අන්තර් පළාත් මාර්ග සහ පළාත් මාර්ග බලපත්‍ර හිමි බස්රථ වෙනුවෙන් නිකුත් කරන ලද දඩ පත්‍රිකා 62 ක් වෙනුවෙන් අයවිය යුතු රු.5,370,300 ක දඩ මුදල් සහ ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි. | 1994 අංක 08 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය පිහිටුවීමේ ප්‍රඥප්තියේ විධිවිධාන අනුව අන්තර් පළාත් මාර්ග සහ පළාත් මාර්ග බලපත්‍ර හිමි බස්රථ වෙනුවෙන් නිකුත් කරන ලද දඩ පත්‍රිකා වෙනුවෙන් දඩ මුදල් සහ ප්‍රමාද ගාස්තු අය කළයුතු වේ. | මෙම දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කරන ලෙස අධිකාරියේ සාමාන්‍යාධිකාරී වෙත ප්‍රධාන ලේකම් විසින් උපදෙස් දී ඇත. | නිකුත් කරන ලද දඩ පත්‍රිකා වෙනුවෙන් දඩ මුදල් සහ ප්‍රමාද ගාස්තු අය කර නොතිබුණි. |

15. **උතුරුමැද පළාත් පූර්ව ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය**

---

| | | | | |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 71 ප්‍රකාරව අධිකාරිය සඳහා ගණකාධිකාරි තනතුරක් අනුමතකර නොගෙන වැඩබලන ගණකාධිකාරිවරයෙකු පත්කර සමාලෝචිත වර්ෂයේ දී රු.144,000 ක වැඩ බැලීමේ දීමනා ගෙවා තිබුණි. | විධිමත් පරිදි තනතුර අනුමත කරගත යුතු අතර වැඩ බැලීමේ දීමනා ආපසු අයකර ගතයුතුය. | වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | තනතුර අනුමත කරගෙන නැත. වැඩ බැලීමේ දීමනා ආපසු අයකරගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | වසර 03 ක සිට මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කරමින් පැවති අළෙවි නියෝජිතයින් 17 දෙනෙකුගෙන් අයවිය යුතු රු.571,830 ක ප්‍රගති වාර්තා අලෙවි ආදායම සමාලෝචිත වර්ෂයේ දී ද අයකර ගෙන නොතිබුණි. | වසර 03 ක සිට අය නොවී පවතින අළෙවි ආදායම් අයකරගත යුතුය. | මෙම හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරන ලෙස අධිකාරියේ සාමාන්‍යාධිකාරී වෙත ප්‍රධාන ලේකම් විසින් උපදෙස් දී ඇත. | වර්තමානයේ දී ද තත්ත්වය එසේම පවතී. |
| (ඇ) | වසර 04 ක සිට නිරවුල්කර නොමැති රු.3,000,000 ක් වූ ගුරු දීමනා සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කිරීමට කටයුතුකර නොතිබුණි. | වසර 04 ක සිට ගුරු දීමනා නිරවුල් නොකිරීමට හේතු පරීක්ෂාකර අවශ්‍ය කටයුතු සිදුකළ යුතුවේ. | නොගෙවා ඇති ගුරු දීමනාවලට අදාළ තොරතුරු සොයා බලා නිරවුල් කරන ලෙස අධිකාරීයේ සාමාන්‍යාධිකාරී වෙත ප්‍රධාන ලේකම් විසින් උපදෙස් දී ඇත. | වර්තමානයේ දී ද තත්ත්වය එසේම පවතී. |
| (ඈ) | 2020 දෙසැම්බර් 31 දිනට අළෙවි නියෝජිතයින් 28 දෙනෙකුගෙන් ලැබිය යුතු රු.5,942,292 ක පුවත්පත් ආදායමින් රු.5,391,779 ක ආදායම් වසරකට වැඩි කාලයක සිට අය නොවී පැවතුණි. | පුවත්පත් ආදායම් අයනොවීමට හේතු පරීක්ෂාකර ලැබිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතුවේ. | ලැබිය යුතු පුවත්පත් ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් අධිකාරියේ කළමනාකරණ අධ්‍යක්ෂ වෙත දන්වා ඇත. | මෙතෙක් අයකරගෙන නොමැත. |
| (ඉ) | සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට නියමිත කාලයේදී දායක මුදල් නොගෙවීම හේතුවෙන් රු.437,852 ක අධිභාර නිවේදනයක් පනවා තිබුණු අතර එය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට හෝ ගෙවීමට කටයුතු කර නොතිබුණි. | සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නියමිත කාලයේ දී ගෙවීමට කටයුතු නොකළ නිලධාරීන්ගෙන් අදාළ අධිභාර අයකර ගතයුතුය. | මෙම අධිභාරය ඉවත් කර ගැනීමට ඉල්ලීම්කර ඇති බව කළමනාකරණ අධ්‍යක්ෂ විසින් දන්වා ඇති අතර අධිභාරය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් දැනුම් දී ඇත. | අධිභාරය ඉවත් කරගෙන නැත. |

## 16. උතුරුමැද පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය

| | | | | |
|---|---|---|---|---|
| (අ) | වසර 12 කට අධික කාලයක සිට ගෙවිය යුතුව පවතින එකතුව රු.16,011,120 ක එකතු කළ අගය මත බදු සහ රු.8,966,846 ක භාණ්ඩ හා සේවා මත බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු එකතු කළ අගය මත බදු (VAT)සහ භාණ්ඩ හා සේවා මත බදු (GST) ප්‍රේෂණය කිරීමට කටයුතු කළයුතු වේ. | වාරික වශයෙන් ගෙවීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇති නමුත් ඒ සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ඉඩ ලබා දී නැත. | වර්තමානයේ දී ද තත්ත්වය එසේම පවතී. |
| (ආ) | 2015 වර්ෂයේ සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදයට අදාළව රජයේ ආයතනවලින් අයවිය යුතුව තිබුණු යන්ත්‍ර කුලී ආදායම්, මුද්‍රණාල ආදායම් සහ වාහන අලුත්වැඩියා අංශයේ ආදායම් පිළිවෙළින් රු.2,795,558 ක්, රු.31,294,850 ක් සහ රු.2,556,908 ක් අය නොවී පැවතුණි. ඉන් පිළිවෙළින් සියයට 47 ක් වූ රු.1,304,135 ක්, සියයට 23 ක් වූ රු.7,261,712 ක් සහ සියයට 60 ක් වූ රු.1,542,131 ක් අය නොවී පැවතුණු කාලය වසර 01 සිට වසර 04 දක්වා පරාසයක විය. | අය නොවීමට හේතු සොයා බැලීම සඳහා පරීක්ෂණයක් සිදුකළ යුතුය. | සිහි කැඳවීම් ලිපි යවා ඇත. | අය නොවීමට හේතු සොයා බැලීම සඳහා පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ඉදිකිරීම් ව්‍යාපෘතිවලින් ලැබිය යුතු අත රැඳවුම් මුදල් සහ නළ ලිං ව්‍යාපෘතියක් වෙනුවෙන් ලැබිය යුතු මුදල් පිළිවෙළින් රු.8,527,044 ක් සහ රු.3,159,160 ක් වූ අතර එකී ආදායම් වසර 06 සිට වසර 17 දක්වා කාලයක සිට අය නොවී පැවතුණි. | හිඟ හිටීමට හේතු සොයා බැලීම සඳහා පරීක්ෂණයක් සිදුකළ යුතුය. | සිහි කැඳවීම් ලිපි යවා ඇත. | හිඟ හිටීමට හේතු සොයා බැලීම සඳහා පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ඈ) | ඉකුත් වර්ෂ ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කරමින් පවතින එකතුව රු.18,977,029 ක් වූ ගෙවිය යුතු අත රැඳවුම් මුදල්, ගෙවිය යුතු යන්ත්‍ර කුළී සහ ගෙවිය යුතු අමතර කොටස් හා අළුත්වැඩියා වියදම් 2020 දෙසැම්බර් 31 දින වන විටද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | සියලුම බැරකම් නිරවුල් කිරීමට හෝ සත්‍ය වශයෙන් බැරකම් නොපවතින්නේ නම් ආදායමට ගැනීමට ක්‍රියා කළ යුතුය. | මීට අදාළ ගොනු සොයමින් පවති. | තත්ත්වය එසේම පවති. |

විගණකාධිපති ත්‍රෛවාර්ෂික තත්ත්ව වාර්තාව - 2020

අස්ථිතායවයේ නම :- දකුණු පළාත් සභාව

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණකාධිපති වාර්තාවේ ඇතුළත් ප්‍රධාන අඩුපාඩු | විගණකාධිපතිගේ නිර්දේශ | ආස්ථිතායය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| **01.** | **ගිණුම්කරණ අඩුපාඩු** | | | |
| (අ) | පළාත් අරමුදල් ගිණුමේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය අනුව උපචිත වියදම් රු.193,505,412 ක් වුවද ශීර්ෂ 25 ට අදාළව එම ශේෂය රු.239,469,097 ක් බැවින් රු.45,963,685 ක වෙනසක් පැවතීම නිසා උපචිත වියදම් හා වර්ෂයේ ඌනතාවය රු.45,963,685 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන උපචිත වියදම් ශේෂය සහ අරමුදල් ගිණුමේ දැක්වෙන ශේෂ සසඳා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. | මෙම වෙනස නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැත. | වෙනසට හේතු දක්වමින් නිවැරදි කිරීමට කටයුතු කර නොමැත. |
| (ආ) | වාණිජ අත්තිකාරම් ගිණුම් 07 ක මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ක්ෂය සංචිත අරමුදල් ලෙස එකතුව රු.73,110,507 ක අගයක් දක්වා තිබුණද පළාත් අරමුදල් ගිණුමෙහි එය දක්වා නොතිබීම නිසා ක්ෂය සංචිත අරමුදල් ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | වාණිජ අත්තිකාරම් ගිණුම්වල දැක්වෙන ශේෂ අරමුදල් ගිණුම් සමඟ නිවැරදි විය යුතුය. | පෙර වර්ෂවලදීද වාණිජ අත්තිකාරම් ගිණුම්වල හර බැර වාර්තාවේ ශේෂය පමණක් ගිණුම්ගත කර ඇත. වාණිජ අත්තිකාරම් ගිණුම්වල දැක්වෙන ගෙවිය යුතු ක්ෂය සංචිත අරමුදල් ශේෂය අරමුදල් ගිණුමට ගෙන නිරවුල් කිරීමට කටයුතු සිදු කර නොමැත. | ක්ෂය සංචිත අරමුදලෙහි රු.73,110,507 ක අඩුවක් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | දකුණු පළාත් සභා අරමුදල් ගිණුමේ සටහන් අංක 18 යටතේ ඇතුළත් කර තිබුණු වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු හා වාහන බලපත්‍ර ගාස්තු වල එකතුව රු.1,361,194,437 ක් වුවද මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන වලට අනුව එය රු.1,343,184,266 ක් විය. ඒ අනුව රු.18,010,171 ක වෙනසක් පැවතුණි. | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු වේ මූල්‍ය ප්‍රකාශයේ දැක්වෙන ශේෂය හා අරමුදල් ගිණුමේ ශේෂය සැසදීම් කර නිවැරදි කළ යුතුය. | වෙනස නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැත. | ලැබිය යුතු වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු හා වාහන බලපත්‍ර ගාස්තු අරමුදල් ගිණුමට ඇතුළත් වී නැත. |
| (ඈ) | පළාත් අරමුදල් ගිණුමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුළත් අවසාන ලිපිද්‍රව්‍ය තොගය තුළ විෂය අංක 31302 දරන වාණිජ අත්තිකාරම් ගිණුමට අදාළ අවසාන තොගය වූ රු.209,164,862 ක් ඇතුළත් කර තිබීම නිසා සමාලෝචිත වර්ෂයට අදාළ අනෙකුත් සැපයුම් හා සේවා වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවයද එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | වර්ෂ අවසාන ඉතිරි ලිපි ද්‍රව්‍ය තොගය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | වාණිජ අත්තිකාරම් ගිණුමට අදාළ අවසාන තොගය අරමුදල් ගිණුමේ ලිපිද්‍රව්‍ය තොගයෙන් ඉවත් කිරීමට කටයුතු කර නොමැත. | වර්ෂයේ සැපයුම් හා සේවා වියදම හා ඌනතාවය ඌන ගණනය වී ඇත. |
| (ඉ) | පළාත් අරමුදල් ගිණුමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ, දකුණු පළාතේ පළාත් පාලන ආයතනවලට ගෙවිය යුතු උසාවි දඩ රු.166,580,523 ක් හා ගෙවිය යුතු මුද්දර ගාස්තු රු.1,049,220,528 ක් අඩුවෙන් දැක්වීම නිසා අරමුදල් ගිණුමේ ජංගම වගකීම් ශේෂය ඊට සමාන | අරමුදල් ගිණුමෙහි ශේෂය හා පළාත් පාලන ආයතන මූල්‍ය ප්‍රකාශන ශේෂයන් අතර පවතින වෙනස්කම් වලට අදාළ ගැලපීම් සිදු කල යුතුය. | මෙම වෙනස නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැත. | අරමුදල් ගිණුමේ ජංගම වගකීම් ශේෂය අඩුවෙන් පෙන්වයි. |

| | | | | |
|---|---|---|---|---|
| | වටිනාකමකින් ඌන ගණනය වී තිබුණි. | | | |
| (ඊ) | පළාත් සභාව යටතේ ඇති ශීර්ෂ 25 කට අයත් එක් එක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ දේපල පිරියත හා උපකරණවල 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.10,653,262,621 ක්වූ අතර එදිනට පළාත් අරමුදල් ගිණුමේ දක්වා ඇති ශේෂය රු.11,166,824,576 ක් වූයෙන් ඒ දෙක අතර රු.513,561,955 ක නොසැසඳු වෙනසක් නිරීක්ෂණය විය. | අරමුදල් ගිණුම හා ශීර්ෂවල දේපල පිරියත උපකරණ වලට අදාළ ශේෂයන් සැසඳී තිබිය යුතුය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට සැසඳුම් ප්‍රකාශ සකස් කර නොමැත. |

**02. ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

| | | | | |
|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.319,062,138ක් වූ නොපියවූ අග්‍රිම ශේෂයෙන් රු.304,482,670 ක් 2019 මාර්තු 31 දින වන විටත් පියවා නොතිබුණි. | අග්‍රිම ශේෂයන් පියවීමට කටයුතු කළයුතුය | 2018.12.31 දිනට ඒකාබද්ධ පළාත් භාණ්ඩාගාර අග්‍රිම ගිණුම් අනුව රු. 319,062,138 ක් වූ ශේෂයෙන් තවදුරටත් නොපියවූ අග්‍රිම වශයෙන් ද.ප. සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ රු.54,064,169.02 ක මුදලක් පමණක් පවතින බව වාර්තා කරමි. 2019 දෙසැම්බර් 31 දිනට වූ නොපියවූ අග්‍රිම ශේෂය රු.54,064,169 ක් දක්වා නිරවුල් කරගෙන තිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනට නොපියවූ අග්‍රිම ශේෂය රු.149,288,441 ක් විය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | දකුණු පළාත් සංවර්ධන අධිකාරිය විසින් දසුන ණය යෝජනා ක්‍රමය යටතේ ලබාදුන් ණය අතුරින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණය ශේෂ 20 කට අදාළව හිඟහිටි ණය වාරික හා පොලිය රු. 1,092,984 ක් විය. | මෙම ණය වාරික හා පොලී අයකර ගැනීමට කඩිනම් වැඩපිළිවෙලක් යෙදිය යුතුය. | ප්‍රධාන නීති නිලධාරී විසින් ඇප කරුවන්ගෙන් හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන ලෙස දැනුම් දී තිබුණි. ඒ අනුව 03 දෙනෙකු පමණක් ණය ගෙවා තිබුණි. | 2021 සැප්තැම්බර් 30 දිනට ණය ශේෂ 17 කට අදාළව රු.3,613,458 ක ශේෂයක් තවදුරටත් හිඟව පවතී. |

**03. විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම**

---

| | | | |
|---|---|---|---|
| දකුණු පළාත් සංවර්ධන අධිකාරිය විසින් එකතුව රු.12,280,690 ක්වූ ණයගැතියන් සහ වටිනාකම රු.283,555 ක් වූ ණයහිමියන් සම්බන්ධයෙන් විස්තරාත්මක උපලේඛන හා ශේෂ සනාථන ඉදිරිපත් නොකෙරුණි. | ණයගැතියන් හා ණය හිමියන් සම්බන්ධයෙන් විස්තරාත්මක උප ලේඛන සහ ශේෂ සනාථන ඉදිරිපත්කළ යුතුය. | ණය හිමියන් ජ'නල් සටහන් මගින් සමුච්චිත අරමුදලට බැර කොට ඇත. ණයගැතියන් සම්බන්ධව 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන තහවුරු කිරීමේදී අදාල සනාථයන් ලබා දීමට කටයුතු කර නොමැත. | 2020 දෙසැම්බර් 31 දිනටද විස්තරාත්මක උප ලේඛන හා ශේෂ සනාථන ඉදිරිපත් කර නොතිබුණි. |

**04. නීති,රීති හා රෙගුලාසි හා කළමනාකරණ තිරණවලට අනුකූල නොවීම**

---

| | | | | |
|---|---|---|---|---|
| (අ) | 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍රයේ xvii වැනි පරිච්ඡේදයේ 184 වන වගන්තිය ප්‍රකාරව 2020 පෙබරවාරි 25 දිනැති දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරිගේ ලිපිය මඟින් සේවකයින් 04 දෙනෙකු වැඩ පරිපාලක තනතුරු වලට පත්කර 2020 මාර්තු සිට ජුනි දක්වා රු.649,760 ක වැටුප් ගෙවා තිබුණි. | අංක 1589/30 දරන 2009 පෙබරවාරි 20 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍රයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය | එම සංශෝධනයන් බඳවා ගැනීමේ පරිපාටියට ඇතුළත් කිරීමට හා ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා යොමු කිරීමට කටයුතු කරමින් පවතී. | ගැසට් නිවේදනයට පටහැනිව සිදුකර ඇති බඳවා ගැනීම් සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2016 අප්‍රේල් 19 දිනැති දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමත බඳවා ගැනීමේ පටිපාටියට පටහැනිව සුදුසුකම් සපුරා නොතිබුණු අයදුම්කරුවන් දෙදෙනෙකු දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) තනතුරට උසස් කර 2019 සැප්තැම්බර් 09 දින පත්වීම් ලබා දී තිබුණි. | සිදුකර ඇති වරද නිවැරදි කිරීම හා වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී මෙවැනි අතපසු වීම නොවීමට ක්‍රමවේදයන් සකස් කර ඇත. එහෙත් ඡේදයේ සඳහන් කරුණු සම්බන්ධව ක්‍රියාමාර්ග ගෙන නොමැත. | වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXI පර්ච්ඡේදයෙහි 1.1 උප ඡේදය ප්‍රකාරව නිල ඇඳුම් දීමනා හිමි නිලධාරීන් ගණයට අයත් නොවන ගුරුවරුන් සඳහා නිල ඇඳුම් සපයා ගැනීමට රු.157,706,458 ගෙවා තිබුණි. | ආයතන සංග්‍රහයේ XXI පරිච්ඡේදයේ 1.1 උප ඡේදය අනුව කටයුතු කළ යුතුය. | ආයතන සංග්‍රහයේ XXI පර්ච්ඡේදයෙහි 1.1 උප ඡේදය උල්ලංඝනය කිරීම සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | නිල ඇඳුම් දීමනා අහිමි ගුරුවරුන්ට ගෙවන ලද ගෙවීම එලෙසම පවතී. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව ආයතන 05 කට අදාළ වටිනාකම රු.28,682,581 ක් වූ වර්ෂ 02 කාලයක් ඉක්ම වූ පොදු තැන්පතු ගිණුම් ශේෂ 228 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 අනුව කටයුතු කල යුතුය | 2019.12.31 දිනට වසර දෙක ඉක්මවූ තැන්පතු වලින් ආයතන 03 කට අදාළව රු.8,094,453 ක කල් ඉක්මවූ තැන්පතු තවදුරටත් පවතින බව වාර්තා කර ඇත. | රු.8,094,453 ක ශේෂයක් තවදුරටත් පවතී. |

(ඉ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | | | |
|---|---|---|---|---|
| (i) | 2017 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2017 ප්‍රකාරව විශේෂිත රාජකාරී සඳහා නිලධාරියෙකු අදාළ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ හෝ ගණන්දීමේ නිලධාරීයාගේ පූර්ව අනුමැතිය ඇතිව අධිවේගී මාර්ගය භාවිතා කළ අවස්ථාවකදී, ඒ සඳහා භාවිතා කළ වාහනය වෙනුවෙන් ගෙවූ ප්‍රවේශපත්‍ර ගාස්තුව ප්‍රතිපූර්ණය කළ හැකිය.නමුත් ඊට අනුකූල නොවී දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ නිවසේ සිට කාර්යාලයට දෛනික සාමාන්‍ය රාජකාරී සඳහා පැමිණීමේදී අධිවේගී මාර්ගය භාවිතා කිරීම වෙනුවෙන් රු.137,250 ප්‍රවේශ පත්‍ර ගාස්තු ප්‍රතිපූර්ණය කර තිබුණි. | 2017 පෙබරවාරි 17 දිනැති අංක 02/2017 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. | අංක 02/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව දරන ලද වියදම් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | දෛනික සාමාන්‍ය රාජකාරී සඳහා පැමිණීමේදී මේ වන විට අධිවේගී මාර්ගය භාවිතා කිරීම වෙනුවෙන් ප්‍රවේශ පත්‍ර ගාස්තු ප්‍රතිපූර්ණය කිරීමක් සිදු නොවේ. |
| (ii) | 2019 මැයි 31 දිනැති අංක 13/2008 (v) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව පළාත් ප්‍රධාන ලේකම්වරුන් වෙත නිල වාහන සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් රාජ්‍ය පරිපාලන හා ආපදා කළමණාකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් | 2019 මැයි 31 දිනැති අංක 13/2008(v) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. | ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ගෙවීම් සිදු කරනු ලබයි. | කිසිදු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | නිකුත් කරන ලද චක්‍රලේඛය අනුව දකුණු පළාත් සභාව තුළද ඉන්ධන දීමනා ලබාගත යුතු වුවත්, එම චක්‍රලේඛයට අනුකූල නොවී දකුණු පළාත තුළ 2019 මැයි 16 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) -02- 2019 අනුව නිල වාහන සඳහා ලබාගන්නා ඉන්ධන ප්‍රමාණය වැඩිකර තිබුණි. | | | |
| (iii) | 2009 මාර්තු 05 දිනැති හා අංක 2007/10 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව දකුණු පළාත් හිටපු කෘෂිකර්ම අමාත්‍යවරයාට 2004 වසරේ සිට 2019 වසරේ අප්‍රේල් මස දක්වා නිල නිවාස දිමනා වශයෙන් රු.3,000,000 ක් 2019 අප්‍රේල් 22 දින ගෙවා තබූ නමුත් මෙම කාල පරිච්ඡේදයේ එම අමාත්‍යවරයාට ගාල්ල ප්‍රදේශයෙ හිම ස්ථිර පදිංචි ස්ථානයේම පදිංචි වී සිට ඇති බව අනාවරණය විය. | 2009 මාර්තු 05 දිනැති හා අංක 2007/10 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. | කිසිදු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | මේ වන විට මෙම හිටපු අමාත්‍යවරයා මිය ගොස් ඇත. චක්‍රලේඛ විරෝධී ගෙවීම් එලෙසම පවතී. |
| (ඊ) | **පළාත් මූල්‍ය රීති**<br>------------------ | | | |
| | 272.1 ප්‍රකාරව බාහිර පාර්ශවයකට රු 2,000 ක් හෝ ඊට වැඩි මුදලක් ගෙවීමේදී එය මුදලින් නොගෙවිය යුතු වුවත් ඊට | පළාත් මූල්‍ය රීති 272.1 අනුව කටයුතු කළ යුතුය. | සම්පූර්ණ කමිටු වාර්තාව ලද පසු ඉදිරි ක්‍රියාමාර්ග සිදු කරනු ලබන බව දැනුම් දී ඇත. | මේ සම්බන්ධව මූලික විමර්ශනයක් පැවැත්වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | අනුකූල නොවී හුංගම ගොවිපළ භූමියේ භෞතික ප්‍රාග්ධන වත්කම් ගොඩනැගීම හා සංවර්ධන ව්‍යාපෘතියේ රු.3,389,406 ක සියලු වියදම් දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ නමට ලියන ලද චෙක්පත් මගින් සිදු කර තිබුණි. | | | |
| (උ) | 2015 මාර්තු 10 දිනැති අංක 03/2014(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධිසේවක පදනම මත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට පත්කර තිබුණු නිලධාරියෙකු දෙපාර්තමේන්තුවේ සුදුසුකම්ලත් නිලධාරින් සිටියදී රාජකාරී ඉටුකිරීමේ පදනම මත එකී සේවයේ පළමුවන ශ්‍රේණියේ තනතුරකට (ඇල්පිටිය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ලෙස) පත්කිරීම හේතුවෙන් 2014 සැප්තැම්බර් සිට 2018 සැප්තැම්බර් දක්වා රු. 445,726 ක රාජකාරී ඉටු කිරීමේ දීමනාවක් සහ දුරකථන දීමනාවක් ගෙවා තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධව අමාත්‍යාංශ ලේකම් විසින් ගනු ලබන ක්‍රියාමාර්ග පළාත් ගිණුම්කාරක සභාව වෙත වාර්තා කරන ලෙස දන්වා තිබුණද, එයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැත. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොමැත. |

## 05 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | | | | |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 20(1) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව විසින් කලින් කලට ප්‍රඥප්ති මඟින් නිශ්චය කරනු ලබන මුදල් ප්‍රමාණයන් පළාත් සභා අරමුදලින් දකුණු පළාත් ආන්ඩුකාර ලේකම් කාර්යාලයේ හදිසි අවස්ථා අරමුදලට ගෙවනු ලැබිය යුතුය. කෙසේ වුවද, අරමුදල ආරම්භක අවස්ථාවේදී පළාත් සභා අරමුදලින් ලබාදුන් මුදල හැර වෙනත් කිසිදු මුදලක් පළාත් සභා අරමුදලින් ලබාදී නොතිබුණි. අරමුදල් ආයෝජනයෙන් උපයන ස්ථාවර තැන්පතු පොලී ආදායම පමණක් අරමුදලේ එකම අරමුදල් ලැබීම් ප්‍රවාහය විය. | පළාත් හදිසි අවස්ථා අරමුදල ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධයෙන් පවතින ගැටලු සාකච්ඡා කර ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | පළාත් සභා අරමුදලින් නියමිත මුදල් හදිසි අවස්ථා අරමුදලට බැරකර මේ දක්වා කටයුතු කර නොමැත. |
| (ආ) | දකුණු පළාත් සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද දකුණු පළාත් ව්‍යවසායකත්ව දිරිබල සංවර්ධන ණය ව්‍යාපෘතිය (Southern Province Entrepreneurship Encouragement Development Loan Project) යටතේ 2020 ඔක්තෝබර් 31 දිනට හිඟ ණයලාභීන් 282 ක් වූ අතර මුළු හිඟ ණය මුදල රු.23,371,333 ක් විය. මේ අතරින් අවුරුදු 01 ට වැඩි හිඟ ණය ප්‍රතිලාභීන් 60 දෙනෙකුගෙන් අයවිය යුතු ණය මුදල | හිඟ ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ගනු ලබන ක්‍රියාමාර්ග දැනුම් දී නොමැත. | අදාළ ණය මුදල් අයකර ගැනීමට කටයුතු කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | රු.10,305,929 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදීත් එම මුදල නිරවුල් කර ගෙන නොතිබුණි. | | | |
| (ඇ) | දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් කැබ් රථයක් 2019 මාර්තු 29 දින අනතුරට පත්වී තිබුණි. එම අනතුර පිළිබඳ සිදුකළ මූලික විමර්ශන වාර්තාව අනුව හා 2020 මාර්තු 17 දිනැති ත්‍රිපුද්ගල පරීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව ලබාදී තිබුණු නිර්දේශ වූයේද අනතුර සිදුවන අවස්ථාවේ රිය පැදවූ රියදුරු වගකිව යුතු බැවින් සිදුවූ හානිය වන රු.284,626 ක් ඔහුගෙන් අයකිරීමටත් අනතුරෙන් පසුව මෙම කැබ් රථය පැදවීම හේතුවෙන් එන්ජිමට සිදුවූ හානිය වන රු.254,337 ක මුදල අදාළ රියදුරු ගෙන් අයකිරීමට නිර්දේශ කර තිබුණද විගණිත දිනය වූ 2020 නොවැම්බර් 30 දින දක්වාම අයකරගෙන තිබුණි. | මූලික විමර්ශන වාර්තාවට අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධයෙන් පරීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව කටයුතු කරන බව දන්වා තිබුණද, ඒ අනුව කටයුතු කර නොමැත. | පරීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව වගකිවයුතු පාර්ශවයන් ගෙන් අලාභය අයකර ගැනීමට කටයුතු කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ ඇති පාසැල්වල කිසිදු කාර්යයක් සිදු නොකර, වැටුප් ලබමින් සිටින ගුරුවරුන්ගේ සංඛ්‍යාව 84 ක් විය. | ගුරුවරුන්ගේ සෞඛ්‍ය තත්ත්වය සම්බන්ධව වෛද්‍ය මණ්ඩලයකට යොමු කළ යුතු වේ. | කිසිදු කාර්යයක් සිදු නොකරන රෝග තත්ත්වයෙන් පෙලෙන ගුරු භවතුන් සම්බන්ධ තොරතුරු දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කිරීමට කටයුතු කර ඇත. එහෙත් වෛද්‍ය මණ්ඩල වෙත යොමු කර අදාළ වාර්තා ලබා ගැනීමට කටයුතු කර නොමැත. | වෛද්‍ය මණ්ඩලය වෙත යොමු කර වෛද්‍ය වාර්තා ලබා ගැනීමට කටයුතු කර නොමැත. |
| (ඉ) | දකුණු පළාතේ කලාප කාර්යාල 05 කට අයත් පාසැල් 128 ක ගුරුවරුන් 205 දෙනෙකු වෙත ඔවුන්ගේ පත්වීම් විෂයයට අදාළ ඉගැන්වීමේ කටයුතු පැවරීමකින් තොරව කාර්යාලය කටයුතු, පාසැල් අධීක්ෂණය, පුස්තකාල හා ගබඩා කටයුතු වැනි පාසලේ වෙනත් කාර්යයන් පවරා තිබුණි. | ගුරුවරුන් පාසල්වල ඉගැන්වීම් කටයුතුවල යෙදවිය යුතුය. | මේ සම්බන්ධව ගෙන ඇති ක්‍රියාමාර්ග දැනුම් දී නොමැත. | මේ වන විටත් අදාළ ගුරුවරුන් වෙත පත්වීම් විෂයට අදාළ ඉගැන්වීමේ කටයුතු පැවරීමක් සිදුවී නොමැත. |
| (ඊ) | 1972 අංක 15 දරන සමුපකාර සමිති පනතේ 43(ii) වගන්තිය ප්‍රකාරව විගණනය කරන ලද බල ප්‍රදේශයේ සමිති 229 ක ලාභයෙන් සමුපකාර අරමුදලට රු.194,382,122 ක මුදලක් අයවිය යුතුව තිබුණු නමුත් මෙම මුදල් අයකර ගැනීමට මාතර සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලය කටයුතු කර නොතිබුණි. | සමුපකාර සමිති පනතට අනුකූලව කටයුතු කර සමුපකාර අරමුදලට අයවිය යුතු මුදල් අයකර ගත යුතුය. | 2021 දෙසැම්බර් 31 දිනට රු.180,288,146 ක මුදලක් තවදුරටත් අයවිය යුතු බැවින් එම මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැත. | සමුපකාර අරමුදලට තවදුරටත් අයවිය යුතුව තිබූ රු.180,288,146 ක මුදල් අයකර ගැනීමට කටයුතු කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත අධිකරණය විසින් ප්‍රේෂණය කරන දඩ මුදල් අදාළ සමිති වෙත කඩිනමින් ප්‍රේෂණය කළ යුතු වුවත් හඳුනා නොගත් රු.914,468 ක දඩ මුදල් ශේෂයක් 2020 දෙසැම්බර් 31 දිනට පැවතුණි. | උසාවි දඩ මුදල් නිවැරදිව හඳුනාගෙන අදාළ සමිති වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතුය | 2021 අගෝස්තු 30 දින වන විට තවදුරටත් සමිති වෙත ප්‍රේෂණය කළ යුතුව පවතින ශේෂය රු.899,761 කි. | රු.899,761 ක ශේෂයක් තවදුරටත් අදාළ සමිති වෙත ප්‍රේෂණය කිරීමට පවතී. |
| (ඌ) | මහානගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 317 වගන්තිය ප්‍රකාර දකුණු පළාතේ මහා නගර සභාවන්හි කටයුතු සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්වරයා විසින් පිළියෙල කර මහානගර සභාවට ඉදිරිපත් කළයුතු වාර්ෂික වාර්තා 2018 හා 2019 වර්ෂ සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මහානගර සභා ආඥා පනතේ 317 වගන්තිය අනුව කටයුතු කළ යුතුය. | මහා නගර සභා ආඥා පනතේ 317 වගන්තිය ප්‍රකාරව දකුණු පළාතේ මහා නගර සභාවල කටයුතු සම්බන්ධයෙන් 2018 වර්ෂය සඳහා පළාත් පාලන කොමසාරිස්වරයා විසින් පිළියෙල කළ යුතු වාර්ෂික වාර්තා සකස් කර නොමැති බවත්, 2019 වර්ෂයට අදාළව වාර්ෂික වාර්තා සකස් කිරීම සඳහා විමර්ශන නිලධාරීන් වෙත බලය පැවරීම සිදුකර ඇත. | මේ දක්වා වාර්ෂික වාර්තා සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. |

**06. අපේක්ෂිත ප්‍රතිලාභ (Out put) ලබා නොගැනීම**

---------------------------------------------------------

| | | | | |
|---|---|---|---|---|
| (අ) | රුහුණු සංචාරක කාර්යාංශයේ මදුනාගල ව්‍යාපෘතියේ උණුදිය උල්පත් ජලය යොදාගෙන පාද සම්භාහනය කිරීම සඳහා අඩි 30X10 ක් වූ ප්‍රමාණයේ ගොඩනැඟිල්ලක් ඉදිකිරීම සඳහා රු.1,979,625 ක් වැයකර තිබුණද, ඒ සඳහා අත්තිවාරම් සහ කණු පමණක් ඉදිකර තිබීම නිසා ව්‍යාපෘතියේ අරමුණු ඉටු වී නොතිබුණු බැවින් රු.1,979,625 ක | ව්‍යාපෘතිය අවසන් කර අපේක්ෂිත අරමුණ ඉටුකර ගත යුතුය. | 2021/2022 සංවර්ධන සැලැස්මෙන් ප්‍රතිපාදන වෙන් කර මෙම කර්මාන්තය නිම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව වාර්තා කර ඇත. | ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | වියදම නිෂ්ඵල වියදම් බවට පත් වී තිබුණි. | | | |
| (ආ) | මදුනාගල ස්වාභාවික උණුදිය උල්පත් ආශ්‍රිතව සංචාරක පහසුකම් සංවර්ධනය කිරීම වෙනුවෙන් රුහුණු සංචාරක කාර්යාංශය විසින් රු මිලියන 46 ක් වටිනා භෝජනාගාරයක් 2017 වර්ෂයේ සිට ඉදිකෙරෙමින් තිබූණු නමුත්, මෙම ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබීම හේතුවෙන් මහජනයාට ඉන් ප්‍රයෝජනය ගත හැකිව නොතිබුණි. | ඉදිකිරීම් කටයුතු කාර්යක්ෂමව කරගත යුතුය. | 2019 වර්ෂයේද අවිච්ඡේද ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාවට නැංවීම සිදු කර ඇති නමුත්, භෝජනාගාරය මෙතෙක් මහජනයාට ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී ඇත. | භෝජනාගාරය මෙතෙක් ප්‍රයෝජනයට ගෙන නැත. |

**07. නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | රුහුණු සංචාරක කාර්යාංශය විසින් මදුනාගල ව්‍යාපෘතිය යටතේ රු.41,452,679 ක් වියදම් කර ඉදිකරන ලද ආපනශාලාව, විවේකාගාරය හා භෝජනාගාරය භාවිතයට නොගෙන නිෂ්ක්‍රීය තත්ත්වයේ පැවතුණු අතර සංචාරක බංගලාව සඳහා ලබාදී තිබුණු රු.837,000 ක් වටිනා විදුලිජනක යන්ත්‍ර 03 ක් ද අක්‍රීය තත්ත්වයේ පැවතුණි. තවද 2007 වර්ෂයේ රු.1,306,910 ක් වියදම් කර ඉදිකළ ගැම් කඩමණ්ඩියේ ඉදිකිරීම් කිසිවක් හඳුනාගත නොහැකි පරිදි නටඹුන් පමණක් ඉතිරිවී තිබුණි. එමෙන්ම ගැම් ගම්මානයේ රු.2,718,744 ක් වියදම් කර ඉදිකරන ලද සංචාරක නිවාස 04 හි | අදාළ වත්කම් නිසි පරිදි අලුත්වැඩියා කර ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතුය. | 2021 වර්ෂය අවසානයට පෙර එය සංචාරක පහසුකම් සපයන ස්ථානයක් ලෙස භාවිතයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | සංචාරකයින්ගේ අවශ්‍යතාවය සඳහා භාවිතය ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | සෙවිලි තහඩු ගැලවී නිවාස විනාශ වී තිබුණි. | | | |
| (ආ) | දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ගලගොඩ ස්ථාපිත කරන ලද ගල්තාර අංගනයේ නිෂ්පාදන කටයුතු 2018 ජූලි 09 වැනි දින සම්පූර්ණයෙන් නවතා දමා තිබුණු අතර, කාපට් නිෂ්පාදන යන්ත්‍ර 2020 සැප්තැම්බර් 09 විගණිත දින දක්වාම භාවිතයට නොගැනීමෙන් දිරාපත් වෙමින් පැවතුණි. මෙම ගල්තාර නිෂ්පාදනය නතර කර දැමීම නිසා මෙම යන්ත්‍ර සමඟ ආනයනය කරන ලද ගල්තාර ඇඹරුම් යන්ත්‍ර 02 ක් හා සනවත් කරන යන්ත්‍ර 02 ක් උඩුකාව යාන්ත්‍රික අංශයේ ගාල් කර නිෂ්කාර්යව තිබුණි. | මෙම යන්ත්‍ර වලින් තවදුරටත් ප්‍රයෝජනයක් ගත නොහැකි නම් අපහරණය කළ යුතුය. | විකිණීම සඳහා කටයුතු සූදානම් කර ඇත. | යන්ත්‍ර විකිණීම සඳහා අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග ගනිමින් පවතී |
| (ඇ) | වර්ෂ 2011-2015 කාල පරිච්ඡේදය තුළ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් මාර්ග කාපට් කිරීම සඳහා දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට ලබා දී තිබුණු යන්ත්‍ර 14 ක් නිෂ්කාර්යව යාන්ත්‍රික අංශයේ ගාල් කර තිබුණු අතර ගාල්ල ප්‍රධාන කාර්යාලය ඉදි කිරීමට ගෙනෙන ලද ද්‍රව්‍ය හා උපාංග 166 ක් 2001 වර්ෂයේ සිට යාන්ත්‍රික ඉංජිනේරු ආයතනයේ සේවක විවේකාගාරයේ නිෂ්කාර්යව ගොඩගසා තිබුණි. එමෙන්ම ගල්තාර නිෂ්පාදන යන්ත්‍ර ක්‍රියාකාරවීම සඳහා භාවිතා කර | යන්ත්‍ර හා උපාංග නිෂ්කාර්යව පැවතීම අවම කිරීමට කටයුතු කළ යුතුය. | යන්ත්‍ර 02 ක් ඇල්පිටිය හා අළුත්වැව පෙරමුසු යන්ත්‍ර පරිශ්‍රයේ සේවා සඳහා යොදවා ඇත. එක් යන්ත්‍රයක් වෙන්දේසි කර ඇත. වාහන 02 ක් ඇස්පෝල්ට් නිෂ්පාදනය සඳහා උණු තාර ප්‍රවාහනය සඳහා භාවිතා කරයි. අනෙකුත් යන්ත්‍ර ඇස්පෝල්ට් නිෂ්පාදනය හා ඒවා මාර්ග වල ඇතිරීම සඳහා සම්බන්ධ වන යන්ත්‍ර වේ. ද්‍රව්‍ය අතුරින් ප්‍රයෝජනයට ගතහැකි අයිතමයන් අවශ්‍යතාවය පරිදි | ඉතිරි යන්ත්‍ර 09 අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | තිබුණු විදුලි ජනක යන්ත්‍ර 02 ක් 2018 ජුලි මස සිට 2020 ඔක්තෝබර් 09 විගණිත දින දක්වාම භාවිතයට ගෙන නොතිබුණි. | | ප්‍රයෝජනයට ගෙන ඇත. තවදුරටත් ඉතිරිවී ඇති ද්‍රව්‍ය දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ අනෙකුත් කාර්යාලවලට පරීක්ෂා කර බලා ලබා ගන්නා ලෙස දන්වා ඇති අතර ඉතිරි ද්‍රව්‍ය කඩිනමින් අපහරණය කිරීමට කටයුතු කරමින් පවතී. | |

**08. ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | ආයුර්වේද නිෂ්පාදන අත්තිකාරම් ගිණුමේ (විෂයය අංක 30702) ලැබීම් වල බලය දෙනු ලැබූ අවම සීමාව රු.60,000,000 ක් වුවද ලැබීම් වල තථ්‍ය අගය රු.52,412,730 ක් වූයෙන් ලැබීම් වල අවම සීමාවට රු.7,587,270 කින් ලගා වී නොතිබුණි. | සීමා ඉක්මවා යාමට පෙර අවශ්‍ය සීමා සංශෝධනයන් සිදු කර ගත යුතුය. | ඉදිරියේදී මෙසේ සිදු නොවීමට වගබලා ගැනීමට කටයුතු කර ඇත. | ලැබීම්වල අවම සීමාව රු.7,587,270 කින් ලගා වී නොතිබුණි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී ආයුර්වේද නිෂ්පාදන අත්තිකාරම් ගිණුමේ අනුමැතිය ලබා දී තිබුණු වියදමේ උපරිම සීමාව රු.161,775 කින් ඉක්මවා තිබුණු අවස්ථාවක් නිරීක්ෂණය විය. | වාණිජ අත්තිකාරම් ගිණුම්වල බලය දෙනු ලැබූ සීමා අනුව කටයුතු කළ යුතුය. යම් හෙයකින් සීමාව ඉක්මවීමක් පෙනී යන්නේ නම් අවශ්‍ය සීමා සංශෝධනයන් සිදු කරවා ගත යුතුය. | ඉදිරියේදී මෙසේ සිදු නොවීමට වගබලා ගැනීමට කටයුතු කර ඇත. | බලය දෙනු ලැබූ වියදමේ උපරිම සීමාව රු.161,775 කින් ඉක්මවා තිබුණි |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | බෙලිඅත්ත ඖෂධ නිෂ්පාදනාගාරයේ ජීව වායු ඒකකයක් ඉදිකිරීමට දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය හා හෙල්පෝ ඉකෝ ග්‍රීන් සමාගම 2013 අගෝස්තු 21 දින ගිවිසුමකට එළඹ තිබුණි. කර්මාන්තය නිමකළ බව සහතික කර 2014 පෙබරවාරි 21 දින රු.792,000 ක් ගෙවීම් කර තිබුණ නමුත් එය 2015 පෙබරවාරි 21 දිනෙන් පසු ප්‍රයෝජනයට ගත නොහැකිව අක්‍රීයව තිබුණි. | ගිවිසුම ප්‍රකාරව ඉදිකිරීම් ඉටුකරවා ගෙන ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. | ඖෂධ නිෂ්පාදනයේදී ජීව වායු ගැස් උඳුන් භාවිතය අසාර්ථක වීම සම්බන්ධයෙන් Helpo ආයතනය සමඟ සාකච්ඡා කර එය වැඩිදියුණු කිරීම සඳහා මූලික කටයුතු සිදුකර ඇත. | නිශ්ක්‍රීය වත්කමක් ලෙස පවතී. |
| (ඇ) | මූලධන වියදම් විධිමත් කිරීම සම්බන්ධ ප්‍රධාන ලේකම්ගේ අංක 03/2015 දරන හා 2015 ජූනි 26 දිනැති චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල නොවී දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අධිකාරියට නිදහස් කළ මුදලින් එකතුව රු 136,237,163 ක් නොපියවා අධිකාරියේ බැංකු ගිණුම්වල අධිකාරී බලයක් නොමැතිව රඳවාගෙන තිබුණි.පළාත් මූල්‍ය රීති 268.2.1 ට අනුකූල නොවී එම බැංකු ගිණුම ආරම්භ කර තිබුණි.1995 අංක 01 දරන දකුණු පළාත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්තියේ 25(2) වගන්තියට අනුකූල නොවී එම ගිණුමේ ඉපයූ එකතුව රු 9,950,045 ක් වූ පොලී ආදායම් අධිකාරිය | ප්‍රධාන ලේකම්ගේ චක්‍රලේඛ, පළාත් මූල්‍ය රීති හා දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ ප්‍රඥප්තිය අනුව කටයුතු කළ යුතුය. | රු.82,110,854 ක් ප්‍රධාන ලේකම් වෙත පියවා ඇත. | රු.54,126,309 ක් තවදුරටත් රඳවාගෙන ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | විසින් විවිධ ණය පහසුකම් ලබාදීමේ වැඩසටහන් සඳහා විධිමත් අනුමැතියෙන් තොරව භාවිතා කර තිබුණි. | | | |
| (ඉ) | මුදල් කොමිෂන් සභා ලේකම්ගේ අංක FC /3/3/2014 හා 2014 දෙසැම්බර් 31 දිනැති චක්‍රලේඛයට අනුකූල නොවී සහ 2016,2017 හා 2018 වර්ෂ සඳහා පරිපාලන වියදම් දැරීමට ප්‍රධාන ලේකම් විසින් එකතුව රු 6,661,619 ක් ලබා දී තිබියදී දකුණු පළාත් සංවර්ධන අධිකාරියට ලැබුණු රු 38,000,000 ක ප්‍රාග්ධන මුදලින් තවත් රු.3,420,000 ක් පරිපාලන වියදම් ලෙස රඳවාගෙන වියදම් කර තිබුණි. | මුදල් කොමිෂන් සභා චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතුය. | 2018 වර්ෂයේදී අත්තිකාරම් පියවීමේ පදනමින් යුතුව, ප්‍රධාන අමාත්‍යාංශය හරහා පරිපාලන වියදම් සංවර්ධන අධිකාරිය වෙත ලබා දෙන ලද බවත්, අග්‍රිම ලද තුලිත, විශේෂ, වැඩ යෝජනා වලින් අධ්‍යක්ෂ ජනරාල් ගේ උපදෙස් පරිදි 9% ක් පරිපාලන වියදම් ලෙස මාරු කරන ලද බවත්, පරිපාලන වියදම් අත්තිකාරම් ලැබුණු පසු එම මුදල් නැවත ව්‍යාපෘති ගිණුමට අධිභාර කර ක්‍රියාත්මක කිරීමේ පදනමින්, දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය පරිදි අග්‍රිම මාරු කරන ලදි. එහෙත් ලද ප්‍රාග්ධන මුදල් වලින් සියයට 9 ක් පරිපාලන වියදම් දැරීම සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයන් ගෙන නොමැත. | අදාළ චක්‍රලේඛය පරිදි කටයුතු කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | 2019 වර්ෂය තුළදී ජාතික පාසල් ඉදිකිරීම අධීක්ෂණය සඳහා දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමිය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ සහ ගණකාධිකාරි යන නිලධාරීන් තිදෙනෙකු වෙනුවෙන් මාස 11 ක් සඳහා රේඛීය අමාත්‍යාංශ වැය ශීර්ෂය මගින් එම ඉදිකිරීම් අධීක්ෂණය සම්බන්ධයෙන් කිසිදු වාර්තාවක් ඉදිරිපත් කර නොතිබියදී රු.571,458 ක මුදල් ගෙවා තිබුණි. | ඉදිකිරීම් අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් වාර්තා ඉදිරිපත් කළ යුතුය. | ප්‍රධාන ගණකාධිකාරී විසින් වරද පිළිගෙන ලබා ගත් රු.186,293 ක මුදල ගෙවා ඇත. | නිලධාරී තිදෙනාගෙන් ප්‍රධාන ගණකාධිකාරී වරද පිළිගෙන ඔහු විසින් ජාතික පාසල් අධීක්ෂණය වෙනුවෙන් ලබා ගත් දීමනා රු.186,293 ක් ගෙවා ඇත. අනෙකුත් නිලධාරීන් තිදෙනා සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

**09.** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

| | | | | |
|---|---|---|---|---|
| (අ) | දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් එකතුව රු.74,999,565 ක් වූ ණයගැති ශේෂ 04 ක් සහ රු.276,084,492 ක් වූ ණයහිමි ශේෂ 03 ක් දීර්ඝ කාලයක් තිස්සේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන අතර, ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | දීර්ඝ කාලයක් තිස්සේ පවතින ශේෂ කඩිනමින් නිරවුල් කිරීම සඳහා කටයුතු කළ යුතුයි. | කිසිදු වැලැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | මෙම ණයගැති හා ණයහිමි ශේෂ නිරවුල් නොකර තවදුරටත් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | එකතුව රු.13,135,482 ක් වූ ශේෂ 04 ක් වර්ෂ ගණනාවක සිට ලැබිය යුතු ශේෂ වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අතර, ඒවා අයකර ගැනීමට හෝ ඒ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි | දීර්ඝ කාලයක් තිස්සේ පවතින ලැබිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කිරීම සඳහා කටයුතු කළ යුතුයි. | කිසිදු වැලැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | මෙම ලැබිය යුතු ශේෂ මෙතෙක් නිරවුල් කර නොමැත. |
| (ඇ) | ගාල්ල දිස්ත්‍රික් ඖෂධ ගබඩාවේ 2019 වර්ෂයේ ගබඩා පරීක්ෂණ වාර්තාව අනුව අපහරණය කළ යුතු බවට හඳුනාගන්නා ලද වටිනාකම රු 17,755,890 ක් වූ ඖෂධ වර්ග 154 ක් 2019 නොවැම්බර් 29 දින දක්වා අපහරණය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ගබඩා පරීක්ෂණ වාර්තා අනුව ඖෂධ අපහරණය සඳහා ක්‍රියාමාර්ග ගතයුතුය. | අපහරණය කළයුතු ඖෂධ සම්බන්ධයෙන් කටයුතු කිරීමට පරීක්ෂණ මණ්ඩලයක් පත් කර ඇත. | අපහරණ ක්‍රියාවලිය අවසන් වී නොමැත. |
| (ඈ) | දකුණු පළාත් සභාවේ 2009 අංක 1 දරන දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරී (සංශෝධිත) ප්‍රඥප්තියේ 11 වන වගන්තිය යටතේ 2012 සැප්තැම්බර් 26 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1777/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2012 අංක 01 දරන ත්‍රීරෝද රථ මගී ප්‍රවාහන සේවා රෙගුලාසි හා 2012 අංක 2 දරන පාසැල් සිසුන් ප්‍රවාහන සේවා රෙගුලාසි සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | 2012 අංක 01 දරන ත්‍රීරෝද රථ මගී ප්‍රවාහන සේවා රෙගුලාසි හා 2012 අංක 2 දරන පාසැල් සිසුන් ප්‍රවාහන සේවා රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුය. | රජයේ අංක 1777/39 දරන අති විශේෂ ගැසට් නිවේදනය නිකුත් කලද ඊට අදාළ ජාතික ප්‍රතිපත්ති සැකසීමකින් තොරව අදාළ රෙගුලාසි ක්‍රියාත්මක කළ නොහැකිව පවතී. | ජාතික ප්‍රතිපත්ති සකසා නොමැති බැවින් අදාළ රෙගුලාසි මේ දක්වාම ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. |

## 10. මතභේදයට තුඩු දුන් ගනුදෙනු

| | | | | |
|---|---|---|---|---|
| (අ) | දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ හිටපු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරවරයා (පාලන), පරිපාලන නිලධාරි තනතුරට පත් කිරීම හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පාලන) තනතුරට උසස් කිරීම 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට පටහැනිව සිදුකර තිබුණි. එමෙන්ම අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව අනුව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පාලන) තනතුරක් නොතිබියදීත් හා පරිපාලන නිලධාරි තනතුරෙහි සේවය ස්ථිරකර නොතිබියදී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි තනතුරෙහි වැඩ බැලීම සඳහා පත් කර තිබුණි. ඒ අනුව එම තනතුරු සඳහා ගෙවා තිබුණු වැටුප් හා දීමනා ආපසු අය කිරීමට කටයුතු කළ යුතු බවත්, 2018 දෙසැම්බර් 17 දින පැවති දකුණු පළාත් සභා අරමුදල් හා ගිණුම්කාරක සභාව තීරණය කර තිබුණද, එම තීරණ ක්‍රියාත්මකවී නොතිබුණි. | දකුණු පළාත් සභා අරමුදල් හා ගිණුම් කාරක සභා තීරණය ක්‍රියාත්මක කළ යුතුය . | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) තනතුරට පත්කර ඇති අතර පසුව ගිණුම්කාරක නියෝගය අනුව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) තනතුරේ සිට සහකාර කළමනාකරු (පාලන) තනතුරේ පිහිටුවීමට තීරණය කරන ලද නමුත් ඔහු එය ප්‍රතික්ෂේප කර සේවයෙන් ඉල්ලා අස්වී ඇත.නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය හා පාලන) තනතුරක් ඇති බැවින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) තනතුරක් සඳහා අනුමැතිය ලබාගෙන නැත. කාර්යමණ්ඩලයට රාජකාරී පැවරීම පමණක් සිදුකර ඇත. වැටුප් රහිත සේවා කාලයට අදාළ වැටුප් වර්ධක ගෙවීම රෙගුලාසි වලට පටහැනි වන්නේ නම් එම වැටුප් වර්ධක අඩු කිරීමටත්, වැඩිපුර ගෙවූ මුදලක් වේ නම් එම මුදල නැවත අයකර ගැනීමටත් කටයුතු කරන බව දන්වා තිබුණද, ඊට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මෙම නිලධාරීයා සේවයෙන් ඉල්ලා අස්වී ඇත. | අදාළ නිලධාරියා සේවයෙන් ඉල්ලා අස් වී ඇති අතර ගෙවා තිබූ වැටුප් හා දීමනා නැවත අය කරගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ප්‍රධාන අමාත්‍යාංශය විසින් 2019 වර්ෂයේ ග්‍රාම නිලධාරී ධාරිතා සංවර්ධන වැඩසටහනේ මූලධන වියදම් යටතේ ලිපිද්‍රව්‍ය දීමනා වශයෙන් දකුණු පළාතේ ග්‍රාම නිලධාරීන් සඳහා 2019 මැයි 24 දින අනුමත දීමනාවට අමතරව තවත් රු 1,500ක් බැගින් ගෙවීම නිසා ග්‍රාම නිලධාරීන් 2095 ක් සඳහා රු 3,142,500 ක මුදලක් අනුමැතියකින් තොරව ගෙවා තිබුණු.ඊට අමතරව අදාළ චෙක්පත ලබා දීමේ උත්සව 02 ක් පවත්වා තිබූ අතර ඒ සඳහා රු 1,259,163 ක් ද ගෙවා තිබුණි. | අනුමත නොවන අමතර දීමනා ගෙවීමේදී අනුමැතිය ලබාගෙන ගෙවීම් කළ යුතුය. | ග්‍රාම නිලධාරීන් සඳහා ගෙවන ලද රු.3,142,500 ක මුදල දකුණු පළාත් සභා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ප්‍රකාරව සිදු කරන ලද නමුත් ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ විශේෂ අනුමැතියක් ලබා ගෙන නොමැති බව පිළිගන්නා ලද බවත් . ඒ අනුව ඉදිරියේදී මෙවැනි ගෙවීම් සිදු කරන්නේ නම් ගරු ආණ්ඩුකාරතුමාගේ විශේෂ අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කරන බව ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් විසින් දන්වා ඇත. එහෙත්, රජයේ අනුමත දීමනාවට අමතරව ගෙවන ලද මුදල් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | අනුමැතියෙන් තොරව රු.3,142,500 ක් බෙදා හැර තිබුණු අතර උත්සව 02 ක් සඳහා රු.1,259,163 ක් ගෙවා තිබුණි. |
| (ඇ) | රුහුණු සංචාරක කාර්යාංශය විසින් රු.46,042,006 ක් වැය කර රජයේ ඉඩමක ඉදිකර තිබූ හික්කඩුව අභිමංසල ගොඩනැගිල්ල අවිධිමත් ලෙස තෙවන පාර්ශවයකට පැවරීම මත නිශ්ක්‍රීයව පැවති අතර 2019 වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු රු 6,800,000 ක බදු මුදලද ලැබී නොතිබිණි. | විධිමත් පරිදි තෙවන පාර්ශවයකට පැවරිය යුතුය. | හික්කඩුව අභිමංසල ව්‍යාපෘතියට අදාළව පෞද්ගලික සමාගමක් සමඟ ගිවිසුම් ප්‍රකාරව ඇති කර ගත් එකගතාවන් මේ තාක් සාක්ෂාත් වී නොමැති බැවින් සන්තකය ආපසු පවරා ගැනීම යටතේ නඩු පවරන ලෙසට හික්කඩුව ප්‍රාදේශීය ලේකම් වෙත ලිඛිතව දන්වා ඇත. | නෛතික ක්‍රියාමාර්ග ගන්නා ලෙසට හික්කඩුව ප්‍රාදේශීය ලේකම්ට දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ 2019 සංවර්ධන සැලස්ම යටතේ ස්වේච්ඡා සංවිධාන සඳහා ප්ලාස්ටික් පුටු 16056 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.15,880,200 ක් වැය කර තිබුණි.මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.<br>(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1 සහ 4.4 වගන්තිවලට අනුකූල නොවී දකුණු පළාතේ දිස්ත්‍රික්ක 03 සඳහා වෙන වෙනම කොටස්කර ප්‍රසම්පාදනයන් සිදුකර තිබිණු අතර, ප්‍රධාන ලේකම්ගේ අංක 3/2016 දරන හා 2016 අගෝස්තු 24 දිනැති චක්‍රලේඛයට අනුකූල නොවී භාණ්ඩ සඳහා වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමය යටතේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු අනුමත සීමාව ඉක්මවා, ඇස්තමේන්තු වටිනාකම රු. මිලියන 16.5 ක් වූ මෙම ප්‍රසම්පාදනය සිදුකර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට හා චක්‍රලේඛ වලට අනුකූලව කටයුතු නොකළ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. | දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දිස්ත්‍රික්ක පදනමින් වෙන වෙනම මිල ගණන් කැඳවා තිබූ බවත්, මින් ඉදිරියට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව නිවැරදිව කටයුතු කිරීමට පියවර ගන්නා බවත්, දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දක්වා ඇත. එහෙත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල නොවී කටයුතු කිරීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයන් ගෙන නොමැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල නොවී කටයුතු කිරීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. |
| (ii) ප්ලාස්ටික් පුටු මිලදී ගැනීම සඳහා වෙළෙඳපොල මිල සැඳැහුම් ක්‍රමය යටතේ සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීමේදී නිශ්චිත පිරිවිතරයන් සඳහන් නොකර, ප්ලාස්ටික් පුටු නිෂ්පාදිත ආයතනයකින් හා ප්ලාස්ටික් පුටු අලෙවිකරන වෙළඳසැල් | නිශ්චිත පිරිවිතරයන් සඳහන් කර මිල ගණන් කැඳවිය යුතුය. | ඉදිරියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කරන බව ප්‍රකාශ කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල නොවී කටයුතු කිරීම සම්බන්ධයෙන් සහ වැඩිපුර ගෙවන ලද රු.2,819,085 ක |

| | | | |
|---|---|---|---|
| වෙතින් මිල ගණන් කැඳවා තිබුණි.ඒ අනුව ප්‍රසම්පාදන කමිටුවට ලැබුණු අවම මිල ගණන් පිළිබඳව නොසලකා වැඩි මිලට පුටු 16,056 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු 2,819,085 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | | | මුදල සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. |
| (iii) අධිකාරිය විසින් මිළදී ගෙන තිබුණු ප්ලාස්ටික් පුටුවක මිළ වෙළෙඳ පොලේ පවතින සාමාන්‍ය මිළට වඩා වැඩි බවට විගණන ක්ෂේත්‍ර පරීක්ෂාවේදී අනාවරණය වූ අතර, ඍජුවම නිෂ්පාදන ආයතන වලින් මිළ ගණන් කැඳවීම නොකර, එක් නිෂ්පාදන ආයතනයක මිළ ගණන් සමග තොග හා සිල්ලර සැපයුම්කරුවන්ගේ මිළ ගණන් සැසඳීමෙන් පුටු මිළ දී ගැනීමට ප්‍රසම්පාදන තීරණ ගැනීම හේතුවෙන් රු. 4,300,988 ක පාඩුවක් රජයට සිදුකර තිබුණි. | රජයට සිදු වූ පාඩුව වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගත යුතුය. | මේ සම්බන්ධයෙන් පවත්වන ලද මූලික විමර්ශණයේ වාර්තාව අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර ඇති බවත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාදෙන උපදෙස් මත ඉදිරි ක්‍රියාමාර්ග සඳහා යොමු කර තිබුණද, මෙතෙක් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැත. | මෙතෙක් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| (ඉ) දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ මාණ්ඩලික නිලධාරීන්ගේ නිල වාහන දීමනා හා ඉන්ධන දීමනා පිළිබඳ පරීක්ෂාවේදී පහත දැක්වෙන කරුනු නිරීක්ෂණය විය. | | | |

| | | | |
|---|---|---|---|
| (i) භාණ්ඩාගාර ලේකම්ගේ අංක PED 1/2015 දරන හා 2015 මැයි 25 දිනැති චක්‍රලේඛයේ 3.1 හා 3.2 ඡේදයන්ට අනුකූල නොවී අධිකාරියේ සභාපතිවරයා විසින් පාවිච්චි කළ නිල වාහනය සඳහා 2016 වර්ෂයේ ජනවාරි මස සිට 2019 ජුනි මස දක්වා මසකට අනුමත ඉන්ධන ලීටර ප්‍රමාණය ඉක්මවා එකතුව රු. 1,999,984 ක් වූ ඉන්ධන ලීටර 17,092 ක් ද අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් පාවිච්චි කළ නිල වාහනය සඳහා 2016 ජනවාරි මස සිට 2018 වර්ෂයේ සැප්තැම්බර් මස දක්වා මසකට අනුමත ඉන්ධන ලීටර ප්‍රමාණය ඉක්මවා එකතුව රු.714,672 ක් වූ ඉන්ධන ලීටර 7256 ක් ඉන්ධන ඇනවුම් මගින් ලබාගෙන තිබුණි. | 2015 මැයි 25 දිනැති භාණ්ඩාගාර ලේකම්ගේ අංක PED 1/2015 දරන චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය . | මේ සම්බන්ධයෙන් නීති සහය ලබා ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර ඒ සඳහා උපදෙස් ලබා ගැනීමට කටයුතු කර ඇත. | අධිකාරියේ සභාපතිවරයා ගෙන් හා අධ්‍යක්ෂ ජනරාල්වරයා ගෙන් රජයට අයවිය යුතු පිළිවෙලින් රු.1,999,984 ක සහ රු.714,672 ක මුදල් අයකර ගැනීමට කටයුතු කර නැත. |
| (ii) යථෝක්ත චක්‍රලේඛයේ 3.3 ඡේදයට අනුකූල නොවී අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2018 වර්ෂයේ ඔක්තෝබර් මස සිට 2019 ජුනි මස දක්වා ප්‍රවාහන දීමනාව හා ඉන්ධන දීමනාව වශයෙන් එකතුව රු.750,000 ක් ලබා ගනිමින් අධිකාරියේ සංචිත වාහනයක්ද පාවිච්චි කර තිබුනි. | 2015 මැයි 25 දිනැති භාණ්ඩාගාර ලේකම්ගේ අංක PED 1/2015 දරන චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධයෙන් නීති සහය ලබා ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර ඒ සඳහා උපදෙස් ලද පසු ඉදිරි කටයුතු සිදු කරනු ලබන බව වාර්තා කර ඇත. | මේ සම්බන්ධයෙන් නිතී සහය ලබා ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තු ව වෙත යොමු කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | ඒ අනුව ඉන්ධන දීමනාවට හා ප්‍රවාහන දීමනාවට අමතරව රියදුරු වැටුප් හා දීමනා සඳහා එකතුව රු.619,826 ක් ද ඉන්ධන සඳහා එකතුව රු.400,199 ක් ද අධිකාරිය විසින් අමතරව වැය කර තිබුණි | | | |
| **11.** | **අවිධිමත් ගනුදෙනු** | | | |
| | වැලිපිටිය නැවුරල් පාක් නැමැති පෞද්ගලික අයෙකුට හිමි ඉඩමක් වෙන්දේසි කිරීමේදී වෙන්දේසිකරු විසින් විදුලිය හා ජලය සපයා ඉඩම වෙන්දේසි කළයුතු වුවද, එම වෙන්දේසි ඉඩමට විදුලිය ලබාදීම සඳහා සමාලෝචිත වර්ෂයේ ජුනි 21 දින ධීවර අමාත්‍යාංශය විසින් රු.1,674,654 ක් ගෙවා තිබුණි. | අමාත්‍යාංශ විසින් ගෙවූ මුදල් අදාළ පාර්ශවයන්ගෙන් අයකරගත යුතුය | වෙන්දේසි ඉඩම වෙනුවෙන් විදුලිය ලබා ගැනීම සඳහා වැය වූ මුදල් අයකර ගැනීමට සහ ඒ සඳහා අනුමැතිය ලබා දුන් අයට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | මේ දක්වාම අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොමැත. |
| **12.** | **කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු** | | | |
| (අ) | යශෝරාපුර ආදර්ශ ගම්මානය සඳහා තොරතුරු මධ්‍යස්ථානයක් ඉදිකිරීම වෙනුවෙන් රු 26,924,982 ක මුදලකට 2016 දෙසැම්බර් 31 දින වන විට කර්මාන්තයේ වැඩ නිම කිරීමට 2016 දෙසැම්බර් 23 දින පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙක් සමග ගිවිස ගෙන තිබුණි.මහල් 02 කින් යුතු ගොඩනැගිල්ල දින 08 කින් නිම කිරීමට ගිවිසුම් ගත වී තිබිණද , කර්මාන්තයේ වැඩ නිම කර 2019 වර්ෂය අවසාන වන තෙක් භාර දී නොතිබිණි.කාර්ය සාධන බැදුම්කර | කර්මාන්තයේ කාලය දීර්ඝ කිරීම සමඟ කාර්යසාධන බැඳුම්කරයේ කාලය දීර්ඝ කල යුතු අතර නිසි ප්‍රමිතියෙන් හා ගිවිසුම්ගත වටිනාකම් අනුව ඉදිකිරීම් ඉටුකර ගතයුතුය. ඉටු නොකළ වැඩ සහතික කිරීම | ගිවිසුම් ප්‍රකාරව ලැමිනේටඩ් ටෙම්පර්ඩ් වීදුරු සවිකර ඇති නමුත්, ඉටු නොකළ වැඩ සහතික කිරීම වෙනුවෙන් වගකිව යුතු නිලධාරීයාට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමේ කටයුතු අවසන් කර නොමැත. | මෙවන විට ලැමිනේටඩ් ටෙම්පර්ඩ් සවිකර ඇත. ඉටු නොකළ වැඩ සහතික කිරීම සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | දීර්ස කර නොතිබු අතර කර්මාන්තයේ කාලය දින 842 කින් දීර්ස කර තිබුණි.ලැමිනේට් ටෙම්පර්ඩ් වීදුරු සවි කිරීම වැඩ විෂයය සඳහා අදාළ කාර්යය සිදු කිරීමකින් තොරව රු.7,144,677 ක මුදලක් ගෙවා තිබුණි. | සම්බන්ධයෙන් අදාළ නිලධාරින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. | | |
| (ආ) | ඇල්පිටිය මහජන ක්‍රීඩාංගනය ඉදිකිරීම සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.<br>(i) වැඩ විෂය අංක B – 2 අනුව අනුමත ගුණත්වයෙන් යුතු පස් සපයා මුට්ට කළයුතු අතර, (Approved Quality soil supplying and pilling) ක්‍රීඩාපිටියට සපයන ලද පස්වල තිබිය හැකි ගල්වල උපරිම විශාලත්වය මි.මී.37.5 ක් වුවද, සපයා අතුරන ලද පස්වල අඩි 1 1/2 ක් වූ ගල්ද පැවතුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව නිසි ගුණත්වයෙන් තොරව පස් සපයා තිබියදී ඒ පිළිබඳව නොසලකා සැපයුම්කරු වෙත රු.3,354,000 ක් ගෙවා තිබුණි. පසුව සපයන ලද පස්තට්ටුවේ ඇති ගල් වෙනුවෙන් පස් ඝණ මීටර් 75 ක් අඩුකර ගෙවීම් කර තිබූ නමුත් එය නිවැරදි ක්‍රියාමාර්ගයක් නොවීය. | ඇස්තමේන්තුව පරිදි නියමිත ප්‍රමිතියෙන් යුතු ද්‍රව්‍ය සපයා ගතයුතුය. | නියමිත ප්‍රමිතියෙන් යුත් පස් නොසපයා ගෙවීම් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නියමිත ප්‍රමිතියෙන් යුත් පස් නොසැපයීම සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයන් ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) යන්ත්‍ර මඟින් පස් තුනී කිරීම සඳහා අඩු මිලගණන් තිබියදී, ශ්‍රමිකයන් යොදවා පස් තුනී කිරීම සඳහා වැඩි මිලගණන් ඇස්තමේන්තුවට ඇතුළත්කර ගෙවීම් කිරීම නිසා පළාත් සභාවට රු. 956,535 ක පාඩුවක් සිදුව තිබුණි. | ප්‍රායෝගික මෙන්ම ආර්ථික වනසේ මිලගණන් සකස්කළයුතු අතර පළාත් සභාවට සිදුවූ පාඩුව අයකර ගත යුතුය. | පළාත් සභාවට සිදු වූ පාඩුව අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැත. | පළාත් සභාවට සිදු වූ පාඩුය අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| | (iii) ගංගා වැලි වෙනුවට විධිමත් අනුමැතියක් රහිතව මුහුදු වැලි භාවිතාකර තිබුණු අතර ඒ අනුව වැලි මීටර් කියුබ් 200 ක් සඳහා මීටර් කියුබ් 1 කට රු.3,998 බැගින් රු.799,600 ක් වැඩිපුර ගෙවා තිබුණි. 2018 දෙසැම්බර් 3 දිනැතිව රුහුණු විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨය විසින් මේ පිළිබඳව ලබාදී තිබූණු පරීක්ෂණ වාර්තාව අනුව මුහුදු වැලි යෙදීමට පෙර කිසිඳු පරීක්ෂණයක් කර නොතිබුණු අතර එම සිනිඳු වැලි යෙදීම හේතුවෙන් දිගුකාලීනව ජල වහන පද්ධතිය අක්‍රීය වන බව වාර්තා කර තිබුණි. | පරීක්ෂණයකින් හා අනුමැතියකින් තොරව සිදුකරන ලද ඉදිකිරීම් සඳහා වැඩිපුර ගෙවනලද මුදල් ආපසු අයකර ගත යුතුය.මෙවැනි අක්‍රමිකතා සම්බන්ධයෙන් විනයානුකූල පියවර ගත යුතුය. | රුහුණු විශ්ව විද්‍යාලයේ සිවිල් සහ පාරිසරික ඉංජිනේරු අධ්‍යයනාංශයෙන් වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කර ඇති බව දක්වා තිබුණු අතර වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට සහ එයට වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නිරීක්ෂණය මඟින් පෙන්වා දී ඇති රු.799,600 ක් වූ වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට මේ දක්වාම කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක මාතර කතරගම නව දුම්රිය මාර්ග ව්‍යාපෘතියේ රු.35,381,059 ක මූල්‍ය ප්‍රතිපාදන මත මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් 2014 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද | මෙම ව්‍යාපෘතියේ කටයුතු අධීක්ෂණය කරන ලද නිලධාරින් සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර අවශ්‍ය | මේ වන විට දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) විසින් ඉහත කරුණට අදාළව වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණයෙන් | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) විසින් විනය පරීක්ෂණයක් සිදු කර |

| | | | |
|---|---|---|---|
| බෙරුවල ප්‍රදේශයේ ඇළ මාර්ග 03 ක නවීකරණ කටයුතු පිළිබඳව අධීක්ෂණය මාතර දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ ඉංජිනේරු හා දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ කාර්මික නිලධාරීන් විසින් සිදුකර තිබුණි. මෙම ඉදිකිරීම් සම්බන්ධයෙන් 2017 වර්ෂයේදී සිදුකරන ලද විගණන පරික්ෂාවේදී ඉටුනොකළ වැඩ, නියමිත ප්‍රමිතියට ඉටු නොකළ වැඩ, සාවද්‍ය මිනුම් මතවූ වැඩ සහ විධිමත් අනුමැතියක් රහිතව ඉටුකරන ලද බාහිර හා අමතර වැඩ සඳහා ගෙවීම් නිර්දේශ කිරීම වැනි අඩුපාඩු රාශියක් නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් නිකුත් කරන ලද විගණන විමසුමට අනුව මෙම ව්‍යාපෘතියේ කටයුතු අධීක්ෂණය කරන ලද නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර අවශ්‍ය පියවර ගැනීම සඳහා ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම් විසින් අදාළ විගණන විමසුමේ පිටපතක් දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්වරයා වෙත 2018 මාර්තු 27 දින යොමුකර ඇතත්, අදාළ නිලධාරීන් සම්බන්ධයෙන් වූ මූලික විමර්ශණය 2019 මාර්තු 31 දක්වා නිමකර නොතිබුණි. | පියවර ගත යුතුය. | අනතුරුව තාක්ෂණ සේවා නිලධාරී දෙදෙනා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්ගේ (ඉංජිනේරු සේවා) අංක 1/2/10/21 හා 2020.05.06, 2020.08.10 දිනැති ලිපි මගින් නිදොස් කොට නිදහස් කර ඇති බව දන්වා ඇත.<br>එසේම මාතර සහකාර කොමසාරිස් කාර්යාලයේ තාක්ෂණික සේවා නිලධාරි (විශේෂ පන්තිය) සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් තවදුරටත් පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කර ඇත. | තාක්ෂණික සේවා නිලධාරීන් දෙදෙනකු නිදොස් කොට නිදහස් කර ඇති අතර දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් තවදුරටත් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රතිපාදන මත 2014 වර්ෂයේදී ආරම්භ කර 2016 වර්ෂයේදී නිම කරන ලද කටුවන ප්‍රාදේශීය සභාවට අයත් කිරම බස් නැවතුම්පොළ අලුත්වැඩියා කිරීමේ ඇස්තමේන්තුවේ වැඩ විෂයය අංක U – 02 යටතේ වූ මිලිමීටර් 200x75x80 ප්‍රමාණයේ කොන්ක්‍රීට් කුට්ටි ගල් වෙනුවට මිලිමීටර් 222x111x80 ප්‍රමාණයේ කුට්ටි ගල් අතුරා තිබියදී, ඒ පිළිබඳව නොසලකා හා අදාළ කොන්ක්‍රීට් කුට්ටි ගල්වල ශක්තිය පිළිබඳ පරීක්ෂණ වාර්තාවක් ලබා ගැනීමකින් තොරව රු.2,452,808 ක් ගෙවා තිබුණි. මේ පිළිබඳව විගණන විමසුමක් තිබියදී ඒ පිළිබඳ නොසලකා කොන්ත්‍රාත්කරුට රඳවුම් මුදල්ද ගෙවා තිබුණි. 2018 ජනවාරි 22 දින සිදු කරන ලද රසායනාගාර පරීක්ෂාවට අනුව මෙම කොන්ක්‍රීට් කුට්ටි ගල් නියමිත ප්‍රමිතියෙන් තොර බව තහවුරු විය. | ඇස්තමේන්තුව පරිදි නිසි ප්‍රමිතියෙන් යුතු ද්‍රව්‍ය යොදාගත යුතුය. | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් පත්කළ කමිටුවක් මගින් මේ පිළිබඳව විමර්ශනයක් කර කමිටු වාර්තාව පළාත් පාලන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. | පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මඟින් පත්කළ කමිටුවක් මඟින් මේ පිළිබඳව විමර්ශනයක් සිදුකර කමිටු වාර්තාව පළාත් පාලන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. |
| (ඉ) | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් 2014 වර්ෂයේදී හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් 2015 සහ 2017 වර්ෂවලදී මාතර දිස්ත්‍රික් ලේකම් වෙත ලබාදී තිබුණු මූල්‍ය ප්‍රතිපාදන මත රු.35,721,029 ක් වැයකර ඉදිකරන ලද දෙයියන්දර ප්‍රාථමික පාසල සඳහා වූ | නිසි ප්‍රමිතියට ඉදිකිරීම් ඉටුකර ගැනීමට කටයුතු කළයුතුය. | තවදුරටත් මෙම ගොඩනැගිලි නිෂ්කාර්යව පවතී. | රු.35,721,029 ක් වැයකර ඉදිකරන ලද දෙයියන්දර ප්‍රාථමික පාසල පවත්වා ගෙන යාමට සුදුසු භෞතික |

| | | | |
|---|---|---|---|
| ගොඩනැඟිලි භාරගැනීම පළාත් අධ්‍යාපන බලධාරීන් විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් 2019 අප්‍රේල් 10 දින දක්වා මෙම ඉදිකිරීම් නිෂ්කාර්යව පැවතුණි. | | | පරිසරයක් නොමැති වීම මත මේ දක්වාම පාසල ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. |

**13. නිශ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්**

-------------------------------------

| | | | |
|---|---|---|---|
| දකුණු පළාත් සංවර්ධන අධිකාරියට අයත් වාලිමවුන්ට් කර්මාන්තපුරයේ කාර්යාලය පිහිටි ගොඩනැලිලේ ප්‍රධාන ශාලාව හා එයට යාබද වූ කාමර 03 වර්ෂයකට පෙර රු.2,899,471 ක් වැයකර නවීකරණය කර තිබුණද, ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | වත්කම් වලින් උපරිම ප්‍රයෝජන ගැනිමට කටයුතු කිරීම | මෙම පරිපාලන ගොඩනැගිල්ල හා යාබද කාමර 03 ඇතුළත් පරිශ්‍රය තුළ කර්මාන්ත පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම සඳහා ව්‍යාපෘති වාර්තාවක් සකස්කර, ඊට අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කිරීමට කටයුතු කර ඇති බව හා එම වාර්තාව අනුව මෙම ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කිරීමට නියමිතය. | මේ දක්වාම ප්‍රයෝජනයට ගැනීමක් සිදු කර නොමැත. |

**14. ප්‍රසම්පාදනය**

---------------

| | | | |
|---|---|---|---|
| ඇල්පිටිය මායිම්තැන්න කෘෂිකර්ම අධිකලාපයේ භූමිය සකස් කිරීම සඳහා දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට පවරා තිබුණද අදාළ ප්‍රසම්පාදනයන්ට පෙර ස්කැවේටර් යන්ත්‍රයක් දින 05 ක් එම අධිකලාප භූමියේ අක්කර 03 ක පමණ භූමි ප්‍රදේශයක් සකස් කිරීමේ කටයුතුවල යොදවා ගෙනතිබුණි. | ප්‍රාදේශීය ඉංජිනේරු තනතුරේ වැඩබලන ලද කාක්ෂණික නිලධාරියාගෙන් එම අලාභය අයකර ගැනීමට සහ ඔහුට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. | වර්ග මීටර් 300 ක පමණ ප්‍රදේශයක භූමිය හෙළි පෙහෙළි කර තිබීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ඉංජිනේරු තනතුරේ වැඩ බලන ලද තාක්ෂණික නිලධාරීයා නොදන්නා බව ප්‍රකාශ කළ බවත්, මෙම සිදුවීම පිළිබඳ ආයතනික පරීක්ෂණයක් සිදුකළ නමුත්, ඒ සම්බන්ධයෙන් කිසිම | ඇල්පිටිය ප්‍රාදේශීය ඉංජිනේරු තනතුරේ වැඩ බලන ලද තාක්ෂණික නිලධාරීයා එම තනතුරෙන් ඉවත් කර ඇත. මේ සම්බන්ධව මෙම |

| | | | |
|---|---|---|---|
| | | තොරතුරක් ලබා ගැනීමට නොහැකි වූ බවත්, තොරතුරු වසන් කිරීම මගින් වරදක් සිදුකර ඇති ඇල්පිටිය ප්‍රාදේශීය ඉංජිනේරු තනතුරේ වැඩබලන ලද තාක්ෂණික නිලධාරීයා එම තනතුරෙන් ඉවත් කර ඇත. වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | නිලධාරීයාට එරෙහිව වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. |

**15. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

-----------------------------

| | | | |
|---|---|---|---|
| කැකණදුර කුකුළු ගොවිපලේ සත්ත්ව නිෂ්පාදන ආශ්‍රිත කටයුතු සඳහා නළ ළිඳක් ඉදිකිරීමට 2019 වර්ෂයේදී සහ 2020 සමාලෝචිත වර්ෂයේදී පළාත් නිශ්චිත සංවර්ධන සැලැස්ම මගින් රු.1,207,933 ක් ජල සම්පාදන මණ්ඩලයට ගෙවා තිබුණද අදාළ ව්‍යාපෘතියේ වැඩ අවසන් කර අදාළ කාර්යය සඳහා යොදවා ගෙන නොතිබුණි. | ගිවිසුම්ගත පරිදි කඩිනමින් අදාළ ව්‍යාපෘතියේ වැඩ නිම කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. | මේ දක්වාම වැඩ අවසන් කිරීමට කටයුතු කර නොමැත. | ව්‍යාපෘතියේ වැඩ අවසන් කර අදාළ කාර්ය සඳහා යොදවා ගෙන නොතිබුණි. |

**16. හඳුනා ගන්නා ලද පාඩු**

--------------------------

| | | | |
|---|---|---|---|
| දකුණු පළාත් සභාවේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු හා කාර්යාල වලට අයත් නොවිසඳී පවතින අවස්ථා 104 කට අදාළ රු.14,367,682 ක වාහන අනතුරු සම්බන්ධ හානි, අවස්ථා 15 කට අදාළ රු.1,459,142 ක දේපළ හානි වල එකතුව රු.15,826,824 ක් විය. | මු.රෙ.104 ප්‍රකාරව කටයුතු කළ යුතුය. | වාහන සහ දේපළ හානි සම්බන්ධව කටයුතු කිහිපයක් අවසන් කර ඇති බවත් ඉතිරි හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරමින් පවතින බවත් එමෙන්ම ඒ සඳහා නීති උපදෙස් අනුගමනය කරමින් පවතින බවත් වාර්තා කර ඇත. | වාහන අනතුරු සම්බන්ධව හානි හා දේපළ හානි සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නිරවුල් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

**17.** **පොදු තැන්පත් ගිණුම්**

| | | | |
|---|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයට අනුව මු.රෙ. 571 ප්‍රකාරව ආයතන 07 කට අයත් නියාදනය නොකළ තැන්පත් ශේෂ එකතුව රු.64,704,758 ක් විය. | කල් ඉකුත් වූ තැන්පත් පිළිබඳ මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය. | රු.58,309,545 ක මුදලක් තවදුරටත් නිරවුල් කිරීමට ඇත. | රු.58,309,545 ක මුදලක් තවදුරටත් නිරවුල් කිරීමට ඇත. |

**18.** **හිඟ සේවක ණය**

| | | | |
|---|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් වල එකතු ශේෂය රු.1,243,111,752 ක් ජංගම වත්කම් ලෙස දක්වා තිබූ අතර එම ශේෂයට ස්ථානමාරුවී ගිය, විශ්‍රාමගිය හා මියගිය වැඩ තහනම් කළ සේවය හැර ගිය සහ සේවයෙන් පහකළ නිලධාරීන් 918 දෙනෙකුගෙන් වර්ෂයක් ඉක්මවා අයනොවී පවතින එකතුව රු.42,950,767 ක් වූ ණය ශේෂ ඇතුළත්ව තිබුණි. | මෙම ණයශේෂ නිරවුල් කිරීමේ කටයුතු ආයතන මඟින් සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | අදාළ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරමින් පවති. | නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. |

**19.** **දෘශ්‍ය අක්‍රමිකතා**

| | | | |
|---|---|---|---|
| දකුණු පළාත් සංවර්ධන අධිකාරිය විසින් ඌන උපයෝජිත අරමුදල් භාවිතා කරමින් ව්‍යවසායකත්ව දිරිබල සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ 2019 වර්ෂයේදී බාහිර පුද්ගලයන් දෙදෙනෙකුට SPEED LOAN ණය ලෙස එකතුව රු. 5,000,000 ක් ලබාදී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.<br>(i) මෙම ණය යෝජනා | නිසි අනුමැතිය හා ඇප සුරකුම් ලබාගෙන ණය ලබාදිය යුතුය. | මෙම ණය යෝජනා ක්‍රමය සඳහා අනුමැතිය නොලැබීම මත එය මේ වන විට නතර කර ඇති බවත් මෙම ණය ක්‍රමය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදු කර ඇති බවත් එහිදී අනාවරණය වූ කරුණු අනුව ඊට අදාළ අධ්‍යක්ෂ ජනරාල්වරයා සඳහා වැඩතහනම් ලක් කර ඇත. | මෙම ණය යෝජනා ක්‍රමය සඳහා අනුමැතිය නොලැබීම මත ණය නතර කර ඇත. අදාළ නිලධාරීයා සම්බන්ධව විනය ක්‍රියාමාර්ග ගෙන වැඩ |

| | | | | |
|---|---|---|---|---|
| | ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා දකුණු පළාත් ප්‍රධාන ලේකම්තුමාගේ, දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්), දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ හෝ අනුමැතිය ලැබී නොතිබුණු අතර, ණය කරුවන්ගෙන් ඇප සුරැකුම් ලබානොගෙන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ පෞද්ගලික ඉඩම ඇප සුරැකුම් ලෙස තබාගෙන ණය මුදල් නිදහස් කර තිබුණි. | | තවදුරටත් නෛතික ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | තහනමකට ලක් කර ඇත. තවදුරටත් නෛතික ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |
| (ii) | පළාත් සභා මූල්‍ය රීති 83 ප්‍රකාරව නිකුත් කළ ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ මූල්‍ය බලතල චක්‍රලේඛයට අනුකූල නොවී ණය මුදල් ගෙවීමට අදාළ වවුචර් පත් අනුමත කිරීම, සහතික කිරීම හා ගෙවීම යන සියලු කටයුතු දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින්ම සිදුකර තිබුණු අතර, ණය කරුවන් නමින් නිකුත් කරන ලද එකතුව රු.5,000,000 ක් වූ චෙක්පත් දෙකෙහිම රේඛනය අවලංගු | පළාත් මූල්‍ය රීති 83 අනුව නිකුත් කළ මූල්‍ය බලතල චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. | මේ යටතේ ප්‍රතිලාභීන් දෙදෙනෙකු වෙත වාර්ෂික පොලී අනුපාතිකය 15% යටතේ ලබා දී ඇති ණය මුදල රු 5,000,000 ක් වන බවත් 2019.07.29 දින වන විට ණය මුදල හා පොලිය රු.58,995 සමග සම්පූර්ණයෙන් ගෙවා අවසන් කර ඇති අතර තවදුරටත් නෛතික ක්‍රියාමාර්ග ගනිමින් පවති. | අදාළ අධ්‍යක්ෂ ජනරාල්වරයා වැඩ තහනමකට ලක් කර ඇත. තවදුරටත් නෛතික ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| කර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ම බැංකු කවුන්ටරයෙන් මුදල් ලබාගෙන තිබුණි. එසේම ණය ලාභියෙකුගේ රු. 1,557,610 ක් වූ ණය වාරිකයන් අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ගෙවා තිබුණු අතර, ඉදිරියේදී ගෙවිය යුතු ණය වාරික සඳහා අධ්‍යක්ෂ ජනරාල්ගේ පෞද්ගලික ජංගම ගිණුමට අදාළව වටිනාකම හා දිනය සඳහන් නොවූ හිස් චෙක්පත් 06 ක් භාර දී තිබුණි. | | | |
| **20. වත්කම් කළමණාකරණය** | | | |
| **වාහන අපහරණය** | | | |
| දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් වාහන 08 ක් භාවිතයෙන් තොරව ප්‍රාදේශිය ඖෂධ ගබඩා භූමියේ ගාල්කර තිබිණු අතර, ඉන් වාහන 06 ක් අපහරණය කිරීමට නිර්දේශ කර තිබිණි.එම වාහන වෙනත් ආයතනයකට ලබා දීමට හෝ රාජ්‍ය මුදල් චක්‍රලේඛය 02/2015 විධිවිධාන ප්‍රකාරව අපහරණය කිරීමට කටයුතු කර නොතිබිණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2015 අනුව කටයුතු කළ යුතුය. | මෙම වාහන අතුරින් LB – 1909 දරන වාහනයේ හිමිකාරීත්වය රේඛීය අමාත්‍යාංශය වෙත බැවින් අපහරණය සඳහා රේඛීය අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. පළාත් අධ්‍යක්ෂ වෙත හිමිකාරීත්වය පැවරෙන 52 – 6802,SRI 6818 ,GE – 8007, 42 SRI 243, QC – 5674 ,JY – 6503, JY 6508 වාහන සම්බන්ධයෙන් අපහරණය කිරීමට අදාළ කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. | තව දුරටත් පවතින අපහරණය සඳහා නිර්දේශිත වාහන 04 ක් තක්සේරු කිරීම සඳහා තක්සේරු මණ්ඩලයක් පත් කර ඇත. |

## 21. නොවිසඳී ඇති විගණන ඡේද

---------------------------------

| | | | |
|---|---|---|---|
| 2017 නොවැම්බර් 07 දින පැවති පාර්ලිමේන්තු රාජ්‍ය ගිණුම්කාරක සභාවේ නියෝගය ප්‍රකාරව දකුණු පළාත් අධ්‍යාපන ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය විසින් ලියාපදිංචිය අක්‍රීය සැපයුම්කරුවන්ට ගෙවන ලද එකතු කළ අගය මත බදු මුදල් වහාම අයකර රාජ්‍ය ආදායමට බැර කළ යුතු වුවද කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුගෙන් අයකර ගත යුතු වූ එකතුව රු.921,535 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | රු.921,535 ක් වූ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොමැත. |

**2018, 2019 හා 2020 වර්ෂ වෙනුවෙන් වූ ත්‍රෛවාර්ෂික විගණකාධිපති වාර්තාව**

**---------------------------------------------------------------------------------**

විගණිත ආයතනයේ නම - උතුරු පළාත් සභාව

මූල්‍ය ප්‍රකාශන මත විගණන මතය

2018 වර්ෂය සඳහා - තත්ත්වාගණනය කළ මතය

2019 වර්ෂය සඳහා - තත්ත්වාගණනය කළ මතය

2020 වර්ෂය සඳහා - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියා මාර්ග | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | **2018 වර්ෂය** | | | |
| **01.** | පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් දීර්ඝ කාලයක සිට අබලන්ව පවතින වාහන 20 ක් බැහැර කිරීම සම්බන්ධයෙන් 2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි අවශ්‍ය පියවර 2019 ජුනි 28 දින දක්වා ගෙන නොතිබුණි. | අදාළ චක්‍රලේඛයට අනුව නියමිත කාලය තුළ අවශ්‍ය පියවර ගත යුතුය. | භාවිතයට ගත නොහැකි වාහන 07 ක් විකිණීමටත්, වාහන 07ක හිමිකම ප්‍රධාන ලේකම්වරයා වෙත පැවරීමටත්, වාහන 06 ක් අලුත්වැඩියා කර භාවිතයට ගැනීමටත් කටයුතු කර ඇත. | වාහන 11ක් තවදුරටත් අභාවිතව පවතී. |
| **02.** | සමාලෝචිත වර්ෂය තුළ නිම කළ යුතු, එකතුව රු.මිලියන 48.2 ක් වූ පාලම්පිඩි කෘෂිකර්ම පුහුණු ඒකකය, කෘෂිකර්ම උපදේශක කාර්යාලය, වට්ටකච්චි දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු ඒකකය සහ මන්නාරම කලාප අධ්‍යාපන කාර්යාල ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු මේ දක්වා අවසන් කර නොතිබුණි. | නියමිත දිනට ඉදිකිරීම් කටයුතු නිම කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. | ඉදි කිරීම් නිමකර තිබුණි. | සියලු ගොඩනැගිලි අභාවිතව පවතී. |

## 03. නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ

---

| | | | | |
|---|---|---|---|---|
| (අ) | උතුරු නැගෙනහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II පන්තියට අවිධිමත් පත් කිරීමක් 1999 වර්ෂයේ දී සිදු කර තිබුණි. | පළාත් ගිණුම් කාරක සභාව නියම කළ නිර්දේශ පරිදි ඉදිරි කටයුතු සිදු කළ යුතුය | ගිණුම් කාරක සභාවේ නිර්දේශ පරිදි කමිටුවක් පත්කර විමර්ශනයක් සිදුකර අදාළ වාර්තා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමුකර තිබුණි. | අධ්‍යාපන අමාත්‍යාංශය වෙත දන්වා තිබීම හැර, වෙනත් ප්‍රගතියක් නොවීය. |
| (ආ) | එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වූ බවට සහතිකයක් ලබා ගැනීමකින් තොරව ප්‍රාදේශීය සභා මඟින් කොන්ත්‍රාත්කරුවන් වෙත රු.මිලියන 3.16 ක් වටිනා එකතු කළ අගය මත බදු ගෙවා තිබුණි. | පළාත් ගිණුම් කාරක සභාව නියම කළ නිර්දේශ පරිදි ඉදිරි කටයුතු සිදු කළ යුතුය. | එම මුදලින් කොටසක් අයකර තිබුණි. | රු. 670,000ක් තවදුරටත් අය වීමට පවතී. |
| (ඇ) | පුවත්පත් දැන්වීම්වල බඳවා ගැනීමේ සුදුසුකම් සාවද්‍ය ලෙස දක්වමින් 2014 වර්ෂයේදී යාපනය මහා නගර සභාව විසින් විදුලි කාර්මිකයින් 07 දෙනෙකු බඳවා ගෙන තිබුණි. උතුරු පළාත් ගිණුම්කාරක සභාව විසින් 2018 අගෝස්තු 15 දින මේ සම්බන්ධයෙන් ලබා දුන් නිර්දේශයට අනුව උතුරු පළාත් පාලන කොමසාරිස්වරයා විසින් ගනු ලැබූ ඉදිරි පියවර මේ දක්වා විගණනය වෙත ලැබී නොතිබුණි. | පළාත් ගිණුම් කාරක සභාව නියමය පරිදි, සාවද්‍ය දැන්වීම් ඉදිරිපත් කිරීමට අදාළ නිලධාරීන් ඇතුළු වගකිව යුතු සියලු නිලධාරීන්ට එරෙහිව විමර්ශනයක් සිදු කළ යුතුය. | මෙම බඳවා ගැනීමට අදාළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය නිවැරදිව කටයුතු කර නොමැති බවට උතුරු පළාත්, පළාත් පාලන කොමසාරිස්වරයා විසින් දක්වා තිබුණි. | මෙම අවිධිමත් බඳවා ගැනීම සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| **(ඇ)** | යාපනය මහා නගර සභාවේ කළමනාකරණ සහකාර නිලධාරිනියක විසින් 2016 වර්ෂයේදී සිදුකළ රු.මිලියන 2.93 ක මුදල් වංචාව සම්බන්ධයෙන් 2018 අගෝස්තු 15 දින පැවති උතුරු පළාත් ගිණුම්කාරක සභාවේ නිර්දේශයට අනුව උතුරු පළාත් පළාත් පාලන කොමසාරිස්වරයා විසින් ගනු ලැබූ ඉදිරි පියවර මේ දක්වා විගණනය වෙත ලැබී නොතිබුණි. | පළාත් ගිණුම් කාරක සභාව නියම කළ නිර්දේශ පරිදි ඉදිරි කටයුතු සිදු කළ යුතුය. | මෙම මුදල අයකර ගැනීම සඳහා ප්‍රධාන ලේකම් විසින් එම නිලධාරිනියට එරෙහිව අභියාචනාධිකරණයේ නඩු පැවරීමට කටයුතු කරමින් සිටී. | නඩු පැවරීමට මේ දක්වාම කටයුතු කර නොතිබුණි. |

**2019 වර්ෂය**

---------------

| | | | | |
|---|---|---|---|---|
| **04.** | උතුරු පළාත් සභාව විසින් 2011 වර්ෂයේදී රු. 8,500,000කට මිල දී ගත් ගිලන් රථයක් කි.මී. 9000ක් ධාවනය කිරීමෙන් පසු අනතුරට පත් වී තිබුණි. මෙම රථය අලුත්වැඩියා කිරීම වෙනුවට, අවිධිමත් ලෙස මුලතිව් දිස්ත්‍රික් රෝහලේ ඉන්වෙන්ට්‍රි ලේඛනයෙන් කපා හැරීමට හා ජංගම නොවන වත්කම් පිලිබඳ ප්‍රකාශනයෙන් ඉවත් කිරීමට සමාලෝචිත වර්ෂය තුළ පියවර ගෙන තිබුණි. | විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කර ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි අනුව සුදුසු පියවර ගත යුතුවේ. | පළමු මූලික විමර්ශන වාර්තාව අසම්පූර්ණය. පසුව, නැවත විමර්ශනයක් ආරම්භ කළ අතර එය අවසන් අදියරේ පවතී. | මේ දක්වාම සුදුසු පියවර ගෙන නොතිබුණි. |
| **05.** | උතුරු පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙනුවෙන් සන්දිලිප්පායි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත කළ නිලධාරියා විසින් ආදායම් බලපත්‍ර | විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කර නිර්දේශ ක්‍රියාත්මක කිරීම | මේ සම්බන්ධයෙන් වූ මූලික විමර්ශන වාර්තාව 2021 අප්‍රේල් 08 දින උතුරු පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට භාර දී | සියලු මුදල් අයකර තිබුණද, අදාළ නිලධාරියාට එරෙහිව අවශ්‍ය |

| | | | | |
|---|---|---|---|---|
| | ගාස්තු රු. 1,499,535ක් වංචා සහගත ලෙස ලබා ගෙන තිබුණි. | හා සුදුසු අභ්‍යන්තර පාලන පිළිවෙත් ක්‍රියාත්මක කළ යුතු ය. | තිබුණි. | විනය පියවර ගෙන නොතිබුණි. |
| **06.** | වට්ටකච්චි ආයුර්වේද රෝහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීමේදී සාවද්‍ය මිනුම් මත රු. 718,395ක් කරච්චි ප්‍රාදේශීය සභාව විසින් ගෙවා තිබුණි. | සම්පූර්ණ කළ වැඩ සඳහා පමණක් ගෙවීම් කළ යුතු අතර වැඩිපුර කළ ගෙවීම් අප්‍රමාදව අයකරගත යුතු ය. | මෙම මුදලින් අය නොකළ ඉතිරි රු. 517,378ක් අයකර ගැනීම සඳහා විමර්ශනයක් සිදු කෙරේ. | රු. 517,378ක මුදලක් තවදුරටත් අය වීමට තිබුණු අතර එම ගෙවීම් සිදුකළ නිලධාරීන්ට එරෙහිව විනය පියවර ගෙන නොතිබුණි. |
| **07.** | එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් සක්‍රීය බැඳියාවක් නොමැති කොන්ත්‍රාත්කරුවන් වෙත යාපනය අධ්‍යාපන කලාප කාර්යාලය විසින් එකතු කළ අගය මත බදු රු. 654,995ක් ගෙවා තිබීම වෙනුවෙන් වර්ෂ 2½ක කාලය තුළ කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | අදාළ බදු ගෙවීමට පෙර ඒ සඳහා කොන්ත්‍රාත්කරුවන් විධිමත්ව ලියාපදිංචි වී සිටී ද යන්න තහවුරු කරගත යුතු අතර දෝෂ සහගත ගෙවීම් අය කළ යුතු ය. | කිසිදු වැළැක්වීමේ ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | මේ දක්වාම සුදුසු පියවර ගෙන නොතිබුණි. |
| **08.** | පළාත් ජලසම්පාදන දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර 2019 අප්‍රේල් මාසයේදී රු. 4,041,004කට වෙන්දේසි කළ තොණ්ඩමනාරු ලවන ජල බාධකයේ පැරණි ලෝහමය ගේට්ටු | වෙන්දේසි භාණ්ඩ සඳහා නිවැරදි තක්සේරුවක් සිදු නොකිරීම, ඉවත් කර නොගත් | කිසිදු වැළැක්වීමේ ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් කිසිදු විමර්ශනයක් සිදුකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ගැනුම්කරු විසින් ගිවිසුම් කොන්දේසි පරිදි පැය 24කින් ඉවත් කර ගැනීම වෙනුවට මාසයක කාල ප්‍රමාදයකින් පසුව ඒවා ඉවත් කරගෙන තිබුණි. ඊට පසු එම ගැනුම්කරු වෙත ඉහත අයකළ මුදලින් සියයට 55ක් ආපසු ගෙවීමට පළාත් අධ්‍යක්ෂවරයා කටයුතු කිරීම නිසා රු. 2,211,335ක මූල්‍යමය හානියක් රජයට සිදු වී තිබුණි. | භාණ්ඩ සඳහා ගිවිසුම් කොන්දේසි පරිදි කටයුතු නොකිරීම, වෙන්දේසි මගින් විකුණුම් ලෙස අයකළ මුදලින් ආපසු ගැණුම්කරුට මුදල් ගෙවීම යනාදී දෑ පිළිබඳ විධිමත් විමර්ශනයක් සිදු කළ යුතු ය. | | |
| **09.** | මන්නාරම දිස්ත්‍රික් රෝහලේ පැවැති රු. 2,547,786ක ඖෂධ කල් ඉකුත් වී තිබුණි. උතුරු පළාත තුළ එක් රෝහලක අතිරික්තව පවතින ඖෂධ, වෙනත් රෝහල්වලට බෙදාහැරීමට ක්‍රමවේදයක් නොතිබීම මෙයට හේතු වී තිබුණි. | ඖෂධ තොග ප්‍රසස්ත මට්ටමින් පවත්වා ගැනීමට පිළිවෙත් සකස් කළ යුතු ය. | කිසිදු වැළැක්වීමේ ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | තව දුරටත් මෙවැනි අලාභහානි වැළැක්වීමට සුදුසු පියවර ගෙන නොතිබුණු අතර මේ දක්වාම විමර්ශන කමිටුව හෝ නම්කර නොතිබුණි. |

**2020 වර්ෂය**

---------------

| | | | | |
|---|---|---|---|---|
| **10.** | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2008 ජූනි 30 දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුමත කළ විශේෂ ශ්‍රේණීන් වන, පළාත් රාජ්‍ය පරිපාලන සමුපකාර සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තනතුරු සහ 2013 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුමත කළ විශේෂ ශ්‍රේණියක් වූ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලැසුම්) යන තනතුර සඳහා විශේෂ ශ්‍රේණියට අයත් නොවූ නිලධාරීන් තිදෙනෙකු පත්කර ඔවුන්ට විශේෂ ශ්‍රේණියට හිමි වැටුප් ගෙවීම නිසා එම ශ්‍රේණියට පත් කළ දින සිට 2020 දෙසැම්බර් දක්වා වැටුප් හා දීමනා ලෙස රු.2,192,191ක් වැඩිපුර ගෙවා තිබුණි. | මෙවැනි ගැටලු අප්‍රමාදව නිරවුල් කරගත යුතු ය. | මේ වෙනුවෙන් අවශ්‍ය උපදෙස් සඳහා රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. | මේ දක්වාම මෙම ගැටලුව නිරාකරණය වී නොතිබුණි. |
| **11.** | පළාත් දෙපාර්තමේන්තු 06ක සේවය කර, පසුව රාජකාරියට වාර්තා නොකළ, මියගිය, විශ්‍රාම ගිය සහ සේවයෙන් පහ කළ නිලධාරීන් 39 දෙනෙකුගෙන් රු. 2,781,384ක ණය ශේෂ අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. | හිඟ ශේෂ අප්‍රමාදව අයකරගත යුතු ය. | කිසිදු වැළැක්වීමේ ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | හිඟ ශේෂ අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| **12.** | පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුළ නිලධාරීන් 10 දෙනෙකුට රු.1,643,018ක අතිකාල දීමනා වැඩියෙන් ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් අප්‍රමාදව අයකරගත යුතු ය. | මෙම මුදලින් කොටසක් අයකළ අතර ඉතිරි මුදල් අය කරමින් පවතී. | නිලධාරීන් දෙදෙනෙකුගෙන් රු.1,009,275ක් අයකර ගැනීමට මේ දක්වාම කටයුතු කර නොතිබුණි. |
| **13.** | පූනාකරි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් 2018 අප්‍රේල් මාසයේදී රජය සතු රු.9,000,000ක් වටිනා කැබ් රථයක් පෞද්ගලික අවශ්‍යතාවක් වෙනුවෙන් ධාවනය කරන අතරතුර අනතුරට පත් වී මුළුමනින්ම විනාශ වී තිබුණි. වාහන අනතුර පිළිබඳව 2018 මැයි මාසයේදී මූලික විමර්ශනය සිදුකර ඉදිරිපත් කළ කෙටුම්පත් චෝදනා පත්‍රයේ සඳහන්ව තිබුණු පරිදි, අනුමැතියකින් තොරව වාහනය භාවිතා කිරීම, රාජකාරි නොවන පාර්ශවයන් කැඳවාගෙන යාම සහ නීතියට පටහැනිව වේගයෙන් රිය පදවා රජයේ දේපළවලට විශාල පාඩු සිදුකිරීම සම්බන්ධයෙන් වාර්තා කරන දින දක්වා විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | විමර්ශන වාර්තාව ලබා ගෙන ඊට අදාළ කටයුතු කඩිනමින් නිම කිරීම. | අවසන් විමර්ශන වාර්තාව මේ දක්වාම ලැබී නොතිබුණි. | මෙම මුදල ප්‍රතිපූරණය කිරිම රක්ෂණ ආයතනය ප්‍රතික්ෂේප කර තිබුණු අතර අදාළ අලාභ වගකිව යුතු නිලධාරියාගෙන් අයකර ගැනීමට අවශ්‍ය පියවර මේ දක්වාම ගෙන නොතිබුණි. |
| **14.** | යාපනය - කිලිනොච්චිය ජල සම්පාදන හා පවිත්‍රකරණ ව්‍යාපෘතිය මගින් රු.400,280,744ක වියදමින් ඉරණමඩු ජලාශයේ අතිරික්ත ජලවහනය සඳහා ලෝහමය වාන් දොරටු 14ක් හා සොරොව් දොරටු | කොන්ත්‍රාත්කරුගේ වගකීම් කාල සීමාව අදාළ පරීක්ෂාවන් ඉටු කරන තෙක් දීර්ඝ නොකිරීමට හේතු | කිසිදු වැළැක්වීමේ ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | සිදු වි තිබුණු අලාභය අයකර ගැනීම සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන |

| | | | | |
|---|---|---|---|---|
| | 02ක් සකස් කර තිබුණි. ප්‍රමාණවත් ජල ධාරිතාවක් එම දොරටු වෙත මුදා හැරීමට නොහැකි වීම හේතුවෙන් ඒවායේ ක්‍රියාකාරීත්වය පිළිබඳ ඇගයීමක් සිදු කිරීමට නොහැකි වී තිබුණි. එහෙත්, ඒ පිළිබඳ සැළකිලිමත් නොවී අදාළ කාර්යය වෙනුවෙන් වූ මුළු මුදලම කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. පසුව, ප්‍රමාණවත් ජල ධාරිතාවක් ලැබීමෙන් පසු එම දොරටු පරීක්ෂා කර අවශ්‍ය අඩුපාඩු නැවත සකස් කිරීම සිදුකර තිබුණි. රු. 11,389,680 ක් වූ එම නැවත සකස් කිරීම් පිරිවැය කොන්ත්‍රාත්කරු විසින් දරාගත යුතු වුව ද, එම මුදල පළාත් නිශ්චිත සංවර්ධන අරමුදලට වැය බරක් වන පරිදි ගෙවා දැමීමට පළාත් සභාව කටයුතු කර තිබුණි. | වූ කරුණු සොයා බලා අවශ්‍ය පියවර ගැනීම. | | නොතිබුණි. |
| **15.** | මන්නාරම නගර සභාවට අයත් කඩකාමර 30කට ගින්නෙන් වූ හානි සඳහා උතුරු පළාත් සභා අරමුදල් වැයකර පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් 2012 වර්ෂයේදී නිකුත් කළ ණයවලින් 2019 දෙසැම්බර් 31 දිනට පැවැති රු.3,584,000ක ශේෂයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.304,000ක් පමණක් නිරවුල් කර තිබුණි. | ණය අයකර ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතු ය. | මේ සම්බන්ධයෙන් නීතිමය කටයුතු සිදු කරමින් පවතී. | රු.3,280,000ක හිඟහිටි ණය ශේෂය මේ දක්වාම අයකර ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| **16.** | උතුරු පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් කයිතඩි රජයේ වැඩිහිටි නිවාසයට ආහාර ලබා දීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | | |
| (අ) | තෝරාගත් ලංසුකරු සමග එළැඹි ගිවිසුමට අනුව, එකඟ වූ මිල ගණන්වලට වඩා වැඩි මිල ගණන් මත ගෙවීම් කිරීම නිසා සමාලෝචිත වර්ෂය තුළ රු. 200,070ක පාඩුවක් රජයට සිදු වී තිබුණි. | විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කර අවශ්‍ය ඉදිරි පියවර ගැනීම. | මේ සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා කමිටුවක් පත්කර ඇත. | විමර්ශන කටයුතු නිමකර සුදුසු පියවර ගෙන නොතිබුණි. |
| (ආ) | මෙම ප්‍රසම්පාදනයේදී විවිධ ලංසුකරුවන් විසින් යම් යම් භාණ්ඩ සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. එහෙත්, ප්‍රසම්පාදන කමිටුව විසින් ලංසුකරුවන් ඉදිරිපත් කළ සමස්ත මිල කියුමේ මුළු වටිනාකම පමණක් සැලකිල්ලට ගෙන අවම මිල ඉදිරිපත් කළ ලංසුකරු තෝරා ගැනීම නිසා සමාලෝචිත වර්ෂය තුළ දී රජයේ අරමුදල්වලට රු.2,655,746ක පාඩුවක් සිදු වී තිබුණි. | විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කර අවශ්‍ය ඉදිරි පියවර ගැනීම. | මේ සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා කමිටුවක් පත්කර ඇත. | විමර්ශන කටයුතු නිමකර සුදුසු පියවර ගෙන නොතිබුණි. |
| (ඇ) | ලංසුකරුවෙකු විසින් භාණ්ඩ 08ක් වෙනුවෙන් ඉදිරිපත් කර තිබුණු මිල ගණන් වෙළඳපොල මිලට වඩා සියයට 46 සිට සියයට 98 දක්වා අඩු අගයක් ගෙන තිබුණි. එය අතාත්වික තත්ත්වයක් බැවින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ | විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කර අවශ්‍ය ඉදිරි පියවර ගැනීම. | මේ සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා කමිටුවක් පත්කර ඇත. | විමර්ශන කටයුතු නිමකර සුදුසු පියවර ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සංග්‍රහයේ 7.9.11 මාර්ගෝපදේශය අනුව අදාළ ලංසුකරුගෙන් මේ පිළිබඳ පැහැදිලි කිරීම් ලබාගත යුතු ව තිබුණි. එහෙත්, ඒ කිසිවක් පිළිබඳ සැලකිලිමත් නොවී එම ප්‍රශ්නගත මිල ගණන් ඉදිරිපත් කළ ලංසුකරු වෙත ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි. | | | |
| **17.** | වවුනියා දකුණ කළාප අධ්‍යාපන කාර්යාලය යටතේ රාජකාරි ඉටු කරන ගුරුවරුන් 13දෙනෙකුගේ තනතුරු ස්ථිර කළයුතු කාල පරිච්ඡේදය අවසන් වී වර්ෂ 4ත්, වර්ෂ 32ත් අතර කාල ප්‍රමාදයක් සිදු වී තිබුණද, අංක 1817/30 හා 2013 ජූලි 03 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු පළාත් **රාජ්‍ය** සේවා කාර්ය පරිපාටි හා රීති සංග්‍රහය VIII පරිච්ඡේදය පරිදි ස්ථිර කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අප්‍රමාදව අවශ්‍ය පියවර ගැනීම. | ස්ථිර කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | මේ දක්වාම ඔවුන් ස්ථිර කර නොතිබුණි. |
| **18.** | 2007 දෙසැම්බර් 13 දිනැති අංක 2007/20 දරන අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 3.4 (II) ඡේදයට පටහැනිව, කලාප අධ්‍යාපන බල ප්‍රදේශ 07ක සේවය කරන ගුරුවරුන් 31 දෙනෙකු වර්ෂ 01ත් වර්ෂ 06ත් අතර කාලයක සිට ස්ථිර පදිංචි ස්ථානයට යාබද පාසැලකට තාවකාලිකව අනුයුක්ත වී සේවය කරමින් සිටී. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතු ය. | මින් ඉදිරියට මෙවැනි තත්ත්වයන් පිළිබඳ සැලකිල්ලෙන් කටයුතු කරනු ලැබේ. | මේ දක්වාම සුදුසු පියවර ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| **19.** | 2007 දෙසැම්බර් 13 දිනැති අංක 2007/20 දරන අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 3.2 ඡේදයට පටහැනිව, අධ්‍යාපන කලාප 12ක වූ ගුරුවරුන් 490 දෙනෙකු ස්ථාන මාරු වීම් නොලබා එකම පාසැලේ වර්ෂ 8ත් වර්ෂ 32ත් අතර කාලයක් සේවය කරමින් සිටී. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතු ය. | මේ සඳහා අවශ්‍ය උපදෙස් අදාළ නිලධාරීන් වෙත ලබා දී තිබුණි. | මේ දක්වාම සුදුසු පියවර ගෙන නොතිබුණි. |
| **20.** | වවුනියා උතුර කලාප අධ්‍යාපන කාර්යාලයේ නිලධාරීන් දෙදෙනෙකු 2013 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා රු.10,557,045ක ගුරු වැටුප් වංචනිකව ලබාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ එලෙස වංචනික ලෙස ලබාගත් ගුරු වැටුප් මුදල රු.11,448,400ක් විය. | හිඟ ශේෂ නොපමාව අයකරගත යුතු ය. | රු. 1,557,970ක් අයකළ අතර හිඟ ශේෂය වෙනුවෙන් නීතිමය කටයුතු සිදු කරමින් පවතී. | අවශ්‍ය විනය පරීක්ෂණ සිදුකර රු. 0,447,475ක මුදල අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. |
| **21.** | උතුරු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට අයත් වවුනියාව ප්‍රදේශයේ වූ ඉඩම් වෙනුවෙන් අයවිය යුතු බදු ගාස්තු රු.13,245,047ක් වර්ෂ 05ත් වර්ෂ 27ත් අතර කාලයක් පැරණි වුවද, අංක 96/05 දරන 1996 අගෝස්තු 01 දිනැති ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 07 ඡේදය පරිදි අයකර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි නොපමාව කටයුතු කළ යුතු ය. | මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීමට අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කරන ලදී. | රු. 300,000ක් අයකර ගෙන තිබීම හැර වෙනත් ප්‍රගතියක් නොවීය. |

| | | | | |
|---|---|---|---|---|
| **22.** | අංක 2017/01 හා 2017 ජූලි 04 දිනැති ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය පරිදි, කිලිනොච්චිය, කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ වූ කඩකාමර 100කින් පමණ සමන්විත වෙළඳ සංකීර්ණයේ කඩ කාමරහිමියන් සමග ගිවිසුම්වලට එළැඹ බදු ආදායම් රැස් කිරීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කර නොපමාව ගිවිසුම්ගත වී අදාළ බදු ආදායම් රැස් කිරීමට පියවර ගැනීම. | මේ වෙනුවෙන් දේපළ හිමියන්ට අයදුම් පත්‍ර ලබා දී තිබුණ ද, ඔවුන්ගෙන් සියයට 54ක් පමණක් අයදුම්පත්‍ර සම්පූර්ණ කර භාර දී තිබුණි. | මෙම බදු ආදායම ලබා ගැනීම සඳහා මේ දක්වාම කටයුතු කර නොතිබුණි. |

**විගණකාධිපති ත්‍රෛවාර්ෂික තත්ත්ව වාර්තාව (2018, 2019, 2020)**

---------------------------------------------------------------------

විගණන අස්ථිත්‍යයේ නම - බස්නාහිර පළාත් සභාව

මූලා‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය -

2018 තත්ත්වාගණනය කළ මතය

2019 තත්ත්වාගණනය කළ මතය

2020 තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශ | අස්ථිත්‍යය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 1. | 2007 මැයි 11 දිනැති අංක 2007/09 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 05 වන වගන්තිය ප්‍රකාර නැවත සේවයේ යොදවනු ලැබූ විශ්‍රාමිකයන්ට විශ්‍රාම වැටුප සමග නියමිත ජීවන වියදම් දීමනාව ගෙවන බැවින් නැවත ජීවන වියදම් දීමනාව ගෙවිය නොහැකි නමුත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිලධාරීන් 04 දෙනෙකුට 2010 ජනවාරි 01 දින සිට 2018 ජනවාරි 31 දින දක්වා රු.813,404 ක් ජීවන වියදම් දීමනා වශයෙන් ගෙවා තිබුණි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුගත විය යුතුය. | මෙම නිලධාරීන් විශ්‍රාම ගන්වා ඇති අතර වැඩිපුර ගෙවූ මුදල් විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගෙන් නිරීක්ෂණ ලබා ගැනීමට කටයුතු කර ඇත. | වැඩිපුර ගෙවන ලද මුදල මේ දක්වා අය කරගෙන නොතිබුණි. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12(2) වගන්තිය ප්‍රකාරව එම මුදල් අදාළ නිලධාරීන්ගේ විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමේ හැකියාව පිළිබඳව විමසමින් 2020 අගෝස්තු 20 දින විශ්‍රාම |

| | | | | |
|---|---|---|---|---|
| | | | | වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපියක් යොමුකර තිබුණි. එයට මේ දක්වා පිළිතුරු ලැබී නොතිබුණි. |
| 2. | 2012 අංක 04 දරන බස්නාහිර පළාත් ඉඩම් සංවර්ධන ප්‍රඥප්තියේ 04(2) හා 06(3) වගන්ති ප්‍රකාර රජයේ ඉඩමක් ආණ්ඩුව විසින් ප්‍රයෝජනයට ගැනීම සඳහා පළාත් සභාවේ එකඟත්වය ලබාදීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය රීති මඟින් නියම කර නොතිබුණි. | ක්‍රියාපටිපාටි රීති මඟින් නියම කළ යුතුය. | බස්නාහිර පළාත් ඉඩම් ප්‍රඥප්තිය සඳහා රීති සකස් කර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙනමෙන් පළාත් කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයෙන් ඉල්ලා ඇත. | පළාත් උපදේශන සභාවේ උපදේශනය මත රීති සෑදිය යුතු නමුත් මේ වන විට බස්නාහිර පළාත් සභාව විසුරුවා ඇති බැවින් රීති පිළියෙල කර නොතිබුණි. |
| 3. | අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් අක්කර 15 රූඩ් 3 පර්චස් 38.5 ක ඉඩමක් 2003 පෙබරවාරි 28 දින සිට වර්ෂයකට රු.79,200 ක මුදලකට පෞද්ගලික බදුකරුවෙකුට බදු දී තිබුණි. බදු ගිවිසුම අනුව වාර්ෂික බදු වැඩිවීම සියයට 10 ක් වුවත් එම වැඩිවීමට අදාළ 2003 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ රු.1,252,035 ක හිඟ බදු හා දඩ මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාර්ෂික බදු වැඩිවීම අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | හිඟ බදු හා දඩ මුදල් අයකර ගැනීමට ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | බදුකරු 2020 පෙබරවාරි 28 දින රු.200,000 ක මුදලක් ගෙවා තිබුණි. ඉතිරි මුදල අයකරගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 4. | 2010 වර්ෂයේ ඇති කළ කරදියාන කසළ අංගනය සම්බන්ධයෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් 2019 මැයි 08 දින ඉදිරිපත් කර තිබුණු මූලික වාර්තාව අනුව කසළ බැහැර කරන ස්ථානයේ මීටර් 20 සිට මීටර් 70 අතර දුරකින් පිහිටි නිවාස 19 ක් සහිත භූමිය දැඩි අවදානම් සහිත ප්‍රදේශයක් ලෙස හා භූමිය තුළින් විෂ වායු ඇතිවීමට ඉඩ ප්‍රස්ථා පවතින බව හඳුනාගෙන තිබුණි. 2007 අංක 01 දරන බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරි ප්‍රඥප්තියේ 7 වගන්තියේ අරමුණුවලට අනුකූලව මෙම කසළ අංගනය කළමනාකරණය කර නොතිබුණු අතර ජාතික පරිසර පනතේ විධිවිධානයන් අනුව (1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 අ වගන්තිය යටතේ පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යවරයා විසින් බලපත්‍ර ලබාගත යුතු කටයුතු ලෙස ප්‍රකාශයට පත්කර ඇති ලේඛනයෙහි පළමු කොටසෙහි 60 වන නියමය පරිදි) මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව මෙය පවත්වාගෙන ගොස් තිබුණි. | මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබා ගැනීමට හා 2007 අංක 01 දරන බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරි ප්‍රඥප්තියේ අරමුණුවලට අනුකූලව කසළ අංගනය කළමනාකරණය කිරීමට කටයුතු කළ යුතුය. | කසළවලින් විදුලිය ජනනය කිරීමේ ව්‍යාපෘතිය නැවත පණගැන්වීම" යන මැයෙන් 2021 සැප්තැම්බර් 09 දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇතත් කසළවලින් විදුලිය නිපදවීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණි. | කසළ අංගනය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරී ප්‍රඥප්තියේ අරමුණු ප්‍රකාරව කසළ කළමනාකරණය සිදු නොවන බවට තවදුරටත් නිරීක්ෂණය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| 5. | කල් ඉකුත්වීම් හා වේයන්ගෙන් සහ මීයන්ගෙන් හානි වීම හේතුවෙන් 2018 ජූලි 20 සහ 21 දිනයන්හිදී වතුපිටිවල රෝහලේදී අපහරණය කරන ලද ඖෂධ තොගයේ වටිනාකම රු.1,260,821 ක් විය. | ඖෂධ කල් ඉකුත්වීමට පෙර අවශ්‍ය රෝහල්වලට ලබාදීමට වැඩපිළිවෙලක් තිබිය යුතුය. | කල් ඉකුත්වීමට ආසන්න ඖෂධ සම්බන්ධයෙන් අදාළ ආයතන දැනුවත් කර ඇත. | ඖෂධ කල් ඉකුත්වීම් 2021 වර්ෂයේදීද නිරීක්ෂණය විය. |
| 6. | හෙක්ටයාර 1.978 ක වපසරියකින් යුතු මිනුවන්ගොඩ මූලික රෝහල 1954 වර්ෂයේදී රෝගී සත්කාරක සේවාව ආරම්භ කර තිබුණ ද භූමිය විධිමත් පරිදි පවරාගෙන නොතිබුණි. | පැවරුම් ඔප්පුවක් ලබාගැනීමට කටයුතු කළ යුතුය. | ඉඩම පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. | ඉඩම පවරාගෙන නොතිබුණි. |
| 7. | මතුගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ 2016 ජුනි මස සිට ගබඩා කර ඇති භාවිතයට නොගන්නා මෝටර් සයිකල් 19 ක් පැවතුණි. | අපහරණය කිරීමට හෝ භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම මෝටර් බයිසිකල් 19 අපහරණය කිරීම සඳහා 2019 වර්ෂයේ දී පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයෙන් ඉල්ලීම් කර ඇත. | මෝටර් බයිසිකල් 19 අපහරණය කර නොතිබුණි. |
| 8. | බස්නාහිර පළාත් 2010 අංක 06 දරන සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය යටතේ සාදන ලද රීතිවල 5 හා 6 වගන්ති ප්‍රකාර ප්‍රඥප්තිය ක්‍රියාත්මක දිනට වයස අවුරුදු 56 ඉක්මවූ සේවකයෙකුට රීතිවල (අ) උපලේඛනයේ වගුව අංක 02 ප්‍රකාරව විශ්‍රාම වැටුප් හිමිකම විය යුත්තේ විශ්‍රාම යන වයසේ ලැබූ ඒකාබද්ධ වැටුපෙන් සියයට 40ක ප්‍රමාණයකි. එහෙත් 2019 දෙසැම්බර් 31 දින වනවිට වයස අවුරුදු 56 ඉක්මවූ පළාත් සමුපකාර විශ්‍රාම වැටුප් අරමුදලේ සේවකයින් 211 දෙනෙකුට සියයට 40 කට වඩා වැඩි | සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය යටතේ සාදන ලද රීති ප්‍රකාරව විශ්‍රාම වැටුප් ගෙවිය යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | දැනට සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය ප්‍රකාරව විශ්‍රාම වැටුප් ගෙවනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රතිශතයකට අදාළව රු.40,898,103 ක් විශ්‍රාම වැටුප වශයෙන් ගෙවා තිබුණි. | | | |
| 9. | පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ රු.මිලියන 235 ක ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා පවරා තිබූ කොන්ත්‍රාත්තුවක් නතර කිරීමට එම අධිකාරිය විසින් 2006 වර්ෂයේදී තීරණය කිරීම නිසා රු.මිලියන 90 ක වන්දියක් හා ඊට අදාළ සියයට 11.3 ක නෛතික පොලිය ගෙවිය යුතු බව බේරුම් කාරක මණ්ඩලය විසින් 2012 වර්ෂයේදී තීරණය කර තිබුණි. ඒ සම්බන්ධව අධිකාරිය විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කළ අභියාචනය 2018 අගෝස්තු 31 දින නිෂ්ප්‍රභා කිරීම නිසා 2019 වර්ෂයේදී රු.මිලියන 190.2 ක වන්දියක් ගෙවීමට සිදුවී තිබුණි. මෙකී පාඩුව සිදුවී 2020 දෙසැම්බර් 31 දිනට වසර 08 ක් ගතවී ඇතත් දුර්වල කොන්ත්‍රාත් පරිපාලනය හේතුවෙන් පළාත් මූල්‍ය රීති 51, 52.1, 54 සහ 55 යටතේ වන පරිපාටීන් අනුගමනය කර වගකිව යුතු නිලධාරීන් හඳුනා ගැනීම හා පළාත් මූල්‍ය රීති 76.1.8 හා 106 යටතේ වන කාර්ය පටිපාටීන් අනුගමනය කිරීමට කටයුතු කර නොතිබුණි. | බස්නාහිර පළාත් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කර වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. | පළාත් මූල්‍ය රීති අනුගමනය කරමින් පරීක්ෂණයක් පවත්වා ඇත. එහි නිර්දේශ මත ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතව ඇත. | මූලික පරීක්ෂණයක් සිදුකර තිබුණි. නමුත් එහි සඳහන් නිර්දේශ මෙතෙක් ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 10. | අස්ගිරිය, මොරගහහේන හා රත්මලාන ප්‍රාදේශිය යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාල මගින් යන්ත්‍ර කුළියට දීම හා අලුත්වැඩියා වෙනුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 24 ක් අය විය යුතුව පැවතුණි. ඒ අතර 1996 වර්ෂයේ සිට පැවත එන ශේෂයන්ද පැවතුණි. මේ සම්බන්ධව පළාත් මූල්‍ය රීති 51, 52.1, 54 සහ 55 යටතේ වන පටිපාටීන් අනුගමනය කර වගකිව යුතු නිලධාරීන් හඳුනා ගැනීම හා පළාත් රීති 76.1.8 හා 106 යටතේ වන කාර්ය පටිපාටීන් අනුගමනය කිරීමට කටයුතු කර නොතිබුණි. | බස්නාහිර පළාත් මූල්‍ය රීති ප්‍රකාරව අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම ශේෂ සියල්ල රාජ්‍ය ආයතන සඳහා වාහන අලුත්වැඩියා හා යන්ත්‍ර කුලියටදීම වෙනුවෙන් අයවිය යුතු ශේෂයන් බැවින් ශේෂ අයකර ගනිමින් පවතී. | 2022 මාර්තු 03 දින වනවිට රු.මිලියන 17.6 ක මුදලක් අයවිය යුතුව පැවතුණි. |
| 11. | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා පළාත් සංවර්ධන ප්‍රදාන (PSDG හා PDG) යටතේ මාර්ග සංවර්ධන කටයුතු සඳහා 2016, 2017 හා 2018 වර්ෂවලදී පළාත් භාණ්ඩාගාරය විසින් ලබාදුන් මුදල්වලින් රු.මි 89.56 ක් මාර්ග සංවර්ධන කටයුතු සඳහා භාවිතා නොකර 2019 වර්ෂයේදී සංචිත වෙත මාරු කර තිබුණි. | අදාළ මුදල් මාර්ග සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් යොදා ගැනීමට කටයුතු කළ යුතුය. | කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අඩුපාඩු එලෙසම පැවතුණි. |
| 12. | ජපාන විශ්ව විද්‍යාලයක් මගින් සංවිධානය කර තිබූ ජපානයේ මාර්ග සංවර්ධනය පිළිබඳ උපායශීලී ක්‍රමවේදයන් පිළිබඳ ජාත්‍යන්තර සමුළුව ලෙස හඳුන්වා ඇති වැඩසටහනක් සඳහා 2019 ජූනි 15 දින සිට ජූනි 21 දින දක්වා නිලධාරීන් 04 දෙනෙකු සහභාගිවී | වැඩිපුර ගෙවූ මුදල් අයකර ගත යුතුය. | කිසිදු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නිලධාරියෙකු වෙනුවෙන් වැඩිපුර ගෙවූ මුදල අයකර ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | තිබුණි. මෙහිදී පස් දෙනෙකුගෙන් යුතු කණ්ඩායමක් සඳහා එක් අයෙකුට ඇ.ඩො 5,750 බැගින් ඇ.ඩො. 28,750 ක් පාඨමාලා ගාස්තු ලෙස ගෙවා තිබුණි. එහෙත් සහභාගීවී තිබුණේ හතර දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් බැවින් ඇ.ඩො. 5,750 කට සමාන වටිනාකම වූ රු.1,037,875 ක් ආපසු අයකරගෙන නොතිබුණි. | | | |
| 13. | 2019 දෙසැම්බර් 31 දින වනවිට පාවිච්චියෙන් ඉවත් කළ යන්ත්‍රෝපකරණ ඒකක 26 ක් අවුරුදු 01 මාස 04 සිට අවුරුදු 07 මාස 08 දක්වා කාලපරාසයක් අලුත්වැඩියාවකින් තොරව මාර්ග සංවර්ධන අධිකාරියේ මොරගහහේන යන්ත්‍රාගාරයේ නවතා තිබුණි. | අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අලුත්වැඩියා කිරීම ආර්ථිකමය වශයෙන් වාසිදායක තත්ත්වයක් නොවන්නේ නම් විධිමත්ව අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. | යන්ත්‍ර 11 ක් අලුත්වැඩියා කටයුතු සිදුකර අවසන්ය. ඉතිරි යන්ත්‍ර 15 න් 05 ක් අලුත්වැඩියා කටයුතු සිදු කරමින් පවතී. අලුත්වැඩියා කිරීමෙන් ආර්ථික වශයෙන් වාසිදායක තත්ත්වයක් නොමැති යන්ත්‍ර 10 ක් අපහරණය කිරීමට කටයුතු කරමින් පවතී. | යන්ත්‍රෝපකරණ ඒකක 15 ක් තව දුරටත් අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට පැවතුණි. |
| 14. | 1994 වර්ෂයේදී සම්මත කරන ලද 1994 අංක 3 දරන බස්නාහිර පළාත් සංචාරක මණ්ඩල ප්‍රඥප්තියට අදාළව සංචාරක මණ්ඩලය සඳහා රීති සකස් කර සම්මත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රීති සකස් කිරීමට කටයුතු කළ යුතුය. | රීති පිළියෙල කරමින් පවතී. | රීති අනුමත කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 15. | සංචාරක මණ්ඩලය විසින් මීගමුව ඡේත්තුකාළ ජල උද්‍යානයේ මෙහෙයුම්, පරිපාලන හා නඩත්තු කටයුතු 2019 පෙබරවාරි 20 දින සිට වසර 03 ක කාලයක් සඳහා අවබෝධතා ගිවිසුමක් මඟින් මීගමුව මහනගර සභාවට ලබා දී තිබුණි. අවබෝධතා ගිවිසුමේ (3) වන කොන්දේසිය ප්‍රකාරව ජල උද්‍යානයේ මෙහෙයුම්, පාලන හා නඩත්තු කටයුතු කරගෙනයාම සඳහා පළමු පාර්ශවයේ අනුමැතිය සහිතව තෙවන පාර්ශවයක් සමඟ ගිවිසුම්ගත වීමේ හැකියාව දෙවන පාර්ශවයට ඇති නමුත් පළමු පාර්ශවයේ අනුමැතිය නොලබා තෙවන පාර්ශවයක් වෙත එම කටයුතු කරගෙන යාමට අවසර ලබාදී තිබුණි. එසේම අවබෝධතා ගිවිසුමේ (4) වන කොන්දේසිය ප්‍රකාරව ජල උද්‍යානය අතුරු බදු දී ලැබෙන මාසික බදු මුදලින් සියයට 30 ක් දෙවන පාර්ශවය විසින් පළමු පාර්ශවය වෙත ලබාදිය යුතුය. එහෙත් දෙවන පාර්ශවය තුන්වන පාර්ශවය සමඟ එළඹි ගිවිසුමේ පිටපතක් මණ්ඩලය සතුව නොතිබීම හේතුවෙන් ජල උද්‍යානය බදු දීමෙන් මණ්ඩලයට ලැබෙන මාසික බදු මුදලේ නිවැරදිභාවය තහවුරු කර ගැනීමට නොහැකි විය. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු සිදු කළ යුතුය. | ගිවිසුම් කාලය අවසන්වීමට නියමිත හෙයින් නව ආයෝජකයෙකු තෝරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. | මීගමුව මහා නගර සභාව විසින් නියමිත පරිදි බදු මුදල් ගෙවා නොතිබුණි. වසර 03 සඳහාම රු.378,126 ක් පමණක් ගෙවා ඉතිරි මුදල් ගෙවීම පැහැර හැර තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 16. | ගම්පහ අධ්‍යාපන කලාපයේ දෙකටන පද්මාවතී මහා විද්‍යාලයට බස් රථයක් මිලදී ගැනීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.<br>(i) මෙම විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ 2013 ඔක්තෝබර් 30 දින පැවති මහා සභා රැස්වීමේදී පාසලට බස්රථයක් මිලදී ගැනීමට ආදි ශිෂ්‍ය සංගමය තීරණය කර තිබුණු අතර ගම්පහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් එයට අනුමැතිය ලබාදී තිබුණි. මේ සඳහා 2019 දෙසැම්බර් 31 දින වනවිට ආදි ශිෂ්‍ය සංගමයේ බැංකු ගිණුමට රු.6,645,348 ක් පරිත්‍යාගශීලීන් බැරකර තිබුණු නමුත් මෙම මුදලින් රු.5,073,400 ක් වෙනත් කාර්යයන් සඳහා වැයකර තිබුණි. | මූලික විමර්ශනයේ නිර්දේශ අනුව විදුහල්පතිවරයාට එරෙහි චෝදනා සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් සිදු කළ යුතුය. | විදුහල්පතිගේ වැඩ තහනම් කර ඇත. මෙම තත්ත්වය වළක්වා ඉදිරියේදී විධිමත් හා නිරවද්‍ය ආකාරයෙන් කටයුතු කිරීම සඳහා පාසල් අධීක්ෂණය, කොට්ඨාශ අධීක්ෂණය හා පළාත් අධීක්ෂණය නිරන්තරයෙන් සිදු කරන අතර චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට උපදෙස් ලබාදීම සිදු කරයි. | මූලික විමර්ශනයක් සිදු කිරීමෙන් අනතුරුව 2021 දෙසැම්බර් 07 දිනැතිව චෝදනා 12 කින් යුත් චෝදනා පත්‍රයක් විදුහල්පතිට නිකුත් කර තිබුණි. විධිමත් විනය පරීක්ෂණයක් ආරම්භ කර තිබුණි. |
| | (ii) බස් රථය මිලට ගැනීමට මූලික ගෙවීමක් වශයෙන් 2018 නොවැම්බර් 19 හා 30 යන දිනයන්හිදී රු.1,200,000 ක් මෝටර් රථ අලෙවි ආයතනයකට ගෙවා තිබූ අතර රු.2,700,000 ක ඉතිරි ගෙවීම සඳහා කල්බදු මූල්‍ය සමාගමකින් චක්‍රීය ණය පහසුකමක් ලබා ගැනීමට විදුහල්පතිවරයා ක්‍රියාකර තිබුණි. මෙම බස්රථය 2019 ජනවාරි 01 දින විදුහල්පතිවරයාගේ පෞද්ගලික නමින් මෝටර් රථ | මූලික විමර්ශනයේ නිර්දේශ අනුව විදුහල්පතිවරයාට එරෙහි චෝදනා සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් සිදු කළ යුතුය. | විදුහල්පතිගේ වැඩ තහනම් කර ඇත. මෙම තත්ත්වය වළක්වා ඉදිරියේදී විධිමත් හා නිරවද්‍ය ආකාරයෙන් කටයුතු කිරීම සඳහා පාසල් අධීක්ෂණය, කොට්ඨාශ අධීක්ෂණය හා පළාත් අධීක්ෂණය නිරන්තරයෙන් සිදු කරන අතර චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට උපදෙස් ලබාදීම සිදු කර ඇති බවත් මෙවැනි වැරදි නැවත ඇති නොවීම සඳහා කලාප | මූලික විමර්ශනයක් සිදු කිරීමෙන් අනතුරුව 2021 දෙසැම්බර් 07 දිනැතිව චෝදනා 12 කින් යුත් චෝදනා පත්‍රයක් විදුහල්පතිට නිකුත් කර තිබුණි. විධිමත් |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබුණු අතර 2020 ජූලි මාසය වන විට විදුහල්පතිවරයා වෙනත් පාසලකට මාරු කිරීම හැර වෙනත් ක්‍රියාමාර්ගයක් අධ්‍යාපන අමාත්‍යාංශ නිලධාරීන් විසින් ගෙන නොතිබුණි. | | අධ්‍යක්ෂවරුන් දැනුවත් කිරීම සිදු කරනු ලබන බවත් වාර්තා කර ඇත. | විනය පරීක්ෂණයක් ආරම්භ කර තිබුණි. |
| | (iii) බස්රථය මිලදී ගැනීම සඳහා විදුහල්පතිවරයා විසින් පාසල් සංවර්ධන අරමුදලින් රු.700,000 ක් ලබාගත් බව අනාවරණය වුවද බස් රථය මිලදී ගැනීම සඳහා සියලු ගෙවීම් කර තිබුණේ ආදි ශිෂ්‍ය සංගමය විසින් රැස් කර ගෙන තිබූ පරිත්‍යාග මුදලින් විය. | මූලික විමර්ශනයේ නිර්දේශ අනුව විදුහල්පතිවරයාට එරෙහි චෝදනා සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් සිදු කළ යුතුය. | විදුහල්පතිගේ වැඩ තහනම් කර ඇත. මෙම තත්ත්වය වළක්වා ඉදිරියේදී විධිමත් හා නිරවද්‍ය ආකාරයෙන් කටයුතු කිරීම සඳහා පාසල් අධීක්ෂණය, කොට්ඨාශ අධීක්ෂණය හා පළාත් අධීක්ෂණය නිරන්තරයෙන් සිදු කරන අතර චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට උපදෙස් ලබාදීම සිදු කර ඇති බවත් මෙවන් වැරදි නැවත ඇති නොවීම සඳහා කලාප අධ්‍යක්ෂවරුන් දැනුවත් කිරීම සිදු කර ඇති බවත් වාර්තා කර ඇත. | මූලික විමර්ශනයක් සිදු කිරීමෙන් අනතුරුව 2021 දෙසැම්බර් 07 දිනැතිව චෝදනා 12 කින් යුත් චෝදනා පත්‍රයක් විදුහල්පතිට නිකුත් කර තිබුණි. විධිමත් විනය පරීක්ෂණයක් ආරම්භ කර තිබුණි. |
| 17. | ගම්පහ අධ්‍යාපන කලාපයේ දෙකටන පද්මාවතී මහා විද්‍යාලයේ 2018 වර්ෂයේ උසස් පෙළ පන්ති සහ 2019 වර්ෂයේ 6 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කරගැනීමේදී පාසැල් සංවර්ධන සමිතියට ලබාගත් රු.2,373,580 ක් රජය මඟින් නිකුත් කර ඇති මුදල් රෙගුලාසි, චක්‍රලේඛ | විදුහල්පතිවරයා සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතු අතර මුදල් රෙගුලාසි, චක්‍රලේඛ හා පළාත් අධ්‍යාපන | විදුහල්පතිගේ වැඩ තහනම් කර ඇත. මෙම තත්ත්වය වළක්වා ඉදිරියේදී විධිමත් හා නිරවද්‍ය ආකාරයෙන් කටයුතු කිරීම සඳහා පාසල් අධීක්ෂණය, කොට්ඨාශ අධීක්ෂණය හා පළාත් අධීක්ෂණය නිරන්තරයෙන් | මූලික විමර්ශනයක් සිදු කිරීමෙන් අනතුරුව 2021 දෙසැම්බර් 07 දිනැතිව චෝදනා 12 කින් යුත් |

| | | | | |
|---|---|---|---|---|
| | හා උපදෙස්වලට පටහැනිව විදුහල්පතිවරයා විසින් අවභාවිතා කර තිබුණි. | දෙපාර්තමේන්තු චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. | සිදු කරන අතර චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට උපදෙස් ලබාදීම සිදු කර ඇති බවත් මෙවන් වැරදි නැවත ඇති නොවීම සඳහා කලාප අධ්‍යක්ෂවරුන් දැනුවත් කිරීම සිදු කර ඇති බවත් වාර්තා කර ඇත. | චෝදනා පත්‍රයක් විදුහල්පතිට නිකුත් කර තිබුණි. විධිමත් විනය පරීක්ෂණයක් ආරම්භ කර තිබුණි. |
| 18. | ගම්පහ අධ්‍යාපන කලාපයේ දෙකටන පද්මාවතී මහා විද්‍යාලයේ කුවිතාන්සි පොත් අනුව 2018 වර්ෂයේදී සිසුන් 191 දෙනෙකුගෙන් රු.600 බැගින් ලබාගත් බවට තහවුරු වුවද, කුවිතාන්සි කිහිපයක මුල් පිටපතේ වටිනාකම හා කාබන් පිටපතේ වටිනාකම වෙනස් කර තිබුණි. 2019 වර්ෂයේ 6 ශ්‍රේණියේ සිසුවෙකුගෙන් රු.4,260 බැඟින් සිසුන් 276 දෙනෙකුගෙන් රු.1,180,380 ක් එකතුවී තිබුණු අතර එයින් පාසල් සංවර්ධන ගිණුමට බැර කර තිබුණේ රු.166,200 ක් පමණි. ඉතිරි රු.1,014,180 ක මුදල භෞතිකව නොතිබූ අතර වියදම් දරා ඇති බවට ලිඛිත සාක්ෂිද නොතිබුණි. | විදුහල්පතිවරයා සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතුය. | විදුහල්පතිගේ වැඩ තහනම් කර ඇත. මෙම තත්ත්වය වළක්වා ඉදිරියේදී විධිමත් හා නිරවද්‍ය ආකාරයෙන් කටයුතු කිරීම සඳහා පාසල් අධීක්ෂණය, කොට්ඨාශ අධීක්ෂණය හා පළාත් අධීක්ෂණය නිරන්තරයෙන් සිදු කරන අතර චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට උපදෙස් ලබාදීම සිදු කර ඇති බවත් මෙවන් වැරදි නැවත ඇති නොවීම සඳහා කලාප අධ්‍යක්ෂවරුන් දැනුවත් කිරීම සිදු කර ඇති බවත් වාර්තා කර ඇත. | මූලික විමර්ශනයක් සිදු කිරීමෙන් අනතුරුව 2021 දෙසැම්බර් 07 දිනැතිව චෝදනා 12 කින් යුත් චෝදනා පත්‍රයක් විදුහල්පතිට නිකුත් කර තිබුණි. විධිමත් විනය පරීක්ෂණයක් ආරම්භ කර තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 19. | මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයට අයත් ගොඩනැගිල්ලක පසුපස කොටස පෞද්ගලික පාර්ශවයක් විසින් දීර්ඝ කාලයක සිට පරිහරණය කරමින් පැවතුණි. මේ සඳහා ආයතනය සතුව ගිවිසුමක් නොතිබූ අතර කිසිදු මුදලක්ද අයකරගෙන නොතිබුණි. | කාර්යාල ගොඩනැගිල්ලේ කොටස ධීවර සමිතියෙන් ආපසු ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | අදාළ ධීවර සමිතිය සඳහා නව ගොඩනැගිල්ලක් ලබාදෙන තෙක් ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල ගොඩනැගිල්ලෙන් කොටසක් එම සමිතියට ලබාදී තිබුණි. මීගමුව ප්‍රාදේශීය ලේකම් විසින් 1999 ජූලි 29 දින ගොඩනැගිලි කොටසින් ඉවත් වී දින 14 ක් ඇතුළත යතුරු භාරදෙන ලෙස දන්වා තිබුණද යතුරු භාරදී නොමැත. | යතුරු නැවත භාරදීමකින් තොරව ධීවර සමිතිය විසින් ගොඩනැගිල්ල තවදුරටත් පරිහරණය කරමින් පැවතුණි. |
| 20. | දොඩංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අක්කර 11 පර්චස් 26 ක රජයේ ඉඩමක් 1989 වර්ෂයේදී බදු දී තිබූ අතර එම ඉඩම බදුකරුවන් විසින් ව්‍යාජ ඔප්පු සකස් කර පුද්ගලයින් 20 දෙනෙකුට විකුණා තිබුණි. | ඉඩම නැවත පවරාගත යුතුය. බදු ඉඩම විකුණූ පුද්ගලයා සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය. | ඉඩම නැවත පවරාගෙන කට්ටි 25 කට බෙදා ඉන් බිම් කොටස් 05 ක් විධිමත් පරිදි ප්‍රතිලාභීන්ට පවරාදී ඇත. | ඉතිරි බිම් කොටස් 20 ට අදාළ නියමානුකූල කටයුතු මේ දක්වා නිමවී නොතිබුණි. ව්‍යාජ ඔප්පුවක් සකසා ඉඩම විකුණූ පුද්ගලයා සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 21. | ලියාපදිංචිය අවසන් කරන ලද සී/ස කොළඹ - උතුර සමුපකාර සමිතියට අයිතිව තිබූ කොළඹ 12, වෙල්ල වීදියේ අංක 238 දරන ඉඩමේ මුළු වපසරිය වූ පර්චස් 11.09 න් පර්චස් 03 ක සිටි අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමෙන් තොරව ඉතිරි පර්චස් 08.09 සඳහා 2013 සැප්තැම්බර් 18 දින නව පිඹුරුපතක් සකස් කර රු.20,417,619 කට අලෙවි කර තිබුණි. නමුත් කොළඹ මහා නගර සභාව විසින් මෙම පිඹුරුපත අනුමත කර නොතිබුණු අතර ඒ හේතුවෙන් ඉඩම මිලට ගත් පාර්ශවයද අගතියට පත්වී තිබුණි. එමෙන්ම අනවසර පදිංචිකරුවන් පදිංචි වී සිටින පර්චස් 03 ක ඉඩම් ප්‍රමාණය නැවත අත්පත් කර ගැනීමටද කටයුතු කර නොතිබුණි. | අනවසර පදිංචිකරුවන් ඉවත් කර ඉඩම විකුණා සමිති ලියාපදිංචිය අවසන් කළ සමුපකාර සමිතියේ ඈවර කටයුතු කඩිනමින් නිම කළ යුතුය. | බස්නාහිර පළාත් සභාවේ 2011 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 57 වන වගන්තිය යටතේ කටයුතු කරමින් පවතී. | පර්චස් 03 ක ඉඩම් කොටස නැවත අත්පත්කරගෙන නොතිබුණි. |
| 22. | රජයේ ඉඩම් ආඥා පනතට අදාළ ඉඩම් නියෝග අංක 201(1) ප්‍රකාරව ක්‍රීඩා සමාජවලට වාර්ෂික බදු මුදල ගණනය කිරීම සිදුකළ යුත්තේ ඉඩමේ නොදියුණු වටිනාකමින් සියයට 02 බැගිනි. නමුත් 1991 වර්ෂයේදී ක්‍රිකට් ක්‍රීඩා සමාජයක් වෙත බදුදෙන ලද ඉඩමේ තක්සේරු වටිනාකම වන රු.125,000,000 න් සියයට ½ ක බදු මුදලක් පමණක් අයකර තිබුණි. ඒ අනුව වාර්ෂිකව අයකළ යුතු බදු වටිනාකම රු.2,500,000 ක් වුවත් රු.625,000 ක් පමණක් අය කර තිබීම | මෙම බදු ආදායම පළාත් සභා ආදායමකි. බදු ප්‍රතිශත නිවැරදි නොවන බව ඉඩම් කොමසාරිස් ජනරාල් දැනුවත් කර නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. | නැවත බදු කාලය දීර්ඝ කිරීමේදී අයකළ යුතු බදු ප්‍රතිශත පිළිබඳ විශේෂ අවධානය යොමු කරන ලෙස 2022 ජනවාරි 03 දිනැති අංක පඉකො/6/කො/179 දරන බස්නාහිර පළාත් ඉඩම් කොමසාරිස්ගේ ලිපිය මඟින් ඉඩම් කොමසාරිස් ජනරාල්ට දන්වා ඇත. | බදු ප්‍රතිශත නිවැරදි කර හිඟ බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | හේතුවෙන් ඉඩමේ බදු ගිවිසුමේ කාලය වන වර්ෂ 30 ක් සඳහා පළාත් සභාවට අහිමි වූ ආදායම රු.56,250,000 ක් විය. | | | |
| 23. | නව පළාත් සභා ගොඩනැගිල්ල සඳහා මිලදීගත් රු.557,984,598 ක වත්කම් 2019 ඔක්තෝබර් 02 දිනැති අංක 09/2019 දරන බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ මූල්‍ය චක්‍රලේඛයේ 3.1 වගන්තිය පරිදි 2019 නොවැම්බර් 30 දිනට පෙර පළාත් සභාව යටතේ වන ආයතන වෙත ලිඛිතව භාරදීමට කටයුතු කළ යුතු අතර ඒවා භාරගැනීමේදී ලැබෙන නිකුත් නියෝග පදනම් කරගෙන ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ඇතුළත් කර ලැබීම් නියෝග නිකුත් කළ යුතුව තිබුණි. නමුත් පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය, ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය සහ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය විසින් ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඉංජිනේරු කාර්යාංශය විසින් 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා රු.557,984,598 ක් මුදලින් ගෙවා මිලදී ගන්නා ලද වත්කම්වලට අදාළව ඒ ආකාරයට නිකුත් නියෝග හෝ ලැබීම් නියෝග නිකුත් කර නොතිබුණි. එහෙයින් ඉහත වත්කම් බස්නාහිර පළාත් සභාවේ 2020 වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි. | ප්‍රධාන ලේකම්ගේ මූල්‍ය චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව අදාළ වත්කම් ඉන්වෙන්ට්‍රි ලේඛනවලට ඇතුළත් කළ යුතුය. | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය සහ තොරතුරු තාක්‍ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය මඟින් තොරතුරු විමසා ඇති අතර, එම තොරතුරු ලද පසු මෙම වර්ෂයේදී ඉදිරි කටයුතු කරන බව දන්වා තිබුණි. | රු.557,984,598 ක්වූ වත්කම්වලට සමාන අගයකට ලැබීම් / නිකුත් කිරීමේ නියෝග නිකුත් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 24. | 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02 හා 07 වගන්ති සහ 2019 මාර්තු 01 දිනැති අංක 03/2019 දරන බස්නාහිර පළාත් මූල්‍ය චක්‍රලේඛය ප්‍රකාර 2019 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සියලුම මූල්‍ය නොවන වත්කම් තක්සේරු කර වත්කම් පිළිබඳ නිවැරදි තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ඉංජිනේරු කාර්යාංශයේ රු.6,069,989,056 ක්වූ වත්කම් තක්සේරු කර අදාළ නිවැරදි තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර එලෙස තක්සේරු නොකිරීම හේතුවෙන් නිවැරදි වටිනාකම් ගිණුම්වලටද ගෙන නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2021 වර්ෂයේදී අදාළ තක්සේරු කිරීම සිදු කර ගිණුම්වලට ඇතුළත් කර ගැනීමට සටහන් කර ගෙන ඇත. | වත්කම් තක්සේරු කිරීම අවසන් කර නොතිබුණි. |
| 25. | 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තැන්පත් කර වර්ෂ 02 ඉක්මවූ නමුත් නියාදනය නොකළ අමාත්‍යාංශ 02 ක, දෙපාර්තමේන්තු 09 ක, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18 ක හා කොමිෂන් සභාවක එකතුව රු.64,472,590 ක්වූ තැන්පතු ශේෂ 581 ක් සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව තැන්පතු ශේෂ සම්බන්ධව කටයුතු කළ යුතුය. | නිරවුල් නොකළ තැන්පත් ගිණුම් ශේෂ 2021 වර්ෂය තුළදී නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ප්‍රධාන ගණන්දීමේ නිලධාරින්ට හා ගණන්දීමේ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | තවදුරටත් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කිරීමට ශේෂයන් පැවතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 26. | බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට පැවති රු.230,917,360 ක අග්‍රිම ශේෂය 2021 ජූලි 12 දින වනවිටත් බස්නාහිර පළාත් භාණ්ඩාගාරයට නිරවුල් කර නොතිබුණි. | නොපියවූ අග්‍රිම ශේෂය නොපමාව පියවීමට කටයුතු කළ යුතුය. | නොපියවූ අග්‍රිම ශේෂය හැකි ඉක්මනින් පියවා අවසන් කරන ලෙස සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙත උපදෙස් ලබා දී ඇත. | නොපියවූ අග්‍රිම ශේෂය 2021 දෙසැම්බර් 31 දිනට රු.121,473,537 ක් විය. |
| 27. | ගම්පහ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාලය යටතේ ඇති ආයතනවලට අනුයුක්ත කර ඇති වාහන 46 ක් තක්සේරු කර නිවැරදි වටිනාකම ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. එම නිසා වත්කම් තුළ නිවැරදි වාහන වටිනාකම පෙන්නුම් කිරීමට නොහැකි වී තිබුණි. | වාහනවල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. | 2021 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙම වාහන තක්සේරු කර එහි අගයන් ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසට ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල දැනුවත් කර ඇත. | වාහන තක්සේරු කර නොතිබුණි. |
| 28. | විවිධ ව්‍යාපෘති හා කාර්යයන් සඳහා අනුමත කාර්ය මණ්ඩලයට අමතරව පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් තදුචිත පදනම යටතේ සේවකයින් 408 ක් හා කොන්ත්‍රාත් පදනම යටතේ සේවකයින් 146 ක් වශයෙන් අධිකාරියේ කටයුතු සඳහා අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයින් 554 දෙනෙකු සේවයේ යොදවාගෙන තිබුණු අතර මිනිස්බල සැලැස්මක් සකස්කර ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයින් බඳවා ගැනීම සිදු නොකළ යුතුය. | මෙම කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීම සඳහා තවදුරටත් ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 29. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xix පරිච්ඡේදය ප්‍රකාර නිලධාරීන්ට මාසිකව නිවාස දීමනාවක් ගෙවිය නොහැකි වුවත් 2017 නොවැම්බර් සිට 2020 දෙසැම්බර් මාසය දක්වාත් පළාත් සභාවේ එම කාලය තුළ විශ්‍රාම ගිය හා ස්ථානමාරුවීම් ලැබූ නිලධාරීන්ද සමඟ නිලධාරීන් 19 දෙනෙකු සඳහා රු.12,417,000 ක නිල නිවාස දීමනාවක් ගෙවා තිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පළාත් ලේකම්වරුන්, නියෝජ්‍ය ලේකම්වරුන් සහ පළාත් ප්‍රධාන ලේකම් සඳහා නිල නිවාස ලබාදීමට අවශ්‍ය නිල නිවාස ඉදිකිරීමේ වැඩපිළිවෙලක් කඩිනමින් යෙදීමටද තාවකාලිකව විසඳුමක් ලෙස නිල නිවාස දීමනාව ගෙවීම ප්‍රධාන ලේකම් විසින් නිර්දේශ කර 2022 මාර්තු වනවිටත් නිල නිවාස දීමනාව ගෙවමින් පැවතුණි. |
| 30. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.2.2, 4.2.3, 4.5, 4.6 හා 6.3 වගන්ති ප්‍රකාරව ආයතන 06 ක මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් හෝ සේවකයන් වෙත ලබාදෙන ලද | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීම කළ යුතුය. | මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ණය ශේෂයන් පාරිතෝෂිතයෙන් අයකර දෙන ලෙසට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත දැනුම්දී ඇති අතර විශ්‍රාම | මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් හෝ සේවකයින්ගෙන් තවදුරටත් අයවිය යුතු |

| | | | | |
|---|---|---|---|---|
| | ණය අත්තිකාරම් රු.1,868,511 ක ශේෂයක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | | වැටුප් හිමි නැති මියගිය නිලධාරීන්ගේ ණය ශේෂයන් අදාළ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට අදාළ කටයුතු සිදුකරමින් පවතී. | ශේෂයන් පැවතුණි. |
| 31. | සමාලෝචිත වර්ෂයේදී ආදායම් සංකේත 30 ක් යටතේ ආදායම් රැස්කර තිබුණු අතර 2020 දෙසැම්බර් 31 දින වනවිට එයින් ආදායම් සංකේත 17 කට අදාළව රු.11,279,032,524 ක හිඟ ආදායමක් පැවතුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | පවත්නා කොවිඩ් වසංගත තත්වය යටතේ ආදායම් එකතු කිරීම සඳහා පවත්නා යාන්ත්‍රණයන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රායෝගික ගැටලු හේතුවෙන් දිගින් දිගටම ආදායම් එකතු කරගැනීමේ අපහසුතා පැවති බව හා මේවන විටත් පවතින බව පෙන්වා දී ඇත. | තවදුරටත් හිඟ ආදායම් අයකළ යුතුව පැවතුණි. |
| 32. | 2020 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශයේ පිහිටි පළාත් පාලන බල මණ්ඩල 49 ක හිඟ ආදායම රු.7,295,160,138 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | හිඟ ආදායම් අයකර ගනිමින් පවතී. | තවදුරටත් හිඟ ආදායම් අයකළ යුතුව පැවතුණි. |
| 33. | මහා නගර සභා 04 ක සහ ප්‍රාදේශීය සභා 02 ක නිලධාරීන්ට එරෙහිව විගණකාධිපතිවරයා විසින් පනවන ලද අධිභාර 25 කට අදාළව 2020 දෙසැම්බර් 31 දිනට අයකර ගතයුතු වටිනාකම රු.32,682,530 ක් විය. | අධිභාර මුදල් වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | අධිභාර මුදල් අයකර ගනිමින් පවතී. | මෙම මුදලින් රු.29,724,476 ක් තව දුරටත් අයකළ යුතුව පැවතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 34. | බස්නාහිර පළාත් සංචාරක මණ්ඩලය සඳහා 2019 සැප්තැම්බර් 30 දිනැති කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියක් මගින් කාර්ය මණ්ඩලය 15 දෙනෙකු අනුමත කර තිබුණි. එසේ වුවත් මණ්ඩලය සඳහා බඳවාගැනීමේ පටිපාටියක් අනුමත කරවා ගෙන නොතිබීම හේතුවෙන් එම කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට නොහැකි වී තිබුණු අතර වර්තමාන කාර්ය මණ්ඩලය වැඩ බලන තනතුරු 06 කින් සහ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලද තනතුරු 09 කින් සමන්විත විය. | බඳවා ගැනීමේ පටිපාටි සකස් කර නොපමාව අනුමත කරවාගත යුතුය. | බඳවා ගැනීම් පටිපාටි මේ දක්වා අනුමත වී නොමැත. අනුමැතිය ලැබෙන තුරු මණ්ඩලයේ කටයුතු අඛණ්ඩව කරගෙන යාම සඳහා අදාළ නිලධාරීන් යොදාගෙන ඇති බව දන්වමි. | බඳවා ගැනීමේ පටිපාටි අනුමත නොවීම හේතුවෙන් අනුමත කාර්ය මණ්ඩලය බඳවාගෙන නොතිබුණි. |
| 35. | බස්නාහිර පළාත් සංචාරක මණ්ඩලයේ කොන්ත්‍රාත් පදනම මත සේවය කරන කළමනාකරණ සහකාර නිලධාරීන් 08 දෙනෙකු සහ වැඩ බලන කළමනාකරණ සහකාර නිලධාරීන් 04 දෙනෙකු පත්කර තිබුණි. මණ්ඩලය සඳහා අනුමත කාර්ය මණ්ඩලයේ කළමනාකරණ සහකාර තනතුරු 03 ක් පමණක් පැවතීම මත 09 දෙනෙකු අතිරික්තව සේවයේ යොදවා තිබුණි. | අනුමත කර ඇති කාර්ය මණ්ඩලය පමණක් සේවයේ යෙදවිය යුතුය. | කිසිදු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2021 වර්ෂයේදීද කළමනාකරණ සහකාර නිලධාරීන් 09 දෙනෙකු අතිරික්තව සේවයේ යොදවා තිබුණි. |
| 36. | බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතන පාලන අධිකාරියේ මූලා ප්‍රකාශනවල රු.5,350,000 ක වටිනාකමට ගිණුම්ගත කර තිබුණු ඩබල් කැබ් රථයේ සහ ත්‍රී රෝද රථයේ අයිතිය බස්නාහිර පළාත් මාර්ග අමාත්‍යාංශයෙන් පවරා | අධිකාරිය යටතේ ගිණුම්ගත කර ඇති වත්කම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | ඩබල් කැබ් රථයේ සහ ත්‍රී රෝද රථයේ අයිතිය අමාත්‍යාංශයෙන් පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. | කැබ් රථයේ සහ ත්‍රී රෝද රථයේ අයිතිය පවරා ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් කටයුතු කර නොතිබුණි. | | | |
| 37. | බස්නාහිර පළාත් සභාවේ සභා ගර්භයට පළාත් ඉංජිනේරු කාර්යාංශය විසින් රු.මිලියන 115ක සන්නිවේදන උපකරණ පද්ධතියක් ප්‍රසම්පාදනය කර තිබුණි. පිළියෙල කර තිබුණු මූලික වැඩ ප්‍රමාණන පත්‍රය අනුව ඩෙලිගේට් ඒකක (Delegate units) 145 ක් ප්‍රසම්පාදනය කළ බව දක්වා තිබුණු නමුත් සවිකර තිබූ ඒකක සංඛ්‍යාව 110 ක් බැවින් ඒකක 35 ක් වෙනුවෙන් එකක් රු.498,031 බැගින් රු.17,431,085 ක වැඩිපුර ගෙවීමක් සිදුකර තිබුණි. එමෙන්ම සභාවේ යෝජනා සඳහා ඡන්ද විමසීම සිදු කළ යුතු මුළු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව මන්ත්‍රීවරු 104 ක් නමුත් ඡන්දය ලබාදීමේ උපාංග (Voting Units) එකක් රු.83,105 ක් බැගින් ඒකක 40 ක් වැඩිපුර මිලදී ගැනීමෙන් රු.3,324,200 ක මතභේදාත්මක වැයක් දරා තිබුණි. එමෙන්ම අවශ්‍යතාවය ඉක්මවා අමතරව මිලදීගෙන තිබුණු තවත් උපකරණ අයිතම 1,058 ක් අභාවිතව ගබඩා තුළ තබා තිබුණු අතර ඒවායේ වගකීම් කාලය සහ යාවත්කාලීනව භාවිතා කිරීමේ හැකියාව යල් පනිමින් පැවතුණි. | දැනට සිටින මන්ත්‍රී ප්‍රමාණයට සරිලන ලෙස සන්නිවේදන උපකරණ හා ඡන්දය ලබාදීමේ උපාංග මිලදීගත යුතුය. | කිසිදු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ඩෙලිගේට් ඒකක 35 හා ඡන්දය ලබාදීමේ උපාංග 40 හා තවත් උපකරණ අයිතම 1,055 ක් ඉදිරියේදී මන්ත්‍රී ප්‍රමාණය වැඩිවීමක් අපේක්ෂාවෙන් මිලදීගෙන තිබුණි. වැඩිපුර මිලදීගත් ඡන්දය ලබාදීමේ උපාංග හා අනෙකුත් උපකරණ අයිතම තවදුරටත් ඌන උපයෝජිතව පැවතුණි. ඩෙලිගේට් ඒකක අපේක්ෂිත අරමුණින් පරිබාහිරව සභා ගර්භයේ නොව |

| | | | | |
|---|---|---|---|---|
| | | | | කම්ටු රැස්වීම් ශාලාවක සවිකර තිබුණි. |
| 38. | බස්නාහිර පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් මාසය දක්වා අවස්ථා 03 කදී රු.14,025,573 ක් වැය කර LED පුවරු 06 ක් ප්‍රසම්පාදනය කර තිබුණු අතර එම පුවරු 06 න් 03 ක්ම මේ වනවිට ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින අතර අනෙක් පුවරු 03 ද ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. මූල්‍ය රීති 431 ප්‍රකාරව ගිවිසුම්වලට එළඹ නොතිබීම හේතුවෙන් අක්‍රිය පුවරු සක්‍රීය කරවා ගැනීමට නොහැකි වී තිබුණි. | LED පුවරු මිලදී ගැනීමේ අපේක්ෂිත ප්‍රතිලාභ / ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | LED පුවරු 06 ම මේ වනවිට ක්‍රියාවිරහිත තත්ත්වයේ පවතී. පුවරු අලුත්වැඩියා කිරීමට විශාල පිරිවැයක් දැරීමට සිදුවන නිසාත් අදාළ උපාංග සපයා ගැනීම සඳහා රට තුළ පැවති කොවිඩ් වසංගත තත්ත්වය සහ ආර්ථික අර්බුදය හේතුවෙන් ගැටලුකාරී තත්ත්වයක් මතුවීම මත අලුත්වැඩියා කටයුතු ප්‍රමාද වී ඇත. | පුවරු මඟින් 2022 මාර්තු වනවිටත් අපේක්ෂිත ප්‍රතිලාභ / ආදායම් ලබාගැනීමට අපොහොසත් වී තිබුණි. පුවරු අක්‍රීය තත්ත්වයේ පැවතුණි. |
| 39. | අමාත්‍යාංශ 03 ක් සහ දෙපාර්තමේන්තු 11 ක් විසින් 2020 දෙසැම්බර් 31 දින වනවිට අය කරගත යුතුව තිබුණු අලාභ හානි වටිනාකම රු.59,187,542 ක් විය. | අලාභ හානි අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | එක් ආයතනයක් පමණක් අදහස් දක්වා තිබුණි. | තවදුරටත් අලාභහානිවල ට අදාළව අයවිය යුතු ශේෂයන් පැවතුණි. |
| 40. | ළඟම පාසල හොඳම පාසල කිරීමේ සංකල්පය යටතේ 2017 වර්ෂයේදී මීගමුව කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් ජා-ඇල හෝලිරොසරි මහා විද්‍යාලයේ භෝජනාගාරය සහ ගුරු නේවාසිකාගාරයක් ඉදිකිරීම ආරම්භකර රු.6,929,991 ක වියදමක් දරා වහල දක්වා | ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුය. | මෙම ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන් කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන මෙන් ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘති අධ්‍යක්ෂ දැනුවත් කර ඇති බව වාර්තා කර තිබේ. | ඉදිකිරීම් අවසන් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | නිමකිරීමෙන් පසුව ඉදිකිරීම් නවතා දමා තිබුණි. එමෙන්ම අඩක් නිමකළ තවත් ගොඩනැඟිලි දෙකක් පවතින මෙම පාසලේ ප්‍රාථමික අංශය පවත්වාගෙන යාමට ප්‍රමාණවත් ගොඩනැඟිලි නොමැති නිසා මීටර් 800 ක් දුරින් පිහිටි කතෝලික දේවස්ථානයක ප්‍රාථමික අංශයේ පන්ති පැවැත්වෙන බව නිරීක්ෂණය විය. මෙම ව්‍යාපෘතීන් එලෙස අතර මග නවතා දැමීම තුළින් පාසල අනාරක්ෂිත වීම, යකඩ කම්බි දිරාපත්වීම, පාසල් දේපළවලට හානි සිදුවීම හා ඩෙංගු රෝගය ව්‍යාප්තවීම වැනි අවධානම් සහගත පරිසරයක් නිර්මාණයවීම හා ගොඩනැඟිලි පහසුකම් අවම වීම නිසා ප්‍රාථමික අංශ සිසුන්ටද විවිධ අපහසුතාවයන්ට මුහුණපෑමට සිදුවී තිබුණි. | | | |
| 41. | ළහම පාසැල හොඳම පාසල ව්‍යාපෘතිය යටතේ 2017 මාර්තු 06 දින වැඩ ආරම්භ කරන ලද මීගමුව කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් ශාන්ත සෙබස්තියන් මහා විද්‍යාලයේ දෙමහල් තාක්ෂණ විද්‍යාගාර ගොඩනැඟිල්ලේ ඉදිකිරීම් වැඩ 2018 අගෝස්තු 04 දින සිට නවතා දමා තිබුණි. රු.22,860,962 ක වියදම් දරා අඩක් ඉදිකළ මෙම ගොඩනැඟිල්ල වසර දෙකකට ආසන්න කාලයක් පරිසරයට නිරාවරණය වී තිබීම නිසා යකඩ | වැඩ ආරම්භ කර ඇති ඉදිකිරීම් කඩිනමින් නිම කිරීමට කටයුතු කළ යුතුය. | ඉදිකිරීම් නැවත ආරම්භ කිරීම සඳහා ටෙන්ඩර් කටයුතු සඳහා අනුමැතිය ලබා ගැනීමට ඉල්ලීම් කර ඇති බව වාර්තා කර තිබේ. | ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | කම්බි මලකඩ කමින් දිරාපත් වෙමින් පවතින බව 2020 සැප්තැම්බර් 28 දින සිදු කළ භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | | | |
| 42. | බස්නාහිර පළාත් ඉංජිනේරු කාර්යාංශය විසින් 2018 වර්ෂයේදී මිලදීගෙන තිබුණු ගෘහ භාණ්ඩ, කාර්යාල උපකරණ, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ හා මෘදුකාංග සංවර්ධන යනාදී එකතුව රු.මිලියන 557.98 ක්වූ වත්කම් 2020 දෙසැම්බර් 31 දින වනවිටත් ලේඛනගත කර නොතිබුණි. | වත්කම් මිලදීගත් වහාම ලේඛනගත කළ යුතුය. | 2021 වර්ෂයේ ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරමින් පවතින බව දැනුම් දී තිබේ. | 2022 පෙබරවාරි 15 දින වනවිටත් ස්ථාවර වත්කම් ලේඛනගත කර නොතිබුණි. |
| 43. | බස්නාහිර පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.122,976,348 ක්වූ වත්කම් පළාත් මූල්‍ය රීති 560 හා 561 ප්‍රකාරව ලේඛනගත කර නොතිබුණි. | වත්කම් ලේඛනගත කිරීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කරන බව දැනුම් දී තිබේ. | වත්කම් තවදුරටත් ලේඛනගත කළ යුතුව පැවතුණි. |
| 44. | මිනුවන්ගොඩ කලාපයේ අවධානම් සහිත ඉතා හදිසි වහල අලුත්වැඩියාවන් කළ යුතු ගොඩනැඟිලි පවතින බව නිරීක්ෂණය වූ අතර පාසල් 21 ක් අතුරින් පාසල් 19 ක එවැනි අවදානම් සහිත ගොඩනැඟිලි තුළ සිසු දරුවන් අධ්‍යාපන කටයුතු වල නිරත වී සිටින බවත් පාසල් 02 ක වහල කඩා වැටී තිබුණු බවත් නිරීක්ෂණය විය. අවදානම් සහිත වහල අලුත්වැඩියාව සඳහා රු.100,500,000 ක දළ | අවධානම් සහිත ඉතා හදිසි අලුත්වැඩියාවන් කඩිනමින් සිදු කළ යුතුය. | ගොඩනැගිලි 04 ක් මේ වනවිට අලුත්වැඩියාවන් සිදුකර අවසන් අතර ඉතිරි පාසල් පොරොත්තු ලේඛනයට ඇතුළත් කර ඇත. | ඉතිරි පාසල් 15 හි අවධානම් සහිත ගොඩනැගිලි අලුත්වැඩියා කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තු සකස් කර වර්ෂ 2020 සංවර්ධන සැලැස්මටද ඇතුළත් කර තිබුණු නමුත් මෙම පාසැල්වල වහල අලුත්වැඩියාව සිදුකර නොතිබුණි. | | | |
| 45. | පසුගිය දශක දෙකක කාලපරිච්ඡේදය තුළදී ගම්පහ කලාප අධ්‍යාපන බල ප්‍රදේශය තුළ ඇති පාසල්වලින් ශිෂ්‍ය සංඛ්‍යාව අඩුවීම හේතු කරගෙන වසා දැමූ පාසල් සංඛ්‍යාව 15 ක් විය. | ශිෂ්‍ය සංඛ්‍යාව අඩු පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීමට කටයුතු කළ යුතුවේ. එසේ කළ නොහැකි නම් පමණක් වෙනත් කාර්යයක් සඳහා යොදාගත යුතුය. | කලාප අධ්‍යාපන කාර්යාලයට පාසල් ලබා ගැනීමට එන දරුවන් සඳහා පාසල් ලබාදීමේදී ශිෂ්‍ය සංඛ්‍යාව අඩු පාසල්වලට ප්‍රමුඛතාවය ලබාදීම සිදුකරයි. | වසා දැමූ පාසල් 14 ක් මේ වනවිට ප්‍රාදේශීය ලේකම් වෙත භාරදී ඇත. |
| 46. | පසුගිය දශක දෙකක කාලපරිච්ඡේදය තුළ දී මීගමුව කලාප අධ්‍යාපන බල ප්‍රදේශ තුළ ඇති පාසල්වලින් වසා දැමූ පාසල් 12 ක් පැවති අතර එයින් පාසල් 04 ක් වෙනත් පාසලකට ඒකාබද්ධ කර තිබුණි. ඉතිරි පාසැල් 08ක් සම්පූර්ණයෙන්ම වසා දමා එයින් පාසල් 04 ක් විවිධ ආයතන සහ ආගමික ස්ථානවලට පවරා තිබුණි. | ශිෂ්‍ය සංඛ්‍යාව අඩු පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීමට කටයුතු කළ යුතුවේ. එසේ කළ නොහැකි නම් පමණක් වෙනත් කාර්යයක් සඳහා යොදාගත යුතුය. | කලාප අධ්‍යාපන කාර්යාලයට පාසල් ලබා ගැනීමට එන දරුවන් සඳහා පාසල් ලබාදීමේදී ශිෂ්‍ය සංඛ්‍යාව අඩු පාසල්වලට ප්‍රමුඛතාවය ලබාදීම සිදුකරයි. | එම විද්‍යාලයේම කණිෂ්ඨ විද්‍යාලයට හෝ මහා විද්‍යාලයට ඒකාබද්ධ කර ඇත. පාසල් 03 ක් කතෝලික සභාවට අයත් බැවින් සභාව වෙත පවරා ඇත. |
| 47. | ගම්පහ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ තිබුණු ගිලන් රථ 03 ක්, කැබ් රථයක්, ජීප් රථයක් හා ත්‍රීවිලර් රථයක් වසර 01 සිට වසර 05 කට වැඩි කාලයක් භාවිතයට ගෙන නොතිබුණි. | භාවිතයට ගෙන නොතිබූ වාහන භාවිතයට ගැනීමට හෝ විධිමත් පරිදි අපහරණය | අපහරණ කටයුතු සිදු කරමින් පවතී. | අපහරණ කටයුතු අවසන් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | කිරීමට කටයුතු කළ යුතුය. | | |
| 48. | මීනුවන්ගොඩ කලාප අධ්‍යාපන බල ප්‍රදේශය තුළ වර්තමානයේ ශිෂ්‍ය සංඛ්‍යාව 100 ට අඩු පාසල් 31 ක් පවතින අතර 1996 වර්ෂයේ සිට ශිෂ්‍ය සංඛ්‍යාව අඩුවීම නිසා වසා දැමූ පාසල් ගණන 15 ක් විය. | ශිෂ්‍ය සංඛ්‍යාව අඩු පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීමට කටයුතු කළ යුතුවේ. එසේ කළ නොහැකි නම් පමණක් වෙනත් කාර්යයක් සඳහා යොදාගත යුතුය. | කලාප අධ්‍යාපන කාර්යාලයට පාසල් ලබා ගැනීමට එන දරුවන් සඳහා පාසල් ලබාදීමේදී ශිෂ්‍ය සංඛ්‍යාව අඩු පාසල්වලට ප්‍රමුඛතාවය ලබාදීම සිදුකරයි. | වසා දැමූ පාසල්වල අයිතිය ප්‍රාදේශීය ලේකම් වෙත භාර දෙමින් පවතී. |
| 49. | ශ්‍රම සවිය වැඩසටහන යටතේ බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2018 අගෝස්තු 15 දින අනුමත කර තිබුණු රු.ලක්ෂ 75 ක මුදලින් 2018 වර්ෂයේ අයවැය යෝජනාවලට ඇතුළත් කර නොතිබුණු කෘෂිකාර්මික භාණ්ඩ මිලදී ගැනීම ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව සිදුකර රු.7,436,845 ක් ගෙවා තිබුණි. එම මිලදී ගැනීම තුළ රු.596,625 ක් වටිනා තණකොළ කපන යන්ත්‍ර 35 ක් ඇතුළත්ව තිබුණි. එසේම 2019 ජනවාරි 11 දින නැවතත් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව තණකොළ කපන යන්ත්‍ර 85 ක් රු.1,705,500 කට මිලදීගෙන තිබුණු අතර මිලදීගෙන තිබුණු තණකොළ කපන යන්ත්‍ර 100 ක් "සිතමු" යැයි නම් කරන ලද පළාත් සභා සංවර්ධන ව්‍යාපෘතියක් යටතේ | 2006 ප්‍රසම්පාදන කාර්යය සංග්‍රහයට අනුව ප්‍රසම්පාදන කටයුතු සිදුකළ යුතුය. | මේ සඳහා මූලික විමර්ශනයක් සිදුකර ඇති අතර නීතිමය කටයුතු සිදු කරමින් පවතී. | ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 13 වගන්තියේ විධිවිධාන අනුව සිදු කළ මූලික විමර්ශනය අනුව ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ පළමු වන උපලේඛනයේ 7 හා 8 ඡේදය අනුව රජයේ මුදල් හා රාජ්‍ය සම්පත් සාවද්‍ය ලෙස, අයථා |

කෘෂි සේවා අධිකාරියේ සභාපති විසින් තෝරාගන්නා ලද පිරිසකට බෙදාහැර තිබුණි.

ලෙස පරිහරණය කිරීම හා එසේ කිරීමට ඉඩ හැරීමට කටයුතු කර ඇති බැවින් අධිකාරියේ නිලධාරීන් දෙදෙනෙකුට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමට නිර්දේශ කර තිබුණි. නමුත් 2022 පෙබරවාරි 28 වනවිටත් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

විගණකාධිපති ත්‍රෛවාර්ෂික තත්ත්ව වාර්තාව : 2018, 2019, 2020

විගණන අස්ථිත්‍යයේ නම : ඌව පළාත් සභාව

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය :

2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

2018 වර්ෂය

---------------

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපති ගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 1. | 2018 දෙසැම්බර් 31 දිනට ආදායම් විෂයයන් 05 ක සමුච්චිත හිඟ ආදායම රු. 147,876,075 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුවේ. | හිඟ ආදායම් අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොමැත. | හිඟ ආදායම රු. 143,656,105 ක් වන අතර හිඟ ආදායම් වශයෙන් පෙන්නුම් කරන මෙම මුදල අයකර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස අදාළ ආයතනයන්වල ගණන්දීමේ නිලධාරීන් දැනුවත් කර ඇති බව දක්වා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| 2. | මො/ බිබිල යශෝධරා බාලිකා විද්‍යාලය සඳහා අක්කර 05 රූඩ් 02 පර්චස් 22 ක ඉඩම් කොටසක් පෞද්ගලික පාර්ශවයකින් 2007 පෙබරවාරි 02 දින රු. 4,800,000 කට මිලදී ගැනීමේදී, ඉඩමට අදාළ පිඹුරුපත්වල සඳහන්ව ඇති විශාලත්වය තිබේද යන්න මැනබලා තහවුරු කරගෙන නොතිබූ අතර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ එකී ඉඩම ලියාපදිංචි කිරීම 2015 පෙබරවාරි 23 වන දිනතෙක් ප්‍රමාද කර තිබුණි. කෙසේ වුවද මොනරාගල දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ 2012 අගෝස්තු 22 දිනැති මැනුම් වාර්තාව අනුව එම ඉඩමෙන් හෙක්ටයාර් 0.3768 ක් පාර්ශවයන් 04 ක් විසින් අනවසරයෙන් අත්කරගෙන ඇති බව තහවුරු කර තිබුණි. | ඌව පළාත් සභාවට අයත් පාසල් ඉඩම්වල භුක්තිය හා අනවසර පදිංචිවීම් වලක්වා ගැනීමට කටයුතු කළ යුතුයි. | ක්‍රියාමාර්ග ගෙන නැත. | අධිකරණ නියෝගයක් මත 2021 ඔක්තෝබර් 16 දින විද්‍යාලය සතු ඉඩම මැනීම සිදුකර ඇති අතර එම මැනුම් වාර්තාව ලැබීමෙන් පසු ඉදිරි කටයුතු සිදුකරන බව දක්වා ඇත. |
| 3. | ඌව පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන හා මිරිදිය ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් 2017 වර්ෂයේ කෘෂි මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ රඹුක්පොත ඇල කෘෂි මාර්ගයේ සංවර්ධන කටයුතු ප්‍රමිතියෙන් තොරව හා අවිධිමත් ලෙස සිදුකර තිබියදී රු. 1,820,952 ක නිමි වැඩ වටිනාකම මත කොන්ත්‍රාත්කරුට රු. 1,169,642 ක් ගෙවා තිබුණි. එහෙත් ඇස්තමේන්තුවේ සඳහන් | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී නිසි අධීක්ෂණයකින් යුතුව කටයුතු කිරීමටත්, සෑම ඉදිකිරීම් කටයුක්තකම පැවතිය යුතු නියමිත ප්‍රමිතිය නිසි පරිදි තිබෙන බවටත් අධීක්ෂණ | ඉදිකිරීම් සම්බන්ධයෙන් සිදුකළ මූලික විමර්ශනයේ නිර්දේශ අනුව, නිමි වැඩ වටිනාකමින් සියයට 80 ක් කොන්ත්‍රාත්කරුට ගෙවීමටත්, මාර්ගය සැහැල්ලු වාහන ගමනා ගමනය සඳහා පමණක් භාවිතා කිරීමටත්, අධීක්ෂණ කාර්මික නිලධාරීට අවවාද කිරීමටත් හා විදුලි කණු ඉවත් කිරීම සඳහා විදුලි | අවසාන බිල්පත සඳහා මුදල් නොගෙවා ඇති අතර 2022 පෙබරවාරි 15 දින වන විටත් විදුලි කණු 3 ඉවත්කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | පැති බැම්ම ඇලවී ගොස් නැවත ආධාරක යොදා සකස් කර තිබුණු අතර බදුල්ල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුවරයා ප්‍රමුඛ කමිටුව විසින් මෙම මාර්ගය වාහන ගමනාගමනයට සුදුසු මාර්ගයක් නොවන බවට නිර්දේශ කර තිබුණි. තවද මාර්ගයේ මැද පිහිටි විදුලි කණු 03 ක් 2018 සැප්තැම්බර් 05 වන විටත් ඉවත් කිරීමෙන් තොරව මාර්ගය සංවර්ධනය කර තිබුණි. | නිලධාරීන් තහවුරු කළ යුතුය. | බල මණ්ඩලය වෙත දැනුම් දීමටත් කටයුතු කර ඇත. | |

**2019 වර්ෂය**

---------------

| | | | | |
|---|---|---|---|---|
| 4. | 2018 ඔක්තෝබර් 12 දිනැති අංක පීඑස්/සීඑස්ජ්/11-18 දරන චක්‍රලේඛයේ 7.4 ප්‍රකාරව පළාත් ප්‍රධාන අමාත්‍ය, පළාත් අමාත්‍ය, පළාත් සභා සභාපති , පළාත් සභා නියෝජ්‍ය සභාපති යන ධූරධාරීන්ට එම තනතුරට හිමි දීමනා පමණක් හිමිවිය යුතු අතර මන්ත්‍රීවරයකු වශයෙන් ලබාගත හැකි දීමනා නොගෙවිය යුතු බව අවධාරණය කර තිබියදී සහ එකී ධූරධාරීන්ට ඒ ඒ අමාත්‍යාංශ හා අංශ වලින් නොකඩවාම දීමනා ලබාදී තිබියදී සභා ලේකම් කාර්යාලය විසින් 2018 නොවැම්බර් මස සිට 2019 සැප්තැම්බර් මස දක්වා වූ කාලයට ඉහත ධූරධාරීන්ට හිමි දීමනා වලට අමතරව, රු. 12,616,362 ක් අදාළ චක්‍රලේඛයට මුළුමනින්ම පටහැනිව පළාත් සභා මන්ත්‍රීවරයෙකු වශයෙන් ලබාගත හැකි දීමනා ද ගෙවා තිබුණි. | 2019 ඔක්තෝබර් 28 දිනැති අංක 03/2019 දරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඡේදය මගින් පෙන්වා දී ඇති වැඩිපුර ගෙවීම් කර තිබූ දීමනා අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ධූරධාරීන්ට එකම කාලවකවානුව තුළ වැරදි ආකාරයෙන් මාසිකව දීමනා 2 ක් ගෙවීමෙන් සිදු වී ඇති අලාභය අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගැනීමක් හෝ අයකර ගැනීමක් සිදු වී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| 5. | ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් බිබිල ගොවි පුහුණු මධ්‍යස්ථානය මගින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ-5) මට්ටමේ පාඨමාලා ආරම්භ කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය සඳහාඅවශ්‍ය බව දක්වමින් 2017 වර්ෂයේදී, ගොවීන්ගේ භාරකාර අරමුදලෙන් රු. 10,000,000 ක ප්‍රතිපාදන ලබාගෙන 2018 සැප්තැම්බර් වන විට එකී යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සිදුකර තිබුණද, 2020 වර්ෂය අවසාන වනවිටද අරමුණ වූ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ-5) මට්ටමේ පාඨමාලා ආරම්භ කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ප්‍රතිපාදන ලබාදීමෙන් අපේක්ෂා කළ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. | 2021 ජනවාරි මාසයේ සිට NVQ-4 පාඨමාලා ආරම්භ කිරීමට පියවර ගනු ලැබේ. | NVQ-5 ජාතික කෘෂිකර්ම තාක්ෂණ ඩිප්ලෝමාවට අදාළ විවිධ විෂයයන් සඳහා රසායනාගාර පහසුකම් සහ සුදුසුකම්ලත් දේශකයන් නොමැති බැවින් මෙම පාඨමාලාව 2022 පෙබරවාරි වන විටත් ආරම්භ කර නොතිබුණි |
| 6. | බුදුරුවගල වැව ආශ්‍රිතව බෝට්ටු සේවාවක් පවත්වාගෙන යාම සඳහා, ඉදිකිරීම් සිදුකර, බෝට්ටු 06 ක් හා ජීවිතාරක්ෂක කබා 30 ක් මිලදී ගැනීමට, 2018 ඔක්තෝබර් වන විට රු. 785,882 ක් වැයකර තිබුණද, 2019 දෙසැම්බර් 31 දින වන විටත් සංචාරක බෝට්ටු සේවාව ආරම්භ කර නොතිබුණි. | ව්‍යාපෘතිය කඩිනමින් නිම කර, අපේක්ෂා කළ අරමුණ එනම් සංචාරක බෝට්ටු සේවාව ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. | 2019 වර්ෂයේ සංචාරක අමාත්‍යාංශය මගින් මෙම බෝට්ටු සේවාව ආරම්භ කිරීම සඳහා වෙන්කළ ප්‍රතිපාදන සීමාවීම හේතුවෙන් ඉතිරි වැඩ කොටස් ප්‍රාදේශීය සභාව හරහා සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | සංචාරක බෝට්ටු සේවාව නිල වශයෙන් ආරම්භ කරන තෙක් එම සේවාව පවත්වාගෙන යන ලෙස අමාත්‍යාංශ ලේකම්ගේ අංක 05/සං/02/201 හා 2021.04.21 දිනැති ලිපියෙන් බුදුරුවගල |

| | | | | |
|---|---|---|---|---|
| | | | | බෝට්ටු සේවා අනු කමිටුවට දන්වා ඇත. |
| 7. | මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දීර්ඝකාලීන බදුකර මත ලබාදී තිබුණු ඉඩම් 5 ක් වෙනුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 24,690,528 ක හිඟ බදු මුදල් අයකරගෙන නොතිබුණි. | හිඟ බදු මුදල් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. | පළාත් ඉඩම් කොමසාරිස් හා ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. | හිඟ බදු මුදල් මෙතෙක් අයකර ගෙන නොමැත. නීතිමය කටයුතු කිරීම සඳහා ඌව පළාත් ඉඩම් කොමසාරිස් වෙත තොරතුරු ලබා දී ඇත. |
| 8. | <u>**රාවණාඇල්ල නැරඹුම් වේදිකාව ඉදිකිරීම**</u> | | | |
| | ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ 2015 ජුලි මස 23 දිනැති පස් පරීක්ෂණ වාර්තාව අනුව රාවණාඇල්ල නැරඹුම් ස්ථානය ඉදිකිරීමට යෝජිතව පැවති ස්ථානයේ අත්තිවාරම් යෙදීමට පෙර පාෂාණ බෑවුම් ස්ථායිතා විශ්ලේෂණයක් සිදුකළ යුතුව තිබුණි. ඒ පිළිබඳ නොසලකා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) විසින් 2015 නොවැම්බර් 11 දින ඉදිකිරීම් කටයුතු සඳහා රු. 6,460,382 ක ගිවිසුමකට එළඹ තිබුණි. ඉදිකිරීම් භූමියේ යෝග්‍යතාවය පිළිබඳව උද්ගත වූ ගැටලු හේතුවෙන් 2016 සැප්තැම්බර් 14 දින ගිවිසුම අන්‍යොන්‍ය එකඟතාවයෙන් අවලංගු කර තිබුණු | පළාත් සභා අරමුදලට සිදු වූ පාඩුව සම්බන්ධයෙන් වගකිව යුත්තන් හඳුනාගෙන අවශ්‍ය කටයුතු කළ යුතුය. | ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් ලබාගත් නිර්දේශ අනුව අස්ථාවර භූමියක් වූ බැවින් මුල් කර්මාන්තය අත්හිටුවා පසුව වෙනත් ස්ථානයක ඉදිකර ඇත. | පළාත් සභා අරමුදලට සිදු වූ පාඩුව පියවා ගැනීමට මෙතෙක් කටයුතු කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | අතර ඒ දක්වා කොන්ත්‍රාත්තුව වෙනුවෙන් වැයකළ රු. 967,042 ක මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබූ අතර පසුව අදාළ ඉදිකිරීම සඳහා නැවත 2018 නොවැම්බර් 22 දින නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) විසින් රු. 9,765,004 ක ගිවිසුමකට එළඹ 2019 සැප්තැම්බර් 04 දින කර්මාන්තයේ වැඩ අවසන් කර තිබුණි. | | | |
| 9. | **හාලිඇල පරිගණක සම්පත් පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම**<br>--------------------------------------------------------------- | | | |
| | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) විසින් 2016 ජුනි 27 දින කොන්ත්‍රාත් සමාගමක් සමඟ රු. 68,848,145 ක වටිනාකමකට ගිවිසුමකට එළඹ 2016 අගෝස්තු 29 දින අත්තිකාරම් වශයෙන් රු. 13,760,000 ක් ගෙවා තිබුණි. 2017 ජුනි 21 දින කර්මාන්තයේ වැඩ අවසන් කළයුතු වුවද, 2019 දෙසැම්බර් 31 දින වන විටත් වැඩ අවසන් කර නොතිබුණි. ගිවිසුම ප්‍රකාරව අයකල යුතු ප්‍රමාද ගාස්තුව රු. 3,422,407 ක් වුවද, 2018 අප්‍රේල් 24 දින වන විට රු. 1,721,204 ක් පමණක් අයකර ගෙන තිබුණි.<br>2019 අප්‍රේල් 09 දින කොන්ත්‍රාත්කරු සමඟ වූ ගිවිසුම අවලංගු කර තිබුණු අතර පළාත් සභා මුදල් රීති 705 ප්‍රකාරව කොන්ත්‍රාත්කරු අසාධුගත කර නොතිබූ අතර අත්තිකාරම් මුදලින් රු. 1,740,000 ක් පමණක් | කර්මාන්තය කඩිනමින් නිම කරගැනීමටත්, කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් ඌව පළාත් සභා මුදල් රීති සංග්‍රහයේ මුදල් රීති 705 ප්‍රකාරව කටයුතු කිරීමටත් පියවර ගත යුතුය. | අත්තිකාරම් ඇපකරය හා කාර්ය සංසිද්ධි ඇපකරය අයකර ගැනීම සඳහා නීතිමය කටයුතු කරමින් පවතී. කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු මුදල් රඳවාගෙන ඇත. | මේ වන විටත් කර්මාන්තයේ වැඩ අවසන් කර නොමැත. ඇපකර මුදල් කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු වෙනත් බිල්පත්වලින් අයකර ගැනීමට කටයුතු කර ඇති බව දන්වා ඇත. වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කටයුතු කර නොමැත. |

අයකර ගෙන තිබුණි. එසේම අත්තිකාරම් ඇපකරයේ වලංගු කාලය 2018 සැප්තැම්බර් 21 දින අවසන් වී තිබීම නිසා අත්තිකාරම් මුදල සම්පූර්ණයෙන් පියවා ගැනීමට හෝ ඇපකරයේ වලංගු කාලය දීර්ඝ කර ගැනීමට කටයුතු නොකිරීමෙන් රු. 12,020,000 ක පාඩුවක් සිදු වී තිබුණි.

එසේම කාර්යසාධන ඇපකරයේ වලංගු කාලය 2019 ජුලි 31 දින අවසන් වී තිබුණු අතර නියමිත කාලයට පෙර ඇපකරයේ කාලය දීර්ඝ නොකිරීම මත කොන්ත්‍රාත්කරු අපේක්ෂිත කාර්යසාධන මට්ටමට ලඟා නොවීම හේතුවෙන් ඇපකරය මගින් අයකර ගත හැකිව තිබුණු රු. 3,443,000 ක මුදලද අයකර ගත නොහැකි වී තිබුණි.

10. **ලුණුගල ආයුර්වේද රෝහලේ මුළුතැන්ගෙය හා ඖෂධ නිෂ්පාදනාගාරය ඉදිකිරීම**

---------------------------------------------------------------------------------------

| | | | |
|---|---|---|---|
| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) විසින් 2018 සැප්තැම්බර් 25 දින රු. 3,024,605 ක වටිනාකමකට අදාළ ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවකු සමඟ ගිවිසුමකට එළඹ තිබුණු අතර 2019 මාර්තු 18 දින වන විට එකී කොන්ත්‍රාත්කරුට අත්තිකාරම සමඟ රු. 1,107,000 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද කොන්ත්‍රාත්තුව නියමිත දිනට අවසන් නොකිරීම හේතුවෙන් 2019 නොවැම්බර් 29 දින ගිවිසුම | අදාළ ඇපකර මුදල් අයකර ගැනීමත්, කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් ඌව පළාත් සභා මුදල් රීති සංග්‍රහයේ මුදල් රීති 705 ප්‍රකාරව කටයුතු කිරීමටත් පියවර ගත | කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු මුදලින් රු. 359,790 ක් රඳවාගෙන ඇති අතර ඉතිරිය කොන්ත්‍රාත්කරු ඉටුකරන වෙනත් කර්මාන්ත සඳහා ගෙවි යුතු මුදල් වලින් අයකර ගැනීමෙන් අත්තිකාරම් මුදල පියවා ගැනීමට කටයුතු කරනු ලැබේ. | කොන්ත්‍රාත්කරු සමඟ වූ ගිවිසුම 2019.11.29 ඒකපාර්ශවීයව අවලංගු කර අත්තිකාරම් ඇපකරයේ සහ කාර්ය සංසිද්ධි ඇපකර වටිනාකම, මෙම කර්මාන්තය |

| | | | | |
|---|---|---|---|---|
| | අවලංගු කර තිබුණු අතර ගිවිසුම ප්‍රකාරව අයකර ගත යුතු ප්‍රමාද ගාස්තු රු. 151,230 ක් අයකරගෙන නොතිබුණි.<br><br>අත්තිකාරම් ඇපකරයේ වලංගු කාලය ඉකුත් වීමට පෙර දින දීර්ඝ කරවා ගෙන නොතිබීම මත රු. 907,000 ක අත්තිකාරම් මුදලද අයකරගෙන නොතිබුණි. කාර්යසාධන ඇපකරයේ වලංගු කාලය ඉකුත් වීමට පෙර දින දීර්ඝ කරවා ගෙන නොතිබීම මත රු. 151,300 ක් වූ කාර්යසාධන ඇපකරයේ වටිනාකමද අයකරගෙන නොතිබුණි. | යුතුය. | | සහ කොන්ත්‍රාත්කරු ඉටුකළ වෙනත් කර්මාන්තවලට ගෙවිය යුතු බිල්පත් වලින් අයකරගෙන ඇත. ප්‍රමාද ගාස්තු රු. 151,230 ක් අයකර ගෙන නොමැත. |
| 11. | මහා නගර සභා හා නගර සභා (සංශෝධිත) පනත් සහ 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 129(2) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පළාත් පාලන ආයතන වලට ගෙවිය යුතු උසාවි දඩ රු. 114,982,672 ක් හා මුද්දර ගාස්තු රු. 242,218,261 ක් විය. | පළාත් පාලන ආයතන වලට අය විය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු එම ආයතන වලට ලබා දීමට කටයුතු කළ යුතුය. | අදාළ ආයතන විසින් ඉල්ලීම් කිරීමෙන් පසු පළාත් විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලද, සියලුම මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් නොපමාව එම ආයතන වෙත ලබාදී ඇත. | 2020 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.100,883,050 ක් හා මුද්දර ගාස්තු රු.74,718,598 ක් ලෙස ගෙවිය යුතු මුළු වටිනාකම රු.175,601,648 ක් පළාත් පාලන ආයතන වලට ගෙවීම් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 12. | රෝහල් වලට අයත් ඉඩම්වල මායිම් නිරවුල් කිරීම් සඳහා නිසි ක්‍රියාමාර්ගයක් නොගැනීම මත බණ්ඩාරවෙල දිසා රෝහලට අයත් ඉඩම තුළ පර්චස් 2.66 ක ප්‍රමාණයක අනවසරයෙන් නිවාස ඉදිකර ඇති බවට මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් 2013 නොවැම්බර් 25 දින වාර්තාවක් ලබාදී තිබුණු අතර වැලිමඩ මූලික රෝහල පිහිටි නියදගල පතන ඉඩමෙන් අක්කර 01 පර්චස් 0.8 කප්‍රමාණයක අනවසර පදිංචිකරුවන් පදිංචි වී ස්ථිර ගොඩනැගිලි ඉදිකර ඇති බව අනාවරණය වී තිබුණි. අනවසර පදිංචිකරුවන් ඉඩම් වලින් ඉවත් කර 1979 අංක 07 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීමේ) පනත යටතේ කටයුතු කර නිරවුල් භුක්තිය ලබාගැනීමට පියවරගෙන නොතිබුණි. | 2017 මාර්තු 23 දින පැවැති රාජ්‍ය ගිණුම්කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය. | බණ්ඩාරවෙල දිසා රෝහලට අයත් හෙක්ටයාර 5.0863 සතු ඉඩමේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් කොටසේ මායිම් මේ වන විට පෙන්වාදී අවසන් කර ඇත. හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් කොටසේ මායිම් නිරවුල් කර ගැනීම සඳහා 2018-24 දරන මැනුම් ඉල්ලීම යොමු කර ඇත. | 2020 දෙසැම්බර් 31 දින වන විටත් 2017 මාර්තු 23 දින පැවැති රාජ්‍ය ගිණුම්කාරක සභාවේ නිර්දේශ අනුව ඉඩම නිරවුල් කර ගැනීම සිදුකර නොතිබුණි. |
| 13. | වැලිමඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ අලකොලගාල ග්‍රාම නිලධාරී වසමේ මීපිලිමාන පිහිටි හෙක්ටයාර 11.056 කින් යුත් බිම් කොටස වාණිජ කටයුත්තක් සඳහා වසර 30 ක කාලයකට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට බදුදී තිබුණු අතර 2011 මැයි 09 දින ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් එය අනුමත කර තිබුණි. කෙසේ වුවද මෙම ඉඩම බදු දීම සම්බන්ධයෙන් | 2017 මාර්තු 23 දින පැවැති රාජ්‍ය ගිණුම්කාරක සභාවේ තීරණය පරිදි ගුවන්විදුලි සංස්ථාවේ අභිමතය පරිදි අතුරු බදුදීම නීතියානුකූල නොවන බැවින් එය අවලංගු කර | කිසිදු වැලැක්වීමේ ක්‍රියාමාර්ගක් ගෙන නොතිබුණි. | 2020 දෙසැම්බර් 31 දින වන විටත්, 2017 මාර්තු 23 දින පැවැති රාජ්‍ය ගිණුම්කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබු අතර |

| | | | | |
|---|---|---|---|---|
| | බදු ගිවිසුමකට එළඹීමට හෝ බදු ඔප්පුවක් පිළියෙල කිරීමට ද කටයුතු කර නොතිබුණු අතර ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව විසින් මෙම ඉඩමෙන් අක්කර 19 ක භූමි ප්‍රමාණයක් වසරකට රු.2,755,000 ක බදු කුලියකට 2012 නොවැම්බර් 06 දින සිට වගා කටයුතු සඳහා පෞද්ගලික පාර්ශවයකට අතුරු බදු දී තිබුණු අතර දිස්ත්‍රික් තක්සේරුකරුගේ 2012 ජුනි 14 දිනැති තක්සේරු වාර්තාව අනුව 2012 සිට 2016 වර්ෂය දක්වා ගුවන් විදුලි සංස්ථාවෙන් ඌව පළාත් සභාවට අයවිය යුතු රු. 8,680,000 ක් වූ බදු ආදායමක් අයකර ගෙන නොතිබුණි. | ඉඩම් භුක්තිය ආපසු පළාත් සභාවට ගැනීමට කටයුතු කළ යුතුය. | | නිරවුල් වී නොතිබුණි. |
| | **2020 වර්ෂය**<br>---------------- | | | |
| 14. | 2006 අප්‍රේල් 25 දිනැති අංක 6/2006 හා 2006 නොවැම්බර් 10 දිනැති අංක 6/2006(ii) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව 2006 ජනවාරි 01 දින සිට රාජ්‍ය සේවයට නව බඳවා ගැනීම් සිදු කිරීමේදී අදාළ නිලධාරීන් පත්කරනු ලැබූ තනතුරට නියමිත වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ පිහිටුවිය යුතු වුවත් 2006 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ඌව පළාත් සභාව විසින් බඳවා ගන්නා ලද පාසල් පුස්තකාල සේවක, පාසල් රසායනාගාර සේවක හා පාසල් මුරකරු තනතුරු 778 ක් සඳහා III | වැඩිපුර ගෙවා ඇති මුදල අයකර ගත යුතුය. | මෙම වැඩිපුර ගෙවීම් අදාළ නිලධාරියා නියමිත තනතුරට හා ශ්‍රේණියට අදාළ වැටුප් තලයට එළඹෙන තෙක් ඉදිරි වැටුප් වර්ධක ලබානොදී වැටුප් වර්ධක වලින් හිලව් කිරීමෙන් ගැටළුව නිරාකරණය කිරීමට කටයුතු කර ඇත. | නව බඳවා ගැනීම් පටිපාටියට අන්තර්ග්‍රහනය වී ඇති සේවකයින්ගේ වැටුප් වර්ධක වලින් හිලව් කිරීම 2022 වර්ෂයේ සිට සිදුකරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | ශ්‍රේණියේ ආරම්භක වැටුප් පියවරේ පිහිටුවීම වෙනුවට II ශ්‍රේණියේ ආරම්භක වැටුප් පියවරේ පිහිටුවා වැරදි ආකාරයෙන් වැඩිපුර වැටුප් ගෙවීම් කර තිබුණි. ඒ අනුව 2006 නොවැම්බර් මස සිට 2020 සැප්තැම්බර් මස දක්වා රු. 132,825,714 ක් වැඩිපුර වැටුප් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් ජාතික වැටුප් කොමිෂන් සභාවේ ලේකම්ගේ 2020 ජුනි 12 දිනැති අංක NSCC/12/78/2/1/SR ලිපියේ 03(ii) ඡේදය අනුව නියමිත ශ්‍රේණියේ සහ වැටුප් තලයේ පිහිටුවා අදාළ වැටුප් තලයට එළඹෙන තෙක් ඉදිරි වැටුප් වර්ධක ලබානොදී, මෙම වැඩිපුර ගෙවා තිබූ රු. 132,825,714 ක මුදලක් වැටුප් වර්ධක වලින් හිලව් කිරීමට සුදුසු බව දක්වා තිබුණ ද එසේ කටයුතු කර නොතිබුණි. | | | |
| 15. | ඌව පළාත් ක්‍රීඩා, යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික, පේෂකර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශය විසින් 2013 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කරන ලද උඩවලව සංචාරක විවේකාංගණය සඳහා 2018 වර්ෂය වන විට රු.39,824,944 ක වියදමක් දරා තිබුණද, 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද විවේකාංගණය හා කඩකාමර 27 ක් සංචාරකයින් සඳහා විවෘත කර නොතිබීමෙන් මෙතෙක් කිසිදු ආදායමක් උපදවා ගැනීමට | විවේකාංගණය හා කඩකාමර සංචාරකයින් සඳහා කඩිනමින් විවෘත කළ යුතුය. | උඩවලව සංචාරක මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ඉවත්කළ කඩකාමර වෙනුවෙන් ඉදිකළ නව කඩ කාමර 11 ක් 2020 ජනවාරි 23 දින බදු පදනම මත කඩ හිමියන්ට ලබා දී ඇති නමුත් කොවිඩ් 19 ව්‍යසනය හේතුවෙන් ව්‍යාපාර පවත්වාගෙන යාමට බාධා වී ඇත. මධ්‍යස්ථානයේ ආපන ශාලාව හා කඩකාමර බදු දීම සඳහා ටෙන්ඩර් පරිපාටිය | 2021 දෙසැම්බර් 31 දින වන විටද විවේකාංගණය සහ කඩකාමර සංචාරකයින් සඳහා විවෘත කර නොතිබීමෙන් වැයකළ මුදලට සරිලන පරිදි ආදායම් උපදවා ගැනීමට |

| | | | | |
|---|---|---|---|---|
| | අපොහොසත්ව තිබුණි. | | අනුගමනය කර ගැණුම්කරුවන් හඳුනා ගත්තද රට තුළ පැවති කොවිඩ් 19 ව්‍යසනය හේතුවෙන් එම ගැණුම්කරුවන් ගිවිසුම් ගතවීමට ඉදිරිපත් නොවුණි. මධ්‍යම රජයේ ප්‍රතිපාදන ලබාගෙන භූමි අලංකරණ හා ඉදිරි සංවර්ධන කටයුතු කඩිනමින් නිම කිරීමට සැලසුම් කර ඇත. | මෙතෙක් අපොහොසත්වී තිබුණි. |
| 16. | කිතුල්කොටේ සංචාරක පහසුකම් මධ්‍යස්ථානයේ මුළුතැන්ගෙය හා ආපනශාලාව රු. 20,987,306 ක් වැයකර 2018 ජුලි 18 දින වන විටද, වැසිකිළි පද්ධතිය රු. 6,029,215 ක් වැයකර 2018 මැයි 02 දින වන විටද වැඩ නිමකර තිබුණද 2020 දෙසැම්බර් 31 දින වන විටද ඒවා ප්‍රයෝජනයට ගෙන නොතිබීමෙන් මෙතෙක් කිසිදු ආදායමක් උපදවා ගැනීමට අපොහොසත්ව තිබුණි. | කඩිනමින් ආපනශාලාව ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. | දුර ගමන් සේවා බස් රථ සඳහා පහසුකම් සපයනු ලබන මධ්‍යස්ථානයේ ගොඩනැගිලි බදු දීම සඳහා මිල ගණන් කැඳවූ පසු ඊට මිල ගණන් ඉදිරිපත් කළ සැපයුම්කරුවන් රට තුළ පැවති කොවිඩ් 19 ව්‍යසනය හේතුවෙන් ගිවිසුම් ගතවීමට ඉදිරිපත් නොවුණි. එබැවින් දේශීය සංචාරකයින් ඉලක්ක කර ගනිමින් මෙහි කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ හෙළ බොජුන් හලක් ස්ථාපනය කිරිමට සැලසුම් කර ඇති අතර ඒ සඳහා මධ්‍යම රජයේ කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කර ඇත. | දුර ගමන් බස් රථ සඳහා සේවා සැපයීමේ මධ්‍යස්ථානයක් ලෙස පවත්වාගෙන යාම සඳහා ඌව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට පවරා දීමට, එහි සභාපති හා ඌව පළාත් සංචාරක අමාත්‍යාංශ ලේකම් අතර 2021 අගෝස්තු 09 දින ද්විපාර්ශවීය ගිවිසුමක් ඇතිකර ගෙන |

| | | | | |
|---|---|---|---|---|
| | | | | තිබුණත් 2021 දෙසැම්බර් 31 දින වන විටත් සේවා සැපයීමේ මධ්‍යස්ථානය විවෘත කර නොතිබුණි. |
| 17. | 2003 වර්ෂයේදී ගොවීන් අතර බෙදා දී තිබූ ආනයනික බීජ අර්තාපල් වලට අදාළව 2021 ආරම්භයට ලැබිය යුතු ණය ශේෂය රු. 10,509,070 ක් වූ අතර ඉන් වර්ෂය තුළ රු. 197,151 ක් පමණක් අයකර ගෙන තිබුණි. ඒ අනුව ණය අයකර ගැනීමේ ප්‍රගතිය සියයට 1.8 ක තරම් ඉතා පහළ මට්ටමක පැවැති අතර ණය පදනමට බීජ ලබාදී වසර 17 ක් ගතවී පැවතියද තවදුරටත් රු. 10,311,919 ක් අයවිය යුතුව පැවතුනි. | කඩිනමින් ණය අයකර ගත යුතුය. | ඇතැම් ණයගැතියන් මියයාම, විශ්‍රාම යාම හා ප්‍රදේශ හැරගොස් සිටීම හේතුවෙන් අයකර ගැනීම දුර්වල මට්ටමක පවතින නමුත් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | 2021 වර්ෂයේදී රු. 324,850 ක් පමණක් අයවී තිබුණි. |
| 18. | ආනයනය කරන ලද බීජ අර්තාපල් නරක්වීම හේතුවෙන් බීජ අර්තාපල් ආනයනය කළ සමාගමෙන් රු. 4,893,741 ක් අයකර ගැනීමට 2003 වර්ෂයේදී කටයුතු කළයුතු වුවද, එසේ සිදුකර නොතිබීම මත වසර 17 ක කාලයක් ගත වී ඇති බැවින් එකී අලාභය අයකර ගත නොහැකි තත්ත්වයකට පත්වී ඇත. | විධිමත් ගිවිසුමකට එළඹීමෙන් අනතුරුව ආනයනය කිරීමට කටයුතු නොකිරීම හා කඩිනමින්ම ජාත්‍යන්තර බේරුම්කරණය ට නොයාම යන හේතුමත වගකීම් පැහැරහැරි | “තෙත කුණුවීම්” රෝගය මත රේගුව තුළදී ප්‍රතික්ෂේප වූ ආනයනය කරන ලද බීජ අර්තාපල් ලබාදෙන ලද සමාගමෙන් අයවිය යුතු අලාභය වන රු. 4,893,741 ක මුදල කඩිනමින් පියවන ලෙස දන්වමින් අදාළ සමාගම වෙත වරින් වර ලිපි යොමු කරන ලදී. එහෙත් මීට යහපත් ප්‍රතිචාරයක් එම සමාගම නොදැක් වූ හෙයින් මෙම ගැටලුව නීතිපති | මෙම මුදල මේවන විටද පියවී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | නිලධාරීන්ගෙන් අයකරගත යුතුය. | දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදි. | |
| 19 | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාර සියලුම නිලධාරීන් විසින් පැමිණීම හා පිටවීම සලකුණු කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කළයුතු වුවද, ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව 2017 වර්ෂයේදී රු. 5,700,000 ක් ගෙවා මිලදීගෙන තිබුණු ඇඟිලි සලකුණු යන්ත්‍ර 100 ක් සහ ඌව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව 2017 වර්ෂයේදී රු. 848,891 ක් ගෙවා මිලදී ගෙන තිබුණු ඇඟිලි සලකුණු යන්ත්‍ර 31 ක් අදාළ කාර්යය සඳහා 2020 දෙසැම්බර් 31 දින දක්වා භාවිතයට ගෙන නොතිබුණි. | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීම සඳහා සියලුම සෞඛ්‍ය ආයතන වෙත යන්ත්‍ර සවි කළත් ඒ අතරින් ආයතන 37 ක කාර්යාලගත නිලධාරීන් පමණක් ඒවා භාවිතා කරයි. ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කරන ලෙස අවස්ථා ගණනාවකදී එම ආයතන දැනුවත් කළද සියලුම තනතුරුවලට අදාළ කාර්ය මණ්ඩල ඒවා භාවිතා නොකරන බැවින් වෘත්තීය සමිති දක්වන විරෝධතා මත ඌව පළාතේ අනෙකුත් රෝහල් හා සෞඛ්‍ය ආයතන මෙම යන්ත්‍ර භාවිතා නොකරයි.<br><br>ආයුර්වේද කොමසාරිස් කාර්යාලය සහ දියතලාව ආයුර්වේද රෝහලේ සේවකයින් හැර ආයතන 31 සෞඛ්‍ය සේවකයින් වෘත්තීය හේතු මත ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා නොකරයි. | වෘත්තීය සමිති විසින් දක්වන ලද විරෝධතා මත ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා නොකරයි |

| | | | | |
|---|---|---|---|---|
| 20. | ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් වාණිජ පදනමින් දීර්ඝකාලීනව ඉඩම් බදු දී තිබුණු ඉඩම් වෙනුවෙන් බදුකරුවන් 06 දෙනෙකුගෙන් 2020 දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවට අයවිය යුතු රු. 22,421,720 ක් අයකර ගැනීම සඳහා ඌව පළාත් ඉඩම් කොමසාරිස් විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග මෙතෙක් ගෙන නොතිබුණි. | හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ඌව පළාත් ඉඩම් කොමසාරිස් හා ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් අනුව ඉදිරි කටයුතු සිදුකරන බව දක්වා ඇත. | හිඟ බදු මුදල් අයකර ගෙන නොමැත. මෙම හිඟ බදු මුදල අයකර ගැනීම සඳහා නව ලිපි ගොනු සකස් කර බදුකරුවන්ට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම වෙනුවෙන් උපදෙස් ලබා ගැනීම සඳහා එම විස්තර ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යොමු කර ඇත. |
| 21. | මොනරාගල දිස්ත්‍රික් ලේකම් විසින් ලබාදී තිබුණු මූල්‍ය ප්‍රතිපාදන අනුව රු. 4,916,581 ක් වැය කර සියඹලාණ්ඩුව කරම්මඩ වැවේ පිටවාන ඉදිකිරීමේදී එය නියමිත උසට වඩා අඩු උසකින් ඉදිකිරීම නිසා වැවේ ජලය ප්‍රමාණවත් පරිදි නොරැදී වල් බිහිවී පවතින අතර දරන ලද වියදම මුළුමනින්ම නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණු අතර, ව්‍යාපෘති යෝජනාව අනුව වූ ගොවි පවුල් 20 මගින් කුඹුරු අක්කර 50 ක් පමණ වගාකරවීමේ අරමුණු ඉටුකර | පූර්ව අධ්‍යයනයක් සිදුකර විධිමත් සැලැස්මක් සහිතව කර්මාන්ත ඉදිකිරීම් කළ යුතුය. | වැව ඇතුළත පස් වෙනත් සංවර්ධන කටයුතු වලට යොදා ගැනීමෙන් වැවේ ධාරිතාවය වැඩිකර ගත හැකි බව ප්‍රාදේශීය ලේකම් දැනුවත් කර ඇති අතර ප්‍රමාණවත් තරම් පළලට පිටවාන ඉදිකර ඇති බැවින් වර්ෂාව අධ්‍යයනය කර මාර්ගය යට නොවන පරිදි ඉදිරියේදී පිටවාන තවත් අඩියක් එසවීමට කටයුතු කරනු ලැබේ. | 2021 දෙසැම්බර් වන විටත් මෙම වැව ප්‍රයෝජනයට ගෙන වගාකිරීමට අපේක්ෂිත කුඹුරු අක්කර 50 ක් වගාකර නොතිබුණ අතර පිටවාන ද නියමිත උසට ඉදිකිරීමට |

| | | | | |
|---|---|---|---|---|
| | ගත නොහැකි වී තිබුණි. | | | කටයුතු කර නොතිබුණි. |
| 22. | 1991 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ණයට විකුණූ රෙදිපිළි වෙනුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට රජයේ ආයතන 799 කට අයත් නිලධාරීන්ගෙන් අයවිය යුතු රු. 3,138,410 ක් අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කඩිනමින් ණය අයකර ගැනීමට පියවර ගත යුතුය. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | හිඟ මුදලින් රු. 487,096 ක් පමණක් අයකරගෙන ඇත. |
| 23. | ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් උපයෝජනය කර ක්‍රියාත්මක කරන "ප්‍රාථමික සෞඛ්‍ය පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ" පළමු වටයේ ව්‍යාපෘති 10 ක් සඳහා ඌව පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ලැබී තිබුණු රු. 3,544,205 ක ඉංජිනේරුමය යෙදවුම් සඳහා උපදේශන ගාස්තු ඌව පළාත් සභා මුදල් රීති 2.1 අනුව පළාත් සභා අරමුදලට බැර නොකර තැන්පත් ගිණුමට බැර කර එකී මුදලින් රාජ්‍ය වියදම් කළමනාකරණය සහ මූල්‍ය විනය පවත්වාගෙන යාම පිළිබඳ 2019 දෙසැම්බර් 04 දිනැති අංක 07/2019 දරන අයවැය චක්‍රලේඛයේ උපදෙස්වලට පටහැනිව පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් රු. 2,862,340 ක් භාවිතා කර රු. 2,290,750 ක ජංගම දුරකථන සහ රු. 571,590 කට කාර්යාල උපකරණ අවිධිමත් ලෙස මිලදී ගෙන තිබුණි. | ඌව පළාත් සභාමුදල් රීති 2.1 අනුව හා ව්‍යාපෘතියේ අරමුණුවලට අදාලව වියදම් දැරීමට කටයුතු කළයුතු අතර ඉන් බැහැරව කටයුතු කළ නිලධාරීන්, ගෙවීම් අනුමත කළ නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතුය. | කිසිදු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මිලදී ගන්නා ලද උපකරණ ස්ථාවර වත්කම් ලෙස හඳුනාගෙන ලේඛන ගතකර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| 24. | ඌව පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ කාර්යාලය සඳහා අත්තිකාරම් ගිණුම් කටයුත්තේ 2008 වසරේ සිට 2015 වසර දක්වා පළාත් සභාවට අයත් ආයතනවලින් අයවිය යුතුව තිබුණු එකතුව රු. 13,307,238 ක් අයනොකර සමුච්චිත අරමුදලට හරකර තිබුණි. | ඌව පළාත් සභා මුදල් රීති 113.4 අනුව කටයුතු කළ යුතුය. | ප්‍රතිපාදන නොමැතිවීම හේතුකොට ගෙන නොගෙවීම හා නැවත ගෙවීම සඳහා පළාත් සභා අරමුදලින් නව ප්‍රතිපාදන සලසා දීමට අවශ්‍යවීම යන හේතු සලකා ඌව පළාත් මුදල් රීති 113.5 ප්‍රකාරව හිඟ ණය සමුච්චිත අරමුදලට කපා හැරීම සිදුකර ඇත. | මේ සම්බන්ධයෙන් ඌව පළාත් සභා මුදල් රීති 113.4 ප්‍රකාරව විගණකාධිපති මෙතෙක් දැනුවත්කර නොමැත. |
| 25. | දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ ගිවිසුම්ගත වටිනාකම රු. 58,815,876 ක් වූ කි.මී. 2.4ක් දිග සෙල්ලකතරගම-කිරිවෙහෙර මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. ව්‍යාපෘතියේ ඉදිකිරීම් සම්බන්ධ ප්‍රමාණ පත්‍රයේ විෂයය අංක 1.6 අනුව මාර්ගයට මිලි මීටර් 150 ක් ඝනකමක කොන්ක්‍රීට් යෙදිය යුතු වුවද, මාර්ගය ආරම්භක ස්ථානයේ සිට මීටර් 300 ක් දිගට යොදා ඇති කොන්ක්‍රීට් ස්ථරයේ ඝණකම මිලි මීටර් 120 ක් විය. එමෙන්ම ප්‍රමාණ පත්‍රයේ විෂයය අංක 1.7 අනුව දිග අතට හා හරස් අතට මිලි මීටර් 250 ක පරතරයක් පවතින ලෙස දඟර වානේ ඇතිරීම සිදුකළ යුතු වුවද, ස්ථාන 10 ක සිදුකළ නියැදි පරීක්ෂාවේදී දිග අතට මිලි මීටර් 260 සිට 280 දක්වා වූ පරතරයටත් හරස් අතට මිලි මීටර් 255 සිට 280 දක්වා වූ පරතරයටත් | පිරිවිතරයන්ගෙන් බැහැරවීම් නිවැරදි කිරීමත්, වරද අනාවරණය කර ගැනීමට අපොහොසත් වූ නිලධාරීන්ට එරෙහිව පරීක්ෂණයන් පැවැත්වීමක් සිදු කළ යුතුය. | කි.මී. 2.4 ක දිගකින් යුතු මාර්ගයේ කි.මී. 2.1 ක් නියමිත ප්‍රමිතීන්ට අනුව ඉදිකර ඇති අතර ඡේදයේ පෙන්වා දී ඇති මීටර් 300 ක් දිගින් යුතු මාර්ග කොටස නියමිත ඝණකම නොමැතිවීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුගෙන් රු. 118,080 ක් අඩුකර ගෙවීමට නිර්දේශයක් කර තිබූ නමුත් පසුව විගණනයෙන් පෙන්වාදීම මත වැරදි නිර්දේශය මත ගෙවීම් කිරීම නවතා තිබුණි. | ප්‍රමිතියෙන් තොරව ඉදිකළ මීටර් 300 ක කොටස සඳහා ගෙවීම් නතර කර ඇත. මාර්ගයේ එම කොටස නියමිත ප්‍රමිතීන්ට අනුව සකස් කර නොමැත. වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව පරීක්ෂණයන් සිදුකර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | දහර වානේ යොදා ගනිමින් ප්‍රමිතියට පටහැනි ලෙස ඉදිකිරීම් කටයුතු කර තිබුණි. | | | |
| 26. | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු රු. මිලියන 956.7 ක ප්‍රතිපාදන උපයෝජනය කර ඌව පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කර තිබුණු ග්‍රාමීය පාලම් ව්‍යාපෘතියේ ඉදිකිරීම් සම්බන්ධයෙන් කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී රු. මිලියන 153 ක් වැයකර ඉදිකර තිබුණු පාලම් 05 ක් සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය. | | | |
| 26.1 | බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රු. මිලියන 32.8 ක වියදමක් දරා ඉදිකර තිබුණු අංක 1125 දරන ගල්කන්දවත්ත පාලම ඉදිකිරීමේ අක්‍රමවත් බව සහ ඊට සම්බන්ධවන මාර්ගය ඉදිකිරීම කර නොතිබීම නිසා පාලම මෙතෙක් භාවිතයට ගැනීමට නොහැකි වී තිබුණි. | සැලසුම්වල හෝ ඇස්තමේන්තු කිරීමේ දෝෂයක් වේනම් එයට සම්බන්ධ නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතුය. නොපමාව පාලම භාවිතයට ගැනීම සඳහා පියවර ගත යුතුය. | ඌව පළාත් මාර්ග අධ්‍යක්ෂකගේ 2021 නොවැම්බර් 19 දිනැති 17/AC/1/1/1/2-4/2021 අංක දරන ලිපිය මගින් පාලම්වලට සම්බන්ධවන මාර්ගවල අඩුපාඩු සකස් කර ගැනීම පළාත් සභාවෙන් වෙන්වන වාර්ෂික ප්‍රතිපාදන වලින් සිදුකර ගන්නා ලෙස ඌව පළාත් පාලන කොමසාරිස් වෙත දන්වා යවා ඇත. | ඡේදය මගින් පෙන්වා දී ඇති නිරීක්ෂණ නිවැරදි කිරීමට පියවර ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| 26.2 | බදුල්ල දිස්ත්‍රික්කයේ හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුරුකුදේගම රු. මිලියන 25.5 ක් වැය කර ඉදිකර තිබුණු අංක 2243 දරන කුරුකුදේගම-බඳුවත්ත පාලමට කුරුකුදේගම සිට එන ප්‍රවේශ මාර්ගය පුළුල් කර සම්බන්ධ කර නොතිබුණු බැවින් වාහන ගමනා ගමනය සඳහා යොදා ගැනීමට නොහැකි වී තිබුණි. | සැලසුම්වල හෝ ඇස්තමේන්තු කිරීමේ දෝෂයක් වේනම් එයට සම්බන්ධ නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතුය. නොපමාව පාලම භාවිතයට ගැනීම සඳහා පියවර ගත යුතුය. | ඌව පළාත් මාර්ග අධ්‍යක්ෂකගේ 2021 නොවැම්බර් 19 දිනැති 17/AC/1/1/1/2-4/2021 අංක දරන ලිපිය මගින් පාලම්වලට සම්බන්ධවන මාර්ගවල අඩුපාඩු සකස් කර ගැනීම පළාත් සභාවෙන් වෙන්වන වාර්ෂික ප්‍රතිපාදන වලින් සිදුකර ගන්නා ලෙස ඌව පළාත් පාලන කොමසාරිස් වෙත දන්වා යවා ඇත. | ඡේදය මගින් පෙන්වා දී ඇති නිරීක්ෂණ නිවැරදි කිරීමට පියවර ගෙන නොමැත. |
| 26.3 | බදුල්ල දිස්ත්‍රික්කයේ ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බල්ලේකෙටුව නාවලගම ග්‍රාමයේ රු. මිලියන 33.4 ක් වැය කර ඉදිකර තිබුණු අංක 1843 දරන උඩුතුරේ පිටපොල පාලමේ දකුණු පසට මාර්ගය සකසා නොතිබුණු බැවින් වාහන ගමනා ගමනය සඳහා යොදා ගැනීමට නොහැකි වී තිබුණි. | සැලසුම්වල හෝ ඇස්තමේන්තු කිරීමේ දෝෂයක් වේනම් එයට සම්බන්ධ නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතුය. නොපමාව පාලම භාවිතයට ගැනීම සඳහා පියවර ගත යුතුය. | ඌව පළාත් මාර්ග අධ්‍යක්ෂකගේ 2021 නොවැම්බර් 19 දිනැති 17/AC/1/1/1/2-4/2021 අංක දරන ලිපිය මගින් පාලම්වලට සම්බන්ධවන මාර්ගවල අඩුපාඩු සකස් කර ගැනීම පළාත් සභාවෙන් වෙන්වන වාර්ෂික ප්‍රතිපාදන වලින් සිදුකර ගන්නා ලෙස ඌව පළාත් පාලන කොමසාරිස් වෙත දන්වා යවා ඇත. | ඡේදය මගින් පෙන්වා දී ඇති නිරීක්ෂණ නිවැරදි කිරීමට පියවර ගෙන නොමැත. |
| 26.4 | බදුල්ල දිස්ත්‍රික්කයේ ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුඹල්වෙල ග්‍රාමයේ රු. මිලියන 33.2 ක් වැය කර ඉදිකර තිබුණු අංක 1130 දරන හෙට්ටිපොලවත්ත පාලමේ වම්පස බදුල්ල-බණ්ඩාරවෙල ප්‍රධාන මාර්ගයට | සැලසුම්වල හෝ ඇස්තමේන්තු කිරීමේ දෝෂයක් වේනම් එයට සම්බන්ධ නිලධාරීන් සම්බන්ධයෙන් | ඌව පළාත් මාර්ග අධ්‍යක්ෂකගේ 2021 නොවැම්බර් 19 දිනැති 17/AC/1/1/1/2-4/2021 අංක දරන ලිපිය මගින් පාලම්වලට සම්බන්ධවන මාර්ගවල අඩුපාඩු සකස් කර | ඡේදය මගින් පෙන්වා දී ඇති නිරීක්ෂණ නිවැරදි කිරීමට පියවර ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | සම්බන්ධ කර දකුණුපස මාර්ගයක් නොමැති තේ වත්තකට සම්බන්ධ කර, වාහන ගමනා ගමනය සඳහා යොදා ගැනීමට අවකාශයක් නොමැතිසේ ඉදිකර තිබුණි. | පරීක්ෂණයක් පැවැත්විය යුතුය. නොපමාව පාලම භාවිතයට ගැනීම සඳහා පියවර ගත යුතුය. | ගැනීම පළාත් සභාවෙන් වෙන්වන වාර්ෂික ප්‍රතිපාදන වලින් සිදුකර ගන්නා ලෙස ඌව පළාත් පාලන කොමසාරිස් වෙත දන්වා යවා ඇත. | |
| 26.5 | බදුල්ල දිස්ත්‍රික්කයේ ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ යහලඅරාව ග්‍රාමයේ රු. මිලියන 28.2 ක් වැය කර ඉදිකර තිබුණු අංක 1844 දරන ගල්තැන්නහේන වැලිඅරාව පාලමේ දකුණු පස කුඹුරකට සම්බන්ධ කර තිබීම සහ ඒ හේතුවෙන් පාලමට විධිමත්ව ප්‍රවේශ මාර්ගයක් සම්බන්ධ වී නොතිබීම හේතුවෙන් වැය කර තිබු මුදල අනාර්ථික වියදමක් වී තිබුණි. | සැලසුම්වල හෝ ඇස්තමේන්තු කිරීමේ දෝෂයක් වේනම් එයට සම්බන්ධ නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතුය.<br>නොපමාව පාලම භාවිතයට ගැනීම සඳහා පියවර ගත යුතුය. | ඌව පළාත් මාර්ග අධ්‍යක්ෂකගේ 2021 නොවැම්බර් 19 දිනැති 17/AC/1/1/1/2-4/2021 අංක දරන ලිපිය මගින් පාලම්වලට සම්බන්ධවන මාර්ගවල අඩුපාඩු සකස් කර ගැනීම පළාත් සභාවෙන් වෙන්වන වාර්ෂික ප්‍රතිපාදන වලින් සිදුකර ගන්නා ලෙස ඌව පළාත් පාලන කොමසාරිස් වෙත දන්වා යවා ඇත. | ඡේදය මගින් පෙන්වා දී ඇති නිරීක්ෂණ නිවැරදි කිරීමට පියවර ගෙන නොමැත. |
| 27. | 2019 දෙසැම්බර් 04 දිනැති අංක 07/2019 දරන අයවැය චක්‍රලේඛයේ 04 ඡේදය මගින් සමාලෝචිත වර්ෂයේ කාර්යාලයීය උපකරණ මිලදී ගැනීම නොකළ යුතු බවට උපදෙස් දී තිබුණද, රු. 50,389,479 ක් වැයකර ලී බඩු හා කාර්යාල උපකරණ මිලදී ගෙන තිබුණි. | 2019 දෙසැම්බර් 31 දිනැති අංක 09/2019 අයවැය චක්‍රලේඛයේ 5.3 මගින් අංක 07/2019 දරන චක්‍රලේඛ විධිවිධාන ඉදිරියටත් වලංගු කර ඇති බැවින් එම චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත. | ඌව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් රු. 30,751,409 ක මුදලක් අත්‍යවශ්‍ය වෛද්‍ය උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් වැය කර ඇති බවත් මිලදී ගැනීම |

| | | | | |
|---|---|---|---|---|
| | | කළ යුතුය. | | අවසන් බැවින් ඒ සම්බන්ධයෙන් නැවත ක්‍රියාමාර්ග ගතනොහැකි බවත් ඉදිරියේදී චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරන බවත් දන්වා ඇත. අනෙකුත් ආයතන විසින් කාර්යාල කටයුතු සක්‍රීයව පවත්වාගෙන යාම සඳහා මෙම උපකරණ මිලදී ගැනීම සිදු කර ඇති බව දක්වා ඇත. |
| 28. | 2013 ඔක්තෝබර් 07 දිනැති අංක 21/2013 හා 2016 ජුලි 01 දිනැති අංක 03/2016(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීම වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් වෙන්කරනු ලබන ප්‍රතිපාදන සීමාව තුළ කළමනාකරණය කරගත යුතුය.මෙසේ අතිකාල හා නිවාඩු දින වැටුප් වෙනුවෙන් වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් වෙන් කරන ලද | වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින්, පරිපූරක ඇස්තමේන්තු සහ මුදල් රීති 66 යටතේ සලසාගනු ලබන ප්‍රතිපාදන සීමාව තුළ වියදම් කළමනාකරණ | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත. | දිගින් දිගටම මෙලෙස බැරකම් ඇති වීම නිරීක්ෂණය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | රු. 1,709,493,500 ක ප්‍රතිපාදනයට අමතරව රු. 204,637,585 ක අතිරේක ප්‍රතිපාදන සලසාගෙන ඉන් රු. 1,913,073,657 ක් ඒ සඳහා වැය කර තිබුණි. එමෙන්ම ඉන් රු. 365,300 ක ප්‍රතිපාදන මුදල් රීති 66 යටතේ වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණු අතර අංක 1002 අතිකාල හා නිවාඩු දින වැටුප් වැය විෂයය සඳහා වර්ෂ අවසානයේ ප්‍රතිපාදන සීමාව ඉක්මවා රු. 172,988,482 ක බැරකම් සඳහා බැඳීම් ඇතිකර ගෙන තිබුණි. | ය කරගත යුතුය. | | |
| 29. | 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ මුළු බැරකම් රු.324,323,594 ක් වූ අතර ඌව පළාත් සභා මුදල් රීති 94.1 ට අනුකූල නොවන ලෙසට පුනරාවර්තන වැය විෂයයන් 09 ක් සහ මූලධන වැය විෂයයන් 02 ක් සඳහා වාර්ෂික ප්‍රතිපාදන සීමාව ඉක්මවා රු. 252,029,445 ක බැරකම් සඳහා බැඳීම් ඇතිකර ගෙන තිබුණි. | ප්‍රමුඛතා හඳුනාගෙන මනා සැලසුමකින් ඇස්තමේන්තු සකස් කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත. | ඌව පළාත් සභා මුදල් රීති 94.1 ට අනුකූලව කටයුතු නොකරන අවස්ථා ඇත. |
| 30. | 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් සහ පළාත් සභාවේ ආයතන 06 කින් ලැබිය යුතු අග්‍රිම රු. 25,340,185 ක් පියවාගෙන නොතිබුණි. | වර්ෂය අවසානයට ඉතිරි අග්‍රිම ශේෂය ඌව පළාත් සභා මුදල් රීති 366.5.2 ප්‍රකාරව ඊළඟ වර්ෂයේ ජනවාරි 10 දිනට හෝ පළාත් භාණ්ඩාගාරය | වර්ෂය අවසානයේ පළාත් භාණ්ඩාගාරය වෙත අග්‍රිම පියවීමට කටයුතු කරන ලෙස අදාළ ආයතන ප්‍රධානීන් දැනුවත් කර ඇත. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) ලබාදුන් පිළිතුර අනුව 2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු අග්‍රිම ශේෂය රු. 10,079,910 කි. |

| | | | | |
|---|---|---|---|---|
| | | නියම කරන දිනට පෙර පියවිය යුතුය. | | |
| 31. | 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තැන්පත් කර වසර 02 ඉක්ම වූ ආයතන 27 කට අදාළ තැන්පතු ශේෂවල එකතුව රු. 104,551,191 ක් මු.රෙ. 571 ප්‍රකාරව නියාදනය කර නොතිබුණි. | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාර අවශ්‍ය නියාදන කටයුතු කරන ලෙසට ආයතන දැනුවත් කර ඇති අතර ඒ අනුව ඉදිරියේදී කටයුතු සිදු කිරීමට නියමිතය. | 2021 දෙසැම්බර් 31 දිනට ආයතන 20 කට අදාළ වසර 02 ඉක්ම වූ පොදු තැන්පත් ශේෂ එකතුව රු.20,897,801 ක් බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් දක්වා ඇත. |
| 32. | ඌව පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල 29 කින් ස්ථාන මාරුවී ගිය, මියගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ සහ සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු. 85,217,140 ක වැටුප් ණය අයකර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නිරවුල් කළ යුතුය. | මෙම ණය ශේෂ පියවීමට සහ නිරවුල් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව වාර්තා කර ඇත. | මෙම ණය ශේෂ අයකර ගනිමින් පවතී. |
| 33. | වර්ෂ 10 කට අධික කාලයක් ඌව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන වල ජංගම වත්කම් වශයෙන් පෙන්වා තිබුණු රු. 40,566,157 ක අයවිය යුතු මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ද අයකර නොතිබුණි. | ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | බීජ අර්තාපල් ගිණුමෙන් නිලධාරීන්ගෙන් අය විය යුතු ශේෂ වෙනුවෙන් අදාළ ආයතන ප්‍රධානින් දැනුවත්කර එම නිලධාරීන්ගෙන් අයකර ගැනීමට දන්වා ඇත. | 2021 අංක 21 දරන පරිපූරක ඇස්තමේන්තුව මගින් 706-3-2-1701 (පාඩු හා හානි) රු. 29,800,401 ක ප්‍රතිපාදන |

| | | | | |
|---|---|---|---|---|
| | | | | සලසාගෙන සිදුව ඇති ප්‍රාග්ධන අලාභය කපා හැර ඇත. |
| 34. | 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හා ඉකුත් වර්ෂ වෙනුවෙන් ඌව පළාතේ පළාත් පාලන ආයතන අයකර ගතයුතු වරිපනම් බදු හා වෙනත් ආදායම් රු. 725,530,590 ක් අයකර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා පළාත් පාලන ආයතන කටයුතු කළත් පසුගිය වර්ෂයේ හා මෙම වර්ෂයේ ඇති වූ කොවිඩ් 19 වසන්ගත තත්ත්වය යටතේ මෙම කටයුතු තාවකාලිකව නතර විය. තවද හිඟ ආදායම් අයකර ගැනීම සම්බන්ධයෙන් සියලුම පළාත් පාලන ආයතන දැනුවත් කර ඇත. | 2021 වර්ෂයට බිල්කළ ආදායම්ද ඇතුළුව 2021 දෙසැම්බර් 31 දිනට තවදුරටත් රු. 431,481,845 ක් අයවිය යුතුව ඇත. |
| 35. | 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඌව පළාතේ පළාත් පාලන ආයතනවල ධූරධාරීන්ට හා නිලධාරීන්ට එරෙහිව පනවා තිබුණු අධිභාර වෙනුවෙන් අයකර ගතයුතු රු. 5,533,839 ක් අය කර නොතිබුණි. | පනවා ඇති අධිභාර කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. | අධිභාර අයවීමේ ප්‍රගතිය පහත පරිදි වේ.<br>වැලිමඩ ප්‍රාදේශීය සභාව : ගෙවමින් පවතී.<br>තණමල්විල ප්‍රාදේශීය සභාව : අධිභාරයට අදාළ නඩුවක් පවතී.<br>බුත්තල ප්‍රාදේශීය සභාව : අභියාචනා සලකා බැලීමෙන් පසු රු. 120,850 ක් ගෙවන ලෙස දන්වා ඇතත් මෙතෙක් ගෙවා නැත.<br>සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව : | තවදුරටත් අයකරගත යුතු හිඟ අධිභාර පවතී.<br>වැලිමඩ ප්‍රාදේශීය සභාව : අයවී නැත.<br>තණමල්විල ප්‍රාදේශීය සභාව : වාරික වශයෙන් අයවන බව දක්වා ඇත.<br>බුත්තල ප්‍රාදේශීය සභාව |

| | |
|---|---|
| රු. 18,008 ක් ගෙවිය යුතුව ඇත. | : රු. 10,000 ක් පමණක් අයවී ඇත. මොනරාගල ප්‍රාදේශීය සභාව : අයවී නොමැත. සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව : රු. 90,000 ක් අයවී ඇත. කොටස් වශයෙන් අයවෙමින් පවතී. |